# ගිණුම්කරණය

## ගුරු මාර්ගෝපදේශය

## 12 ශ්‍රේණිය

**(2017 සිට ක්‍රියාත්මක වේ).**

වාණිජ දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

web : www.nie.lk
Email : info@nie.lk

# ගිණුම්කරණය

## ගුරු මාර්ගෝපදේශය

## 12 ශ්‍රේණිය
**(2017 සිට ක්‍රියාත්මක වේ).**

වාණිජ දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

web : www.nie.lk
Email : info@nie.lk

**ගිණුම්කරණය**

**12 ශ්‍රේණිය**

**ගුරුමාර්ගෝපදේශය**

**ප්‍රථම මුද්‍රණය - 2017**

**© ජාතික අධ්‍යාපන ආයතනය**

ISBN :

**වාණිජ දෙපාර්තමේන්තුව**

**විද්‍යා හා තාක්ෂණ පීඨය**

**ජාතික අධ්‍යාපන ආයතනය**

**මහරගම**

**ශ්‍රී ලංකාව**

web : www.nie.lk

Email : info@nie.lk

# පටුන


| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවුඩය | iv |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය | v |
| අධ්‍යක්ෂගේ පණිවුඩය | vi |
| විෂයමාලා කමිටුව | vii-viii |
| හැඳින්වීම | ix |
| ජාතික පොදු අරමුණු | x |
| පොදු නිපුණතා | xi-xii |
| විෂය අරමුණු | xiii |
| ඉගෙනුම් ඵල හා ආදර්ශ ක්‍රියාකාරකම් | 1-243 |

## අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණු සහිත ව එවකට පැවැති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු වන අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා ලෙස ලදී.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ විවිධ පාර්ශව ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයවල නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩනැඟීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සමෝධාන ක්‍රමය භාවිත කර ඇති අතර විවිධ විෂයවල දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සමෝධාන ක්‍රමය භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබා දීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයකු ලෙස කටයුතු කිරීමට මෙම ගුරු මාර්ගෝපදේශ උපකාර වනු ඇත. සිසුන් ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එ මෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නො වේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමඟ සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවකට හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවලින් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීම යි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශවල ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

අතීතයේ සිට ම අධ්‍යාපනය නිරන්තරයෙන් වෙනස්වීම්වලට භාජනය වෙමින් ඉදිරියට ගමන් කරමින් තිබිණි. මෑත යුගයේ මෙම වෙනස් වීම දැඩි ලෙස ශීඝ්‍ර වී ඇත. ඉගෙනුම් ක්‍රමවේදවල මෙන් ම තාක්ෂණික මෙවලම් භාවිතය අතින් හා දැනුම උත්පාදනය සම්බන්ධයෙන් ද ගත වූ දශක දෙක තුළ විශාල පිබිදීමක් දක්නට ලැබිණි. මේ අනුව ජාතික අධ්‍යාපන ආයතනය ද 2015ට අදාළ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා අප්‍රමාද ව සුදුසු පියවර ගනිමින් සිටී. ගෝලීය ව සිදු වන වෙනස්කම් ගැන හොඳින් අධ්‍යයනය කර දේශීය අවශ්‍යතා අනුව අනුවර්තනයට ලක් කර ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම්-ඉගැන්වීම් ප්‍රවේශය පාදක කර ගනිමින් නව විෂයමාලාව සැලසුම් කර පාසල් පද්ධතියේ නියමුවන් ලෙස සේවය කරන ගුරු භවතුන් වන ඔබ වෙත මෙම ගුරු මාර්ගෝපදේශය පුද කරන්නේ ඉතා සතුටිනි.

මෙවැනි නව මග පෙන්වීමේ උපදේශන සංග්‍රහයක් ඔබ වෙත ලබාදෙන්නේ ඒ මගින් ඔබට වඩාත් දායකත්වයක් ලබාදිය හැකි වේ ය යන විශ්වාසය නිසා ය.

මෙම උපදේශන සංග්‍රහය පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඔබට මහඟු අත්වැලක් වනවාට කිසි ම සැකයක් නැත. එසේ ම මෙය ද උපයෝගි කර ගනිමින් කාලීන සම්පත් ද්‍රව්‍ය භාවිතයෙන් වඩාත් සංවර්ධනාත්මක ප්‍රවේශයක් ඔස්සේ පන්ති කාමරය හසුරුවා ගැනීමට ඔබට නිදහස ඇත.

ඔබ වෙත ලබා දෙන මෙම ගුරු මාර්ගෝපදේශය මැනවින් අධ්‍යයනය කර වඩා නිර්මාණශීලි දරු පරපුරක් බිහි කර ශ්‍රී ලංකාව ආර්ථික හා සමාජීය අතින් ඉදිරියට ගෙන යාමට කැපවීමෙන් යුතු ව කටයුතු කරනු ඇතැයි මම විශ්වාස කරමි.

මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය වූයේ මෙම විෂය ක්ෂේත්‍රයට අදාළ ගුරු භවතුන් හා සම්පත් පුද්ගලයන් රැසකගේ නොපසුබට උත්සාහය හා කැපවීම නිසා ය.

අධ්‍යාපන පද්ධතියේ සංවර්ධනය උදෙසා නිම වූ මෙම කාර්යය මා ඉතාමත් උසස් ලෙස අගය කරන අතර මේ සඳහා කැපවී ක්‍රියා කළ ඔබ සැමට මගේ ගෞරවාන්විත ස්තුතිය පිරි නමමි.

**එම්.එෆ්.එස්.පී. ජයවර්ධන**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
(විද්‍යා හා තාක්ෂණ පීඨය)

## අධ්‍යක්ෂගේ පණිවුඩය

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන විෂයමාලා සම්බන්ධයෙන් දනට පිළිගෙන ඇති ප්‍රතිපත්තිය අනුව සෑම වසර අටකටම වරක් සමස්ත විෂයමාලා සංශෝධනයන් අවශ්‍ය වන්නේ දේශීය හා ගෝලීය වශයෙන් ඇති වන වෙනස්වීම් හා අභියෝගයන්ට මුහුණ දිය හැකි දරු පරපුරක් අප රටේ ද බිහි කළ යුතුය යන අර්ථවත් අපේක්ෂාව නිසාය. ගතවූ කාලය තුළදී ආර්ථික, දේශපාලන සමාජීය හා වානිජ වශයෙන් මෙන්ම සමස්ත ගෝලීය වශයෙන් ද සමස්තව විශාල වෙනසකට පත්වෙමින් පවතී. මේ නිසා 2015 වර්ෂයේ දී සියලුම විෂයමාලා සම්බන්ධයෙන් සංශෝධනය කළ යුතු අවධියක් උදා වී ඇත. අ.පො.ස (උසස් පෙළ) විෂයමාලා සංශෝධනය කර ඉදිරිපත් කරනුයේ 2017 වසරේදීය.

ඉහත සඳහන් තත්වය ගැන සලකා 12 ශ්‍රේණිය සඳහා ගිණුම්කරණය විෂය සම්බන්ධයෙන් කෙටි කලකදී ගුරු අත්පොතක් ලියා ඉදිරිපත් කිරීම ගැන මා අතිශයින් ම සතුටු වෙමි.

විශේෂයෙන් ම මෙම කාර්ය සපුරාලීම සඳහා කැපවීමෙන් යුතුව කටයුතු කළ ලේඛක මණ්ඩලයට හා මෙම කාර්ය ඉතාමත් සාර්ථක ලෙස නිම කර ගැනීමට අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම ලබා දුන් අධ්‍යක්ෂ ජනරාල්තුමියට, සහකාර අධ්‍යක්ෂ ජනරාල්තුමන්ට හා සහාය දැක්වූ අනෙකුත් සියලුම දෙනාට මගේ හෘදයාංගම ස්තුතිය ඉතා සතුටින් පිරිනමමි.

12 ශ්‍රේණිය සඳහා වූ මෙම ගිණුම්කරණය ගුරු අත්පොත දරුවන්ට වඩාත් සාර්ථක ලෙස ඉගෙනුම් අත්දැකීම් ලබා දීම සඳහා විෂය අධ්‍යක්ෂකවරුන්ට, ගුරු උපදේශකවරුන්ට හා ගුරුභවතුන්ට ද මහත් අත්වැලක් වන බව මම තරයේ ම විශ්වාස කරමි.

කේ.රංජිත් පත්මසිරි
අධ්‍යක්ෂ
වාණිජ දෙපාර්තමේන්තුව
විiා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

**උපදේශකත්වය හා අනුමැතිය - ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය**

| | | |
|---|---|---|
| **උපදේශනය** | : | අධ්‍යයන කටයුතු මණ්ඩලය<br>ජාතික අධ්‍යාපන ආයතනය, |
| **මගපෙන්වීම** | : | එම්.එෆ්.එස්.පී. ජයවර්ධන මහතා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්<br>විද්‍යා හා තාක්ෂණ පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය. |
| **අධීක්ෂණය** | : | කේ.ආර්.පද්මසිරි මහතා<br>වැඩ බලන අධ්‍යක්ෂ<br>වාණිජ දෙපාර්තමේන්තුව |
| **විෂය නායකත්වය** | : | එස්.කේ.ප්‍රභාහරන් මහතා<br>ව්‍යාපෘති නායක- ගිණුම්කරණය<br>වාණිජ දෙපාර්තමේන්තුව |
| **අභ්‍යන්තර සම්පත් දායකත්වය** | : | එස්.කේ.ප්‍රභාහරන් මහතා<br>ව්‍යාපෘති නායක- ගිණුම්කරණය<br>වාණිජ දෙපාර්තමේන්තුව<br><br>එම්.ඒ.ඉන්ද්‍රා පද්මිණී පෙරේරා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය- වාණිජ දෙපාර්තමේන්තුව<br><br>ඩී.එල්.සී.ආර්.අජිත් කුමාර<br>කථිකාචාර්ය-වාණිජ දෙපාර්තමේන්තුව<br><br>ආනන්ද මද්දුමගේ<br>කථිකාචාර්ය-වාණිජ දෙපාර්තමේන්තුව<br><br>එස්.ආර්.රත්නජීව<br>සහකාර කථිකාචාර්ය-වාණිජ දෙපාර්තමේන්තුව |
| **බාහිර සම්පත් දායකත්වය** | : | මහචාර්ය සමන්ති සේනාරත්න<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය<br><br>ආචාර්ය හරේන්ද්‍ර කාරියවසම්<br>ප්‍රධානී- ගිණුම්කරණ දෙපාර්තමේන්තුව<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය<br><br>ආචාර්ය අනුර කරුණාරත්න<br>ප්‍රධානී- ගිණුම්කරණ දෙපාර්තමේන්තුව<br>කැළණිය විශ්ව විද්‍යාලය |

කේ.කේ.අරුල්වේල්
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය-යාපනය විශ්ව විද්‍යාලය

සිරිමා නානායක්කාර
කථිකාචාර්ය - විද්‍යා පීඨය
මහරගම

ආර්.පී.ගුණපාල
ගුරු උපදේශක -කලාප අධ්‍යාපන කාර්යාලය
තංගල්ල

අතුල ඒකනායක
ගුරු සේවය - ශාන්ත තෝමස් විදුහල
මාතලේ

ඊ.එම්.නවරත්න
ගුරු සේවය - මධ්‍ය විද්‍යාලය
කුරුණෑගල

ඩී.එම්.එස්.දිසානායක
ගුරු සේවය - පිරිමි විදුහල
කුරුණෑගල

ටී.ධර්මදාස
මධ්‍ය දහා විද්‍යාලය
තඹුත්තේගම

# හැඳින්වීම

නිපුණතා පාදක විෂයමාලාව ශ්‍රී ලංකාවේ පාසල්වල උසස් පෙළ පන්ති සඳහා 2009 වර්ෂයේ දී ප්‍රථම වරට හඳුන්වා දෙනු ලැබී ය. ප්‍රතිපත්තිමය කරුණක් වශයෙන් ජාතික අධ්‍යාපන ආයතනය සෑම අවුරුදු අටකට ම වරක් පාසල්වල විෂයමාලා සංශෝධනය කරනු ලැබේ. ඒ අනුව උසස් පෙළ ගිණුම්කරණය විෂය නිර්දේශය විෂයමාලා සම්පාදකයින් හා විෂය ප්‍රවීණයන්ගෙන් සමන්විත මණ්ඩලයක් මගින් විෂයයට අදාළ නව ප්‍රවණතා හා ඉගෙනුම් ක්‍රමවේදයන් පිළිබඳව ද සැලකිල්ලට ගෙන සකස් කර ඇත.

මෙම විෂයමාලාව හා විෂය නිර්දේශය සම්බන්ධයෙන් ක්‍රමවේද හඳුනා ගැනීම සඳහා විෂය අධ්‍යක්ෂවරු, ගුරු උපදේශකවරු, ගුරු භවතුන්, ශිෂ්‍යයන් හා විදුහල්පතිවරු ද ඒකාබද්ධ කර ගනිමින් ජාතික අධ්‍යාපන ආයතනයේ ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව මගින් පර්යේෂණාත්මක අධ්‍යයනයක් ද සිදු කරන ලදී. එහි ප්‍රධාන අරමුණ වූයේ මෙම විෂය හදාරන සිසුන්ට තමන්ගේ විෂය සම්බන්ධයෙන් උපරිම ඵලදායි ඉගෙනුමක් සඳහා නිසි මගපෙන්වීමක් ලබා දීම ය.

මෙම නව විෂයමාලාව 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ය. එය අධ්‍යාපන සැලසුම්කරුවන්ට මෙන් ම ශිෂ්‍යයන්ට ද අවශ්‍ය උපදේශනය හා මගපෙන්වීම ලබා දෙන අතර උගත් ක්‍රියාශීලි දේශ හිතෛෂී ශිෂ්‍යයෙකු ජාතියට දායාද කිරීමට ද අවස්ථාව සලසාලනු ඇත.

**එස්.කේ.ප්‍රභාහරන්** මහතා
ව්‍යාපෘති නායක- ගිණුම්කරණය
වාණිජ දෙපාර්තමේන්තුව

## ජාතික අරමුණු

(i) මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම මගින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

(ii) වෙනස් වන ලෝකයක අභියෝගවලට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

(iii) මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මත සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යැමට සහාය වීම

(iv) පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

(v) සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

(vi) පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

(vii) ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සුදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

**(viii)** ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ වාර්තාව - (2003)

## පොදු නිපුණතා සමූහ

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

(i) **සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණය ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව :** සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම :** භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය :** රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගලපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය :** පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(ii) **පෞරුෂත්ව වර්ධනය අදාළ නිපුණතා**

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

(iii) **පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

**සමාජ පරිසරය :** ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය :** සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය- ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය :** අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ

මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය,
සංවේදීතාව හා කුසලතාව, ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ

කුසලතා මෙහි අඩංගු වේ.

(iv) **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**
ආර්ථික සංවර්ධනයට දායක වීම
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(v) **ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**
පුද්ගයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාරධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(vi) **ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**
සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(vii) **"ඉගෙනීමට ඉගෙනීම" පිළිබඳ නිපුණතා**
ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබාදීම

## විෂය අරමුණු

- ගිණුම්කරණයේ න්‍යායාත්මක පදනම පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගැනීම.
- ගිණුම්කරණ ශිල්පීය ක්‍රම පිළිබඳ දැනුම ලබා ගැනීම හා එය නිවැරදි ව භාවිත කිරීම.
- ගිණුම්කරණ විෂය ක්ෂේත්‍රය තුළින් විවෘත ව ඇති නව්‍ය අධ්‍යාපන අවස්ථාවන්ට මාර්ගෝපදේශයක් ලබා ගැනීම.
- ගිණුම්කරණ විෂය ක්ෂේත්‍රය තුළින් ලබා ගන්නා වූ නිපුණතා විවිධ වෘත්තීන් සඳහා ඵලදායි ලෙස භාවිතයට ගැනීම
- පවත්නා සමාජ, ආර්ථික හා දේශපාලනික පරිසරය තුළ තිරසාර සංවර්ධනයට යෝග්‍ය වන පරිදි සම්පත් කාර්යක්ෂම ව හා ඵලදායි ව යොදා ගැනීමේ නිපුණතාව ලබා ගැනීම.
- ව්‍යාපාර සංවිධානවල මූල්‍ය වාර්තා පිළියෙල කිරීම, ඉදිරිපත් කිරීම හා අර්ථකථනය කිරීම පිළිබඳ නිපුණතාව ලබා ගැනීම.
- විෂය ක්ෂේත්‍රය තුළ ගවේෂණය තුළින් ලබන හුරුව අනාගතයේ දී පර්යේෂණ හා සංවර්ධන කටයුතුවලට දායක කර ගැනීම.

# ඉගෙනුම් ඵල හා
# ආදර්ශ ක්‍රියාකාරකම්

**නිපුණතාව 1.0 : ගිණුම්කරණය හා එහි අවශ්‍යතාව විග්‍රහ කරයි.**

**නිපුණතා මට්ටම 1.1** : ආයතනයක් කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා ගිණුම්කරණ තොරතුරු වැදගත් වන ආකාරය විග්‍රහ කරයි.


**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් ඵල** :

- ගිණුම්කරණය යන්න පැහැදිලි කරයි.
- ගිණුම්කරණයේ අරමුණ පැහැදිලි කරයි.
- ආයතනයක් කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශ්වයන් නම් කරයි.
- ආයතනයට ඇල්මක් දක්වන පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු අවශ්‍යතා වගු ගත කරයි.
- ගිණුම්කරණයේ ප්‍රභේද දක්වා, එම ප්‍රභේද පැහැදිලි කරයි.

**මූලික පද හා සංකල්ප** :

**සංකල්ප සිතියම**



**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පිවිසුම**

- ''Milinda.com" ව්‍යාපාරයේ තොරතුරු උචිත ආකාරයකට සිසුන්ට ඉදිරිපත් කරන්න.

  රු. 200 000 ක් යොදා මිලින්ද විසින් ''Milinda.com" නමින් සන්නිවේදන සේවා සපයන ආයතනයක් ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපාරයට අදාළ සියලු තොරතුරු පහත දැක්වෙන පරිදි වාර්තා කරයි.

  - ණය ගනුදෙනු - ණය පොතක වාර්තා කිරීම
  - අත්පිට ගනුදෙනු - කටු මුදල් පොතක වාර්තා කිරීම
  - ගනුදෙනුකරුවන්ගේ පෞද්ගලික තොරතුරු වෙනම පොතක වාර්තා කිරීම සිදු කරයි.

  වර්ෂ දෙකකට පසුව, ගනුදෙනුකරුන්ගෙන් ලද ප්‍රතිචාරය අනුව, මිලින්දට ව්‍යාපාරය පුළුල් කිරීමේ අදහසක් ඇති විය. මේ සඳහා රු. 150 000 ක මූල්‍ය අවශ්‍යතාවක් මතු වූ අතර, ඒ සඳහා බැංකු ණයක් ලබා ගැනීමට අදහස් කර ඇත. ණය ලබා ගැනීම සඳහා පසුගිය ආසන්න වසර දෙකක අදාළ ගිණුම් වාර්තා අවශ්‍ය බව බැංකුව දන්වා ඇත.

- 'මෙම සිද්ධියේ ඇතුළත් තොරතුරු ඇසුරින් පහත කරුණු මතු කරමින් සිසුන් සමග සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - ව්‍යාපාරයක මූල්‍ය හා මූල්‍ය නොවන සිද්ධි සිදු වන බව.
  - ව්‍යාපාරයට ඇල්මක් දක්වන විවිධ පාර්ශ්වයන් සිටින බව හා එසේ ඇල්මක් දැක්වීමට හේතු තිබෙන බව.
  - ගිණුම්කරණය, මූල්‍ය හා කළමනාකරණ ලෙස වර්ග කරන බව.
  - මූල්‍ය හා කළමනාකරණ ගිණුම්කරණයේ ක්‍රියාවලියක් පවතින බව.
  - මූල්‍ය හා කළමනාකරණ ගිණුම්කරණයේ වෙනස්කම් ඇති බව.
  - ගිණුම්කරණයේ අරමුණ, ඇල්මැති පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු සැපයීම බව.
  - 'ගිණුම්කරණය' යන්න පිළිබඳ ව සරල අදහසක් මෙයින් ලබා ගත හැකි ය.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- සිසුන් කණ්ඩායම් දෙකකට වෙන් කරන්න
- පහත සඳහන් ප්‍රශ්නාවලිය සකස් කර ගන්න.
  1. ගිණුම්කරණය යන්න කෙටියෙන් හඳුන්වන්න.
  2. ගිණුම්කරණයේ අරමුණ කුමක් ද?
  3. ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවයන් 4 ක් නම් කරන්න.
  4. පහත සඳහන් පාර්ශවයන් ව්‍යාපාරය කෙරෙහි ඇල්මක් දැක්වීමට හේතුවක් බැගින් සඳහන් කරන්න.

     (අ) අයිතිකරු / අයිතිකරුවන්

     (ආ) බැංකු

5. ගිණුම්කරණයේ ප්‍රභේද නම් කරන්න.
6. මූල්‍ය ගිණුම්කරණය යනු කුමක් ද?
7. මූල්‍ය ගිණුම්කරණ ක්‍රියාවලිය නම් කරන්න.
8. කළමනාකරණ ගිණුම්කරණය යනු කුමක් ද?
9. කළමනාකරණ ගිණුම්කරණ ක්‍රියාවලිය නම් කරන්න.
10. මූල්‍ය සිද්ධි හතරක් නම් කරන්න.
11. මූල්‍ය නොවන සිද්ධි දෙකක් ඉදිරිපත් කරන්න.
12. මූල්‍ය ගිණුම්කරණය හා කළමනාකරණ ගිණුම්කරණය අතර වෙනස්කම් දෙකක් ඉදිරිපත් කරන්න.

- අහඹු ලෙස ප්‍රශ්නය තෝරා ගැනීමට කණ්ඩායමට අවස්ථාව ලබා දෙන්න. (ප්‍රශ්න අංකය සඳහන් කරමින් ප්‍රශ්නය ඉල්ලන ලෙස සිසුන්ට දන්වන්න).
- තෝරා ගත් ප්‍රශ්නය එම කණ්ඩායමට ප්‍රසිද්ධියේ ඉදිරිපත් කරන්න.
- නිවැරදි පිළිතුර ලබාදුන් පසු ලකුණක් ලබා දී වැරදි පිළිතුර ලද විට, එම ප්‍රශ්නය අනෙක් කණ්ඩායමට ලබා දෙන්න. එහි දී ලද නිවැරදි පිළිතුරට ලකුණක් ලබා දෙන්න.
- මේ ආකාරයට කණ්ඩායම් දෙකට ප්‍රශ්න ඉදිරිපත් කරමින් නිවැරදි පිළිතුරුවලට ලකුණු ලබා දෙන්න.
- සිසුන් තුළින් නිවැරදි පිළිතුරු නොලැබුනේ නම්, ගුරුවරයා විසින් නිවැරදි පිළිතුර ඉදිරිපත් කරන්න.
  (මීට අදාළ සිද්ධියක් /සිද්ධි ගුරුවරයා විසින් නිර්මාණය කර ගන්න).

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- විවිධ ආයතන විසින් ගිණුම්කරණය යන්න පහත සඳහන් ආකාරයට නිර්වචනය කර ඇත.

**ඇමරිකානු ගිණුම්කරණ සංගමය**

(American Accounting Association)

''තොරතුරු ප්‍රයෝජනයට ගන්නා පාර්ශවයන්ට විනිශ්චයක් කිරීමටත්, තීරණ ගැනීමට හැකිවන අයුරින් ආර්ථික තොරතුරු හඳුනා ගැනීමේ, මැනීමේ සහ සන්නිවේදනය කිරීමේ ක්‍රියාවලිය '' ගිණුම්කරණයයි.

**ඇමරිකානු පොදු සහතිකලත් ගණකාධිකාරී ආයතනය**

(American Institute of Certified Public Accountants)

''ව්‍යාපාරයක යටත් පිරිසෙයින් අර්ධ වශයෙන්වත් මූල්‍ය ස්වරූපයක් ගන්නා ගණුදෙනු හා සිද්ධි සුවිශේෂී ආකාරයට මුදල් මාධ්‍යය උපයෝගී කර ගෙන සටහන් කිරීමේ, වර්ග කිරීමේ, සාරාංශ කිරීමේ සහ ක්‍රියාවලියේ ප්‍රතිඵල විවරණය කිරීමේ කලාව'' ගිණුම්කරණයයි.

පළමු නිර්වචනය ගැන අවධානය යොමු කළ හොත්, එය ගිණුම්කරණය පිළිබඳව පොදු නිර්වචනයකි. දෙවන නිර්වචනය මූල්‍ය ගිණුම්කරණය ගැන අවධාරණය කරයි.

ඉහත නිර්වචන දෙක අධ්‍යයනය කිරීමෙන් පසුව ''ගිණුම්කරණය'' යන්නට පොදු නිර්වචනයක් ගොඩ නැගිය හැකිය.

''උනන්දුවක් දක්වන පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා ගිණුම්කරණ ඒකකයට අදාළ ආර්ථික තොරතුරු සැපයීමේ සමස්ථ ක්‍රියාවලිය ගිණුම්කරණයයි.''

ආර්ථික තොරතුරු, ගිණුම්කරණ ඒකකය, ගිණුම්කරණ ක්‍රියාවලිය, උනන්දුවක් දක්වන පාර්ශ්වයන්, ඔවුන් ගනු ලබන තීරණ, මෙම නිර්වචනය තුළින් ලබා ගත හැකි ය.

**ගිණුම්කරණයේ අරමුණ :**

ගිණුම්කරණ ඒකකය පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ ආර්ථික තොරතුරු, සන්නිවේදනය කිරීම'' ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ වේ.

ගිණුම්කරණ ඒකකය, පුද්ගලයෙක්, රජයක්, ව්‍යාපාර සංවිධානයක්, ව්‍යාපාරයක් හෝ වෙනත් ඕනෑම කටයුත්තක් විය හැකිය. මෙහි දී ආර්ථික තොරතුරු ලෙස හඳුනා ගන්නේ **මූල්‍යමය තොරතුරු** ය.

**නිදසුන් :**

- ව්‍යාපාරයේ ගිණුම් වර්ෂයක ලාභය රු. 200 000 කි.
- ව්‍යාපාරයේ මුළු වත්කම් රු. 2 000 000 කි.
- ව්‍යාපාරයේ මුළු වගකීම් රු. 500 000 කි.

උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා වැදගත්වන **මූල්‍යමය නොවන තොරතුරු** ද ඇත. නිදසුන් ලෙස :

- ආයතනයේ සේවක මණ්ඩලය 500 කි.
- තත්ත්වයෙන්, ගුණයෙන් උසස් භාණ්ඩ අලෙවි කිරීම ව්‍යාපාරය ගැන මහජනයා තුළ හොඳ ප්‍රතිචාරයක් ඇත.
- සේවක අභිප්‍රේරණය සඳහා හොඳ වැඩපිළිවෙලක් ආයතනය තුළ ක්‍රියාත්මක වේ.

ආයතනයට ඇල්මක් දක්වන පාර්ශ්වයන් හා එසේ ඇල්මක් දැක්වීමට හේතු මොනවා ද යන්න පහත වගුවෙන් ඉදිරිපත් කරයි.

| ඇල්මක් දක්වන පාර්ශ්ව | ඇල්මැති පාර්ශ්වවලට අවශ්‍ය වන තොරතුරු |
|---|---|
| 1. අයිතිකරු / අයිතිකරුවන් | • ආයෝජනයට සරිලන / සතුටුදායක ප්‍රතිලාභයක් ලබා තිබේ ද?<br>• තව දුරටත් ආයෝජනය කළ යුතු ද? |
| 2. කළමනාකරුවන් | • සැලසුම් නිසි පරිදි ක්‍රියාත්මක වන්නේ ද?<br>• අනාගත වර්ධනය සඳහා ගත යුතු තීරණ/සැලසුම් මොනවා ද? |
| 3. සේවකයෝ | • රැකියාවේ සුරක්ෂිත බවක් තිබේ ද?<br>• වැටුප් වැඩි කිරීමට ව්‍යාපාරයට හැකියාවක් තිබේ ද? |
| 4. රාජ්‍ය ආයතන<br>නිද : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | • නියමිත පරිදි බදු ගෙවන්නේ ද?<br>• අවශ්‍ය වාර්තා අදාළ ආයතනවලට සපයන්නේ ද?<br>• සාධාරණ මිලකට ගුණාත්මයෙන් යුතු නිෂ්පාදිත ලබා දෙන්නේ ද? |
| 5. ගනුදෙනුකරුවන් | • වගකීම් සහතික (ප්‍රතිඥාභාර) ඉටු කිරීමට ව්‍යාපාරයට හොඳ පැවැත්මක් තිබේ ද? |
| 6. ණය හිමියෝ සහ ණය සපයන ආයතන | • සපයා ඇති ණය ආපසු ලබා ගත හැකි ද?<br>• තවදුරටත් ණය සැපයීම සිදු කිරීම සුදුසු ද? |

**ගිණුම්කරණයේ ප්‍රභේද**

ගිණුම්කරණ තොරතුරු ප්‍රයෝජනයට ගන්නා පාර්ශ්වයන් අනුව ගිණුම්කරණය ප්‍රධාන කොටස් දෙකකි.

**ගිණුම්කරණය**


මූල්‍ය ගිණුම්කරණය

ගිණුම්කරණ ඒකකයක අතීත ගනුදෙනු හා සිද්ධීන්වලට අදාළ තොරතුරු ආර්ථිකමය තීරණ ගැනීමට සුදුසු වන ආකාරයට සකස් කර, බාහිර පාර්ශ්වයන් වෙත ඉදිරිපත් කිරීම මූල්‍ය ගිණුම්කරණයයි.


කළමනාකරණ ගිණුම්කරණය

ආයතනයක සියලුම කළමනාකරණ මට්ටම්වලට අවශ්‍ය වන පරිදි සැලසුම් කිරීම, පාලනය කිරීම, තීරණ ගැනීම, වගකීම් ඉටු කිරීමට හැකි වන සේ මූල්‍ය හා මූල්‍ය නොවන තොරතුරු සැපයීම කළමනාකරණ ගිණුම්කරණයයි.

## මූල්‍ය ගිණුම්කරණ ක්‍රියාවලිය




## කළමනාකරණ ගිණුම්කරණ ක්‍රියාවලිය




**මූල්‍ය ගිණුම්කරණය හා කළමනාකරණ ගිණුම්කරණය අතර වෙනස්කම්**

| මූල්‍ය ගිණුම්කරණය | කළමනාකරණ ගිණුම්කරණය |
|---|---|
| 1. ඓතිහාසික තොරතුරු පමණක් යොදා ගනියි. | 1. ඓතිහාසික හා පුරෝකථන තොරතුරු යොදා ගනියි. |
| 2. බාහිර හා අභ්‍යන්තර පාර්ශ්වයන්ට තොරතුරු ඉදිරිපත් කරයි. | 2. අභ්‍යන්තර පාර්ශ්වයන්ට පමණක් තොරතුරු ඉදිරිපත් කරයි. |
| 3. ගිණුම්කරණ කාලච්ඡේදයක් සඳහා තොරතුරු ඉදිරිපත් කරයි. | 3. කළමනාකරණයට අවශ්‍ය වන අවස්ථාවන්හි තොරතුරු ඉදිරිපත් කරයි. |
| 4. ගිණුම්කරණ සංකල්ප, නීති රීති සම්ප්‍රදායයන් ගිණුම්කරණ ප්‍රමිත යොදා ගනියි. | 4. ගිණුම්කරණ සංකල්ප, නීති රිති, ගිණුම්කරණ ප්‍රමිත අදාළ නොවේ. |

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

- ගිණුම්කරණය යන්න පැහැදිලි කිරීම.
- ගිණුම්කරණයේ අරමුණ සඳහන් කිරීම.
- ව්‍යාපාරය කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශ්වයන් නම් කර, ඔවුන්ට අවශ්‍ය තොරතුරු දක්වීම.
- දෙන ලද ගනුදෙනු හා සිද්ධීන් මූල්‍ය හා මූල්‍ය නොවන ලෙස වෙන් කර දක්වීම.
- මූල්‍ය ගිණුම්කරණය හා කළමනාකරණ ගිණුම්කරණය අතර වෙනස්කම් ඉදිරිපත් කිරීම.

| මූලික පද | **பிரதான பதங்கள்** | **Key terms** |
|---|---|---|
| • ඇල්මැති පාර්ශ්වයන් | அக்கறையுள்ள தரப்பினர் | Stake holders |
| • මූල්‍ය ගිණුම්කරණය | நிதிக் கணக்கீடு | Financial Accounting |
| • කළමනාකරණ ගිණුම්කරණය | முகாமைக் கணக்கீடு | Management Accounting |
| • ගිණුම්කරණයේ අරමුණ | கணகீட்டின் நோக்கம் | Objective of Accounting |
| • ගිණුම්කරණයේ ප්‍රභේද | கணக்கீட்டின் வகைகள் | Branches of Accounting |
| • ගිණුම්කරණ යෙදවුම් | கணக்கீட்டு உள்ளீடுகள் | Accounting Inputs |
| • ගිණුම්කරණ නිමවුම් | கணக்கீட்டு வெளியீடுகள் | Accounting Outputs |
| • ගිණුම්කරණ ක්‍රියාවලිය | கணக்கீட்டுச் செயன்முறை | Accounting Process |

**නිපුණතාව 1.0 : ගිණුම්කරණය හා එහි අවශ්‍යතාව විග්‍රහ කරයි.**

**නිපුණතා මට්ටම 1.2** : ගිණුම්කරණ පරිසර සාධකවල වෙනස්වීම් මත, ගිණුම්කරණයේ වෙනස්වීම් හා ප්‍රවණතා සිදුවන ආකාරය විග්‍රහ කරයි.

**කාලච්ඡේද** : 02


**ඉගෙනුම් ඵල :**

- ගිණුම්කරණ පරිසරය පැහැදිලි කරයි.
- ගිණුම්කරණ පරිසර සාධක නම් කර පැහැදිලි කරයි.
- ගිණුම්කරණ පරිසර සාධකවල වෙනස්වීම් ගිණුම්කරණ ක්‍රියාවලියට බලපාන ආකාරය දක්වයි.

**මූලික පද සංකල්ප :**

**සංකල්ප සිතියම**

:




**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසුම :**

- පාසලේ ඇති පරිසරයට අයත් සාධක පිළිබඳ විමසමින් පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - ව්‍යාපාර පරිසරය මෙන් ම, ගිණුම්කරණයට ද පරිසරයක් තිබීම.
  - පහත පරිසර සාධක ව්‍යාපාරයේ ගිණුම්කරණයට බලපෑම් කිරීම
    - ආර්ථික හා දේශපාලන පරිසරය

- ශිල්පීය හා වෘත්තීය පරිසරය
- නෛතික පරිසරය
- සමාජ හා සංස්කෘතික පරිසරය
- තාක්ෂණික පරිසරය

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- ඇමුණුම් 1.2.1 හි ඇතුළත් ගිණුම්කරණ පරිසර සාධක හා විචල්‍යයන් ඇතුළත් රූප සටහන එක් සිසුවෙකුට එක බැගින් ලබා දෙන්න.
- ගිණුම්කරණ පරිසර සාධකයන් හා එයට අයත් විචල්‍යයන් ඇතුළත් රූපසටහන හොඳින් අධ්‍යයනය කිරීමට සිසුන් යොමු කරන්න.
- රූප සටහනේ දී ඇති පරිසර සාධක විචල්‍යයන් ඊට අදාළ පරිසර සාධකය යටතේ ලිවීමට සිසුන් යොමු කරන්න.
- සම්පූර්ණ කළ රූප සටහන, පන්තියට ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- වැරදි ලෙස වර්ග කිරීම් කර ඇත්නම්, නිවැරදි කිරීමට මග පෙන්වන්න.
- රූප සටහනේ දී ඇති පරිසර සාධක විචල්‍යයන් කිහිපයක් තෝරා ගෙන, එය ගිණුම්කරණයට බලපාන ආකාරය පැහැදිලි කිරීමට යොමු කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

ගිණුම්කරණ පරිසරය : ව්‍යාපාරයක ගිණුම්කරණ ක්‍රියාවලියට බලපෑම් ඇති කරන පරිසරය ගිණුම්කරණ පරිසරයයි.

ව්‍යාපාරයක ගිණුම්කරණ ක්‍රියාවලියට බලපෑම් ඇති කරන ප්‍රධාන පරිසර සාධක පහත ආකාරයට වර්ග කළ හැකිය.

| පරිසර සාධකය | හැඳින්වීම | විචල්‍යයන් |
|---|---|---|
| 01. ආර්ථික හා දේශපාලන පරිසරය | කිසියම් රජයක් තම ආර්ථික ප්‍රතිපත්ති සැලසුම් කර, ක්‍රියාත්මක කිරීමේ දී ගන්නා තීරණ **ආර්ථික හා දේශපාලන පරිසරය** ලෙස හැඳින්වේ. | • බදු ප්‍රතිපත්තිය<br>• විනිමය අනුපාත<br>• මිල මට්ටම්<br>• රාජ්‍ය ප්‍රතිපත්ති (පොළී අනුපාත, වැටුප් තීරණ)<br>• වෙළඳපොල තත්ත්වය (මූල්‍ය /ප්‍රාග්ධන) |
| 02. ශිල්පීය හා වෘත්තීය පරිසරය | ගිණුම්කරණ ක්‍රියාවලියේ දී ව්‍යාපාර සම්පත් ප්‍රමාණාත්මකව හා මූල්‍යමය වශයෙන් මැනීම හා තක්සේරු කිරීමට යොදා ගන්නා විවිධ ශිල්පීය ක්‍රම ඇතුළත් පරිසරය **ශිල්පීය හා වෘත්තීය පරිසරය** වේ. | • ගිණුම්කරණ ප්‍රමිත<br>• ගිණුම්කරණ ශිල්ප ක්‍රම<br>• ගිණුම්කරණ වෘත්තීය ආයතන |
| 03. නෛතික පරිසරය | ව්‍යාපාර විසින් ගිණුම්කරණ ක්‍රියාවලියේ දී අනුගමනය කළ යුතු නෛතික තත්ත්වයන්, **නෛතික පරිසරය** ලෙස හැඳින්වේ. | • 2007 අංක 07 සමාගම් පනත<br>• 1890 හවුල් ආඥා පනත<br>• දේශීය ආදායම් පනත<br>• ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත<br>• ගිණුම්කරණයට අදාළ නඩු තීන්දු |
| 04. සමාජ හා සංස්කෘතික පරිසරය | සමාජයේ සිටින පුද්ගලයින්ගේ සිතුම්, පැතුම් හා ආකල්ප සහිත වටාපිටාව **සමාජ හා සංස්කෘතික පරිසරය** ලෙස හැඳින්වේ. | • ආකල්ප<br>• සිරිත්-විරිත්<br>• පුරුදු<br>• විශ්වාස<br>• ජන සංඛ්‍යාව<br>• ජන සංක්‍රමණය<br>• පුද්ගල ජීවන රටා |
| 05. තාක්ෂණික පරිසරය | ව්‍යාපාරවල ගිණුම්කරණ කටයුතු පහසු කිරීම සඳහා විවිධ තාක්ෂණික උපකරණ භාවිත කිරීම **තාක්ෂණික පරිසරය** ලෙස හැඳින්වේ. | • පරිගණක තාක්ෂණය<br>• නව තාක්ෂණික උපකරණ භාවිතය<br>• සන්නිවේදන තාක්ෂණය |

ගිණුම්කරණ පරිසර සාධකවල වෙනස්වීම් ගිණුම්කරණයට බලපාන ආකාරය


| පරිසර සාධකය | පරිසර සාධක විචල්‍යය | ගිණුම්කරණයට බලපාන ආකාරය |
|---|---|---|
| 1. ආර්ථික හා දේශපාලන පරිසරය | • පොළී අනුපාත | • පොළී අනුපාතය අඩු කිරීම නිසා බැංකු ණය ලබා ගැනීමට පෙළඹේ. <br> • අතිරේක ණය ලබා ගැනීම වැඩි වී ව්‍යාපාර වර්ධනයක් ඇති වී ආදායම් වැඩි වේ. |
| 2. ශිල්පීය හා වෘත්තීය පරිසරය | දේපළ පිරියත හා උපකරණ ගිණුම්කරණ ප්‍රමිතය අනුව ක්ෂය කිරීම | • බොහෝ ව්‍යාපාර විවිධ ක්ෂය ක්‍රම අතුරින් සරල මාර්ග ක්ෂය ක්‍රමය භාවිත කිරීම නිසා ගිණුම් තොරතුරුවල ඒකාකාරී බව ආරක්ෂා වීම තුළින් ගුණාත්මක බව වැඩි වීම. |
| 3. නෛතික පරිසරය | • 1890 හවුල් ආඥා පනත <br> • 2007 අංක 07 සමාගම් පනත | • ලිඛිත ගිවිසුමක් නොමැති ව පවත්වා ගෙන ගිය හවුල් ව්‍යාපාරයක ලාභය සම සමව බෙදා ගත යුතු යි. <br> • සෑම සීමිත පොදු සමාගමක් ම සමාගම් පනතට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| 4. සමාජ හා සංස්කෘතික පරිසරය | • පුද්ගල ජීවන රටා | • දේශීය ආහාර ගැනීමේ රටාවට ජනතාව වැඩි නැඹුරුවක් දැක්වීම නිසා, දේශීය ආහාර වර්ග නිපදවීමේ ව්‍යාපාර වැඩි වශයෙන් ආරම්භ වීම හා එම ව්‍යාපාරවල අලෙවිය වැඩිවීම හා ලාභය වැඩිවීම. |
| 5. තාක්ෂණික පරිසරය | • නව තාක්ෂණික උපකරණ ගිණුම්කරණය භාවිත කිරීම. | • රත්‍රන් අලෙවි කිරීමේදී ''ඩෙන්සි මීටරය'' භාවිත කිරීම නිසා ව්‍යාපාරවල සිදුවිය හැකි වංචා අවම වී ආදායම් ඉහළ යාම. |

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක :**

- ගිණුම්කරණ පරිසර සාධක නම් කිරීම.
- වැටුප් වැඩි කිරීමට රජය ගත් තීරණයක් නිසා ව්‍යාපාරවල ආදායම් වැඩි වී ඇත. මෙය කුමන පරිසර සාධකයට අයත්වේ ද? යන්න ප්‍රකාශ කිරීම.
    1. ආර්ථික හා දේශපාලන පරිසරයට
    2. නෛතික පරිසරයට
    3. තාක්ෂණික පරිසරයට
    4. සමාජ හා සංස්කෘතික පරිසරයට
    5. ශිල්පීය හා වෘත්තීය පරිසරයට
- සමාජ හා සංස්කෘතික පරිසර සාධකයට අයත් විචල්‍යයන් දෙකක් නම් කර, එක් සාධකයක් ගිණුම්කරණයට බලපාන ආකාරය පැහැදිලි කිරීම.
- ''නෛතික පරිසරයෙන් බැහැර ව ගිණුම්කරණය පවත්වාගත හැකියි. ''මෙම ප්‍රකාශය සත්‍යද අසත්‍ය ද යන්න දැක්වීම.

| මූලික පද | பிரதான பதங்கள் | Key terms |
|---|---|---|
| • ගිණුම්කරණ පරිසරය | கணக்கீட்டுச் சூழல் | Accounting Environment |
| • ආර්ථික හා දේශපාලන පරිසරය | பொருளாதார மற்றும் அரசியல் சூழல் | Economic and political environment |
| • ශිල්පීය හා වෘත්තීය පරිසරය | நுட்ப மற்றும் தொழில்சார் நுட்பச் சூழல் | Technical and professional environment |
| • නෛතික පරිසරය | சட்டச் சூழல் | Legal environment |
| • සමාජ හා සංස්කෘතික පරිසරය | சமூக கலாசாரச் சூழல் | Social and cultural environment |
| • තාක්ෂණික පරිසරය | தொழினுட்பச் சூழல் | Technological environment |

**ඇමුණුම 1.2.1**




**පරිසර සාධක විචල්‍යයන්**

1. විනිමය අනුපාත
2. ගිණුම්කරණ ප්‍රමිත
3. නව තාක්ෂණික උපකරණ
4. බදු ප්‍රතිපත්තිය
5. පරිගණක තාක්ෂණය
6. සමාගම් පනත
7. මිල මට්ටම
8. සන්නිවේදන තාක්ෂණය
9. හවුල් ආඥා පනත
10. ජන සංක්‍රමණය
11. ගිණුම්කරණ වෘත්තීය ආයතන
12. පුද්ගල ජීවන රටා

**නිපුණතාව 1.0 : ගිණුම්කරණය හා එහි අවශ්‍යතාව විග්‍රහ කරයි.**

**නිපුණතා මට්ටම 1.3** : ගිණුම්කරණය, ක්‍රියාවලියක් ලෙස විග්‍රහ කරයි.


**කාලච්ඡේද** : 01

**ඉගෙනුම් ඵල** :

- ගිණුම්කරණ ක්‍රියාවලිය පැහැදිලි කරයි.
- ගිණුම්කරණ ක්‍රියාවලියේ පියවර දක්වයි.

**මූලික පද හා සංකල්ප** :

**සංකල්ප සිතියම**



**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**


**පිවිසුම**

- සිසුන් සමග පහත සඳහන් දෑ සාකච්ඡාවට යොමු කර, විෂය කරුණු මතු කර ගන්න.
    - පරිභෝජනය සඳහා ගන්නා පාන්, නිෂ්පාදන ක්‍රියාවලියකින් බිහිවූවක් බව.
    - පාන් නිෂ්පාදනයට යොදා ගන්නා දේ යෙදවුම් වේ. ඒ සඳහා යොදා ගන්නා දේ නම් කරන්න.
    - පාන් නිෂ්පාදනය සිදු කරන ක්‍රියාවලියක් පවතී. එම ක්‍රියාවලියේ කොටස් මොනවා ද?
    - අවසානයට නිෂ්පාදිතයක් ලෙස ''පාන් '' ලැබෙන බව.




ගිණුම්කරණය ද ක්‍රියාවලියක් බව, සිසුන් සමග සාකච්ඡා කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**




- ගිණුම්කරණ නිමැවුම් වන මූල්‍ය ප්‍රකාශන බිහිකරලීමට 'පදනම්' වශයෙන් භාවිත කරන දෑ ගිණුම්කරණ යෙදවුම් ය. ඒවා ගනුදෙනු හා සිද්ධි වේ.
- ගිණුම්කරණ යෙදවුම්වලට අදාළ තොරතුරු සටහන් කෙරෙන මූලාශ්‍ර ලේඛන, මුලින් ම සැලකිල්ලට ගත යුතු ය.

නිද : මුදල් ලැබීමේ දී - ලදුපත
මුදල් ගෙවීමේ දී - වවුචරය

- දෙපාර්ශ්වයක් අතර, හුවමාරුවක් සිදු වන මුදලින් මැනිය හැකි දෑ ගනුදෙනු වේ.

  නිදා :
  - විකිණීම සඳහා රු. 30,000 භාණ්ඩ තොගයක් මිල දී ගැනීම
  - බැංකුවෙන් රු. 50,000 ක ණය මුදලක් ලබා ගැනීම
  - සේවක වැටුප් රු. 10,000 ගෙවීම


මෙම ගනුදෙනු නිසා ව්‍යාපාරයේ වත්කම්, හිමිකම් හා වගකීම්වල මූල්‍යමය ලෙස වෙනස්වීම් සිදු වේ.

දෙපාර්ශ්වයක් අතර හුවමාරුවක් සිදු නොවුව ද, ව්‍යාපාරයේ වත්කම්, වගකීම්, හිමිකම් කෙරෙහි බලපෑමක් ඇති වන මුදලින් මැනිය හැකි දෑ 'සිද්ධි' වේ.

උදා :
- යන්ත්‍ර, ලී බඩු ආදී වත්කම් භාවිතයත් සමග ක්ෂය වීම (අගය අඩු වීම)
- භාණ්ඩ තොග විනාශයට පත් විම

ගිණුම්කරණ ක්‍රියාවලිය පියවර ලෙස දක්වූ විට පහත පරිදි වේ.

1 - ව්‍යාපාරයක ගනුදෙනු හා සිද්ධීන්වල වටිනාකම 'මුදල්' මාධ්‍යයෙන් මැනීම
2 - මූලාශ්‍ර ලේඛන පදනම් කර ගෙන මූලික සටහන් පොත්වල වාර්තා කිරීම
3 - මූලික සටහන් පොත්වල ඇතුළත් කළ දෑ ලෙජරයට පිටපත් කිරීම
4 - ලෙජර් ගිණුම් තුලනය කර, ශේෂ පිරික්සුමක් පිළියෙල කිරීම
5 - මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම



- ගිණුම්කරණ නිමැවුම් යනු ආර්ථිකමය තීරණ ගැනීමට හැකි වන පරිදි ගිණුම්කරණ ක්‍රියාවලිය තුළින් බිහි කරන මූල්‍ය ප්‍රකාශන වේ. මීට අයත් වන්නේ.
    - කාලච්ඡේදයේ ලාභ හා අලාභ පෙන්නුම් කෙරෙන ආදායම් ප්‍රකාශනය / ලාභ හෝ අලාභ ප්‍රකාශනය
    - නිශ්චිත දිනකට පවතින වත්කම්, වගකීම් හා හිමිකම්වල පවතින තත්ත්වය පෙන්නුම් කෙරෙන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
    - හිමිකමේ සිදු වන වෙනස්වීම් පෙන්නුම් කෙරෙන හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනය
    - කාලච්ඡේදය තුළ මුදල් ගලා ඒම් හා මුදල් ගලා යෑම් වෙනස්වීම් පෙන්නුම් කෙරෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශනය.

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

(1) පහත සඳහන් ගනුදෙනුවලට අදාළ තොරතුරු සටහන් වී ඇති මූලාශ්‍ර ලේඛන නම් කිරීම.

1 - අත්පිට විකුණුම් රු. 25 000 කි.

2 - රක්ෂණ ගාස්තු ගෙවීම් රු. 4 000

3 - විකිණීම සඳහා රු. 45 000ක තොගයක් අමල්ගේ ව්‍යාපාරයෙන් ලබා ගැනීම.

4 - අමල්ගේ ව්‍යාපාරයට රු. 2 000 ක බඩු තොගයක් ඉල්ලූ වර්ගයට වඩා වෙනස්වීම මත හරවා යැවීම.

(2) ඉහත (1) හි දැක්වෙන ගනුදෙනු සටහන් කිරීමේ දී යොදා ගන්නා මූලික පොත් නම් කිරීම.

(3) ගිණුම්කරණ ක්‍රියාවලියේ පියවර අනුපිළිවෙලින් සටහන් කිරීම.

(4) පහත සඳහන් දෑ ලබා ගැනීමට පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශන නම් කිරීම.

(අ) කාලච්ඡේදයේ ලාභය

(ආ) වත්කම්, වගකීම් හා හිමිකම්වල තත්ත්වය

(ඇ) මූල්‍ය තත්ත්වය වෙනස්වීම්

| මූලික පද | பிரதான பதங்கள் | Key terms |
|---|---|---|
| • ව්‍යාපාර ඒකක සංකල්පය | வணிக அலகு எண்ணக்கரு | Business entity concept |
| • මූල්‍ය මිණුම් සංකල්පය | பண அளவு எண்ணக்கரு | Money measurement concept |
| • වත්කම් | சொத்துக்கள் | Assets |
| • වගකීම් | பொறுப்புக்கள் | Liabilities |
| • හිමිකම් | உரிமையாண்மை | Equity |
| • ගිණුම්කරණ සමීකරණය | கணக்கீட்டுச் சமன்பாடு | Accounting equation |

**නිපුණතාව 2.0 :** **ව්‍යාපාරයක ගණුදෙනු හා සිද්ධීන් ගිණුම්කරණ සමීකරණය ඇසුරෙන් ඉදිරිපත් කරයි.**


**නිපුණතා මට්ටම 2.1 :** ව්‍යාපාරයක වත්කම්, වගකීම් හා හිමිකම්වල එකතුවට සමාන වන ආකාරය විග්‍රහ කරයි.

**කාලච්ඡේද :** 10

**ඉගෙනුම් ඵල :**

- ව්‍යාපාර ඒකක සංකල්පය පැහැදිලි කරයි.
- ව්‍යාපාර ඒකකයක ''ගනුදෙනු'' පැහැදිලි කරයි.
- මූල්‍ය මිනුම් සංකල්පය පැහැදිලි කරයි.
- ගිණුම්කරණ සමීකරණය ගොඩ නගයි.
- ගනුදෙනු, වත්කම්, වගකීම් හා හිමිකම්වලට කරන බලපෑම ගිණුම්කරණ සමීකරණය ඇසුරින් ඉදිරිපත් කරයි.

**මූලික පද හා සංකල්ප :** **සංකල්ප සිතියම**



**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසුම :**

- ප්‍රදේශයේ පවතින ජනප්‍රිය වෙළඳ ව්‍යාපාරයක් පිළිබඳ සිසු අදහස් විමසමින් පහත සඳහන් කරුණු මතුකරමින් සාකච්ඡාවක නිරතවන්න.
    - ගිණුම් තැබීමේ දී අයිතිකරුත්, ව්‍යාපාරයත් වෙන ම ඒකක දෙකක් ලෙස සලකන බව පැහැදිලි කරන්න.
    - ව්‍යාපාරවල මුදලින් මැනිය හැකි සම්පත්වල වෙනස්කම් පමණක් වාර්තා කරන බව.
    - ව්‍යාපාරයේ අයිතිකරුවන් ව්‍යාපාරයට යොදවන සම්පත් **ප්‍රාග්ධනය** ලෙස හඳුන්වන අතර මෙය හිමිකම ලෙස හඳුන්වනු ලැබේ.
    - අයිතිකරුවන්ගේ ප්‍රාග්ධනය ප්‍රමාණවත් නොවන විට බාහිර පාර්ශ්වයන්ගෙන් ණයට මුදල් හෝ භාණ්ඩ තොග හෝ වෙනත් වත්කම් ගැනීමට සිදු වේ. ඒ නිසා **වගකීම්** ඇති වන බව පැහැදිලි කරන්න.
    - ව්‍යාපාරයට ප්‍රතිලාභ ලබා දෙන මුදලින් අගය කළ හැකි සම්පත්, **වත්කම්** බව සාකච්ඡා කරන්න.
- ව්‍යාපාරයේ අයිතිකරු පමණක් සම්පත් යොදවා ඇතිනම්

  | වත්කම් = හිමිකම් |
  |---|

  බව තහවුරු කර දෙන්න.

- අයිතිකරුවන් ව්‍යාපාරයට සම්පත් යොදවා ඇති විට හා බාහිර පාර්ශ්වයන් සම්පත් යොදවා ඇති විට ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය

  | වත්කම් = හිමිකම් + වගකීම් |
  |---|

  බව තහවුරු කරන්න.

- ඉන් පසුව පහත ක්‍රියාකාරකමේ සිසුන් නිරත කරවන්න.

**ක්‍රියාකාරකම 01 : කාර්ය පත්‍රිකාව**

- එක් එක් කණ්ඩායම සඳහා පහත කාර්ය පත්‍රිකාවේ පිටපත් ලබා දෙන්න.

සංඛ සිල්ලර වෙළෙඳසැලක් කර ගෙන යන ව්‍යාපාරිකයෙකි. ඔහු ව්‍යාපාර කටයුතු 2017 වසරේ ජනවාරි 01 දින ඇරඹීය. මේ සඳහා ඔහුට පිය උරුමයෙන් ලද රු. 2 000 000 ක් වටිනා ගොඩනැගිල්ලක් හා ඔහු ඉතිරි කර ගත් රු. 1000 000 ක් යොදවන ලදී. ඔහු සතු රු. 500 000 ක ඉතුරුම් තැන්පතුව ව්‍යාපාරයට යොදවා නැත.

ව්‍යාපාරික කටයුතු පුළුල් කිරීම සඳහා රු. 4000 000 බැංකු ණයක් ලබා ගත් අතර කළමනාකරණ උපාධියක් සහිත සේවකයකු බඳවා ගන්නා ලදී.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- සිසුන් කණ්ඩායම් හතරකට බෙදන්න.
- සියලු කණ්ඩායම්වලට කාර්ය පත්‍රිකාවේ පිටපත බැගින් ලබා දෙන්න.
- පහත දැක්වෙන ආකාරයට ක්‍රියාකාරකමේ යොදවන්න.
    - ඒ ඒ කණ්ඩායම්වලට අහඹු ලෙස අදාළ ප්‍රශ්න ලබා දීම.
    - සාකච්ඡා කර පිළිතුරු ලිවීමට අවස්ථාව ලබා දීම.
    - එක කණ්ඩායමක අනාවරණ ඉදිරිපත් කළ පසු, එයින් මතු කෙරෙන විෂය කරුණු සිසුන්ට පැහැදිලි කර දීම සිදු කරන්න.
- ඒ ඒ කණ්ඩායම්වලට අදාළ ප්‍රශ්න, පහත ආකාරයෙන් ඉදිරිපත් කරන්න.

| කණ්ඩායම් අංකය | ඉදිරිපත් කරන ප්‍රශ්න |
|---|---|
| 01 | • සංඛ සිය ව්‍යාපාරය සඳහා **යෙදවිය හැකි** සම්පත් වටිනාකම් සහිත ව දක්වන්න.<br>• එම සම්පත්වලින් සිය ව්‍යාපාරික කටයුතුවලට **යොදවා ඇති** සම්පත් වටිනාකම් සහිත ව දක්වන්න. |
| 02 | • සංඛ සිය ව්‍යාපාරික කටයුතු කර ගෙන යාමට යොදවන ලද සම්පත් පහත ශීර්ෂ යටතේ වර්ග කරන්න.<br>1. මුදලින් අගය කළ හැකි සම්පත්<br>2. මුදලින් අගය කළ නොහැකි සම්පත් |
| 03 | • සංඛ සිය ව්‍යාපාරය වෙනුවෙන් යොදවන ලද සම්පත් වටිනාකම් සහිත ව දක්වන්න.<br>• ව්‍යාපාරය සඳහා බාහිර පාර්ශ්වයන්ගෙන් ලබා ගත් සම්පත්, වටිනාකම් සහිත ව දක්වන්න.<br>• ව්‍යාපාරයට යොදවා ඇති සම්පත්වල මුළු වටිනාකම දක්වන්න. |
| 04 | • සංඛ ව්‍යාපාරය ආරම්භ කිරීමට පළමුවෙන් ම යොදවා ඇති සම්පත් මොනවා ද?<br>• එම සම්පත්වල මුළු වටිනාකම දක්වන්න. |

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- එක් එක් කණ්ඩායම තම අනාවරණ ඉදිරිපත් කළ පසු, එම කණ්ඩායම්වල ප්‍රශ්නවලට අදාළ විෂය කරුණු පහත ආකාරයෙන් දැක්විය හැකි ය.

| කණ්ඩායම් අංකය | අදාළ විෂය කරුණු |
|---|---|
| 01 | • ව්‍යාපාරයට එහි අයිතිකරුගෙන් හා වෙනත් පාර්ශ්වයන්ගෙන් වෙන් වූ ස්වාධීන පැවැත්මක් ඇති බව.<br>• එය **ව්‍යාපාර ඒකක සංකල්පය** බව පැහැදිලි කරන්න.<br>• අයිතිකරුගේ ගනුදෙනු නොව ව්‍යාපාරයේ ගනුදෙනු පමණක් වාර්තා කරන බව. |
| 02 | • ව්‍යාපාරයක මුදලින් අගය කළ හැකි සම්පත් පමණක් වාර්තා කරන බව.<br>• එය **මූල්‍ය මිණුම් සංකල්පය** බව පැහැදිලි කරන්න.<br>• මුදලින් අගය කළ නොහැකි සම්පත් ''තීරණ ගැනීම '' සඳහා අවශ්‍ය වන නමුත් ඒවා වාර්තා නොකරන බව පැහැදිලි කරන්න. |
| 03 | • ව්‍යාපාරයට අයිතිකරු යොදවා ඇති සම්පත්, ප්‍රාග්ධනය ලෙසත් මෙම ව්‍යාපාරයේ හිමිකම ලෙසත්<br>• ව්‍යාපාරය, අයිතිකරු නොවන බාහිර පාර්ශ්වයන්ට ගෙවීමට ඇති බැඳීම් ''වගකීම් '' ලෙසත්<br>• අයිතිකරු හා බාහිර පාර්ශ්වයන්ගෙන් ව්‍යාපාරයට ලැබී ඇති මුළු සම්පත් වත්කම් ලෙස හඳුන්වන බවත් පැහැදිලි කරන්න.<br>• වත්කම් = හිමිකම් + වගකීම් ලෙස මූලික ගිණුම්කරණ සමීකරණ ගොඩනැගෙන බව පෙන්වන්න. |
| 04 | • අයිතිකරු පමණක් ව්‍යාපාරයට සම්පත් යොදවා ඇති විට<br>• වත්කම් = හිමිකම් ලෙස සමීකරණය ප්‍රථමයෙන් ගොඩ නැගෙන බව පැහැදිලි කරන්න. |

**ක්‍රියාකාරකම 02**

- පන්තියේ සිසුන් කණ්ඩායම් 04 කට බෙදන්න.
- පහත සිද්ධිය එම කණ්ඩායම්වලට ලබා දෙන්න.

**සිද්ධිය '' මල්ෂා සිල්ලර වෙළෙඳ සැල ''**

| | |
|---|---|
| 01/01 | මල්ෂා 2017/01/01 දින තමා සතු මුදල් රු. 500 000 ක්ද, රු. 700 000 ක් වටිනා මෝටර් රථය ද යොදවා සිල්ලර වෙළඳසැලක් ඇරඹීය. |
| 01/02 | විකිණීම සඳහා රු. 100 000 ක බඩු තොග අත්පිට මුදලට ලබා ගන්නා ලදී. |
| 01/03 | ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු. 150 000 ක් වටිනා ලී බඩු හා සවි කිරීම් ලක්දිව ලී බඩු සමාගමෙන් ණයට ලබා ගන්නා ලදී. |
| 01/04 | මාසික ව රු. 10 000 ක වැටුපක් ගෙවීමේ පොරොන්දුව මත සේවකයකු බඳවා ගන්නා ලදී. |
| 01/05 | ව්‍යාපාරයේ මෝටර් රථය සඳහා රු. 10 000 ක ඉන්ධන වියදම් ගෙව්වා. |
| 01/06 | ලක්දිව ලී බඩු සමාගමට රු. 25 000 ක මුදලක් ගෙව්වා. |
| 01/07 | මල්ෂාගේ නිවස සොරු බිඳීමෙන් රු. 150 000 ක හානියක් සිදු විය. |

- ඉහත ගනුදෙනු හිමිකම් + වගකීම් = වත්කම් යන මූලික සමීකරණයට ආදේශ කර පෙන්වන්න.
- ඉහත සිද්ධියේ ඇතුළත් සියලුම ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට ආදේශ කළ හැකි ද? යන්න විමසන්න.
- කණ්ඩායම් අනාවරණයන් නිර්මාණශීලී ව හා සාමූහික ව සමස්ථ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| උදා : හිමිකම් | + | වගකීම් | = | වත්කම් | |
| | | | | මුදල් | + 500 000 |
| 1 200 000 | | | | මෝටර් රථ | + 700 000 |
| 1 200 000 | | | | | 1 200 000 |

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්**

- මූලික ගිණුම්කරණ සමීකරණයේ ඇතුළත් සංරචක නැවත සිහිපත් කරවීම.
- ව්‍යාපාරයක සිදුවන ගනුදෙනු හා සංසිද්ධීන්වලින් මුදලින් අගය කළ හැකි ගනුදෙනු පමණක් ගිණුම්ගත කරන බව.
- **අතීත සිදුවීමක ප්‍රතිඵලයක් මත බිහි වී ඇති,අනාගත ආර්ථික ප්‍රතිලාභ ගලා එන ව්‍යාපාරය විසින් පාලනය කරන සම්පත් වත්කමකි.**
- **අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් මත බිහි වී ඇති, නිරාකරණය කිරීමේ දී සම්පත් පිටතට ගලා යන, වර්තමාන බැඳීම් වගකීමකි.**
- ව්‍යාපාරික ගනුදෙනු හා සිද්ධීන්, වත්කම් වගකීම් හා හිමිකම්වලට ඇති කරන ද්විත්ව බලපෑම පහත අයුරින් සාරාංශ කරන බව.

| ගනුදෙනු අංකය | හිමිකම් + වගකීම් = වත්කම් | | | | ද්විත්ව ප්‍රතිඵලය |
|---|---|---|---|---|---|
| (01) | | | = | −<br>+ | එක් වත්කමක් අඩු වී, වෙනත් වත්කම් වැඩි වීම |
| (02) | | + | = | + | වත්කම් වැඩි වී වගකීම් වැඩි වීම. |
| (03) | | − | = | − | වත්කම් අඩු වී වගකීම් අඩු වීම |
| (04) | + | | = | + | වත්කම් වැඩි වී හිමිකම් වැඩි වීම. |
| (05) | − | | = | − | වත්කම් අඩු වී හිමිකම් අඩු වීම. |
| (06) | + | − | = | | වගකීම් අඩු වී හිමිකම් වැඩිවීම. |
| (07) | − | + | = | | වගකීම් වැඩි වී හිමිකම් අඩුවීම |

ඉහත ද්විත්ව ප්‍රතිඵලවලට අදාළ ගනුදෙනු උදාහරණ මගින් සිසුන් සමග සාකච්ඡා කරන්න.

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක :**

**(I)** (01) පහත සඳහන් ගනුදෙනු අතරින් ව්‍යාපාරයේ හිමිකමට බලපාන ගනුදෙනු පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(i) අශාන් මුදලින් රු. 1 500 000 ක් යොදා ව්‍යාපාරයක් ඇරඹීම.

(ii) අශාන්ට පිය උරුමයෙන් ලද රු. 1000 000 ක් වටිනා ගොඩනැගිල්ලක් ව්‍යාපාරයේ කටයුතු සඳහා යෙදවීම.

(iii) ව්‍යාපාරයේ කටයුතු සඳහා රු. 800 000 කට මෝටර් රථයක් මිල දී ගැනීම

(iv) ව්‍යාපාරයේ ප්‍රයෝජනය පිණිස රු. 100 000 ක උපකරණ කමල්ගෙන් ණය ගැනීම.

(v) නැවත විකිණීම සඳහා රු. 40 000 ක බඩු තොග අත්පිට මුදලට ගැනීම.

(02) පහත සඳහන් ගනුදෙනු අතුරින් හිමිකම හා වත්කම අඩුවීමට බලපාන ගනුදෙනුව තෝරන්න.

(i) බැංකුවෙන් රු. 200 000 ක ණයක් ගැනීම.

(ii) රු. 50 000 ක තොගයක් අත්පිට මුදලට ගැනීම.

(iii) අයිතිකරුගේ භාණ්ඩ ගැනිලි රු. 10 000 කි.

(iv) බැංකුවෙන් ගත් ණය මුදලින් රු. 30 000 ක් ගෙවීම

(v) රු. 40 000 ක භාණ්ඩ ණයට ගැනීම.

(03) පහත සඳහන් ප්‍රකාශ අතුරින් එකක් හැර අනෙක් ඒවා නිවැරදි වේ. වැරදි ප්‍රකාශය තෝරන්න.

(i) අයිතිකරුවන් හැර වෙනත් පාර්ශ්වයන් බාහිර පාර්ශ්වය ව්‍යාපාර සම්පත් සඳහා දායක වී නොමැති විට ගිණුම්කරණ සමීකරණය වත්කම් = හිමිකම් වේ.

(ii) ව්‍යාපාරයකට, එහි අයිතිකරුගෙන් හා ඔහුට අයත් වෙනත් ව්‍යාපාරවලිනුත්, වෙන් වූ ස්වාධීන පැවැත්මක් ඇත.

(iii) මූල්‍ය මිනුම් සංකල්පයෙන් අදහස් වන්නේ මුදලින් අගය කළ හැකි සම්පත් පමණක් වාර්තාකරණ බවයි.

(iv) ව්‍යාපාරයක වත්කම් වෙනස්වන විට හිමිකම් අඩුවීමක් හෝ වැඩිවීමක් සිදු වේ.

(v) ව්‍යාපාරයක වගකීම් වෙනස්වීම, වත්කම්වලින් මෙන් ම හිමිකමේ බලපෑමෙනුත් සිදු වේ.

(04) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය නම් (√) ලකුණ ද අසත්‍ය නම් (x) ලකුණ ද යොදන්න.

(i) ව්‍යාපාර ඒකක සංකල්පය ගිණුම් තැබීමේ දී අදාළ කර ගත යුතුයි. (....)

(ii) ව්‍යාපාරයක් මඟින් අයිතිකරුගේ පෞද්ගලික වියදම් ගෙවිය යුතු ය. (....)

(iii) වත්කම් වෙනස් වන්නේ හිමිකමේ හෝ වගකීම්වල බලපෑමෙන් පමණි. (....)

(iv) අයිතිකරුට මූලික ව යොදවන ප්‍රාග්ධනයට අමතරව පසුව ප්‍රාග්ධනය යෙදිය නොහැකි ය. (....)

(v) අයිතිකරුවෙකුට ව්‍යාපාර කීපයක් ඇති විට එම සියල්ල ම එකම ව්‍යාපාරයක් ලෙස සලකා ගිණුම් තැබීම සුදුසු ය. (....)

**පිළිතුරු :**

(1) I, II (2) III (3) IV ( 4) I - සත්‍ය, II අසත්‍ය, III අසත්‍ය, IV අසත්‍ය, V අසත්‍ය

(2) ජානිත්‍යා 2017 ජනවාරි 01 දින ව්‍යාපාරයක් ඇරඹීමට යෙදූ වත්කම් හා පළමු සතිය තුළ සිදු වූ ගනුදෙනුවල ද්විත්ව බලපෑම සමීකරණයක ස්වරූපයෙන් පහත දැක්වේ.

(රු. 000)

| ගනුදෙනු | | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|---|
| (i) | ඉඩම් ගොඩනැගිලි | + 5 000 | | | | |
| | මෝටර් රථය | + 2 000 | | | | |
| | මුදල් | + 1 000 | = | 8 000 | + | - |
| (ii) | මුදල් | - 500 | | | | |
| | බඩු තොග | + 500 | = | | + | |
| (iii) | කාර්යාල උපකරණ | + 300 | = | | + | |
| | මුදල් | - 300 | | | | |
| (iv) | මුදල් | + 800 | = | | + | 800 බැංකු ණය |
| (v) | මුදල් | - 200 | = | - 200 (හිමිකම) | + | |

අවශ්‍ය වන්නේ :

1. ඉහත එක් එක් ගනුදෙනුව වටිනාකම් සහිත ව විස්තර කිරීම.
2. පළමු සතිය අවසානයේ මුළු වත්කම් මුළු වගකීම් හා මුළු හිමිකම් එකතු කර දැක්වීම.

(3) තුෂාන්ගේ ව්‍යාපාරයේ 2017 ජනවාරි 01 දිනට ගිණුම් ශේෂ පහත දැක්වේ.

| | (රු. 000) |
|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | රු. 4 000 |
| බස්රථය | රු. 2 000 |
| මුදල් | රු. 500 |

බැංකුණය රු. 1 500

ජනවාරි මාසයේ පළමු සතියේ ගනුදෙනු පහත දැක්වේ (000)

1. රු. 50ක මුදල් ගෙවා භාණ්ඩ තොගයක් ගැනීම.
2. බැංකු ණයෙන් කොටසක් පියවීමට රු. 500 ක් දුන්නා.
3. රු. 250 ක බඩු තොගයක් චතුරගෙන් ණයට ගත්තා.
4. භාණ්ඩවල සන්නම වෙනස්වීම නිසා රු. 25ක තොග චතුරට ආපසු යැවුවා.
5. තුෂාන් පුද්ගලික ප්‍රයෝජනයට ගත් මුදල රු. 50

**අවශ්‍ය වන්නේ :**

1. වත්කම් = හිමිකම් + වගකීම් සමීකරණයේ ඉහත ගනුදෙනු වටිනාකම සමග දැක්වීම..
2. ගනුදෙනු අවසානයේ මුළු හිමිකම, මුළු වත්කම් හා මුළු වගකීම් ගණනය කර දැක්වීම.

**නිපුණතාව 2.0** : **ව්‍යාපාරයක ගණුදෙනු හා සිද්ධීන් ගිණුම්කරණ සමීකරණය ඇසුරෙන් ඉදිරිපත් කරයි.**


**නිපුණතා මට්ටම 2.2** : ව්‍යාපාරයක ගනුදෙනු හා සිද්ධීන් මඟින් හිමිකම වෙනස්වන ආකාරය අනාවරණය කරයි.

**කාලච්ඡේද** : 03

**ඉගෙනුම් ඵල** :
- හිමිකම වෙනස්වීමට බලපාන සාධක නම් කර පැහැදිලි කරයි.
- හිමිකම / ශුද්ධ වත්කම් ගණනය කරයි.
- ශුද්ධ වත්කම් ඇසුරෙන් ලාභය හෝ අලාභය ගණනය කරයි.

**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම**



**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසුම :**

- පහත සඳහන් දෙබස පන්තියේ සිසුන් දෙදෙනෙකු ලවා පන්තියට ම ඉදිරිපත් කරවන්න.
- එහි ඇතුළත් **ගනුදෙනු** තවත් සිසුවෙකු ලවා හුණු පුවරුවේ ලිවීමට සලස්වන්න.
- හිමිකම හා ප්‍රාග්ධනය අතර වෙනස දැක්වීම.
- ව්‍යාපාරයේ මූල්‍ය ප්‍රතිඵලය, හිමිකමට කරන බලපෑම විස්තර කරන්න.

ඕෂධ : ආ. . . මුදිත ඔයාගේ ව්‍යාපාරික කටයුතු කොහොම ද?

මුදිත : මම ළඟ දී ලක්ෂ 20 ක් යොදවල වාහන සේල් එකක් පටන් ගත්තා. ඒ මුදලින් වාහන දෙකක් අරගත්තා. පස්සේ ඒවා ලක්ෂ 30කට වික්කා.

ඕෂධ : ෂා .. ඔයාගේ ව්‍යාපාරය සරුයි නේද?

මුදිත : ඔව්, ඔව්, හැබැයි ටිකක් වියදම් කළා. වාහන සේල් එක පවත්වා ගෙන යන ගොඩනැගිල්ලට මාසයකට රු. 50 000 ක් ගෙවනවා. ඊට අමතර ව විදුලි බිල්, දුරකථන බිල්වලට රු. 10 000 ක් ගෙව්වා.

*

ඕෂධ : ළඟ දී වාහන මිල දී ගත්තේ නැද්ද?

මුදිත : තවත් වාහන දෙකක් ගෙනාවා. ඒවාට ලක්ෂ 25ක් වියදම් ගියා. පස්සේ සල්ලි ටිකක් මදි වුන නිසා මගේ ඉඩමක් විකුණලා ලක්ෂ 50 ක් වාහන බිස්නස් එකට දැම්මා. ඒත් මගේ බිරිඳ අසනීප වෙලා බිස්නස්වල මුදලින් රු. 150 000 ක් වියදම් වුනා. පුතාගේ පාඨමාලා ගාස්තු රු. 100 000 ක්ම බිස්නස් මුදල්වලින් ගෙව්වා. වියදම් ටිකක් පාලනය කර ගන්න බලනවා.

ඕෂධ : මටත් ආසයි වාහන බිස්නස් කරන්න.

මුදිත : හොඳයි අදහස. ඔයාට මුදල් තිබෙනවා නම් ව්‍යාපාරය පටන් ගන්න. මම ගිය සතියේ මහජන බැංකුවෙනුත් රු. 800 000 ක බැංකු ණයක් ව්‍යාපාරයට ගත්තා.

පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

- අමතර ප්‍රාග්ධනය යෙදවීම හිමිකම් වැඩිවීමට බලපාන බව.
- අයිතිකරු තම පෞද්ගලික ප්‍රයෝජනයට ව්‍යාපාරයෙන් ගන්නා සම්පත්වල මූල්‍යමය වටිනාකම ''ගැනිලි'' නමින් හඳුන්වන අතර, ගැනිලි නිසා හිමිකම අඩු වන බව.
- ව්‍යාපාරයක් කර ගෙන යාමේ දී විවිධ වූ මෙහෙයුම් වියදම් දැරීමට සිදු වන අතර, මෙහෙයුම් වියදම් නිසා හිමිකම අඩු වන බව. මෙහෙයුම් වියදම්වලට නිදසුන් ලෙස විදුලි බිල් හා දුරකථන බිල්, ගොඩනැගිලි කුලී දැක්විය හැකිය.
- ව්‍යාපාරයේ දෛනික මෙහෙයුම් කටයුතුවලින් ආදායම් උපයනු ලබන අතර, ආදායම්වලට නිදසුන් ලෙස මෝටර් රථ විකුණුම් ආදායම් දැක්විය හැකි ය. මීට අමතර ව බැංකු / තැන්පතු පොලී ආදායම් ලෙස දැක්විය හැකි බව.
- ආදායම් නිසා ලාභය වැඩි වේ. එමගින් හිමිකම් වැඩි වන බව.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

**ක්‍රියාකාරකම :**

- පහත සඳහන් සිද්ධියේ පිටපත් 4ක්, පන්තියේ සිසුන් කණ්ඩායම් 4කට බෙදා දෙන්න.

> 2017 ජනවාරි 01 දින රූපිකා රූපලාවන්‍යාගාරයක් ආරම්භ කළ අතර, ඇයගේ ව්‍යාපාරයේ පළමු සතිය තුළ දී පහත ගනුදෙනු සිදු වී ඇත.
>
> 2017/01/01 ව්‍යාපාර කටයුතු ඇරඹීමට ඇය සතු රු. 800 000 ක් වටිනා ගොඩනැගිල්ල හා මුදලින් රු. 500 000 ක් යොදවන ලදී.
>
> 2017/01/02 රූපලාවණ්‍ය කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගත්තා. රු. 225 000
>
> 2017/01/03 රූපලාවන්‍ය සේවා සැපයීමෙන් රු. 150 000 ක් ලද අතර ඒ වෙනුවෙන් භාවිත කළ ද්‍රව්‍ය පිරිවැය රු. 100 000 කි.
>
> 2017/01/04 ව්‍යාපාර කටයුතු පුළුල් කිරීමට මහජන බැංකුවෙන් රු. 200 000 ක ණය මුදලක් ලබා ගත්තා.
>
> 2017/01/05 ව්‍යාපාරයේ දුරකථන ගාස්තු රු. 3 000 ක්ද, විදුලිය වෙනුවෙන් රු. 2 000 ක් ද මුදලින් ගෙව්වා.
>
> 2017/01/06 සහායිකාවගේ වැටුප වශයෙන් රු. 10 000 ක් ගෙව්වා.
>
> 2017/01/07 රූපිකාගේ පෞද්ගලික ප්‍රයෝජනයට ව්‍යාපාරයෙන් ලබා ගත් මුදල රු. 4 000 කි.
>
> 2017/01/07 සේවා ණයට සැපයීම් රු. 50 000 යි. භාවිත කළ ද්‍රව්‍යවල වටිනාකම රු. 40 000 කි.

- කණ්ඩායමට ලැබුණු සිද්ධිය හොඳින් අධ්‍යයනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
    - එම සිද්ධියේ ඇතුළත් ගනුදෙනු හඳුනා ගෙන, පහත ආකාරයෙන් දැක්වෙන ගිණුම්කරණ සමීකරණය තුළ ගනුදෙනුවල බලපෑම ඇතුළත් කිරීමට යොමු කරන්න.

| ගනුදෙනුව | ප්‍රාග්ධනය | ආදායම් | වියදම් | වගකීම් | වත්කම් |
|---|---|---|---|---|---|
| 1. | | | | | |
| 2. | | | | | |

- ව්‍යාපාරයේ මුළු ආදායම සහ මුළු වියදම ගණනය කිරීමට මග පෙන්වන්න.
- ව්‍යාපාරයේ මෙහෙයුම් ප්‍රතිඵලය, හිමිකමට කෙසේ බලපාන්නේදැයි යන්න පිළිබඳ අදහස් දැක්වීමට මග පෙන්වන්න.
- කණ්ඩායම් අනාවරණ නිර්මාණශීලී ව හා සාමූහිකව ද සමස්ථ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් ෘ**

- ව්‍යාපාරයක් සිය මෙහෙයුම් කටයුතුවලින් ආදායම් උපදවනු ලබයි.
- **ගිණුම් කාලච්ඡේදයේ දී ව්‍යාපාරයට මුදල් ගලා ඒම හෝ වත්කම් වැඩි කිරීමේ හෝ වගකීම් අඩු කිරීමේ ස්වභාවයෙන්, අයිතිකරුවන්ගේ දායකත්වයෙන් තොරව හිමිකම ඉහළ නැංවීමට හේතු වන ආර්ථික ප්‍රතිලාභයන්ගේ ඉහළ යාම ''ආදායම්'' ලෙස හැඳින්වේ.**
- **ව්‍යාපාරයක් මෙහෙයුම් කටයුතු කරගෙන යාමේ දී විවිධ වර්ගයේ වියදම් දරන අතර ගිණුම් කාලච්ඡේදයක් තුළ දී ව්‍යාපාරයෙන් පිටතට මුදල් ගලායාම් හෝ වත්කම්වල අගය අඩුවීම් හෝ වගකීම් වැඩිවීමේ ස්වභාවයෙන් අයිතිකරුවන්ට කරන බෙදාහැරීම් හැර, හිමිකම් අඩුවීමට හේතු වන ආර්ථික ප්‍රතිලාභයන්ගේ අඩුවීම ''වියදම්'' ලෙස අර්ථ දැක්වේ.**
- වියදම ඉක්මවා ඇති ආදායම **ලාභය** වන අතර, ආදායම ඉක්මවා යන වියදම් **අලාභය** වේ.
- කාලච්ඡේදයේ ආදායම හා වියදම අතර වෙනස මෙහෙයුම් ප්‍රතිඵලයයි.
- ව්‍යාපාරයේ අයිතිකරු සිය පුද්ගලික ප්‍රයෝජනයට ව්‍යාපාරයෙන් ලබා ගන්නා භාණ්ඩ, මුදල් හෝ දේපළ පාවිච්චි කිරීම **ගැනිලි** නමින් හඳුන්වන අතර, ගැනිලි සිදු කිරීම නිසා හිමිකම් අඩු වේ.
- ව්‍යාපාරයේ ආරම්භක හිමිකම හා අවසාන හිමිකම අතර වෙනසට ගැනිලි එකතු කිරීමෙන් හා අමතර යෙදූ ප්‍රාග්ධනය අඩු කිරීමෙන් ලාභය හෝ අලාභය ගණනය කළ හැකි ය. මේ සඳහා,

| | රු. |
|---|---|
| අවසාන ශුද්ධ වත්කම් (CNA) / අවසාන හිමිකම් | ××× |
| - ආරම්භක ශුද්ධ වත්කම් (ONA) / ආරම්භක හිමිකම් | (××) |
| | ×× |
| + ගැනිලි (D) | ×× |
| | ×× |
| - අමතර ප්‍රාග්ධනය (AC) | (××) |
| ලාභය / අලාභය (P/L) | ××/(××) |

$$P/L = CNA - ONA + D - AC$$

- ඉහත සිද්ධියට අදාළ පිළිතුර මේ ආකාරයට දැක්විය හැකි ය.

**රූපිකාගේ ව්‍යාපාරය**

(රු.000)

| ගනුදෙනු සිදුවූ දිනය | ප්‍රාග්ධනය | ආදායම් | වියදම් | වගකීම් | වත්කම් |
|---|---|---|---|---|---|
| 01/01 | +1300 | | | | ගොඩනැගිලි + 800<br>මුදල් + 500 |
| 01/02 | | | | | මුදල් - 225<br>ද්‍රව්‍ය තොග + 225 |
| 01/03 | | +150 විකුණුම් | + 100 (විකුණුම් පිරිවැය) | | මුදල් + 150<br>ද්‍රව්‍ය තොග - 100 |
| 01/04 | | | | +200 බැංකු ණය | මුදල් + 200 |
| 01/05 | | | +3 (දුරකථන)<br>+2 (විදුලිය) | | මුදල් - 5 |
| 01/06 | | | +10 (වැටුප්) | | මුදල් - 10 |
| 01/07 | -4 ගැනිලි | | | | මුදල් - 4 |
| 01/07 | | +50 (විකුණුම්) | + 40 (විකුණුම් පිරිවැය) | | ද්‍රව්‍ය තොග - 40<br>ණයගැති + 50 |
| | 1296 | 200 | 155 | 200 | = 1541 |

- එක් එක් ගනුදෙනුව මගින් ප්‍රාග්ධනයට, ආදායමට, වියදමට වත්කම්වලට හා වගකීම්වලට ඇති කරන බලපෑම + හා - මගින් දැක්වේ.

- කාලච්ඡේදයේ ලාභය පහත ආකාරය ගණනය කළ හැකි ය.

  ලාභය = ආදායම - වියදම

  45 = 200 - 155

රූපිකාගේ ව්‍යාපාරයේ ලාභ / අලාභ ශුද්ධ වත්කම් ඇසුරෙන් ගණනය කිරීම පහත ආකාර වේ.

| | රු. |
|---|---|
| අවසාන ශුද්ධ වත්කම් | 1 341 |
| - ආරම්භක ශුද්ධ වත්කම් | (1 300) |
| | 41 |
| + ගැනිලි | 04 |
| ලාභය | 45 |

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :**

01. ව්‍යාපාරික හිමිකම වෙනස්වීමට බලපාන ගනුදෙනු පමණක් ඇතුළත් පිළිතුර තේරීම.

A - අයිතිකරු සතු රු. 400 000 ක ඉඩම් හා ගොඩනැගිල්ල ව්‍යාපාර කටයුතු සඳහා යෙදීම.

B - අයිතිකරුගේ නිවසේ දුරකතන බිල රු. 50 000 ක් ව්‍යාපාර මුදලින් ගෙවීම

C - ව්‍යාපාරයේ විදුලිය ගාස්තු රු. 150 000 ක් ගෙවීම

D - ව්‍යාපාරයේ ප්‍රයෝජනය පිණිස රු. 100 000 ක් ගෙවා පරිගණකයක් මිලට ගැනීම

E - ව්‍යාපාරයේ ස්ථාවර තැන්පතුවක් සඳහා පොළිය වශයෙන් රු. 20 000 ක් ලැබීම

(I) ABDE (II) ABCD (III) ABCE (IV) BCDE (V) ABC පමණි.

(02) පහත සඳහන් ප්‍රකාශවල හිස්තැනට ගැලපෙන වචනය පහත දී ඇති යෙදුම් අතරින් තෝරා ලිවීම.

(යෙදුම් : ගැනිලි, වියදම, ආදායම්, හිමිකම, අමතර ප්‍රාග්ධනය)

(i) පවත්වා ගෙන යන ව්‍යාපාරයකට අතිරේක ව අයිතිකරුවන් යොදවන සම්පත් .......................... ලෙස හැඳින්වේ. මෙමගින් හිමිකම වැඩි කරයි.

(ii) ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාමේ දී විවිධ වූ ................................. දැරීමට සිදු වේ. මෙමගින් හිමිකම අඩු වේ.

(iii) ව්‍යාපාරයේ අයිතිකරු ව්‍යාපාරයෙන් ඉවත් කර ගන්නා සම්පත්වල මූල්‍ය වටිනාකම ...................... ලෙස හැඳින්වේ. මෙවැනි ගනුදෙනු නිසා හිමිකම අඩු වේ.

(iv) ව්‍යාපාරයේ විවිධ මෙහෙයුම් කටයුතු / ක්‍රියාකාරකම් නිසා විවිධ ඉපයීම් ලැබේ. මේවා ........................ ලෙස හැඳින්වේ. මෙවැනි ගනුදෙනු නිසා හිමිකම වැඩි වේ.

(v) ව්‍යාපාරයේ අයිතිකරුවන්ට ව්‍යාපාරය සම්බන්ධව ඇති අයිතිය .............................. ලෙස හැඳින්වේ.

(03) පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද යෙදීම.

(i) ආදායම් මඟින් ව්‍යාපාර හිමිකම වැඩි වේ. ...........

(ii) අමතර ප්‍රාග්ධනය යෙදීමෙන් හිමිකම වෙනස් නොවේ. ...........

(iii) ආදායම් ඉපයීමේ දී විවිධ වියදම් දැරීමට සිදු වේ. ...........

(iv) බැංකු ණයක් ගැනීමෙන් හිමිකම පමණක් වැඩි වේ. ...........

(v) ගැනිලි සිදු කිරීම නිසා ව්‍යාපාරයේ වියදම් වැඩි වේ. ...........

(04) රෂිනිගේ ව්‍යාපාරයේ 2017/01/01 දිනට පැවති වත්කම් හා වගකීම් පහත දැක්වේ. (සංඛ්‍යා 000 වලිනි)

ඉඩම් ගොඩනැගිලි රු. 5 000, මෝටර් රථ රු. 3 000, ස්ථාවර තැන්පතුව රු. 2 000

බඩු තොගය රු. 1 000, මුදල් ශේෂය රු. 1 500, බැංකු ණය රු. 2 000

2017 ජනවාරි මාසය තුළ සිදු වූ ගනුදෙනුවල සාරාංශය පහත දැක්වේ. (රු. 000 වලිනි)

1. පිරිවැය 400 ක බඩු තොග රු. 600 ක අත්පිට මුදලට විකිණීම
2. සේවක වේතන ගෙව්වා රු. 100 යි.
3. රු. 500 ක බඩු තොග රසිකාගෙන් ණයට ගැනීම
4. රු. 200 ක තොග රු. 300 ට ඉමාෂාට ණයට විකිණීම
5. රෂිනි නිවසේ පැවති දානමය කටයුත්තට රු. 50 ක බඩු තොගයක් ව්‍යාපාරයෙන් රැගෙන යෑම.
6. ජනවාරි මාසයට අදාළ ව ලැබුණු විදුලි බිල රු. 20
7. බැංකු ණය සඳහා පොළී ගෙව්වා රු. 20 යි.

**අවශ්‍ය වන්නේ :**

1. වත්කම් = හිමිකම් + වගකීම් යන සමීකරණයට ඉහත ගනුදෙනු මඟින් සිදුවන බලපෑම + / - වශයෙන් (වටිනාකම සමග) ලිවීම.
2. වත්කම් = හිමිකම් + (ආදායම් - වියදම්) + වගකීම් සමීකරණයට ඉහත ගනුදෙනු මඟින් සිදු වන බලපෑම + / - වශයෙන් වටිනාකම සමග ලිවීම.
3. ඉහත දැක් වූ ආදායම් හා වියදම් ඇසුරෙන් 2017 ජනවාරි මාසයට අදාළ ව ලාභය /අලාභය ගණනය කිරීම.
4. ශුද්ධ වත්කම් ඇසුරෙන් 2017 ජනවාරි මාසයේ ලාභය / අලාභ ගණනය කිරීම.

05) ව්‍යාපාරයක ආදායම් ඉපයීමට වියදම් සිදුවීමට ඉවහල් වන පහත ක්ෂේත්‍ර තුනට අදාළ උදාහරණය බැගින් වෙන වෙන ම සපයන්න.

(1) ව්‍යාපාරයක ආදායම් ඉපයීමට අදාළ වන ආර්ථික ප්‍රතිලාභයන්හි ස්වරූපය

- (1) ව්‍යාපාරය තුළට මුදල් ගලා ඒම ..............................
- (2) ව්‍යාපාරයේ වත්කම් වැඩි වීම ..............................
- (3) වගකීම් අඩුවීම ..............................

(2) ව්‍යාපාරයක වියදමට අදාළ වන ආර්ථික ප්‍රතිලාභයන්හි ස්වරූපය

- (1) මුදල් ව්‍යාපරයෙන් පිටතට ගලා යෑම
- (2) ව්‍යාපාරයේ වත්කම්වල අගය අඩුවීම ..............................
- (3) වගකීම් වැඩි වීම ..............................

| මූලික පද | பிரதான பதங்கள் | Key terms |
|---|---|---|
| • ඇල්මැති පාර්ශ්වයන් | அக்கறையுள்ள தரப்பினர் | Stake holders |
| • ශුද්ධ වත්කම් | தேறிய சொத்துக்கள் | Net Assets |
| • ගැනිලි | பற்றுக்கள் | Drawings |
| • අමතර ප්‍රාග්ධනය | மேலதிக மூலதனம் | Additional Capital |
| • ආදායම | வருமானம் | Income |
| • වියදම | செலவினம் | Expense |
| • ශුද්ධ ලාභය | தேறிய இலாபம் | Net Profit |
| • ශුද්ධ අලාභය | தேறிய நட்டம் | Net Loss |

**නිපුණතාව 02** : **ව්‍යාපාරයක ගනුදෙනු හා සිද්ධීන් ගිණුම්කරණ සමීකරණය ඇසුරෙන් ඉදිරිපත් කරයි.**

**නිපුණතා මට්ටම 2.3** : ගිණුම්කරණ සමීකරණය ඇසුරෙන් ආදායම් ප්‍රකාශනය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කරයි.


**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් ඵල**

- ගැලපුම් සංකල්පය පැහැදිලි කරයි.
- ආදායම් ප්‍රකාශනය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පැහැදිලි කරයි.
- ගිණුම්කරණ සමීකරණය ඇසුරෙන් ආදායම් ප්‍රකාශනය පිළියෙල කරයි.
- ගිණුම්කරණ සමීකරණය ඇසුරින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කරයි.

**මූලික පද සහ සංකල්ප :**

**සංකල්ප සිතියම**



**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසුම :**

- පෙර දැනුම සිහිපත් වන ආකාරයේ පහත ප්‍රශ්න සිසුන්ගෙන් විමසමින් සාකච්ඡාවක නිරත වන්න.
    - හිමිකම යනු කුමක් ද?
    - වත්කම් යනු කුමක් ද?
    - වගකීම් යනු කුමක් ද?
    - හිමිකම වෙනස්වන ගනුදෙනු මොනවා ද?
    - ආදායම සඳහා උදාහරණ මොනවා ද?
    - වියදම් සඳහා උදාහරණ දක්වන්න.

- සිසුන්ගෙන් ලැබෙන පිළිතුරු ඔස්සේ සාකච්ඡාව සංවර්ධනය කර ගනිමින් ගනුදෙනු සංකීර්ණ වන තත්ත්වයක දී ඒවා වාර්තා කර ආදායම හා වියදම ගැලපීමෙන් ලාභය හෝ අලාභය සෙවිය හැකි බව සාකච්ඡා කරන්න.
- ගැලපුම් සංකල්පය පැහැදිලි කර, අවශ්‍යතාව සාකච්ඡා කරන්න.
- ලාභය හෝ අලාභය සෙවීමට **ආදායම් ප්‍රකාශනය** පිළියෙල කළ හැකි බව පැහැදිලි කරන්න.
- ලාභය හෝ අලාභය **මූල්‍ය ප්‍රතිඵලය** ලෙස හැඳින්වෙන බව ප්‍රකාශ කරන්න.
- කාලසීමාව අවසානයේ වත්කම්, වගකීම් හා හිමිකම් ඇසුරින් **මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය** පිළියෙල කළ හැකි බව සාකච්ඡා කරන්න.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- සිසුන් පළමු ක්‍රියාකාරකමේ යෙදවීමෙන් අනතුරු ව දෙවන ක්‍රියාකාරකමේ යොදවන්න. ඉන්පසු තුන් වන ක්‍රියාකාරකමේ යොදවන්න.

**ක්‍රියාකාරකම 01 :** පහත සඳහන් සිද්ධිය ඇතුළත් පත්‍රිකාව කණ්ඩායම් අතර බෙදා හරින්න.

**පත්‍රිකාව :** දුමිඳුගේ ව්‍යාපාරයේ 2017/01/01 දිනට පැවති වත්කම් හා වගකීම් පහත දැක්වේ.

| | | (රු.000) | | | (රු.000) |
|---|---|---|---|---|---|
| **වත්කම්** | ඉඩම් හා ගොඩනැගිලි | 7 000 | **වගකීම්** | බැංකු ණය | 2 500 |
| | මෝටර් රථ | 2 000 | | ණයහිමියෝ | 500 |
| | බඩු තොගය | 600 | | | |
| | ණයගැතියෝ | 300 | | | |
| | මුදල් | 100 | | | |

- පහත දැක්වෙන්නේ ජනවාරි මාසයේ සිදු වූ ගනුදෙනුවල සාරාංශයයි. (රු. 000')

1. රු. 300 ක භාණ්ඩ රු. 500 කට අත්පිට විකිණීම.
2. මෝටර් රථ මාසික ක්ෂය රු. 50 යි.
3. රු. 400 ක මුදලක් දුමිදු ව්‍යාපාරයට යෙදවීම.
4. රු. 400 භාණ්ඩ රු. 600 කට ණයට විකිණීම.
5. දුමිදුගේ භාණ්ඩ ගැනිලි රු. 100 යි.
6. පරණ පත්තර අලෙවියෙන් ලැබුණා. රු. 10 යි.
7. ණයගැතියන්ගෙන් රු. 500 ක් පියවීමට ලද මුදල රු. 450 යි. දුන් වට්ටම් රු. 50කි.
8. ණයහිමියන්ට රු. 300 ක් ගෙව්වා. ණයහිමියන්ගෙන් ලද වට්ටම රු. 30 කි

1. ඉහත ගනුදෙනුවල බලපෑම පහත දැක්වෙන ආකාරයේ සමීකරණයක ආරම්භක ශේෂය සහිත ව සටහන් කිරීමට යොමු කරන්න.

ඉඩම් හා + මෝටර් රථ + තොගය + ණයගැති = බැංකු ණය + ණය හිමියෝ + හිමිකම්
ගොඩනැගිලි

2. එක් එක් තීරුවල එකතුව පහළට එකතු කිරීමට උපදෙස් දෙන්න
3. ආරම්භක දිනට හිමිකම (2017/01/01) හා අවසාන හිමිකම (2017/01/31) අතර වෙනස ලබා ගැනීමට මඟ පෙන්වන්න.
4. එම වෙනස තුළ ඇතුළත් අයිතම නම් කිරීමට යොමු කරන්න.

- ක්‍රියාකාරකම අවසානයේ පහත සඳහන් කරුණු පැහැදිලි කරමින් කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
  - හිමිකම වෙනස්වීමට බලපාන ගනුදෙනු වෙන ම හඳුනාගත හැකි බව.
    - ගැනිලි - අයිතිකරුවන් ව්‍යාපාරයෙන් ඉවත් කර ගන්නා භාණ්ඩ හෝ මුදල් නිසා හිමිකම අඩුවන බව. උදා : භාණ්ඩ ගැනිලි රු. 100 කි.
    - අමතර ප්‍රාග්ධනය - අයිතිකරුවන් ව්‍යාපාරය කරගෙන යන අතරතුර දී ව්‍යාපාරයට යොදවන මුදල් හෝ වෙනත් වත්කම්
      උදා : අමතරව දුමිදු යෙදවූ මුදල රු. 400 කි.
    - ආදායම් - අමතර ප්‍රාග්ධනය යෙදවීම් හැර හිමිකම වැඩිවීමට ඉවහල් වන ගනුදෙනු

| | | |
|---|---|---|
| | | (රු.) |
| උදා : | අත්පිට විකුණුම් | 500 |
| | ණයට විකුණුම් | 600 |
| | ලද වට්ටම් | 30 |
| | පරණ පත්තර විකුණුම් | 10 |

    - වියදම් - ගැනිලිවලින් තොර ව හිමිකම අඩුවන ගනුදෙනු

| | | |
|---|---|---|
| | | රු. |
| උදා : | • විකුණුම් පිරිවැය - අත්පිට විකිණීමේ දී | 300 |
| | ණයට විකිණීමේ දි | 400 |
| | • දුන් වට්ටම් | 50 |
| | • ණය පොළිය | 80 |
| | • සේවක වේතන | 80 |
| | • මෝටර් රථ ක්ෂය | 50 |

- ආදායම් හා වියදම් වෙන ම හඳුනා ගෙන කාලච්ඡේදයේ මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කළ හැකි බවත් එය ලාභයක් හෝ අලාභයක් විය හැකි බවත් පැහැදිලි කරන්න.

  ලාභය / අලාභය = ආදායම් - වියදම්

- ලාභය / අලාභය සෙවීමේ දී ආදායම ඉපයීමට අදාළ වියදම් ගැලපිය යුතුයි. එය ගැලපුම් සංකල්පය වන බව පැහැදිලි කරන්න.
- එසේම ලාභය හෝ අලාභය සෙවීමට ආදායම් ප්‍රකාශනය පිළියෙල කරන බවත්, එය ඇල්මැති පාර්ශ්වයන්ට ලබා දෙන බවත් (ගිණුම්කරණ තොරතුරක්) ප්‍රකාශ කරන්න.

**ක්‍රියාකාරකම අංක 02 :**

- පහත සිද්ධි ඇතුළත් පත්‍රිකා 02 කණ්ඩායම් අතර බෙදා හරින්න.

**පත්‍රිකා අංක 01 :** සුධාරකගේ ව්‍යාපාරයේ 2016/01/01 දිනට හා 2016/12/31 දිනට හිමිකම් හා හිමිකම වෙනස්වීමට බලපෑ ගනුදෙනු සමහරක් පහත දැක්වේ.

| | (රු.000) |
|---|---|
| 2016/01/01 දිනට හිමිකම | 8 000 |
| 2016/12/31 දිනට හිමිකම | 10 000 |

- සුධාරක වසර තුළ මුදලින් රු. 500 ක් හා රු. 200 ක් වටිනා භාණ්ඩ නිවසේ ප්‍රයෝජනයට ගෙන ඇත.
- වසර තුළ සුධාරක රු. 800 ක් වටිනා මෝටර් රථයක් ව්‍යාපාරයේ කටයුතු සඳහා යොදවා ඇත.

අවශ්‍ය වන්නේ :

1. ශුද්ධ වත්කම් ඇසුරෙන් සුධාරකගේ ව්‍යාපාරයේ 2016 වසරේ ලාභය හෝ අලාභය ගණනය කිරීම.

**පත්‍රිකා අංක 02 :**

- සිසු කණ්ඩායම්වලට මෙම සිද්ධිය ඇතුළත් පත්‍රිකාව ලබා දෙන්න.

  තාරක ව්‍යාපාරයේ 2016/12/31 න් අවසන් ගිණුම් වර්ෂයේ ආදායම් හා වියදම් සාරාංශයක් පහත දැක්වේ. (රු. 000')

  1. රු. 4 000 ක තොග රු. 6 000ට අත්පිට මුදලට විකිණීම.
  2. රු. 2 000 ක තොග රු 3 500ට ණයට විකිණීම.
  3. වසරට අදාළ සේවක වේතන ගෙව්වා. රු. 300 යි.
  4. ණයගැතියන්ගෙන් මුදල් අයකර ගැනීමේ දී දුන් වට්ටම් රු. 100 යි.
  5. මෝටර් රථ ක්ෂයවීම රු. 50 යි.
  6. ව්‍යාපාරයේ ස්ථාවර තැන්පතු සඳහා යොදවන ලද පොලී ආදායම රු. 80 යි.
  7. සංග්‍රහ වියදම් රු. 20 යි.
  8. වසරට අදාළ ගෙවිය යුතු විදුලිය වියදම රු. 40 යි.

  1. ඉහත ගනුදෙනු ආදායම් හා වියදම් වශයෙන් වර්ග කිරීමට මඟ පෙන්වන්න.
  2. තාරක ව්‍යාපාරයේ ආදායම් වියදම් ගැලපීමෙන් ලාභය හෝ අලාභය සෙවීමට ලේඛනයක් පිළියෙල කිරීමට උපදෙස් දෙන්න.

- තාරක ව්‍යාපාරය ආශ්‍රයෙන් කණ්ඩායම් අනාවරණ අවස්ථාවේ දී පහත සඳහන් කරුණු ඉස්මතු වන පරිදි සාකච්ඡාව මෙහෙයවන්න.
  - ආදායම් හා වියදම් අතර වෙනස ලාභය හෝ අලාභය බව.
  - ලාභය හෝ අලාභය මෙහෙයුම් ප්‍රතිඵලය වශයෙන් හඳුන්වන බව.
  - මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කිරීමට නිශ්චිත කාලයත් සඳහා ලේඛනයක් පිළියෙල කළ හැකි අතර, එය **ආදායම් ප්‍රකාශනය** බව පැහැදිලි කරන්න.
  - ආදායම් ප්‍රකාශනය පහත ආකාරයට පිළියෙල කළ හැකි බව පැහැදිලි කරන්න.

තාරක ව්‍යාපාරයේ 2016/12/31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

| | | (රු. 000) |
|---|---|---|
| **ආදායම්** | | |
| විකුණුම් | | 9 500 |
| තැන්පතු පොලී | | 80 |
| | | 9 580 |
| **වියදම්** | | |
| විකුණුම් පිරිවැය | 6 000 | |
| සේවක වේතන | 300 | |
| දුන් වට්ටම් | 100 | |
| මෝටර් රථ ක්ෂයවීම | 50 | |
| සංග්‍රහ වියදම් | 20 | |
| විදුලිය වියදම් | 40 | (6 510) |
| ශුද්ධ ලාභය | | 3 070 |

| | | (රු. 000) |
|---|---|---|
| විකුණුම් | | 9 500 |
| (-) විකුණුම් පිරිවැය | | (6 000) |
| දළ ලාභය | | 3 500 |
| තැන්පතු පොලී | | 80 |
| | | 3 580 |
| සේවක වේතන | 300 | |
| දුන් වට්ටම් | 100 | |
| මෝටර් රථ ක්ෂයවීම | 50 | |
| සංග්‍රහ වියදම් | 20 | |
| විදුලිය වියදම් | 40 | (510) |
| ශුද්ධ ලාභය | | 3 070 |

**ක්‍රියාකාරකම 03 :** 
- ක්‍රියාකාරකම් 02 අවසානයේ මෙම මූල්‍ය ප්‍රකාශන ඇතුළත් පත්‍රිකාව කණ්ඩායම් අතර බෙදා හරින්න.
- ඒ ඒ කණ්ඩායමට ලැබෙන පත්‍රිකා ඔස්සේ ක්‍රියාකාරකම් සඳහා යොමු කරන්න.

**පත්‍රිකා අංක 01**

සංජීව ගේ ව්‍යාපාරයේ 2016/12/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ තොරතුරු පහත දක් වේ.

(රු. 000)

| | | | |
|---|---|---|---|
| **හිමිකම** | | **ජංගම නොවන වත්කම්** | |
| 2016.01.01 ප්‍රාග්ධනය | 40 000 | ඉඩම් හා ගොඩනැගිලි | 18 000 |
| ශුද්ධ ලාභය | 2 000 | උපකරණ | 12 000 |
| | | **ජංගම වත්කම්** | |
| 2016/12/31 දිනට හිමිකම් | ............ | බඩු තොගය | 3 000 |
| **ජංගම නොවන වගකීම්** | | ණයගැතියෝ | 7 000 |
| බැංකු ණය | 2 000 | මුදල් | 5 000 |
| **ජංගම වගකීම්** | | | |
| ණය හිමියෝ | ............. | | |
| | ............. | | ...... |

1. හිස්තැන්වලට අදාළ සංඛ්‍යා දැක්වීමට උපදෙස් දෙන්න.
2. මෙම ලේඛනය වෙනත් ආකෘතියකින් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
3. පිළිතුර පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**පත්‍රිකා අංක 02**

රශ්මිගේ ව්‍යාපාරය 2016/12/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(රු. 000)

| | | |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | |
| ඉඩම | 16 000 | |
| ගොඩනැගිලි | 12 000 | 28 000 |
| **ජංගම වත්කම්** | | |
| බඩු තොගය | 4 000 | |
| ණයගැතියෝ | 3 000 | |
| මුදල් | | ............. |
| මුළු වත්කම් | | ...... |
| **හිමිකම්** | | |
| 2016/01/01 දිනට ප්‍රාග්ධනය | 28 000 | |
| වසරේ ශුද්ධ ලාභය | 7 000 | ............. |
| 2016/01/31 හිමිකම | | – |
| **ජංගම වගකීම්** | | |
| ණය හිමියෝ | | 5 000 |
| හිමිකම් හා මුළු වගකීම් | | ...... |

- හිස්තැන්වලට අදාළ සංඛ්‍යා දැක්වීමට උපදෙස් දෙන්න.
- මෙම ලේඛනය වෙනත් ආකෘතියකින් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පිළිතුර පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**විෂය කරුණු සඳහා අත්වැලක් :**

- සිසු කණ්ඩායම් අනාවරණ අවස්ථාවේ දී පහත සඳහන් කරුණු පැහැදිලි කරමින් සාකච්ඡාවට සම්බන්ධ වන්න.
    - මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය යනු ව්‍යාපාරයේ යම් නිශ්චිත දිනකට පැවති වත්කම් වගකීම් හා හිමිකම් අතර පවතින සම්බන්ධතාව නිරූපණය කරන ලේඛනයක් බව පැහැදිලි කරන්න.
    - මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ව්‍යාපාරය කෙරෙහි ඇල්මැති පාර්ශ්වයන්ට තොරතුරු ලබා දීම සඳහා කරන මූල්‍ය වාර්තාවක් බවත් , එමගින් ව්‍යාපාරයක මූල්‍ය තත්ත්වය නිරූපණය කරන ආකාරයත් පැහැදිලි කරන්න.
    - ව්‍යාපාරයක අයිතිකරුවන් යොදන ප්‍රාග්ධනයට ලාභ / අලාභ හා ගැනිලි ගැලපීමෙන් පසුව ලැබෙන අගය හිමිකම ලෙස හඳුන්වන බව සාකච්ඡා කරන්න.
    - මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ගිණුම්කරණ සමීකරණ ආශ්‍රයෙන් ද පිළියෙල කළ හැකි බව පැහැදිලි කරන්න.

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :**

(1) පහත සඳහන් පද සුදුසු තැන්හි යොදා වාක්‍ය සම්පූර්ණ කිරීම.

(ගැලපුම් සංකල්පය, ආදායම් ප්‍රකාශනය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, ශුද්ධ වත්කම්, ලාභය/ / අලාභය)

(i) යම් නිශ්චිත කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රතිඵලය ගණනය කිරීම සඳහා ..................... පිළියෙල කරයි.

(ii) යම් නිශ්චිත කාල සීමාවක ඉපයූ ලාභය හෝ අලාභය සෙවීමට ආදායම් ඉපයීමට අදාළ වියදම් සම්බන්ධ කර ගන්නේ ....................................... ට අනුවයි.

(iii) ව්‍යාපාරයක යම් නිශ්චිත දිනකට වත්කම්, වගකීම් හා හිමිකම් දක්වෙන ලේඛනය ......................... ලෙස හැඳින්වේ.

(iv) ආදායම් ප්‍රකාශනයේ ප්‍රධාන අරමුණ ව්‍යාපාරයක නිශ්චිත කාල සීමාවක් සඳහා ......................... ගණනය කිරීමයි.

(v) ව්‍යාපාරයක හිමිකම ............................ ලෙස ද හඳුන්වනු ලැබේ.

(02) රජිත විසින් පවත්වා ගෙන යනු ලබන සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයේ 2017 ජනවාරි මාසයේ සිදු වූ ගනුදෙනු හා සිද්ධීන් පහත ආකෘතිය යටතේ ගිණුම්කරණ සමීකරණයට ඇතුළත් කර ඇත.

| | වත්කම් | | | | = | වගකීම් | + | හිමිකම් |
|---|---|---|---|---|---|---|---|---|
| ගනුදෙනු අංකය | ඉඩම් හා ගොඩනැගිලි | + තොගය | + ණයගැතියෝ | + මුදල් | | බැංකු ණය | + ණය හිමියෝ | + හිමිකම |
| (i) | .......... | +80 000 | ........ | -80 000 | = | .......... | ........... | ............. |
| (II) | .......... | -150 000 | +250 000 | ...... | = | .......... | .......... | 100 000 |
| (III) | .......... | .......... | -30 000 | 28 000 | = | .......... | .......... | -2 000 |
| (IV) | .......... | .......... | ........ | +1 200 000 | = | .......... | .......... | +1 200 000 |
| (V) | .......... | .......... | .......... | -36 000 | = | ------ | -40 000 | +4 000 |
| (vi) | .......... | .......... | .......... | -15 000 | = | -12 000 | ........ | -3 000 |
| (vii) | .......... | -8 000 | -------- | ---------- | = | ........... | ......... | -8 000 |
| (viii) | -1 0 000 | ............ | ......... | ........... | = | ........... | .......... | -10 000 |
| (ix) | +1000 000 | .......... | .......... | -1000 000 | = | ........... | ......... | ............. |
| (x) | .......... | -2 000 | ............ | ........... | = | ........... | ........ | -2 000 |
| (xi) | .......... | +40 000 | ............ | .......... | = | ............ | +40 000 | ........ |
| (xii) | ............ | .............. | ............ | -12 000 | = | ............ | .......... | -12 000 |

අතිරේක තොරතුරු :

(අ) ගනුදෙනු අංක 07, 09 ලාභයට බලපෑමක් ඇති නොකරයි.

(ආ) 2017/01/01 දිනට ව්‍යාපාරයේ පැවති වත්කම් හා වගකීම් පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| ඉඩම්, ගොඩනැගිලි | රු. 1 000 000 |
| තොගය | රු. 200 000 |
| ණයගැතියෝ | රු. 900 000 |
| මුදල් | රු. 280 000 |
| බැංකු ණය | රු. 180 000 |
| ණයහිමියෝ | රු. 70 000 |

1. ඉහත ආකෘතියේ ඇතුළත් කර ඇති එකිනෙක ගනුදෙනුව හෝ සිද්ධිය විස්තර කරන්න.
2. 2017 ජනවාරි මාසය සඳහා ආදායම් ප්‍රකාශනය පිළියෙල කරන්න.
3. 2017 ජනවාරි 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කරන්න.

(03) පහත දැක්වෙන ප්‍රකාශයන් අතුරින් වැරදි ප්‍රකාශය තේරීම.

(i) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයක් මඟින් යම් නිශ්චිත දිනකට ව්‍යාපාරයක වත්කම්, වගකීම්, හිමිකම් දක්වයි.

(ii) ශුද්ධ වත්කම් ප්‍රවේශයෙන් ලාභය සෙවීමේ දී ගැනිලි අඩු කළ යුතුයි.

(iii) ආදායම් ප්‍රකාශනයක මූලික අරමුණ මූල්‍ය ප්‍රතිඵලය ගණනය කිරීමයි.

(iv) ගිණුම්කරණ සමීකරණයේ ඇතුළත් හිමිකම වෙනස් වීමට අදාළ ගනුදෙනු ආශ්‍රයෙන් ආදායම් ප්‍රකාශනයක් පිළියෙල කළ හැකිය.

(v) ආදායම් ප්‍රකාශනයේ තොරතුරු මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීමට අවශ්‍ය ම නොවේ.

(04) පහත දැක්වෙන ප්‍රකාශය සත්‍ය නම් (√) ලකුණ ද, අසත්‍ය නම් (x) ලකුණ ද ප්‍රකාශය ඉදිරියෙන් දක්වීම.

1. ගිණුම්කරණ සමීකරණය මගින් ව්‍යාපාරයක වත්කම් හා ඒවායේ අයිතිය අතර ඇති සම්බන්ධය දක්වයි. ( )
2. ශුද්ධ වත්කම් ප්‍රවේශයෙන් ලාභ / අලාභ සෙවීමේ දී අවසාන ශුද්ධ වත්කම්වලින් ආරම්භක ශුද්ධ වත්කම් අඩු කර, ගැනිලි හා අමතර ප්‍රාග්ධනය අඩු කළ යුතුයි. ( )
3. ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීමේ දී ගැලපුම් සංකල්පය යොදා ගනී. ( )
4. ව්‍යාපාර ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය සටහන් කිරීමෙන් පසුව ඒ ඇසුරින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයක් පිළියෙල කළ හැකි ය. ( )
5. මුදල් ගැනිලි හා අමතර ප්‍රාග්ධනය ලාභයට හෝ අලාභයට බලපෑමක් ඇති නොකරයි. ( )

| මූලික පද | பிரதான பதங்கள் | Key terms |
|---|---|---|
| • ඇල්මැති පාර්ශ්වයන් | அக்கறையுள்ள தரப்பினர | Stake holders |
| • ආදායම් ප්‍රකාශනය | வருமானக்கூற்று | Income Statement |
| • මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | நிதிநிலைமைக்கூற்று | Statement of Financial Position |
| • ජංගම වත්කම් | நடைமுறைச் சொத்துக்கள் | Current Assets |
| • ජංගම නොවන වත්කම් | நடைமுறையல்லாச் சொத்துக்கள் | Non -current Assets |
| • විකුණුම් පිරිවැය | விற்பனைக் கிரயம் | Cost of Sales |
| • ගැලපුම් සංකල්පය | இணைதல் எண்ணக்கரு | Matching Concept |
| • ජංගම **වගකීම්** | நடைமுறைச் பொறுப்புக்கள் | Current Liabilities |
| • ජංගම නොවන **වගකීම්** | நடைமுறையல்லாச் பொறுப்புக்கள் | Non -current Liabilities |

**නිපුණතාව 3.0 :** **ද්විත්ව සටහන් ක්‍රමය අනුව ගනුදෙනු හා සිද්ධීන් ගිණුම්ගත කරයි.**

**නිපුණතා මට්ටම 3.1 :** ගනුදෙනු ගිණුම්ගත තිරීම සඳහා ද්විත්ව සටහන් නීති අනුගමනය කිරීමේ වැදගත්කම අනාවරණය කරයි.


3.2 : ව්‍යාපාරික ගනුදෙනු හා සිද්ධීන් ගිණුම්ගත කරයි.

**කාලච්ඡේද** : 12

**ඉගෙනුම් ඵල** :
- ගනුදෙනුවක ද්විත්ව ස්වරූපය පැහැදිලි කරයි.
- ද්විත්ව සටහන් ක්‍රමය පැහැදිලි කරයි.
- ද්විත්ව සටහන් රීති ඉදිරිපත් කරයි.
- ගිණුම හා ආකෘතිය පැහැදිලි කරයි.
- ලෙජරයේ ගිණුම් වර්ග නම් කරයි.

**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම**



- ගනුදෙනු ද්විත්ව සටහන් න්‍යාය මත ගිණුම්වල සටහන් කරයි.
- මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග නම් කර දක්වයි.


**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසුම :**

- **ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු. 25 000 ක් වටිනා ලී බඩු උපකරණ ණයට ලබා ගැනීම** යන ගනුදෙනුව සිසුන්ට ඉදිරිපත් කර, එහි ද්විත්ව බලපෑම පිළිබඳ අදහස් විමසමින් පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙය වන්න.
- ලී බඩු උපකරණ ණයට ලබා ගැනීම නිසා ලී බඩු උපකරණ වත්කම වැඩි වී, ඒ හා සමාන වටිනාකමින් වගකීම් ප්‍රමාණයක් ද වැඩි වන බව.
- මෙම ගනුදෙනුව නිසා ව්‍යාපාරයේ සම්පත්වල වෙනසක් ඇති වන බව.
- සෑම ගනුදෙනුවකට ම ද්විත්ව බලපෑමක් ඇති අතර, එම ද්විත්ව බලපෑම ගිණුම්වල සටහන් කළ යුතු බව.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- පන්තියේ සිසුන් කණ්ඩායම් හතරකට බෙදා පහත සඳහන් මාතෘකා අතුරින් ඒ ඒ කණ්ඩායමට ලැබුණු මාතෘකාව කෙරෙහි අවධානය යොමු කර, විමසා ඇති තොරතුරු අනාවරණය වන පරිදි මඟ පෙන්වන්න.
  1. පළමු කණ්ඩායම් මාතෘකාව : වත්කම් සහ වගකීම්
  2. දෙවන කණ්ඩායම් මාතෘකාව : වත්කම් සහ වියදම්
  3. තෙවන කණ්ඩායම් මාතෘකාව : ප්‍රාග්ධනය සහ වත්කම්
  4. සිව්වන කාණ්ඩයම් මාතෘකාව : වත්කම් සහ ආදායම්
- කණ්ඩායමට ලැබුණු මාතෘකාව හඳුනා ගැනීමට උපදෙස් දෙන්න.
- ලද මාතෘකාවට අදාළ ව ව්‍යාපාරයක සිදුවන ගනුදෙනු හතර බැගින්, කණ්ඩායම් සාකච්ඡාවක් තුළින් මතු කර ගැනීමට යොමු කරන්න.
  - එම ගනුදෙනුවලට අදාළව ද්විත්ව බලපෑම, ද්විත්ව ස්වරූපය, වටිනාකම අඩුවීම හා වැඩිවීම ලෙස හඳුනා ගෙන ලිවීමට යොමු කරන්න.
  - එම ද්විත්ව ස්වරූපය හඳුනා ගැනීමේ දී පහත ද්විත්ව සටහන් රීති පදනම් කර ගැනීමට උපදෙස් දෙන්න.



- හඳුනා ගත් ද්විත්ව සටහන්වල බලපෑම් පහත ආකෘතියක සටහන් කිරීමට මඟපෙන්වන්න.

| | | |
|---|---|---|
| ගනුදෙනුව<br>1. රු. 100 000 ක බැංකු ණයක් ලබා ගැනීම | ද්විත්ව බලපෑම<br>1. වත්කම් වැඩිවීම<br>2. වගකීම වැඩි වීම | ද්විත්ව සටහන<br>1. මුදල් ගිණුම - හර<br>2. බැංකු ණය ගිණුම - බැර |

- සකස් කළ ද්විත්ව සටහන් තීරුව අධ්‍යයනය කර, ගනුදෙනුවල ද්විත්ව ප්‍රතිඵලය ලෙජර් ගිණුම්වල පිටපත් කිරීමට යොමු කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- සෑම ව්‍යාපාරික ගනුදෙනුවකම හා සිදුවීමක ද්විත්ව ස්වරූපයක් පවතී.
- ගිණුම්කරණ ඒකකයක ඇති වන මූල්‍යමය ගනුදෙනු වාර්තා කරන සම්මත ආකෘතිය ''ගිණුම'' වේ. එහි දී ව්‍යාපාරික ගනුදෙනු හා සිදුවීම්වල ද්විත්ව ස්වරූපය නිශ්චිත දිනක සිට තවත් නිශ්චිත දිනයක් දක්වා අනුපිළිවෙළින් වාර්තා කරනු ලැබේ.
- ගනුදෙනුවල ද්විත්ව මූල්‍ය ප්‍රතිඵලය ව්‍යාපාරය කෙරෙහි දෙයාකාරයකට බලපාන බවත්, එකී බලපෑම එකවර සටහන් කරන ක්‍රමය ''ද්විත්ව සටහන් ක්‍රමය'' නම් වේ.
- ගනුදෙනුවක ද්විත්ව මූල්‍ය ප්‍රතිඵලය ද්විත්ව සටහන් මූලධර්මය මත පදනම වන අතර, මෙය ක්‍රි. ව. වර්ෂ 1494 දී ඉතාලි ජාතික ලූකා පැසියෝලි (Luca Pacioli) පියතුමා විසින් මුල් වරට ඉදිරිපත් කරනු ලැබීය.
- සෑම ගනුදෙනුවක ම ද්විත්ව ස්වරූපය ගිණුම්වලට පිටපත් කළ යුතු ආකාරය ද්විත්ව සටහන් මූලධර්මයෙන් කියවෙන අතර, එම ද්විත්ව ප්‍රතිඵලය හර හා බැර වශයෙන් එකවර සටහන් කිරීමට අනුගමනය කරන රීතීන් සමූහය ද්විත්ව සටහන් මූලධර්ම වේ.
- සෑම ගනුදෙනුවක් නිසාම වත්කම්, වගකීම් හා හිමිකම වැඩිවීම හෝ අඩුවීම ගිණුම්කරණයේ දී හර හා බැර වශයෙන් සටහන් තබයි. හර යන්න භාවිත කළ යුත්තේ වැඩිවීමට ද අඩුවීමට ද යන්න ද්විත්ව සටහන් රීතින්වලින් මඟ පෙන්වයි.
- සම්ප්‍රදායික ලෙජර් ගිණුමක ආකෘතිය ඉංග්‍රීසි අකුරක " T " හැඩය ගන්නා අතර භාවිතයේ දී ඒ සඳහා පහත ස්වරූපයක් උපයෝගී කර ගනියි.

**ගිණුමක ආකෘතිය**

(I)

හර                                                                                    බැර

(ii) හර ........................................... ගිණුම බැර

| දිනය | විස්තරය | සඟල | වටිනාකම | දිනය | විස්තරය | සඟල | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| | | පිටුව | (රු.) | | | පිටුව | (රු.) |
| | | | | | | | |

(iii) ........................................... ගිණුම

| දිනය | විස්තරය | සඟල | හර | බැර | ශේෂය |
|---|---|---|---|---|---|
| | | පිටුව | (රු.) | (රු.) | (රු.) |
| | | | | | |

- ගිණුම් සියල්ල එකතු වන ස්ථානය **ලෙජරය** නම් වේ. එය පොතක්, ලිපි ගොනුවක්. විද්‍යුත් පත්‍රිකාවක් හෝ කාඩ් පතක් විය හැකි ය.

  උදා : පරිගණකගත ආයතනයක ගනුදෙනු වාර්තා, චුම්බක පටියක (Magnetic tape) හෝ චුම්බක තැටියක (Magnetic Disc) සටහන් කිරීම.

- ව්‍යාපාරික ගනුදෙනුවලින් මතුවන ලෙජර් ගිණුම් වර්ග 5කි. එනම් වත්කම්, වියදම්, වගකීම්, ආදායම් හා හිමිකම් ගිණුම් වේ.

- ඒ ඒ ගිණුම්වල වටිනාකම් අඩුවීම හා වැඩිවීම පහත අයුරු සාරාංශ කළ හැකි ය.

**වත්කම් හා වියදම් ගිණුම්**

| හර | බැර |
|---|---|
| වැඩිවීම<br>+<br>සාමාන්‍ය ශේෂය | අඩුවීම<br>- |

**ප්‍රාග්ධනය ආදායම් හා වගකීම් ගිණුම්**

| හර | බැර |
|---|---|
| අඩුවීම<br>- | වැඩිවීම<br>+<br>සාමාන්‍ය ශේෂය |

- ගනුදෙනු හා සිද්ධීන්වල බලපෑම වාර්තා කරන වත්කම්, වගකීම් ආදායම්, වියදම් හා හිමිකම්, ගිණුම් මූල්‍ය ප්‍රකාශන මූලිකාංග ලෙස හඳුන්වන බව විස්තර කරන්න.

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක :**

(01) අදාළ හිස්තැන් සහිත තීරු සම්පූර්ණ කිරීමට උපදෙස් දීම.

| ගනුදෙනුව | ද්විත්ව සටහන් රීතිය | ද්විත්ව සටහන (රු.) |
|---|---|---|
| 1. ව්‍යාපාරය ආරම්භ කිරීමට අයිතිකරු රු. 200 000 ක් යෙදවීම | වත්කම් වැඩිවීම- හර<br>හිමිකම් වැඩිවීම - බැර | මුදල් ගිණුම - හර 200 000<br>ප්‍රාග්ධන ගිණුම - බැර 200 000 |
| 2. රු. 25 000 ක ලී බඩු මිලට ගැනීම. | ...................................... | ...................................................... |
| 3. රු. 60 000 ක භාණ්ඩ අත්පිට මුදලට ගැනීම. | ...................................... | ...................................................... |
| 4. අත්පිට විකුණුම් රු. 100 000. | ...................................... | ...................................................... |
| 5. දුරකතන බිල් ගෙව්වා රු. 6 000 | ...................................... | ...................................................... |
| 6. රු. 30 000 ක භාණ්ඩ ණයට ගැනීම | ...................................... | ...................................................... |
| 7. රු. 40 000 ක භාණ්ඩ ණයට විකිණීම. | ...................................... | ...................................................... |
| 8. ණය හිමියන්ට මුදල් ගෙව්වා. රු. 20 000. | ...................................... | ...................................................... |
| 9. ණය ගැතියන්ගෙන් මුදල් ලැබුණා. රු. 35 000. | ...................................... | ...................................................... |
| 10. ගෙවල් කුලී ආදායම් ලැබුණා. රු. 72 000. | ...................................... | ...................................................... |
| 11. බැංකු ණයක් ගත්තා. රු. 100 000. | ...................................... | ...................................................... |
| 12. අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට රු. 5000 ක් ව්‍යාපාරයෙන් ගත්තා. | ...................................... | ...................................................... |

(i) ඉහත ද්විත්ව සටහන් තීරුවේ ඇති සටහන් ලෙජරයට පිටපත් කිරීම.

(ii) ලෙජර් ගිණුම තුලනය කිරීම.

(iii) එම ගිණුම් මූල්‍ය ප්‍රකාශන මූලිකාංග යටතේ වර්ග කර දැක්වීම.

**(02)** පහත දැක්වෙන්නේ ව්‍යාපාර ආයතනයක සිදු වූ ගනුදෙනුවල ද්විත්ව සටහන් කිහිපයකි. ඊට සම්බන්ධ ගනුදෙනුව නම් කිරීම.

| ද්විත්ව සටහන | | (රු.) | (රු.) | ගනුදෙනුව |
|---|---|---|---|---|
| 1. මුදල් ගිණුම | හර | 300 000 | | |
| ප්‍රාග්ධන ගිණුම | බැර | | 300 000 | .................... |
| 2. මෝටර් රථ ගිණුම | හර | 150 000 | | |
| ප්‍රාග්ධන ගිණුම | බැර | | 150 000 | .................... |
| 3. බැංකු ණය ගිණුම | හර | 20 000 | | |
| මුදල් ගිණුම | බැර | | 20 000 | .................... |
| 4. ගැනුම් ගිණුම | හර | 50 000 | | |
| මුදල් ගිණුම | බැර | | 30 000 | .................... |
| ණය හිමි පාලන ගිණුම | බැර | | 20 000 | |
| 5. විදුලිය ගිණුම | හර | 8 000 | | |
| මුදල් ගිණුම | බැර | | 8 000 | .................... |
| 6. ණයගැති ගිණුම | හර | 20 000 | | |
| විකුණුම් ගිණුම | බැර | | 20 000 | .................... |
| 7. ණය හිමි පාලන ගිණුම | හර | 20 000 | | |
| මුදල් ගිණුම | බැර | | 20 000 | .................... |
| 8. මුදල් ගිණුම | හර | 8 000 | | |
| දුන් වට්ටම් ගිණුම | හර | 2 000 | | |
| ණයගැති පාලන ගිණුම | බැර | | 10 000 | .................... |
| 9. ගැණිලි ගිණුම | හර | 6 000 | | |
| ගැණුම් ගිණුම | බැර | | 6 000 | .................... |
| 10. විදුලිය වියදම් ගිණුම | හර | 1 500 | | |
| ගෙවිය යුතු විදුලිය වියදම් ගිණුම | බැර | | 1 500 | .................... |

(03) ද්විත්ව සටහන් රීතිය **නිවැරදිව දක්වා නැති** වගන්තිය දැක්වීම.

(i) වත්කම් හා වියදම් — වැඩිවීම — හර
(ii) වගකීම් හිමිකම් හා ආදායම් — වැඩිවීම — බැර
(iii) වත්කම් හා වියදම් — අඩුවීම — හර
(iv) වගකීම් හිමිකම් හා ආදායම් — අඩුවීම — හර
(v) වත්කම් හා වියදම් — අඩුවීම — බැර

(04) ගනුදෙනුවට අදාළ ද්විත්ව සටහන **නිවැරදිව දක්වා ඇති** වගන්තිය දක්වීම.

(i) අත්පිට මුදලට බඩු ගත්තා. රු. 20 000 යි.

ගැනුම් ගිණුම හර - මුදල් ගිණුම බැර

(ii) ණයට බඩු ගත්තා. රු. 30 000 යි.

තොග ගිණුම හර. ණය ගැති ගිණුම බැර

(iii) අත්පිට මුදලට බඩු විකුණුවා. රු. 50 000 යි.

විකුණුම් ගිණුම හර - තොග ගිණුම බැර

(iv) ණයට බඩු විකුණුවා. රු. 40 000 යි. - විකුණුම් ගිණුම හර

- ණයගැති ගිණුම බැර

(v) දුරකතන බිල ලැබුණා. රු. 2 000 යි. දුරකතන වියදම් ගිණුම හර

- මුදල් ගිණුම බැර

(05) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද / අසත්‍යය ද යන්න දක්වීම.

1. ගිණුම්කරණයේ පියා ලූකා පැසියෝලි සාමිවරයා ය. ( )
2. ගනුදෙනු හා සිද්ධීන්වල ද්විත්ව බලපෑම ගිණුම්වල වාර්තා කරන්නේ ද්විත්ව සටහන් රීතිය පදනම් කර ගෙනයි. ( )
3. හිමිකම් පිළිබඳ ද්විත්ව සටහන් රීතිය හා වගකීම් පිළිබඳ ද්විත්ව සටහන් රීතිය එකිනෙකට වෙනස් වේ. ( )
4. භාණ්ඩ ගැනිලි හිමිකම අඩු කරයි. ( )
5. ගිණුම් කාලච්ඡේදයක් තුළ දී උපයන ශුද්ධ ලාභය අයිතිකරුගේ හිමිකම වෙනස්වීමට බලනොපායි. ( )

(06) පහත සඳහන් ගණුදෙනුවල ද්විත්ව බලපෑම හා ද්විත්ව සටහන දක්වන්න.

ලෝචන ව්‍යාපාරයේ 2017 ජනවාරි මාසය.

| ගනුදෙනුව | ද්විත්ව බලපෑම | ද්විත්ව සටහන |
|---|---|---|
| උදා : ලෝචන ව්‍යාපාරයක් ආරම්භ කිරීමට මුදලින් රු. 500 000 ක් යෙදීම. | වත්කම් වැඩිවීම - හර<br>හිමිකම් වැඩිවීම - බැර | මුදල් ගිණුම හර 500 000<br>ප්‍රාග්ධන ගිණුම බැර 500 000 |
| 1. අමන්දා ව්‍යාපාරයෙන් රු. 80 000 ක බඩු තොග ණයට ගැනීම. | | |
| 2. ව්‍යාපාරයේ ප්‍රයෝජනය පිණිස රු. 150 000ක කාර්යාල උපකරණ මිලට ගැනීම. | | |
| 3. බැංකුවෙන් රු. 200 000 ක් ණය ගැනීම. | | |
| 4. අත්පිට මුදලට බඩු විකුණුවා. රු. 100 000 යි. | | |
| 5. සේවක වේතන ගෙව්වා. රු. 10 000 යි. | | |

ඉහත ගනුදෙනු ලෙජර ගිණුම්වල සටහන් කරන්න.

| මූලික පද | பிரதான பதங்கள் | Key terms |
|---|---|---|
| • ද්විත්ව සටහන් ක්‍රමය | இரட்டைப் பதிவு முறைமை | Double Entry System |
| • ගිණුම | கணக்கு | Account |
| • ගිණුම් වර්ග | கணக்கீட்டின் வகைகள் | Branches of Accounting |
| • ලෙජරය | பேரேடு | Ledger |
| • ද්විත්ව බලපෑම | இரட்டை விளைவு | Dual Aspect / Effect |
| • මූල්‍ය ප්‍රකාශන මූලිකාංග | நிதிக்கூற்றின் கூறுகள் | Elments of Financial Statements |

**නිපුණතාව 4.0** : **මූලික සටහන් පොත් උපයෝගී කර ගනිමින් ගනුදෙනු ලෙජරයට පිටපත් කරයි.**


**නිපුණතා මට්ටම 4.1** : මූලික සටහන් පොත් පවත්වා ගෙන යාමේ වැදගත්කම විග්‍රහ කරයි.

**කාලච්ඡේද** : 04

**ඉගෙනුම් ඵල** :

- මූලාශ්‍ර ලේඛන හා ඒවායේ වැදගත්කම පැහැදිලි කරයි.
- ගනුදෙනුවලට අදාළ මූලාශ්‍ර ලේඛන නම් කරයි.
- මූලික සටහන් පොත් හා ඒවායේ වැදගත්කම පැහැදිලි කරයි.
- මූලික සටහන් පොත් හා මූලාශ්‍ර ලේඛන වගු ගත කරයි.
- එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වූ ව්‍යාපාරයක මූලික සටහන් පොත් පිළියෙල කරයි.

**මූලික පද හා සංකල්ප :** **සංකල්ප සිතියම**



**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පිවිසුම**

- පහත සඳහන් ගනුදෙනු සිදු වූ බවට ඉදිරිපත් කළ ලිඛිත සාක්ෂි පිළිබඳ සිසු අදහස් විමසන්න.
    - බසයෙන් ගමන් කිරීම.
    - ස. තො. ස. ආයතනයෙන් භාණ්ඩ මිල දී ගැනීම.
    - පාසලට පහසුකම් සේවා ගාස්තු ගෙවීම.
    - විදුලි බිල්පත් ගෙවීම.
    - විශේෂඥ වෛද්‍යවරයකුගෙන් වෛද්‍ය සේවා ලබා ගැනීම.

- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - ව්‍යාපාරවල විවිධ ගනුදෙනු සිදුවන අතර, එම ගනුදෙනුවලට අදාළ විස්තර ඇතුළත් කරමින්, නිකුත් කරන ලියවිලි, **ප්‍රභව ලියවිලි හෙවත් මූලාශ්‍ර ලේඛන** යනුවෙන් හඳුන්වනු ලැබේ.
    - ඒ ඒ ගනුදෙනුවලට අදාළ ව භාවිත වන මූලාශ්‍ර ලියවිලි විවිධ වේ.
    - මෙම ලියවිලිවල අන්තර්ගත වන්නේ ඒ ඒ ගනුදෙනුවලට අදාළ වැදගත් තොරතුරුයි.
    - මූලික පොත්වල ගනුදෙනු සටහන් කිරීම සඳහා භාවිත කරනුයේ මූලාශ්‍ර ලේඛනයි.
    - ගිණුම්කරණ ක්‍රියාවලියේ දී ඇති වූ අඩුපාඩු, දෝෂ, වංචා, අනුක්‍රමිකතා යනාදිය හෙළිදරව් කර ගැනීමටත්, ගනුදෙනු සිදු වු බවට සාක්ෂි සැපයීමටත් මෙම ලේඛන ප්‍රයෝජනවත් වේ.
    - ගනුදෙනුවේ වටිනාකම විශ්වාසදායී ලෙස මැනීම සඳහා මෙම මූලාශ්‍ර ලේඛන උපකාරී වේ.

- මූලාශ්‍ර ලේඛන පදනම් කර ගෙන, ගනුදෙනුවල ස්වභාවය අනුව පහත දැක්වෙන මූලික සටහන් පොත් ව්‍යාපාර විසින් පවත්වා ගෙන යයි.
    - මුදල් ලැබීම් ජර්නලය / ලැබීම් ජර්නලය
    - මුදල් ගෙවීම් ජර්නලය / ගෙවීම් ජර්නලය
    - සුළු මුදල් ගෙවීම් ජර්නලය
    - ගැනුම් ජර්නලය
    - ආපසු යැවුම් ජර්නලය
    - විකුණුම් ජර්නලය
    - ආපසු එවුම් ජර්නලය
    - පොදු ජර්නලය

- මූලික සටහන් පොත් උපයෝගී පොත්, ජර්නල්, යනාදී නම්වලින් ද හඳුන්වයි.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- පහත සඳහන් තොරතුරු ඒ ඒ කණ්ඩායම් වෙත යොමුකර, විමසා ඇති තොරතුරු අනාවරණය කර ගැනීමට උපදෙස් දෙන්න.
    - ව්‍යවහාර මුදලින් සිදුවන ලැබීම් හා ගෙවීම් සම්බන්ධ තොරතුරු
    - චෙක්පත් ලැබීම් හා චෙක්පත්වලින් ගෙවීම් සම්බන්ධ තොරතුරු
    - වෙළඳ භාණ්ඩ ණයට ගැනුම් හා ආපසු යැවුම් සම්බන්ධ තොරතුරු
    - වෙළෙඳ භාණ්ඩ ණයට විකුණුම් හා ආපසු එවුම් පිළිබඳ තොරතුරු
    - සුළු වියදම් ගෙවීම් හා සම්බන්ධ තොරතුරු
    - දේපළ, පිරියත හා උපකරණ ණයට ගැනුම් සහ ණයට විකුණුම්, ගිණුම්කරණ වැරදි ආදිය ඇතුළත් වන තොරතුරු

- කණ්ඩායමට ලැබී ඇති තොරතුරු අවධානයෙන් යුතු ව අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ඉදිරිපත් කිරීමට යොමු කරන්න.
    - ගනුදෙනුවල ස්වභාවය
    - ගනුදෙනුව සඳහා අදාළ මූලාශ්‍ර ලේඛන
    - ගනුදෙනුවලට අදාළ මූලික සටහන් පොත / පොත්

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- මූලාශ්‍ර ලේඛන හා මූලික පොත්වල වැදගත්කම පහත දැක්වේ.

- **මූලාශ්‍ර ලේඛන**
    - ගනුදෙනුව ගිණුම්ගත කිරීම සඳහා පදනම් ලියවිල්ලක් ලෙස මූලාශ්‍ර ලේඛන යොදා ගැනීම.
    - ගනුදෙනුවට අදාළ සම්පූර්ණ විස්තර දැනගත හැකි වීම.
    - ගනුදෙනුව සිදු වූ බවට ලිඛිත සාක්ෂියක් ලෙස යොදා ගත හැකි වීම.
    - මූලාශ්‍ර ලේඛනයට අත්සන යොදා ඇති නිලධාරියා වෙත එහි වගකීම පැවරිය හැකි වීම.

- **මූලික සටහන් පොත්**
    - සමාන වර්ගයේ ගනුදෙනු සාරාංශ කර එකම පොතක පවත්වා ගෙන යාම නිසා ලෙජරයට පිටපත් කිරීම පහසු වීම
    - අමතකවීම් හා අත්හැරීම් දෝෂ අවම වීම
    - ගනුදෙනු වාර්තා කිරීමේ දී සිදු වූ දෝෂ ඉක්මනින් අනාවරණය කර ගත හැකි වීම.
    - ව්‍යාපාර ගනුදෙනු මනා පාලනයකින් යුතුව පවත්වාගත හැකි වීම.
    - වෙන ම කාර්ය මණ්ඩලයක් මඟින් මූලික සටහන් පොත් පවත්වා ගෙන යාම නිසා ගිණුම් කටයුතු පහසු වීම.

- මූලික සටහන් පොත් හා මූලාශ්‍ර ලේඛන පහත ආකාරයෙන් දැක්විය හැකිය.

| ගනුදෙනුව | මූලාශ්‍ර ලේඛනය | මූලික පොත |
|---|---|---|
| 1. මුදල් හා චෙක්පත් ලැබීම් | • ලදුපත | මුදල් ලැබීම් ජර්නලය |
| 2. බැංකු ගිණුමෙන් ගෙවීම | • ගෙවීම් වවුචරය | මුදල් ගෙවීම් ජර්නලය |
| 3. ව්‍යාපාරයේ ස්වභාවය මත සුළු ගෙවීම් | • සුළු මුදල් වවුචරය | සුළු මුදල් ගෙවීම් ජර්නලය |
| 4. වෙළඳ භාණ්ඩ ණයට ගැනීම | • ගැනුම් ඉන්වොයිසිය | ගැනුම් ජර්නලය |
| 5. වෙළඳ භාණ්ඩ ආපසු යැවීම | • හරපත | ආපසු යැවුම් ජර්නලය |
| 6. වෙළඳ භාණ්ඩ ණයට විකිණීම | • විකුණුම් ඉන්වොයිසිය | විකුණුම් ජර්නලය |
| 7. වෙළඳ භාණ්ඩ ආපසු එවීම | • බැරපත | ආපසු එවුම් ජර්නලය |
| 8. අනිකුත් මූලික සටහන් පොත්වල සටහන් නොවූ ගනුදෙනු | • ජර්නල් වවුචරය | පොදු ජර්නලය |

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක :**

01) කල්පනී ව්‍යාපාරය විකිණීම සඳහා එකක් රු. 800 බැගින් ළමා ඇඳුම් 100ක් සඳීපා පැෂන් වෙතින් මිල දී ගත් අතර, මෝස්තර වෙනස්වීම මත ළමා ඇඳුම් 10ක් ආපසු යවන ලදී. කල්පනී ව්‍යාපාරයට අදාළ ව,

(i) මූලාශ්‍ර ලේඛන නම් කිරීම.
(ii) එම මූලාශ්‍ර ලේඛනවලට අනුව පිළියෙල කරන මූලික සටහන් පොත් නම් කිරීම.
(iii) සඳීපා පැෂන් ව්‍යාපාරයේ මූලාශ්‍ර ලේඛන හා මූලික සටහන් පොත් නම් කිරීම.

(02) ලිපි ද්‍රව්‍ය මිලට ගෙන විකිණීමේ කටයුතුවල නිරත ''නිශා බුක් ෂොප්'' ව්‍යාපාරයේ පාවිච්චිය සඳහා එකක් රු. 1 500/- බැගින් ලී පුටු 10 ක් 2016/10/15 වෙනි දින මිලට ගන්නා ලදී. මෙම ගනුදෙනුවට අදාළ මූලාශ්‍ර ලේඛනය හා මූලික සටහන් පොත තෝරා ගැනීම.

(i) ගෙවීම් වවුචරය - මුදල් ගෙවීම් ජර්නලය
(ii) ජර්නල් වවුචරය - පොදු ජර්නලය
(iii) ඉන්වොයිසිය - ගැනුම් ජර්නලය
(iv) හරපත - පොදු ජර්නලය
(v) ඉන්වොයිසිය - විකුණුම් ජර්නලය

(03) ව්‍යාපාරයක ගැනුම් ඉන්වොයිසියක් පහත දැක්වේ.

**ඉන්වොයිසිය**

මධුරි ව්‍යාපාරය
සමනල මාවත
පැල්මඩුල්ල

තාරක ව්‍යාපාරය
පළමු පටුමග
රත්නපුරය

ඉන්වොසියි අංකය : 0048
2017. 01. 05 දින

| අනු අංකය | විස්තරය | ප්‍රමාණය | ඒකකයක මිල (රු.) | වටිනාකම (රු.) |
|---|---|---|---|---|
| 01 | පිටු 80 අභ්‍යාස පොත් | 500 | 30 | 15 000 |
| 02 | පිටු 120 සී. ආර්. පොත් | 200 | 90 | 18 000 |
| 03 | චිත්‍ර පොත් | 100 | 150 | 15 000 |
| 04 | පැස්ටල් පෙට්ටි | 100 | 60 | 6 000 |
| | | | | 54 000 |
| | අඩු කළා : වට්ටම 10% | | | (5 400) |
| | | | | 48 600 |

සැ.යු. 2017/01/31ට පෙර මුදල් ගෙවන්නේ නම් 5% වට්ටමක්.

අත්සන් කළේ
කළමනාකරු

ඉහත ගැනුම් ඉන්වොයිසිය නිරීක්ෂණය කර, එහි අන්තර්ගත මූලික කරුණු 06ක් ලිවීම.

1. ...................................................................... 4. ......................................................................
2. ...................................................................... 5. ......................................................................
3. ...................................................................... 6. ......................................................................

4) පහත සඳහන් එක් එක් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න ඉදිරියෙන් දැක්වීම.

(1) ව්‍යාපාරයක්, නැවත විකිණීමේ පරමාර්ථයෙන් ණයට මිල දී ගත් ලී බඩු සටහන් කෙරෙන, මූලික සටහන් පොත පොදු ජර්නලය වේ. ( )

(2) ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා යන්ත්‍රයක් ණයට ගැනීමට අදාළ මූලාශ්‍ර ලේඛනය ගැනුම් ඉන්වොසියයි. ( )

(3) මූලික සටහන් පොත්වල ගනුදෙනු සටහන් කිරීමට මූලාශ්‍ර ලේඛන යොදා ගැනීම කළ යුතු වේ. ( )

| මූලික පද | பிரதான பதங்கள் | Key terms |
|---|---|---|
| • ද්විත්ව සටහන් ක්‍රමය | இரட்டைப் பதிவு முறைமை | Double Entry System |
| • හරපත | வரவுத்தாள் | Debit Note |
| • බැරපත | செலவுத்தாள் | Credit Note |
| • ලදුපත | பற்றுச்சீட்டு | Receipt |
| • වවුචරය | கைச்சாத்து | Voucher |
| • සුළු මුදල් වවුචරය | சில்லறைக் காசேட்டுக் கைச்சாத்து | Petty Cash Voucher |

**නිපුණතාව 4.0 : මූලික සටහන් පොත් උපයෝගී කර ගනිමින් ගනුදෙනු ලෙජරයට පිටපත් කරයි.**

**නිපුණතා මට්ටම 4.2** : ව්‍යාපාරයක මුදල් ගනුදෙනු වාර්තා කරයි.


**කාලච්ඡේද** : 15

**ඉගෙනුම් ඵල** :

- මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් සඳහා මූලාශ්‍ර ලේඛන නම් කරයි.
- මුදල් ලැබීම් ජර්නලයේ ආකෘතිය ගොඩනගා මුදල් ලැබීම් ගනුදෙනු සටහන් කරයි.
- මුදල් ගෙවීම් ජර්නලයේ ආකෘතිය ගොඩනගා මුදල් ගෙවීම් ගනුදෙනු සටහන් කරයි.
- මුදල් ලැබීම් ජර්නලයේ හා මුදල් ගෙවීම් ජර්නලයේ ගනුදෙනු පොදු ලෙජරයට පිටපත් කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**මූලික පද හා සංකල්ප : සංකල්ප සිතියම**



**පිවිසුම :**

- තම පවුලේ මුදල් ලැබීම් හා ගෙවීම් සම්බන්ධව විමසා සාකච්ඡාවක් මෙහෙයවන්න.
- මුදල් ගනුදෙනු පාලනයකින් යුක්තව පවත්වාගෙන යාමේ වැදගත්කම පැහැදිලි කරන්න.
- මුදල් ලැබීම් සඳහා ලදුපත් ද, මුදල් ගෙවීම් සඳහා වවුචර ද භාවිතයෙන් මුදල් ගනුදෙනු පිළිබඳ විශ්වසනීයතාව තහවුරු වන බව දක්වන්න.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

**ක්‍රියාකාරකම 01**

- පහත සඳහන් ක්‍රියාකාරකම කේවල ක්‍රියාකාරකමක් ලෙස සිසුන්ට ලබා දෙන්න.
- පහත උපදෙස් පත්‍රිකාව උචිත ආකාරයකට පන්තියට ඉදිරිපත් කරන්න.
  - **චෙක්පත් මගින් ගනුදෙනු නොකරන ව්‍යාපාරයක** කිසියම් මාසයකට අදාළ ව මුදල් ලැබීම් හා මුදල් ගෙවීම්වලට සම්බන්ධ ගනුදෙනු 10ක් දිනය හා වටිනාකම සහිතව ලියන්න.
  - ඒ සඳහා පහත වර්ගයේ ගනුදෙනු ද ඇතුළත් කරන්න.
    - ණයගැති ලැබීම්
    - ණයහිමි ගෙවීම්
  - එම මුදල් ගනුදෙනුවලට අදාළ මූලාශ්‍ර ලේඛන නම් කරන්න.
  - ඔබ විසින් ලියන ලද ගනුදෙනු 10 පහත සඳහන් ආකෘති භාවිත කරමින්, මුදල් ලැබීම් හා ගෙවීම් ජර්නල්වල සටහන් කර මාසයේ අවසාන දිනට එකිනෙක තීරු එකතුව ලබා ගන්න.

**මුදල් ලැබීම් ජර්නලය / ලැබීම් ජර්නලය**

| දිනය | ලදුපත් අංකය | විස්තරය | දුන් වට්ටම් රු. | වටිනාකම රු. | ලැබීම් විශ්ලේෂණය (රු.) | | | | ලෙ. පිටුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | අත්පිට විකුණුම් | ණයගැති ලැබීම් | ආදායම් | වෙනත් ලැබීම් | |
| | | | | | | | | | |
| | | | ×× | ××× | ×× | ×× | ×× | ×× | |
| | | | (1) | | (2) | (3) | (4) | (5) | |

**මුදල් ගෙවීම් ජර්නලය / ගෙවීම් ජර්නලය**

| දිනය | වවුචර් අංකය | විස්තරය | ලද වට්ටම් රු. | වටිනාකම රු. | ගෙවීම් විස්තරය (රු.) | | | | ලෙ. පිටුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | අත්පිට ගැණුම් | ණයහිමි ගෙවීම් | වියදම් | වෙනත් ගෙවීම් | |
| | | | | | | | | | |
| | | | ×× | ××× | ×× | ×× | ×× | ×× | |
| | | | (6) | | (7) | (8) | (9) | (10) | |

- ඉහත සකස් කළ මුදල් ලැබීම් ජර්නලයේ හා මුදල් ගෙවීම් ජර්නලයේ තීරුවල එකතුව පොදු ලෙජරයට පිටපත් කිරීමට යොමු කරන්න.
- ඒ සඳහා පහත දැක්වෙන ගිණුම් ආකෘති හා විස්තර සිසුන්ට ලබා දෙන්න.
- ලෙජරයට පිටපත් කිරීම පහත දැක්වෙන ආකාරයට විය යුතුයි.

**මමුදල් ගිණුම / මුදල් පාලන ගිණුම** (රු.)

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ/ශේෂය | ×× | (7) ගැනුම් ගිණුම | ×× |
| (2) විකුණුම් ගිණුම | ×× | (8) ණයහිමි පාලන ගිණුම | ×× |
| (3) ණයගැති පාලන ගිණුම | ×× | (9) වියදම් ගිණුම් | ×× |
| (4) ආදායම් ගිණුම් | ×× | (10) වෙනත් ගෙවීම් ගිණුම් | ×× |
| (5) වෙනත් ලැබීම් ගිණුම් | ×× | ශේ/ප/ගෙ | ×× |
| | ××× | | ××× |
| ඉ/ගෙ/ශේෂය | ×× | | |

**හෝ**

මුදල් ගිණුම / මුදල් පාලන ගිණුම (රු.)

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ/ශේෂය | ×× | විවිධ ගිණුම් / මුදල් ගෙවීම් | ×× |
| විවිධ ගිණුම් / මුදල් ලැබීම් | ×× | ශේ/ප/ගෙ | ×× |
| | ××× | | ××× |
| ඉ/ගෙ/ශේෂය | ×× | | |

දුන් වට්ටම් ගිණුම (රු.)

| | | | |
|---|---|---|---|
| (1) ණයගැති පාලන ගිණුම | ×× | | |

විකුණුම් ගිණුම (රු.)

| | | | |
|---|---|---|---|
| | | (2) මුදල් ගිණුම | ×× |

ණයගැති පාලන ගිණුම (රු.)

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ/ශේෂය | ×× | (1) දුන් වට්ටම් ගිණුම | ×× |
| | | (3) මුදල් ගිණුම | ×× |

කුලී ආදායම් ගිණුම (රු.)

| | | | |
|---|---|---|---|
| | | (4) මුදල් ගිණුම | ×× |

ලද වට්ටම් ගිණුම (රු.)

| | | | |
|---|---|---|---|
| | | (6) ණයහිමි පාලන ගිණුම | × × |

ණයහිමි පාලන ගිණුම (රු.)

| | | | |
|---|---|---|---|
| (6) ලද වට්ටම් ගිණුම | × × | ඉ/ගෙ/ශේෂය | × × |
| (8) මුදල් ගිණුම | × × | | |

ගැනුම් ගිණුම (රු.)

| | | | |
|---|---|---|---|
| (7) මුදල් ගිණුම | × × | | |

බැංකු ණය ගිණුම (රු.)

| | | | |
|---|---|---|---|
| (10) මුදල් ගිණුම | × × | (5) මුදල ගිණුම | × × |

සේවක වැටුප් ගිණුම (රු.)

| | | | |
|---|---|---|---|
| (9) මුදල් ගිණුම | × × | | |

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් ඃ**

- ව්‍යාපාරයකට විවිධ අන්දමින් ලැබෙන මුදල් හා චෙක්පත්, මුල් වරට සටහන් කරන මූලික සටහන් පොත මුදල් ලැබීම් ජර්නලය වේ.
- මුදල් හා චෙක්පත් ලැබීමට අදාළ මූලාශ්‍ර ලේඛනය **ලදුපත** වේ.
- ව්‍යාපාරයක් බැංකු ගිණුම මගින් සිදු කරන ගෙවීම්, මුල්වරට සටහන් කරන මූලික සටහන් පොත, මුදල් ගෙවීම් ජර්නලය වේ.
- බැංකු ගිණුම් මගින් සිදු කරන ගෙවීම්වලට අදාළ මූලාශ්‍ර ලේඛනය **ගෙවීම් වවුචරය** වේ.
- ව්‍යාපාරයක මුදල් ගනුදෙනු, අදාළ මූලාශ්‍ර ලේඛන උපයෝගී කර ගෙන ලැබීම් හා ගෙවීම් ජර්නල්වල වාර්තා කිරීමෙන් පසුව, ද්විත්ව සටන් මූලධර්මවලට අනුව පොදු ලෙජරයට පිටපත් කළ යුතු ය.
- **මුදල් ලැබීම් ජර්නලයේ තීරුවල එකතුව පහත සඳහන් ආකාරයට පොදු ලෙජරයට පිටපත් කළ යුතු වේ.**

| දුන් වට්ටම් තීරුවේ එකතුව | දුන් වට්ටම ගිණුම හර | ණයගැති පාලන ගිණුම - බැර |
|---|---|---|
| එක් එක් තීරුවේ එකතුව / වට්නාකම් තීරුවේ එකතුව | මුදල් ගිණුම හර | |
| අත්පිට විකුණුම් තිරුවේ එකතුව | | විකුණුම් ගිණුම - බැර |
| ණයගැති ලැබීම් තීරුවේ එකතුව | | ණයගැති පාලන ගිණුම - බැර |
| ආදායම් තීරුවේ එකතුව | | එක් එක් අදාළ ආදායම් ගිණුම් වෙන් වෙන් ව - බැර |
| වෙනත් ලැබීම් තීරුවේ එකතුව | | එක් එක් අදාළ ලැබීම් ගිණුම් වෙන් වෙන් ව - බැර |

- **මුදල් ගෙවීම් ජර්නලයේ තීරුවල එකතුව පහත සඳහන් ආකාරයට පොදු ලෙජරයට පිටපත් කළ යුතු වේ.**

| | | |
|---|---|---|
| • ලද වට්ටම් තීරුවේ එකතුව | ණයහිමි පාලන ගිණුම හර | ලද වට්ටම් ගිණුම - බැර |
| • අත්පිට ගැනුම් තිරුවේ එකතුව | ගැනුම් ගිණුම හර | |
| ණයහිමි ගෙවීම් තීරුවේ එකතුව | ණයහිමි පාලන ගිණුම හර | |
| වියදම් තීරුවේ එකතුව | අදාළ එක් එක් වියදම් ගිණුම්වලට වෙන් වෙන් ව හර | |
| වෙනත් ගෙවීම් තීරුවේ එකතුව | අදාළ එක් එක් ගිණුම්වලට වෙන් වෙන් ව හර | |
| වටිනාකම් තීරුවේ එකතුව | | මුදල් ගිණුම - බැර |

- ණය ගනුදෙනු පියවීමේ දී වට්ටම් බිහි වේ.
  - ණයගැතියන් ගිවිසගත් කාලය තුළ මුදල් පියවීමේ දී ලැබිය යුතු ණය මුදලින් කරන අඩු කිරීම් දුන් වට්ටමයි. එය වියදමකි.
  - ණයහිමියන්ට ගිවිසගත් කාලය තුළ මුදල් පියවීමේ දී ගෙවිය යුතු ණය මුදලින් කෙරෙන අඩු කිරීම් ලද වට්ටමයි. එය ව්‍යාපාරයට අදායමකි.
- මුදල් ලැබීම්, ලැබීම් ජර්නලයේ සටහන් කරනු ලැබේ. මේ සඳහා පහත නිදසුන බලන්න.
- අමල්ගේ ව්‍යාපාරයේ 2017 අප්‍රේල් මාසයේ සිදු වූ මුදල් ලැබීම් හා සම්බන්ධ ගනුදෙනු

| | | | (රු.) |
|---|---|---|---|
| 2017. 04. 05 | අත්පිට විකුණුම් | (ල. අ. 01) | 60 000 |
| 2017. 04. 10 | ලද ගොඩනැගිලි කුලී | (ල. අ. 02) | 5 000 |
| 2017. 04. 15 | බැංකු ණය ලැබීම් | (ල. අ. 03) | 100,000 |
| 2017. 04. 18 | ණයගැති අමල්ගෙන් ලැබුණා | (ල. අ. 04) | 9 000 |
| | අමල්ට දුන් වට්ටම | | 500 |
| 2017. 04. 20 | අත්පිට විකුණුම් | (ල. අ. 05) | 50 000 |
| 2017. 04. 22 | (ණයගැති) තිලක්ගෙන් ලැබුණා | (ල. අ. 06) | 48 000 |
| | දුන් වට්ටම් | | 2 000 |
| 2017. 04. 25 | කොමිස් ලැබුණා | (ල. අ. 07) | 1 000 |
| 2017. 04. 28 | අතිරේක ප්‍රාග්ධනය යෙදීම | (ල. අ. 08) | 20 000 |

### ලැබීම් ජර්නලය / මුදල් ලැබීම් ජර්නලය

| දිනය | ලදුපත් අංකය | විස්තරය | දුන් වට්ටම් (රු.) | වටිනාකම (රු.) | විශ්ලේෂණය (රු.) | | | | ලෙ. පිටුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | අත්පිට විකුණුම් | ණයගැති | ආදායම් | වෙනත් ලැබීම් | |
| 4/5 | 01 | විකුණුම් | | 60 000 | 60 000 | | | | |
| 4/10 | 02 | ගොඩනැගිලි කුලී | | 5 000 | | | 5 000 | | |
| 4/15 | 03 | බැංකු ණය | | 100 000 | | | | 100 000 | |
| 4/18 | 04 | අමල් | 500 | 9 000 | | 9 000 | | | |
| 4/20 | 05 | විකුණුම් | | 50 000 | 50 000 | | | | |
| 4/22 | 06 | තිලක් | 2 000 | 48 000 | | 48 000 | | | |
| 4/25 | 07 | ලද කොමිස් | | 1 000 | | | 1 000 | | |
| 4/28 | 08 | ප්‍රාග්ධනය | | 20 000 | | | | 20 000 | |
| | | | 2 500 | 293 000 | 110 000 | 57 000 | 6 000 | 120 000 | |

- මුදල් ගෙවීම් හා සම්බන්ධ ගනුදෙනු පහත දක්වේ. ගෙවීම් ජර්නලයේ සටහන් කරනු ලැබේ. මේ සඳහා පහත සඳහන් නිදසුන බලන්න.

අමල්ගේ ව්‍යාපාරයේ 2017 අප්‍රේල් මාසයේ සිදු වූ ගෙවීම් සම්බන්ධ ගනුදෙනු

| | | | |
|---|---|---|---|
| | | . | (රු.) |
| 2017. 04. 06 | මාසික විදුලි බිල ගෙවීම් | (ව.අ. 01) | 6 000 |
| 2017. 04. 08 | ණයහිමි - මාලින්දට ගෙවීම | (ව.අ. 02) | 12 000 |
| | ලද මුදල් වට්ටම් | | 1 000 |
| 2017. 04. 10 | අත්පිට ගැනුම් | (ව.අ. 03) | 18 000 |
| 2017. 04. 12 | මාසික රක්ෂණ ගාස්තු | (ව.අ. 04) | 12 000 |
| 2017. 04. 14 | ණයහිමි - සාගරට ගෙවීම් | (ව.අ. 05) | 16 000 |
| | - ලද මුදල් වට්ටම් | | 1 000 |
| 2017. 04. 16 | කාර්යාල ලී බඩු ගැනීමට | (ව.අ. 06) | 50 000 |
| 2017. 04. 18 | වැටුප් හා වේතන ගෙවීම | (ව.අ. 07) | 30 000 |
| 2017. 04. 20 | බැංකු ණය වාරිකය ගෙවීම | (ව.අ. 08) | 12 000 |
| 2017. 04. 22 | අත්පිට ගැණුම් | (ව.අ. 09) | 22 000 |
| 2017. 04. 26 | මුදල් ගැනිලි | (ව.අ. 10) | 5 000 |

## මුදල් ගෙවීම් ජර්නලය

| දිනය | ලදුපත් අංකය | විස්තරය | ලද වට්ටම් (රු.) | වට්නාකම (රු.) | විශ්ලේෂණය (රු.) | | | | ලෙ. පිටුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | අත්පිට ගැනුම් | ණයහිමි ගෙවීම් | වියදම් | වෙනත් ගෙවීම් | |
| 4/6 | 1 | විදුලිය | - | 6 000 | - | - | 6 000 | - | |
| 4/8 | 2 | මිලින්ද | 1 000 | 12 000 | - | 12 000 | - | - | |
| 4/10 | 3 | ගැනුම් | - | 18 000 | 18 000 | - | - | - | |
| 4/12 | 4 | රක්ෂණ ගාස්තු | - | 12 000 | - | - | 12 000 | - | |
| 4/14 | 5 | සාගර | 1 000 | 16 000 | - | 16 000 | | - | |
| 4/16 | 6 | කාර්යාල ලී බඩු | - | 50 000 | – | - | | 50 000 | |
| 4/18 | 7 | වැටුප් හා වේතන | - | 30 000 | - | - | 30 000 | - | |
| 4/20 | 8 | බැංකු ණය | - | 12 000 | - | - | - | 12 000 | |
| 4/22 | 9 | ගැනුම් | - | 22 000 | 22 000 | - | - | - | |
| 4.26 | 10 | ගැනිලි | - | 5 000 | - | - | - | 5 000 | |
| | | | 2 000 | 183 000 | 40 000 | 28 000 | 48 000 | 67 000 | |

- ඉහත අමල්ගේ ව්‍යාපාරයේ 2017.04.01 දිනට මුදල් ශේෂය රු.25 000 ක් ලෙස සලකා මුදල් ලැබීම් ජර්නලයේ හා මුදල් ගෙවීම් ජර්නලයේ ගනුදෙනු පොදු ලෙජරයට පිටපත් කිරීම පහත දැක්වේ.

**පොදු ලෙජරය**

**මුදල් ගිණුම / මුදල් පාලන ගිණුම**

| | රු. | | රු. |
|---|---|---|---|
| 4/1 ඉ/ගෙ/ශේෂය | 25 000 | ගැනුම් ගිණුම | 40 000 |
| විකුණුම් ගිණුම | 110 000 | ණයහිමි පාලන ගිණුම | 28 000 |
| ණයගැති පාලන ගිණුම | 57 000 | වියදම් ගිණුම් | 50 000 |
| ආදායම් ගිණුම් | 6 000 | වෙනත් ගෙවීම් ගිණුම් | 65 000 |
| වෙනත් ලැබීම් ගිණුම් | 120 000 | 4/30 ශේෂය ප/ගෙ | 135 000 |
| | 318 000 | | 318 000 |
| 5/1 ඉ/ගෙ/ශේෂය | 135 000 | | |

**හෝ**

**මුදල් ගිණුම / මුදල් පාලන ගිණුම** රු.

| | | | |
|---|---|---|---|
| 4/1 ඉ/ගෙ/ ශේෂය | 25 000 | 4/30 මුදල් ගෙවීම් | 293 000 |
| 4/30 මුදල් ලැබීම් | 293 000 | 4/30 ශේෂය ප/ගෙ | 135 000 |
| | 318 000 | | 318 000 |
| 5/1 ඉ/ගෙ/ශේෂය | 135 000 | | |

**විකුණුම් ගිණුම** රු.

| | | | |
|---|---|---|---|
| | | 4/30 මුදල් ගිණුම | 110 000 |

### බැංකු ණය ගිණුම

| | | රු. | | | රු. |
|---|---|---|---|---|---|
| 4/20 | මුදල් ගිණුම | 10 000 | 4/15 | මුදල් ගිණුම | 100 000 |

### ප්‍රාග්ධන ගිණුම

| | | රු. | | | රු. |
|---|---|---|---|---|---|
| | | | 4/1 | ශේෂය ඉ/ගෙ | ×× ×× |
| | | | 4/28 | මුදල් ගිණුම | 20 000 |

### දුන් වට්ටම් ගිණුම

| | | රු. | | | රු. |
|---|---|---|---|---|---|
| 4/30 | ණයගැති පාලන ගිණුම | 2 500 | | | |

### ලද වට්ටම් ගිණුම

| | | රු. | | | රු. |
|---|---|---|---|---|---|
| | | | 4/30 | ණයහිමි පාලන ගිණුම | 2 000 |

### ණයගැති පාලන ගිණුම

| | | රු. | | | රු. |
|---|---|---|---|---|---|
| | | | 4.30 | මුදල් ගිණුම | 57 000 |
| | | | | දුන් වට්ටම් ගිණුම | 2 500 |

### ණයහිමි පාලන ගිණුම

| | | රු. | | | රු. |
|---|---|---|---|---|---|
| 4.30 | මුදල් ගිණුම | 28 000 | | | |
| | ලද වට්ටම් ගිණුම | 2 000 | | | |

### ලද ගොඩනැගිලි කුලී ගිණුම

| | | රු. | | | රු. |
|---|---|---|---|---|---|
| | | | 4.10 | මුදල් ගිණුම | 5 000 |

### ලද කොමිස් ගිණුම

| | | රු. | | | රු. |
|---|---|---|---|---|---|
| | | | 4.25 | මුදල් ගිණුම | 1 000 |

ගැණුම් ගිණුම

| | | රු. | | රු. |
|---|---|---|---|---|
| 4/30 | මුදල් ගිණුම | 40 000 | | |

විදුලිය වියදම් ගිණුම

| | | රු. | | රු. |
|---|---|---|---|---|
| 4/06 | මුදල් ගිණුම | 6 000 | | |

රක්ෂණ ගාස්තු ගිණුම

| | | රු. | | රු. |
|---|---|---|---|---|
| 4/12 | මුදල් ගිණුම | 12 000 | | |

ණය පොළී ගිණුම

| | | රු. | | රු. |
|---|---|---|---|---|
| 4/20 | මුදල් ගිණුම | 2 000 | | |

කාර්යාල ලී බඩු ගිණුම

| | | රු. | | රු. |
|---|---|---|---|---|
| 4/16 | මුදල් ගිණුම | 50 000 | | |

ගැනිලි ගිණුම

| | | රු. | | රු. |
|---|---|---|---|---|
| 4/26 | මුදල් ගිණුම | 5 000 | | |

වැටුප් හා වේතන ගිණුම

| | | රු. | | රු. |
|---|---|---|---|---|
| 4/18 | මුදල් ගිණුම | 3 0 000 | | |

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

- බොහෝ ව්‍යාපාර මුදලින් පමණක් නොව චෙක්පත් මගින් ද ගනුදෙනු සිදු කරයි.
- චෙක්පත් මගින් ගනුදෙනු කරන ව්‍යාපාරවලට ගනුදෙනු තුළින් ලැබෙන මුදල් හා චෙක්පත් සෘජුව ම බැංකුගත කරන අතර, ඒවා මුදල් ලැබීම් ජර්නලයේ වාර්තා කරයි.
- චෙක්පත් මගින් කරන ගෙවීම් මුදල් ගෙවීම් ජර්නලයේ වාර්තා කරයි.
- එවැනි ව්‍යාපාරයක මුදලින් සිදු කෙරෙන්නේ සුළු මුදල් ගෙවීම් පමණි. එම ගෙවීම් සුළු මුදල් ගෙවීම් ජර්නලයේ සටහන් කරයි.
- ව්‍යාපාරයට ලැබෙන මුදල් සියල්ල ම ඒ දිනම බැංකුවේ තැන්පත් කරන බව පැහැදිලි කරන්න.

**ක්‍රියාකාරකම 02** : ඇමුණුම් අංක 4.2.1 සිසුන්ට ලබා දෙන්න. ඇමුණුම 4.2.1

2017. 04. 01 තිළිණ රු. 800 000 ක් ව්‍යාපාරය නමින් බැංකු ගිණුමක තැන්පත් කර වෙළෙඳ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. පහත දැක්වෙන්නේ අප්‍රේල් මාසය තුළ සිදු වූ ගනුදෙනු වේ.

| ගනුදෙනු සිදු වූ දිනය | විස්තරය | චෙක් අංකය | වටිනාකම (රු.) |
|---|---|---|---|
| 2017. 04. 01 | අත්පිට ගැනුම් (ව. අ. 1) | 800400 | 120 000 |
| 2017. 04. 02 | ලී බඩු උපකරණ මිලට ගත්තා (ව. අ. 2) | 800401 | 80 000 |
| 2017. 04. 02 | අත්පිට විකුණුම් (ල. අ. 2) | 712520 | 200 000 |
| 2017. 04. 03 | අතුලගෙන් ණයට ගැනුම් | - | 100 000 |
| 2017. 04. 04 | වෙනුරට ණයට විකුණුම් | - | 150 000 |
| 2017. 04. 05 | සුළු මුදල් භාරකරුට ගෙවීම් (ව. අ. 3) | 800402 | 10 000 |
| 2017. 04. 06 | ගෙනඒමේ කුලී ගෙව්වා (ව. අ. 4) | 800403 | 5 000 |
| 2017. 04. 07 | තුෂාන්ගෙන් ණයට ගැනුම් | - | 80 000 |
| 2017. 04. 08 | චතුරට ණයට විකුණුම් | - | 90 000 |
| 2017. 04. 08 | මහජන බැංකුවෙන් ලබා ගත් ණය මුදල (ල. අ. 3) | - | 300 000 |
| 2017. 04. 09 | අතුලට ගෙව්වා. ලද වට්ටම් රු. 5 000 (ව. අ. 5) | 800404 | 95 000 |
| 2017. 04. 10 | වෙනුරගෙන් 10% ක වට්ටමකට යටත්ව මුදල් ලැබුණා. (ල. අ. 4) | 620703 | 135 000 |
| 2017. 04. 12 | අත්පිට විකුණුම් (ල. අ. 5) | මුදල් | 250 000 |
| 2017. 04. 14 | ගොඩනැගිලි කුලී ගෙවීම (ව. අ. 6) | 800405 | 20 000 |
| 2017. 04. 15 | අත්පිට ගැනුම් (ව. අ. 7) | 800406 | 110 000 |
| 2017. 04. 18 | තුෂාන්ට ගෙව්වා (ව. අ. 8) අඩු කළ වට්ටම් 10% | 800407 | 72 000 |
| 2017. 04. 22 | චතුරගෙන් ලැබීම් (ල. අ. 6) දුන් වට්ටම් 10% | මුදල් | 81 000 |
| 2017. 04. 25 | සේවක වේතන ගෙව්වා (ව. අ. 9) | 800408 | 10 000 |
| 2017. 04. 26 | තිළිනගේ ගැනිලි (ව. අ. 10) | 800409 | 10 000 |
| 2017. 04. 28 | ලද කොමිස් (ල. අ. 7) | මුදල් | 8 000 |

- තිළිණගේ ව්‍යාපාරයේ ගනුදෙනු ලැබීම් ජර්නලයක හා ගෙවීම් ජර්නලයක සටහන් කර, ඒවායේ ඇතුළත් තොරතුරු පොදු ලෙජරයට පිටපත් කරන්න.

- දී ඇති විසඳුමට අනුව සිසුන්ගේ පිළිතුරු නිවැරදිදැයි තහවුරු කරන්න.

## ලැබීම් ජර්නලය / මුදල් ලැබීම් ජර්නලය

| දිනය | ලදුපත් අංකය | විස්තරය | චෙක්පත් අංකය | දුන් වට්ටම් | විශ්ලේෂණය (රු.) වටිනාකම (රු.) | අත්පිට විකුණුම් | ණයගැති ලැබීම් | ආදායම් | වෙනත් ලැබීම් |
|---|---|---|---|---|---|---|---|---|---|
| 17/4/1 | 1 | ප්‍රාග්ධනය | - | - | 800 000 | - | - | - | 800 000 |
| 17/4/2 | 2 | විකුණුම් | 712 520 | - | 200 000 | 200 000 | - | - | - |
| 17/4/8 | 3 | බැංකු ණය | - | - | 300 000 | - | - | - | 300 000 |
| 17/4/10 | 4 | වෙනුර | 620 703 | 15 000 | 135 000 | - | 135 000 | - | - |
| 17/4/12 | 5 | විකුණුම් | - | - | 250 000 | 250 000 | - | - | - |
| 17/4/22 | 6 | චතුර | - | 9 000 | 81 000 | - | 81 000 | - | - |
| 17/4/28 | 7 | ලද කොමිස් | - | - | 8 000 | - | - | 8 000 | - |
| | | | - | 24 000 | 1 774 000 | 450 000 | 216 000 | 8 000 | 1 100 000 |

## ගෙවීම් ජර්නලය / මුදල් ගෙවීම් ජර්නලය

| දිනය | වවුචර් අංක | විස්තරය | චෙක්පත් අංකය | ලද වට්ටම් | විශ්ලේෂණය (රු.) වටිනාකම (රු.) | අත්පිට ගැනුම් | ණයහිමි ගෙවීම් | වියදම් | වෙනත් ගෙවීම් |
|---|---|---|---|---|---|---|---|---|---|
| 17/4/1 | 1 | ගැනුම් | 800400 | - | 120 000 | 120 000 | - | - | - |
| 17/4/2 | 2 | ලී බඩු | 800401 | - | 80 000 | - | - | - | 80 000 |
| 17/4/5 | 3 | සුලු මුදල් | 800402 | - | 10 000 | - | - | - | 10 000 |
| 17/4/6 | 4 | ගෙනප්මේ කුලී | 800403 | - | 5 000 | - | - | 5 000 | - |
| 17/4/9 | 5 | අතුල | 800404 | 5 000 | 95 000 | - | 95 000 | - | - |
| 17/4/14 | 6 | ගොඩනැගිලි කුලී | 800405 | - | 20 000 | - | - | 20 000 | - |
| 17/4/15 | 7 | ගැනුම් | 800406 | - | 110 000 | 110 000 | - | - | - |
| 17/4/18 | 8 | කුෂාන් | 800407 | 8 000 | 72 000 | - | 72 000 | - | - |
| 17/4/25 | 9 | සේවක වේතන | 800408 | - | 10 000 | - | - | 10 000 | - |
| 17/4/26 | 10 | ගැනිලි | 800409 | | 10 000 | - | | - | 10 000 |
| | | | | 13 000 | 532 000 | 230 000 | 167 000 | 35 000 | 100 000 |

**පොදු ලෙජරය**

දුන් වට්ටම් ගිණුම රු.

| | |
|---|---|
| 4/30 ණයගැති ගිණුම 24 000 | |

ප්‍රාග්ධන ගිණුම රු.

| | |
|---|---|
| | 4/01 මුදල් ගිණුම 800 000 |

ලද වට්ටම් ගිණුම රු.

| | |
|---|---|
| | 4/30 ණයහිමි පාලන ගිණුම 13 000 |

විකුණුම් ගිණුම රු.

| | |
|---|---|
| | 4/30 මුදල් ගිණුම 450 000 |

**සුළු මුදල් ගිණුම** රු.

| | | | |
|---|---|---|---|
| 4/05 මුදල් ගිණුම | 10 000 | | |

**බැංකු ණය ගිණුම** රු.

| | | | |
|---|---|---|---|
| | | 4/08 මුදල් ගිණුම | 300 000 |

**ලද කොමිස් ගිණුම** රු.

| | | | |
|---|---|---|---|
| | | 4/28 මුදල් ගිණුම | 8 000 |

**ණයහිමි පාලන ගිණුම** රු.

| | | | |
|---|---|---|---|
| 4/30 ලද වට්ටම් | 13 000 | | |
| 4/30 මුදල් ගිණුමට | 167 000 | | |

**ලී බඩු ගිණුම** රු.

| | | | |
|---|---|---|---|
| 4/02 මුදල් ගිණුම | 80 000 | | |

**ණයගැති පාලන ගිණුම** රු.

| | | | |
|---|---|---|---|
| | | දුන් වට්ටම් ගිණුම | 24 000 |
| | | මුදල් ගිණුම | 216 000 |

**ගැනුම් ගිණුම** රු.

| | | | |
|---|---|---|---|
| 4/30 මුදල් ගිණුම | 230 000 | | |

**ගෙන ඒමේ කුලී** රු.

| | | | |
|---|---|---|---|
| 4/04 මුදල් ගිණුම | 5 000 | | |

**සේවක වේතන ගිණුම** රු.

| | | | |
|---|---|---|---|
| 4/25 මුදල් ගිණුම | 10 000 | | |

**ගොඩනැගිලි කුලී ගිණුම** රු.

| | | | |
|---|---|---|---|
| 4/14 මුදල් ගිණුම | 20 000 | | |

**ගැනිලි ගිණුම** රු.

| | | | |
|---|---|---|---|
| 4/26 මුදල් ගිණුම | 10 000 | | |

**මුදල් ගිණුම / මුදල් පාලන ගිණුම**

| | රු. | | රු. |
|---|---|---|---|
| විකුණුම් ගිණුම | 450 000 | ගැනුම් | 230 000ණ |
| ණයගැති පාලන ගිණුම | 216 000 | ණයහිමි පාලන ගිණුම | 167 000 |
| ආදායම් ගිණුම් | 8 000 | වියදම් ගිණුම් | 35 000 |
| වෙනත් ලැබීම් ගිණුම් | 1 100 000 | වෙනත් ගෙවීම් ගිණුම් | 100 000 |
| | | 4/30 ශේ/ප/ගෙ | 1 242 000 |
| | 1 774 000 | | 1 774 000 |
| 5/1 ශේ/ඉ/ගෙ | 1 242 000 | | |

**අභ්‍යාසයකි :**

මලිඳුගේ ව්‍යාපාරය බැංකු ගිණුමක් මගින් සියළු මුදල් ගනුදෙනු සිදු කරයි. 2017. 04. 01 දිනට බැංකු ගිණුමේ ශේෂය රු. 1 200 000 කි. 2017 අප්‍රේල් මාසයේ සිදු වූ ගනුදෙනු පහත දක්වේ.

| ගනුදෙනු සිදු වූ දිනය | මූලාශ්‍ර ලේඛන අංකය | විස්තරය | චෙක් අංකය | වටිනාකම (රු.000) |
|---|---|---|---|---|
| 2017. 04. 01 | ල. අ. 01 | අත්පිට විකුණුම් | 135 401 | 4 000 |
| 2017. 04. 02 | ව. අ. 01 | අත්පිට ගැනුම් | 350 150 | 2 000 |
| 2017. 04. 03 | ල. අ. 02 | සුදේශ්ගෙන් ලැබුණා | මුදල් | 1 500 |
| 2017. 04. 04 | ව. අ. 02 | සුජානිට ගෙව්වා | 350 151 | 1 400 |
| 2017. 04. 05 | ව. අ. 03 | විදුලි බිල ගෙව්වා | 350 152 | 300 |
| 2017. 04. 06 | ල. අ. 03 | ගෙවල් කුලී ආදායම | මුදල් | 400 |
| 2017. 04. 08 | ල. අ. 04 | නාමල්ගෙන් 10%ක වට්ටමකට යටත්ව ලැබුණා | 125 214 | 360 |
| 2017. 04. 10 | ව. අ. 04 | සුධාරකට 10%ක වට්ටමකට යටත්ව ගෙව්වා | 350 153 | 180 |
| 2017. 04. 12 | ව. අ. 05 | සේවක වේතන ගෙව්වා | 350 154 | 120 |
| 2017. 04. 14 | ව. අ. 06 | මෝටර් රථයක් ගත්තා | 350 155 | 2 500 |
| 2017. 04. 15 | ල. අ. 05 | බැංකු ණයක් ගත්තා | මුදල් | 3 000 |
| 2017. 04. 18 | අගරු නි. | නාමල්ගෙන් ලැබී තැන්පත් කර ඇති චෙක්පත අගරු වී ඇති බව බැංකුව දැනුම් දුන්නා. | 125 214 | 360 |
| 2017. 04. 20 | ල. අ. 06 | අත්පිට විකුණුම් | මුදල් | 4 400 |
| 2017. 04. 22 | ව. අ. 07 | පසිඳුට ගෙව්වා. ලද වට්ටම 10% කි. | 350 156 | 450 |
| 2017. 04. 24 | අගරු නි. | විදුලිය බිල සඳහා ගෙවූ චෙක්පත ලිවීමේ දෝෂයක් නිසා ආපසු ලැබුණා. | 350 152 | 300 |
| 2017. 04. 26 | ව. අ. 08 | මලිඳුගේ ගැනිලි | 350 157 | 100 |
| 2017. 04. 28 | ව. අ. 09 | අත්පිට ගැණුම් | 350 158 | 1 300 |
| 2017. 04. 29 | ල. අ. 07 | හසිතගෙන් ලැබුණා | 138 146 | 350 |
| 2017. 04. 30 | ව. අ. 10 | විදුලිය වියදම් | 350 159 | 300 |

**අවශ්‍ය වන්නේ :**

1. ඉහත තොරතුරු ඇසුරින් 2017 අප්‍රියෙල් මාසය සඳහා මලිඳුගේ ව්‍යාපාරයේ ලැවීම් ජර්නලය හා ගෙවීම් ජර්නලය පිළියෙල කිරීම.

2. මුදල් ලැබීම් ජර්නලයේ හා මුදල් ගෙවීම් ජර්නලයේ තොරතුරු උපයෝගී කර ගෙන මුදල් ගිණුම පිළියෙල කිරීම.

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

- ණයගැතියකුගෙන් ලැබුණු චෙක්පතක් බැංකුවේ තැන්පත් කිරීමෙන් පසුව අගරු වුවහොත් එම අගරු වීම පොදු ජර්නලය තුළ වාර්තා කළ යුතුයි.
- එහි දී ණයගැතියකුට වට්ටමක් පිරිනමා ඇත්නම් සාමාන්‍යයෙන් එම වට්ටම අහිමි කෙරේ.
- ඒ අනුව පහත සටහන පොදු ජර්නලය තුළ තබන්න.

| | | | | |
|---|---|---|---|---|
| ණයගැති පාලන ගිණුම | හර | ××× | | |
| දුන් වට්ටම් ගිණුම | | | බැර | ×× |
| මුදල් ගිණුම | | | බැර | ××× |
| (චෙක්පත අගරු වීම හා දුන් වට්ටම අහිමි කිරීම) | | | | |

- ණයහිමියකුට නිකුත් කළ චෙක්පතක් පසුව අගරු වුවහොත් එම අගරු වීම පොදු ජර්නලයේ වාර්තා කළ යුතු ය.
- එහි දී ණයහිමියාගෙන් වට්ටම් ලැබී තිබුණේ නම් සාමාන්‍යයෙන් එම වට්ටම ද අහිමි වේ.

ඒ අනුව පහත සටහන පොදු ජර්නලය තුළ තබන්න.

| | | | | |
|---|---|---|---|---|
| මුදල් ගිණුම | හර | ×× | | |
| ලද වට්ටම් ගිණුම | හර | ×× | | |
| ණයහිමි පාලන ගිණුම | | | බැර | ×× |
| (චෙක්පත අගරු වීම හා ලද වට්ටම අහිමි කිරීම) | | | | |

- වියදමක් සඳහා ව්‍යාපාරය ගෙවූ චෙක්පතක් අගරු වුවහොත් එම සටහන ද පොදු ජර්නලය තුළ පහත ආකාරයට සටහන් තබන්න.

| | | | | |
|---|---|---|---|---|
| මුදල් ගිණුම | හර | ××× | | |
| උපචිත වියදම් ගිණුම / වියදම් ගිණුම | | | බැර | ××× |
| (වියදම් සඳහා වූ චෙක්පත් අගරු වීම) | | | | |

| මූලික පද | பிரதான பதங்கள் | Key terms |
|---|---|---|
| • ද්විත්ව සටහන් ක්‍රමය | இரட்டைப் பதிவு முறைமை | Double Entry System |
| • මුදල් ලැබීම් ජර්නලය | காசுப் பெறுவனவு நாட்குறிப்பேடு | Cash Receipt Journal |
| • මුදල් ගෙවීම් ජර්නලය | காசுக் கொடுப்பனவு நாட்குறிப்பேடு | Cash Payment Journal |
| • ආකෘතිය | அமைப்பு / மாதிரி | Format |
| • මුදල් පාලන ගිණුම | காசுக் கட்டுப்பாட்டுக் கணக்கு | Cash Control Account |
| • මුදල් | காசு | Cash |
| • චෙක්පත | காசோலை | Cheque |

**නිපුණතාව 04 : මූලික සටහන් පොත් උපයෝගී කර ගනිමින් ගනුදෙනු ලෙජරයට පිටපත් කරයි.**

**නිපුණතා මට්ටම 4.3** : සුළු වියදම් හා බැඳි ගනුදෙනු සටහන් කිරීමට සුළු මුදල් ගෙවීම් ජර්නලය පවත්වා ගනියි.


**කාලච්ඡේද සංඛ්‍යාව** : 12

**ඉගෙනුම් ඵල** :

- සුළු මුදල් ගනුදෙනුවලට අදාළ මූලාශ්‍ර ලේඛන නම් කරයි
- සුළු මුදල් අග්‍රිමය හා අග්‍රිමය ප්‍රතිපූරණය කිරීම පැහැදිලි කරයි.
- සුළු මුදල් ගෙවීම් ජර්නලයේ ආකෘතිය ගොඩ නගයි.
- සුළු මුදල් ගෙවීම් ජර්නලයේ පිළියෙළ කරයි.
- සුළු මුදල් ගෙවීම් ජර්නලයේ ඇතුළත් කළ ගනුදෙනු ලෙජරයට පිටපත් කරයි.

**මූලික පද හා සංකල්ප** :

**සංකල්ප සිතියම**



**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පිවිසුම** • පහත දක්වෙන ගනුදෙනු ඇතුළත් පත්‍රිකාව පන්තියට සුදුසු ආකාරයට ඉදිරිපත් කර, සිසු අදහස් විමසන්න.

| ගනුදෙනු | රු. |
|---|---|
| බඩු තොග ගැනුම් | 15 000 |
| සංග්‍රහ වියදම් | 75 |
| මුද්දර සහ ලියුම් කවර ගත්තා | 40 |
| වැටුප් ගෙව්වා | 9 000 |
| ලිපිගොනු කවර ගත්තා | 30 |
| පෑනක් ගත්තා | 15 |
| ලී බඩු ගත්තා | 60 000 |
| ගමන් වියදම් ගෙව්වා | 125 |

- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ව්‍යාපාරයක සිදුවන ගනුදෙනු අතර අඩු වටිනාකම් සහිත ගනුදෙනු සිදු වන බවත්, එවැනි ගනුදෙනු සඳහා නිදසුන් ලෙස,
  - සංග්‍රහ වියදම් ගෙවීම
  - මුද්දර හා ලියුම් කවර සඳහා ගෙවීම
  - ලිපිගොනු කවර සඳහා ගෙවීම
  - පෑන ගැනීමට ගෙවීම
  - ගමන් ගාස්තු ගෙවීම, දැක්විය හැකි බව
- එවැනි අඩු වටිනාකම් සහිත ගෙවීම් සුළු ගෙවීම් ලෙස හැඳින්වෙන බව
- සුළු ගෙවීම් සටහන් කිරීමට සුළු මුදල් ගෙවීම් ජර්නලයක් භාවිත කරන බව
- සුළු ගෙවීම් සඳහා සාමාන්‍යයෙන් මසක් වැනි කාලයකට වැය වන මුදල් කලින් තීරණය කර, ප්‍රධාන මුදල් භාරකරු විසින් සුළු මුදල් භාරකරුට ලබා දෙන බව,
- එකවර ලබා දෙන මෙම මුදල **සුළු මුදල් අග්‍රිමය** ලෙස හැඳින්වෙන අතර, එම අග්‍රිම මුදල අවසාන වීමට ආසන්නයේ නැවතත් සුළු මුදල් භාරකරු මුදල් ඉල්ලා සිටිය යුතු අතර එවිට ගෙවූ මුදලට සමාන මුදලක් නැවත ලබා දෙමින් අග්‍රිමය සම්පූර්ණ කිරීම, සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කිරීම ලෙස හැඳින්වෙන බව පැහැදිලි කරන්න.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- පහත සඳහන් ව්‍යාපාර දෙකෙන් ඒ ඒ කණ්ඩායමට ලැබෙන ව්‍යාපාරය කෙරෙහි අවධානය යොමු කරවන්න.

| දිනය 2017 | වවුචර් අංකය | රුවනිගේ ව්‍යාපාරය | රු. | අරුණිගේ ව්‍යාපාරය | රු. |
|---|---|---|---|---|---|
| 3/01 | - | සුළු මුදල් භාරකරුට දුන් මුදල | 2 500 | 1. සුළු මුදල් භාරකරුට දුන් මුදල | 5 000 |
| 3/02 | - | බඩු තොග මිලට ගැනුම් | 60 000 | 2. ත්‍රී රෝද රථ වියදම් | 150 |
| 3/03 | - | භාණ්ඩ ගෙන ඒමේ කුලී | 8 000 | 3. ලිපි ද්‍රව්‍ය වියදම් | 250 |
| 3/04 | 01. | සංග්‍රහ වියදම් | 200 | 4. ලී බඩු මිල දී ගැනීම | 5 300 |
| 03/5 | 02 | මුද්දර හා ලියුම් කවර | 180 | 5. පෑන් හා කොල සඳහා | 80 |
| 3/06 | 03 | පිරිසිදු කිරීමේ වියදම් | 300 | 6. සීනි හා තේ කුඩු සඳහා | 300 |
| 3/07 | - | ලී බඩු මිල දී ගැනීම් | 6 000 | 7. විවිධ වියදම් | 360 |
| 3/08 | 04 | තැපැල් ගාස්තු | 300 | 8. ලිපි ලියාපදිංචි කිරීමේ ගාස්තු | 160 |
| 3/09 | 05 | කුලී රථ ගාස්තු | 250 | 9. ඡායා පිටපත් කඩදාසි | 250 |
| 3/10 | 06 | රනිල්ට ගෙව්වා | 600 | 10. පියල්ට ගෙව්වා | 200 |
| 3/11 | 07 | පිරිසිදු කිරීමේ වියදම් | 150 | 11. බස් ගාස්තු | 50 |

- ඒ ඒ කණ්ඩායමට ලද ව්‍යාපාර තොරතුරු ඇසුරෙන් පහත තොරතුරු අනාවරණය සඳහා කර ගැනීමට මග පෙන්වන්න.
    - ව්‍යාපාරයේ සිදු වී ඇති සාපේක්ෂව අඩු වටිනාකම් සහිත ගනුදෙනු වෙන්කර හඳුනා ගැනීම.
    - සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම හඳුනා ගැනීම.
    - එම ගනුදෙනු සනාථ කිරීමට යොදා ගන්නා මූලික ලියවිලි නම් කිරීම.
    - ව්‍යාපාරයේ අඩු වටිනාකම් සහිත ගනුදෙනු පහත සඳහන් ආකාරයේ ආකෘතියක සටහන් කිරීම.

**සුළු මුදල් ගෙවීම් ජර්නලය**

| දිනය | විස්තරය | ව. අ. | ගෙවීම් (රු.) | විශ්ලේෂණ තීරු | | | | වෙනත් (රු.) | ලෙජර් පිටුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ලිපි ද්‍රව්‍ය (රු.) | කුලී වියදම් (රු.) | ගමන් වියදම් (රු.) | විවිධ වියදම් (රු.) | | |
| | | | | | | | | | |

- 2017. 03. 15 දිනට සුළු මුදල් ජර්නලය තුලනය කිරීම.
- සුළු මුදල් ගෙවීම් ජර්නලයේ ඇතුළත් කළ ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීම.
- සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කළ යුතු වටිනාකම දැක්වීම.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් ඃ**

- ව්‍යාපාරයක දෛනික ව සිදු වන ගනුදෙනු අතර, සුළු වටිනාකම් සහිත ගනුදෙනු හඳුනා ගෙන ඒවා වෙන ම මූලික සටහන් පොතක සටහන් කළ යුතු ය. එම මූලික සටහන් පොත, සුළු මුදල් ගෙවීම් ජර්නලය ලෙස හැඳින්වේ.
- සුළු මුදල් ගෙවීම් ජර්නලයේ ගනුදෙනු වාර්තා කිරීමට යොදා ගන්නා මූලාශ්‍ර ලේඛන, **සුළු මුදල් ගෙවීම් වවුචරය** වේ.
- සුළු ගෙවීම් සඳහා සාමාන්‍යයෙන් අවශ්‍ය වේ යැයි කළමනාකරණය තීරණය කළ මුදල සුළු මුදල් අග්‍රිමය වේ. ප්‍රධාන මුදල් භාරකරු විසින් සුළු මුදල් භාරකරුට මෙම මුදල ලබා දෙයි.
- අග්‍රිමය අවසාන වීමට ආසන්නයේ දී සුළු මුදල් භාරකරු විසින් ගෙවන ලද මුදල ප්‍රධාන මුදල් භාරකරුගෙන් ලබා ගැනීම අග්‍රිමය ප්‍රතිපූරණය නම් වේ.
- විශ්ලේෂණ තීරු සහිත සුළු මුදල් ගෙවීම් ජර්නලයක සුළු වියදම් ගෙවීම් ඇතුළත් කළ යුතු ය.
- සුළු මුදල් ගෙවීම් ජර්නලය හා පොදු ලෙජරයේ සටහන් කරන ගනුදෙනුවලට අදාළ ද්විත්ව සටහන් පහත පරිදි වේ.
- සුළු මුදල් අග්‍රිමය ලැබීම (මෙය ගෙවීම් ජර්නලයේ වාර්තා කිරීමෙන් අනතුරු ව පහත පරිදි ගිණුම්ගත වේ.
  - සුළු මුදල් ගිණුම හර

    මුදල් ගිණුම බැර
  - අග්‍රිමය ප්‍රතිපූරණය කිරීම

    සුළු මුදල් ගිණුම හර

    මුදල් ගිණුම බැර
  - සුළු වියදම් තීරුවල එකතුව

    ඒ ඒ වියදම් ගිණුම් හර

    සුළු මුදල් ගිණුම බැර

රුවනිගේ ව්‍යාපාරයේ සුළු මුදල් ගෙවීම් ජර්නලය පහත සඳහන් ආකාරයෙන් සකස් කළ හැකිය.

## සුළු මුදල් ගෙවීම් ජර්නලය

| දිනය | විස්තරය | ව.අ | ගෙවීම් | විශ්ලේෂණ තීරු | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | සංග්‍රහ | තැ.පැ. | ගමන් | පිරිසිදු | වෙනත් | ලෙ. |
| 3/4 | සංග්‍රහ | 01 | 200 | 200 | | | | | |
| 3/5 | මුද්දර හා ලියුම් කවර | 02 | 180 | | 180 | | | | |
| 3/6 | පිරිසිදු කිරීම් | 03 | 300 | - | - | - | 300 | | |
| 3/8 | තැපැල් ගාස්තු | 04 | 300 | | 300 | | | | |
| 3/9 | කුලී රථ ගාස්තු | 05 | 250 | | | 250 | | | |
| 3/10 | රනිල් (ණයහිමි) | 06 | 600 | | | | | 600 | 08 |
| 3/11 | පිරිසිදු කිරීමේ වියදම් | 07 | 150 | | | | 150 | | |
| | | | 1 980 | 200 | 480 | 250 | 450 | 600 | |
| | | | | සංග්‍රහ වියදම් ගිණුමට හර කළා (ලෙ.ෆ. 20) | තැපැල් වියදම් ගිණුමට හර කළා (ලෙ.ෆ. 21) | ගමන් වියදම් ගිණුමට හර කළා (ලෙ.ෆ. 23) | පිරිසිදු කිරීමේ ගිණුමට හර කළා (ලෙ.ෆ. 24) | | |

සුළු මුදල් පොතේ සටහන් කළ ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීම පහත ආකාරයට සිදු වේ.

**සුළු මුදල් ගිණුම**

| | රු. |
|---|---|
| | විවිධ ගිණුම් 1980 |

**සංග්‍රහ ගාස්තු ගිණුම**

| රු. | රු. |
|---|---|
| 3/15 සුළු මුදල් 200 | |

**මුදල් ගිණුම**

| රු. | රු. |
|---|---|
| 31/1 ඉ/ගෙ ශේෂය ××× | 3/1 සුළු මුදල් 2 500 |

**තැපැල් වියදම් ගිණුම**

| රු. | රු. |
|---|---|
| 3/15 සුළු මුදල් 480 | |

**පිරිසිදු කිරීමේ වියදම්**

| රු. | රු. |
|---|---|
| 3/15 සුළු මුදල් 450 | |

**ගමන් වියදම් ගිණුම**

| රු. | රු. |
|---|---|
| 3/15 සුළු මුදල් 250 | |

**ණයහිමි පාලන ගිණුම**

| රු. | රු. |
|---|---|
| 3/10 සුළු මුදල් 600 | ශේෂය ××× |
| | ඉ/ගෙ |

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක :**

(01) (i) සුළු මුදල් අග්‍රිමය හා සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කෙටියෙන් පැහැදිලි කිරීම.

සුළු මුදල් ගෙවීම් ජර්නලයක සටහන් කෙරෙන පහත ගනුදෙනුවලට අදාළ මූලාශ්‍ර ලේඛන සඳහන් කිරීම.

(i) සුළු මුදල් අග්‍රිමය ලැබීම (ii) සුළු වියදම් ගෙවීම්

(02) ව්‍යාපාරයක මාසික සුළු මුදල් අග්‍රිමය රු. 3 000 කි. 2017 ජනවාරි මාසය තුළ දී සිදු කරන ලද සුළු වියදම් ගෙවීම්වල එකතුව පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| ලිපි ද්‍රව්‍ය වියදම් | 120 |
| ගමන් වියදම් | 240 |
| සංග්‍රහ වියදම් | 300 |
| තැපැල් වියදම් | 450 |
| විවිධ වියදම් | 900 |

2017/01/31 දිනට සුළු මුදල් පොතේ ඉදිරියට ගෙන ගිය ශේෂය වන්නේ,

(i) රු. 990 කි. (ii) රු. 2010 කි. (iii) රු. 3 000 කි. (iv) රු. 3 990 කි. (v) රු. 5010 කි.

(03) සත්සරණී ව්‍යාපාරයේ 2017/04/01 දිනට පැවති ශේෂයන් පහත පරිදි වේ.

- මුදල් පාලන ගිණුමේ ශේෂය රු. 24 000
- විමුක්ති (ණය හිමි) රු. 2 500
- මාසික සුළු මුදල් අග්‍රිමය රු. 2 000
- 2017 අප්‍රේල් මාසය සඳහා සුළු මුදල් අග්‍රිමය 2017.04. 01 දින සුළු මුදල් භාරකරුට ලැබුණි.
- සුළු මුදල් භාරකරු විසින් අප්‍රේල් මාසය සඳහා සිදු කළ සුළු වියදම් ගෙවීම්වල එකතුව පහත දැක්වේ.

| | රු. |
|---|---|
| • සංග්‍රහ වියදම් | 265 |
| • ලිපි ද්‍රව්‍ය වියදම් | 315 |
| • තැපැල් වියදම් | 340 |
| • විමුක්තිට ගෙවීම් | 300 |
| • ගමන් වියදම් | 160 |

අවශ්‍ය වන්නේ :-- සුළු මුදල් ගෙවීම් ජර්නලයේ සටහන් කළ ගනුදෙනු 2017/04/30 දිනට ලෙජරයට පිටපත් කිරීම.

(04) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දැක්වීම.

(i) සුළු මුදල් ගෙවීම් ජර්නලයක් වෙන ම පවත්වා ගැනීමෙන් සුළු මුදල් ගනුදෙනුවල පාලනයක් පවත්වා ගත හැකි වේ. ( )

(ii) සුළු මුදල් ගෙවීම් ජර්නලය මූලික සටහන් පොතක් මෙන් ම ලෙජර් ගිණුමක් ලෙසට ද කටයුතු කෙරේ. ( )

**නිපුණතාව 4.0 :** **මූලික සටහන් පොත් උපයෝගී කර ගනිමින් ගනුදෙනු ලෙජරයට පිටපත් කරයි.**


**නිපුණතා මට්ටම 4.4 :** බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 12

**ඉගෙනුම් ඵල :**

- බැංකු ප්‍රකාශනය පැහැදිලි කරයි.
- බැංකු ප්‍රකාශනයක අන්තර්ගත කරුණු ඉදිරිපත් කරයි.
- මුදල් ලැබීම් ජර්නලය හා මුදල් ගෙවීම් ජර්නලය සමග බැංකු ප්‍රකාශනය සැසඳීමෙන් ඒවායේ ශේෂයන් වෙනස්වීමට බලපා ඇති කරුණු අනාවරණය කරයි.
- මුදල් ගිණුමේ ශේෂය සංශෝධනය කරයි.
- බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කිරීමේ අවශ්‍යතාව පෙන්වා දෙයි.
- බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කරයි.

**මූලික පද හා සංකල්ප :** **සංකල්ප සිතියම**



**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසුම :**

පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

- බොහෝ විට ව්‍යාපාරයේ මුදල් ගිණුමේ ශේෂය, බැංකුව විසින් එවන ලද බැංකු ප්‍රකාශනයේ සඳහන් අතර වෙනස්වීම්, පවතින බව
- ව්‍යාපාරයේ මුදල් ගිණුමට අදාළ තොරතුරු මුදල් ලැබීම් ජර්නලයෙන් සහ මුදල් ගෙවීම් ජර්නලයෙන් ලබා ගන්නා බව
- බැංකුව විසින් සිදු කරන ලද ගනුදෙනු, බැංකු ප්‍රකාශනයේ සඳහන් ව පවතින බව
- මුදල් ගිණුමේ ශේෂය හා බැංකු ප්‍රකාශනයේ ශේෂය අතර වෙනසක් ඇතිවීමට බලපාන හේතු පහත සඳහන් කොටස් දෙක යටතේ හඳුනා ගත හැකි බව.
    - ව්‍යාපාරය සකස් කළ මුදල් ගිණුම් වැරදි හෝ අත්වැරදීම් ලෙස සැලකිය හැකි කරුණු
    - මුදල් ගිණුමේ වූ වැරදි හෝ අත්හැරීම් ලෙස සැලකිය නොහැකි හේතු
- මුදල් ගිණුමේ හා බැංකු ප්‍රකාශනයේ ශේෂයන්ගේ වෙනසට බලපාන හේතු අනාවරණය කර ගැනීමේ දී පහත දැක්වෙන ලෙස ගැලපීම් කළ යුතු බව
    - මුදල් ලැබීම් ජර්නලය හා බැංකු ප්‍රකාශනයේ බැර තීරුව සැසඳීම
    - මුදල් ගෙවීම් ජර්නලය හා බැංකු ප්‍රකාශනයේ හර තීරුව සැසඳීම

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

**ක්‍රියාකාරකම 01 :**

- ඇමුණුම 4.4.1 හි ඇතුළත් 'අමල් ව්‍යාපාරයේ' ඇතුළත් තොරතුරු සිසුන්ට ලබා දෙන්න.
- පහත මාතෘකා ඒ ඒ කණ්ඩායමට යොමු කරන්න.
    1. කණ්ඩායම

       බැංකු ප්‍රකාශනය, මුදල් ලැබීම් ජර්නලය, මුදල් ගිණුම
    2. කණ්ඩායම

       බැංකු ප්‍රකාශනය, මුදල් ගෙවීම් ජර්නලය, මුදල් ගිණුම
    - ඒ ඒ කණ්ඩායමට ලද මාතෘකාවට අනුව සැසඳීම් කර, වෙනස්කම් හඳුනා ගැනීමට යොමු කරවන්න.
    - ඒ ඒ කණ්ඩායම් හඳුනා ගත් වෙනස්කම් හුවමාරු කර ගෙන, මුදල් ගිණුමේ ශේෂය හා බැංකු ප්‍රකාශනයේ ශේෂය අතර වෙනසට බලපා ඇති හේතු පෙළගැස්වීමට යොමු කරවන්න.
    - අනාවරණය කර ගත් තොරතුරු පන්තියට ඉදිරිපත් කිරීමට යොමු කරවීම.
- මේ සඳහා දී ඇති පිළිතුරු සමග සසඳා බලන්න.

**ක්‍රියාකාරකම 02 :**

- ඉහත අමල්ගේ ව්‍යාපාරයේ තොරතුරු ඇසුරෙන් හඳුනා ගත් හේතූන්, ලැයිස්තුව සිසුන්ට අධ්‍යයනය කිරීමට යොමු කරවන්න.
- පහත සඳහන් මාතෘකා දෙක සිසු කණ්ඩායම් කිහිපයකට ලබා දෙන්න.
  - මුදල් ගිණුම සංශෝධනය කිරීම.
  - බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කිරීම.
- එක් එක් කණ්ඩායම්, මාතෘකා දෙකට ම අදාළ ව පිළිතුරු ගොඩ නැගීමට යොමු කරවන්න.

දී ඇති පිළිතුරු සමග නිවැරදි බව තහවුරු කර ගන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්.**

- මුදල් ගිණුම ව්‍යාපාරයේ දෘෂ්ටි කෝණයෙන් වත්කම් ගිණුමක් වන අතර, ව්‍යාපාරය වෙනුවෙන් බැංකුවේ පවත්වා ගනු ලබන ජංගම ගිණුම බැංකුවේ දෘෂ්ටි කෝණයෙන් වගකීම් ගිණුමක් වේ.

- ඒ අනුව මුදල් ලැබීම් ජර්නලයට ඇතුළත් කරන, බැංකුව සමග සිදු කරන ගනුදෙනු බැංකුව විසින් ජංගම ගිණුමට බැර කරනු ලබයි.

  උදා : • බැංකුවේ මුදල් තැන්පත් කිරීම.
  - බැංකුවේ චෙක්පත් තැන්පත් කිරීම්වලින් නිශ්කාෂණය (උපලබ්ධි) වූ චෙක්පත්වල වටිනාකම
- ව්‍යාපාරය මුදල් ගෙවීම් ජර්නලයේ ඇතුළත් කරන බැංකුව සමග සිදු කරන ගනුදෙනු, බැංකුව විසින් ජංගම ගිණුමට හර කරයි.

  උදා : • ව්‍යාපාරය නිකුත් කළ චෙක්පත්වල වටිනාකම්වලින් බැංකුවෙන් ගෙවීම් කර ඇති චෙක්පත්වල වටිනාකම.
- ව්‍යාපාරයේ මුදල් ගිණුමේ සටහන් නොවූ ලැබීම් ජර්නලයේ හා ගෙවීම් ජර්නලයේ පහත සඳහන් අයිතමයන් ද, බැංකු ප්‍රකාශනයේ ඇතුළත් ව තිබිය හැකි ය.

| ගෙවීම් ජර්නලයේ ඇතුළත් නොවූ | ලැබීම් ජර්නලයේ ඇතුළත් නොවූ |
|---|---|
| • ස්ථාවර නියෝග මත සිදු කළ ගෙවීම්.<br>• බැංකුව අය කළ බැංකු ගාස්තු<br>• චෙක්පොත් ගාස්තු<br>• අය කළ පොළී ආදිය | • බැංකුවට සෘජුව ම ලැබී ඇති වටිනාකම් (සෘජු ප්‍රේෂණ)<br>• ණයගැති ලැබීම්<br>• ආයෝජන ආදායම්<br>• ලාභාංශ ආදායම්<br>• පොලී ආදයම් |

- ඉහත කරුණුවලට අමතර ව ශේෂයන්ගේ අසමානතාවට පහත දැක්වෙන කරුණු ද බලපෑ හැකි ය.

- ව්‍යාපාරය ගනුදෙනු වාර්තා කිරීමේ දී සිදු විය හැකි වැරදි හා අඩුපාඩු
- බැංකුවෙන් සිදු විය හැකි වැරදි සහ අඩුපාඩු

- මුදල් ගිණුමේ ශේෂය සංශෝධනය කිරීමේ දී පහත සඳහන් හේතු පමණක් අදාළ කර ගනියි.

| මුදල් ගිණුමට හර කරන අයිතම | මුදල් ගිණුමට බැර කරන අයිතම |
|---|---|
| • බැංකුවට සෘජුව ම ලැබී ඇති ප්‍රේෂණ<br>• ව්‍යාපාරයේ ගනුදෙනු වාර්තා කිරීමේ දී සිදු වී ඇති වැරදි හා අඩුපාඩු නිවැරදි කිරීමට කළ යුතු හර කිරීම් | • බැංකුව විසින් ජංගම ගිණුමෙන් අඩු කර ගෙන ඇති ස්ථාවර නියෝග මත කළ ගෙවීම්<br>• අය කළ ගාස්තු, චෙක්පත් ගාස්තු, අයිරා පොළී<br>• ව්‍යාපාරයේ ගනුදෙනු වාර්තා කිරීමේ දී සිදු වූ වැරදි හා අඩුපාඩු නිවැරදි කිරීමට කළ යුතු බැර කිරීම් |

- මුදල් ගිණුමේ ශේෂය සංශෝධනය කිරීමෙන් පසු, බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කරනු ලබයි. එහි දී **මුදල් ගිණුමේ සංශෝධිත ශේෂයට,**
  - එම කාලය තුළ බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත්වල වටිනාකම එකතු කළ යුතු ය.
  - එම කාලය තුළ නිශ්කාෂණය නොවූ චෙක්පත්වල වටිනාකම් අඩු කළ යුතු ය.
  - බැංකුව විසින් ගනුදෙනු වාර්තා කිරීමේ දී සිදු වී ඇති වැරදි සහ අඩුපාඩු සුදුසු පරිදි එකතු කිරීම හෝ අඩු කිරීම කළ යුතු ය.
- ගැලපීම්වලින් පසු බැංකු ප්‍රකාශනයේ සඳහන් වටිනාකම ලැබේ.
- මුදල් ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම හා බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කිරීමේ ආකෘති පහත සඳහන් පරිදි වේ.

මුදල් පාලන ගිණුම/මුදල් ගිණුම (සංශෝධිත)

| | රු. | | රු. |
|---|---|---|---|
| ඉ/ගෙ/ශේෂය | ××× | සටහන් නොවූ ස්ථාවර නියෝග මත ගෙවීම් | ××× |
| සටහන් නොවූ සෘජු ප්‍රේෂණ | ×× | බැංකු ගාස්තු | ×× |
| අගරු වූ නිකුත් කළ චෙක්පත් | × | චෙක්පත් ගාස්තු | × |
| තැන්පත් කළ චෙක්පත්වල අගය අඩු වීම | × | අගරු වූ තැන්පත් කළ චෙක්පත් | × |
| | | සටහන් නොවූ නිකුත් කළ චෙක්පත් | × |
| | | ශේෂ/ප/ගෙ | × × |
| | ××× | | ××× |
| ඉ/ගෙ/ශේ | × × | | |

**....................................................බැංකු සැසඳුම් ප්‍රකාශනය**

| | රු. | රු. |
|---|---|---|
| මුදල් පාලන ගිණුමේ/මුදල් ගිණුමේ සංශෝධිත ශේෂය | | ××× |
| **එකතු කළා :** | | |
| ඉදිරිපත් නොවූ චෙක්පත් | ×× | |
| බැංකු ප්‍රකාශනයේ සිදු වී ඇති වැරදීම් | ×× | ×× |
| | | ××× |
| **අඩු කළා :** | | |
| නිෂ්කාශණය නොවූ චෙක්පත් | ×× | |
| බැංකු ප්‍රකාශනයේ සිදු වී ඇති වැරදීම් | ×× | (××) |
| (2) | | |
| බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය | | ××× |

''අමල් ව්‍යාපාරයේ තොරතුරු ''

**ඇමුණුම : 4.4.1**

''අමල් ව්‍යාපාරය '' 2016 අප්‍රේල් මාසයට අදාළ ව මුදල් ලැබීම් ජර්නලය පහත දැක්වේ.

**මුදල් ලැබීම් ජර්නලය**

| දිනය | විස්තරය | චෙක්පත් අංකය | දුන් වට්ටම් (රු.) | වටිනාකම (රු.) | විශ්ලේෂණය (රු.) | |
|---|---|---|---|---|---|---|
| | | | | | ණයගැති | විකුණුම් |
| 2016. 04. 05 | විකුණුම් | 147 585 | - | 16 000 | - | 16 000 |
| 2016. 04. 08 | චාමර | 218 570 | 500 | 10 000 | 10 000 | - |
| 2016. 04. 10 | විකුණුම් | - | - | 5 000 | - | 5 000 |
| 2016. 04. 15 | මේනක | 412870 | 800 | 12 000 | 12 000 | - |
| 2016. 04. 20 | සම්පත් | 241 711 | 300 | 8 000 | 8 000 | - |
| 2016. 04. 22 | රුවන් | 281 620 | 700 | 15 000 | 15 000 | - |
| 2016. 04. 25 | සාගර | -- | 1 000 | 19 000 | 19 000 | - |
| | | | 3 300 | 85 000 | 64 000 | 21 000 |

2016 අප්‍රේල් මාසයට අදාළ මුදල් ගෙවීම් ජර්නලය පහත දැක්වේ.

**මුදල් ගෙවීම් ජර්නලය**

| දිනය | විස්තරය | චෙක් අංකය | ලැබූ වට්ටම් (රු.) | වටිනාකම (රු.) | විශ්ලේෂණය (රු.) | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ණයහිමි | ගැනුම් | වියදම් | වෙනත් වියදම් |
| 2016.04.04 | ගැනුම් | 211010 | - | 6 000 | - | 6 000 | - | - |
| 2016.04.06 | සේනක | 211011 | 500 | 15 000 | 15 000 | - | - | - |
| 2016.04.08 | විදුලිය | 211012 | - | 6 000 | - | - | 6 000 | - |
| 2016.04.12 | කෝකිලා | 211013 | 1 000 | 18 000 | 18 000 | - | - | - |
| 2016.04.18 | සුළු මුදල් | 211014 | - | 2 000 | - | - | - | 2 000 |
| 2016.04.25 | ගැනිලි | 211015 | - | 5 000 | - | - | - | 5 000 |
| 2016.04.28 | ගෙවල් කුලී | 211016 | - | 6 000 | - | - | 6 000 | - |
| 2016.04.29 | ගැණුම් | 211017 | - | 4 000 | - | 4 000 | - | - |
| | | | 1 500 | 62 000 | 33 000 | 10 000 | 12 000 | 7 000 |

**මුදල් පාලන ගිණුම/මුදල් ගිණුම**

| | | රු. | | රු. |
|---|---|---|---|---|
| 4/1 | ඉ/ගෙ/ශේෂය | 12 000 | ණයහිමි පාලන | 33 000 |
| | ණයගැති පාලන | 64 000 | ගැණුම් | 1 000 |
| | විකුණුම් | 21 000 | වියදම් | 12 000 |
| | | | වෙනත් ගෙවීම් | 7 000 |
| | | | 4/30 ශේෂය | 44 000 |
| | | 97 000 | | 97 000 |
| | ඉ/ගෙ/ශේ | 44 000 | | |

2016 අප්‍රේල් මාසය සඳහා බැංකුවෙන් ලද ගිණුම් ප්‍රකාශනය පහත දැක්වේ.

**2016 අප්‍රේල් මාසයේ බැංකු ප්‍රකාශනය**

| දිනය | විස්තරය | හර<br>රු. | බැර<br>රු. | ශේෂය<br>රු. |
|---|---|---|---|---|
| 4/01 | ශේෂය | - | 12 000 | 12 000 |
| 4/08 | චෙක් 147585 | - | 16 000 | 28 000 |
| 4/10 | චෙක් 211010 | 6 000 | - | 22 000 |
| 4/10 | මුදල් | - | 5 000 | 27 000 |
| 4/12 | චෙක් 211011 | 15 000 | - | 12 000 |
| 4/15 | චෙක් 412870 | - | 12 000 | 24 000 |
| 4/16 | චෙක් 211013 | 18 000 | - | 6 000 |
| 4/18 | චෙක් 211014 | 2 000 | - | 4 000 |
| 4/20 | චෙක් 218570 | - | 10 000 | 14 000 |
| 4/25 | චෙක් 211015 | 5 000 | - | 9 000 |
| 4/25 | මුදල් | - | 19 000 | 28 000 |
| 4/30 | චෙක් 211016 | 6 000 | - | 22 000 |
| | චෙක් පොත් ගාස්තු | 1 000 | - | 21 000 |
| | ලාභාංශ | - | 4 000 | 25 000 |

ඉහත ඉදිරිපත් කර ඇති මුදල් පාලන ගිණුමේ හා බැංකු ප්‍රකාශනයේ අප්‍රේල් 30 වන දිනට ශේෂය අසමානවීමට හේතු දක්වා

1. මුදල් පාලන ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම හා
2. බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කරන්න.

**විසඳුම :**

බැංකු ප්‍රකාශනයේ හා මුදල් පාලන ගිණුමේ ශේෂය අසමානවීමට බලපෑ කරුණු.

1. තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්
   චෙක් අංක 241711 රු. 8 000
   චෙක් අංකය 281620 රු. 15 000

2. බැංකුවට සෘජුව ම ලද ලාභාංශය රු. 4 000

3. නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත්
   චෙක් අංක 211012 රු. 6 000
   චෙක් අංක 211017 රු. 4 000
4. බැංකුව අය කර ගත් චෙක්පොත් ගාස්තුව රු. 1 000

5. මුදල් ගෙවීම් ජර්නලයේ ගැනුම් තීරුවේ එකතුව රු. 10 000, මුදල් පාලන ගිණුමේ රු. 1 000 ලෙස සටහන් වීම.

- මුදල් පාලන ගිණුම සංශෝධනය කිරීම.

**මුදල් පාලන ගිණුම**

| | රු. | | රු. |
|---|---|---|---|
| ශේෂය | 44 000 | චෙක්පොත් ගාස්තුව | 1 000 |
| ලාභාංශ | 4 000 | ගැනුම් අඩු වීම | 9 000 |
| | | ශේ/ප/ගෙ | 38 000 |
| | 48 000 | | 48 000 |
| ශෙ/ප/ගෙ | 38 000 | | |

**බැංකු සැසඳුම පිළියෙල කිරීම**

- 2016. 04. 30 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය

| | | රු. | රු. |
|---|---|---|---|
| මුදල් පාලන ගිණුමේ නිවැරදි ශේෂය | | | 38 000 |
| එකතු කළා : | | | |
| නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක් | | | |
| | 211012 | 6 000 | |
| | 211017 | 4 000 | 10 000 |
| | | | 48 000 |
| අඩු කළා : | | | |
| උපලබ්ධි නොවූ චෙක්පත් | | | |
| | 241711 | 8 000 | |
| | 281620 | 15 000 | (23 000) |
| බැංකු ප්‍රකාශනයේ ශේෂය | | | 25 000 |

**සටහන :**

- මුදල් පාලන ගිණුමේ බැර ශේෂයක් (අයිරාවක්) පැවතිය හොත් බැංකු සැසඳුම් ප්‍රකාශනයේ අයිතම සටහන් කරන ආකාරය පැහැදිලි කර දෙන්න.

**නිපුණතාව 4.0 :** **මූලික සටහන් පොත් උපයෝගී කර ගනිමින් ගනුදෙනු ලෙජරයට පිටපත් කරයි.**

**නිපුණතා මට්ටම 4.5 :** වෙළඳ භාණ්ඩ ණයට ගැනීම සම්බන්ධ තොරතුරු පවත්වා ගනියි.


**කාලච්ඡේද සංඛ්‍යාව :** 06

**ඉගෙනුම් ඵල :**

- ගැනුම් ජර්නලය පැහැදිලි කරයි.
- ගැණුම් ජර්නලයේ ගනුදෙනු සටහන් කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛනය නම් කරයි.
- ගැණුම් ජර්නලයේ ආකෘතිය ගොඩ නගයි.
- ගැණුම් ජර්නලයේ ගනුදෙනු සටහන් කරයි
- ගැණුම් ජර්නලයේ සටහන් කළ ගනුදෙනු ලෙජරයට පිටපත් කරයි.
- ආපසු යැවුම් ජර්නලය පැහැදිලි කරයි.
- ආපසු යැවුම් ජර්නලයේ ගනුදෙනු සටහන් කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛනය නම් කරයි.
- ආපසු යැවුම් ජර්නලයේ ආකෘතිය ගොඩ නගයි.
  ආපසු යැවුම් ජර්නලයේ ගනුදෙනු සටහන් කරයි.
- ආපසු යැවුම් ජර්නලයේ සටහන් කළ ගනුදෙනු ලෙරජයට පිටපත් කරයි.

**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම**



**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසුම :**

- ගැනුම් ඉන්වොයිසි හා හරපත්වල පිටපත් කිහිපයක් පන්තියේ සිසුන්ට නිරීක්ෂණය සඳහා යොමු කර, පහත කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - ව්‍යාපාරවල, වෙළෙඳ භාණ්ඩ ගැනුම්, අත්පිට මුදලට මෙන්ම ණයට ද සිදු වන බව.
    - වෙළඳ භාණ්ඩ ණයට මිල දී ගැනුම් පිළිබඳ තොරතුරු වෙන ම මූලික පොතක සටහන් කළ යුතු බව.
    - ණයට මිල දී ගන්නා වෙළඳ භාණ්ඩ විවිධ හේතු මත සැපයුම්කරුවන් වෙත ආපසු යවන අතර, භාණ්ඩ ආපසු යැවුම් පිළිබඳ තොරතුරු ද වෙනම මූලික සටහන් පොතක සටහන් කළ යුතු බව.

**ඉගෙනුම් සඳහා යෝජිත උපදෙස් :**

- ගැනුම් ඉන්වොයිසි හා හරපත් කීපයක පිටපත් සපයා දෙන්න.
- සිසුන් කණ්ඩායම් දෙකකට වෙන් කර, ගැනුම් ඉන්වොයිසි එක කණ්ඩායමටත් හරපත් අනෙක් කණ්ඩායමටත් ලබා දෙන්න.
- ඒ ඒ කණ්ඩායමට ලැබී ඇති මූලාශ්‍ර ලේඛන කට්ටලය පරිශීලනයෙන් පසුව කාලච්ඡේදය අවසාන දිනට ණයට ගැනුම්වල වටිනාකමත් ආපසු යැවුම්වල මුළු වටිනාකමත් ගණනය කිරීමට සුදුසු ආකෘතියක් ගොඩ නැගීමට යොමු කරවන්න.
- ගැනුම්වලට අදාළ පහත සඳහන් තොරතුරු පිළිබඳ කෙටි හැඳින්වීමක් කිරීමට උපදෙස් දෙන්න.
    - ණයට ගත් දිනය හා ලියවිල්ලේ අංකය
    - සැපයුම්කරුගේ නම
    - ණයට ගත් භාණ්ඩ වර්ගය
    - ණයට ගත් ප්‍රමාණය
    - ඒකකයක මිල
    - වටිනාකම
    - වෙළෙඳ වට්ටම්
    - මුළු වටිනාකම (වෙළෙඳ වට්ටම් අඩු කිරීමෙන් පසු)
    - ආපසු යැවීමට හේතු
- එක් එක් ගනුදෙනු පොදු ලෙජරයට පිටපත් කරවන්න.
- මුළු ණයට ගැනුම් හා මුළු ආපසු යැවුම්වලට අදාළ ද්විත්ව සටහන් ලියා දැක්වීමට මග පෙන්වන්න.
- ඒවා ලෙජරයට පිටපත් කරවන්න.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

- වෙළඳ භාණ්ඩ ණයට ගැනුම් සටහන් කිරීම සඳහා පවත්වා ගෙන යන මූලික සටහන් පොත, **ගැනුම් ජර්නලය** හෙවත් ගැනුම් පොත වේ.
- ගැනුම් ජර්නලයට අදාළ මූලාශ්‍ර ලේඛනය **ඉන්වොයිසිය වේ** (ගැනුම් ඉන්වොයිසිය).
- වෙළඳ භාණ්ඩ ණයට ගැනීමේ දී භාණ්ඩවල ලකුණු කළ මිලෙන් යම් ප්‍රතිශතයක් අඩු කරන අතර, එය වෙළඳ වට්ටම් ලෙස හඳුන්වනු ලැබේ.
- වෙළඳ වට්ටම් ඉන්වොයිසියෙන් අඩු කර දැක්වීම පමණක් සිදු කරයි. ගිණුම්ගත නොකරයි.
- ව්‍යාපාරයට භාණ්ඩ ණයට සපයන සැපයුම්කරුවන් ව්‍යාපාරයේ වෙළෙඳ ණයහිමියන් වන අතර එම ණයහිමියන් ව්‍යාපාරයේ වගකීමක් ලෙස සැලකේ.
- **VAT සඳහා ලියාපදිංචි නැති ව්‍යාපාරයක ණයට ගැනුම් වාර්තා කරන ආකාරය පිළිබඳ ව සිසුන්ව දැනුවත් කරන්න.**
- VAT සඳහා ලියාපදිංචි වූ ආයතනයක ගැනුම් ජර්නලයක ආකෘතිය පහත සඳහන් පරිදි දැක්විය හැකි ය.

**ගැනුම් ජර්නලය**

| දිනය | ඉන්වොයිසි අංකය | සැපයුම්කරු | වටිනාකම (රු.) | වැට් VAT (රු.) | මුළු වටිනාකම (රු.) | ලෙජර් පිටුව |
|---|---|---|---|---|---|---|
| 2017/03/01 | 264 | මානෙල් සහ සමාගම | ×× | × | ××× | |
| 2017/03/25 | 610 | කුමාර සහ සමාගම | ×× | × | ××× | |
| 2017/03/31 | | පොදු ලෙජජරයට පිටපත් කළා | ×× | ×× | ××× | |

- ඒ ඒ දිනයන්හි වටිනාකම VAT ඇතුළත් මුළු ණයහිමි උපලෙජයේ අදාළ ණයහිමි ගිණුම්වලට වෙන් වෙන් ව බැර කළ යුතුයි.
- කාලච්ඡේදය අවසානයේ දී ගැනුම් ජර්නලයේ වටිනාකම් තීරුවේ එකතුව පොදු ලෙජරයේ ගැනුම් ගිණුමට හර කළ යුතු අතර VAT තීරුවේ එකතුව VAT ගිණුමට හර කර, පසුව VAT ද ඇතුළත් මුළු වටිනාකම තීරුවේ එකතුව ණයහිමි පාලන ගිණුමට බැර කළ යුතුයි
- එනම්, ගැනුම් ජර්නලයේ අදාළ ගනුදෙනු ලෙරජයට පිටපත් කිරීම පහත සඳහන් ආකාරයෙන් සිදු වේ.

| | | | |
|---|---|---|---|
| • ගැනුම් ගිණුම | හර | ⟶ | ගැනුම් ජර්නලයේ වටිනාකම් තීරුවේ එකතුව |
| • වැට් ගිණුම | හර | ⟶ | වැට් තීරුවේ එකතුව |
| • ණයහිමි පාලන ගිණුම | බැර | ⟶ | වැට් සහිත ගැනුම්වල මුළු වටිනාකම |

- ණයට ගත් වෙළෙඳ භාණ්ඩ පහත සඳහන් හේතූන් මත සැපයුම්කරුවන් වෙත ආපසු යැවීම සිදු කෙරේ.

- කාලය ඉකුත් වීම.
- ඇණවුමට අනුකූල නොවීම.
- නශ්‍ය වූ භාණ්ඩ එවා තිබීම.
- ඇණවුම් කාලයෙන් පසුවලැබීම.

- ආපසු යැවුම් සටහන් කිරීම සඳහා භාවිත කරන මූලික සටහන් පොත **ආපසු යැවුම් ජර්නලය** හෙවත් ආපසු යැවුම් පොත වේ.
- ආපසු යැවුම් ජර්නලයේ ගනුදෙනු සටහන් කිරීමට භාවිත කර ගන්නා මූලාශ්‍ර ලේඛනය **හරපත** වේ.

- ආපසු යැවුම් ජර්නලයක ආකෘතිය පහත ආකාරය දැක්විය හැකිය.

| දිනය | හරපත් අංකය | සැපයුම්කරු | වටනාකම (රු.) | වැට් (රු.) | මුළු වටිනාකම (රු.) | ලෙජර් පිටුව |
|---|---|---|---|---|---|---|
| 2017/03/05 | 15 | මානෙල් සහ සමාගම | ×× | × | ×× | |
| 2017/04/29 | 16 | කුමාර සහ සමාගම | × | × | ×× | |
| 2017/03/31 | | පොදු ලෙජරයට | ×× | × | ×× | |
| | | පිටපත් කළා | | | | |

- ඒ ඒ දිනයන්හි VAT ද ඇතුළත් මුළු වටිනාකම් ණයහිමි උපලෙජරයේ අදාළ ණයහිමි ගිණුම්වලට වෙන් වෙන් ව හර කළ යුතු යි.
- කාලච්ඡේදය අවසානයේ ආපසු යැවුම් ජර්නලයේ වටිනාකම් තීරුවේ එකතුව පොදු ලෙජරයේ ආපසු යැවුම් ගිණුමට බැර කළ යුතු අතර VAT තීරුවේ එකතුව VAT ගිණුමට බැර කළ යුතු ය. පසුව VAT ද ඇතුළත් මුළු වටිනාකම් තීරුවේ ණයහිමි පාලන ගිණුමට හර කළ යුතු ය.
- එනම්, ආපසු යැවුම් ජර්නලයට අදාළ ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීම පහත ආකාරයෙන් සිදු වේ.

| | | | |
|---|---|---|---|
| • අදාළ ණයහිමි පාලන ගිණුම | හර | → | මුළු වටිනාකම |
| • ආපසු යැවුම් ගිණුම | බැර | → | වටිනාකම් තීරුවේ එකතුව |
| • වැට් ගිණුම | බැර | → | වැට් තීරුවේ එකතුව |

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :**

(01) තරිඳු ව්‍යාපාරය නැවත විකිණීම සඳහා අත් ඔරලෝසු 20 ක් මිල දී ගැනීමට 2017/03/02 දින මූර්ති ව්‍යාපාරයට ඇණවුමක් යැවූ අතර, 2017/03/10 දින අත් ඔරලෝසුවක් රු. 1200/- ක් බැගින් මිල සඳහන් කර, තරිඳු ව්‍යාපාරය වෙත ඔරලෝසු 20 ක් එවීය. ඉල්ලුම් කළ වර්ගයට වඩා වෙනස්වීම මත ඔරලෝසු 10ක් 2017/03/20 වෙනි දින මූර්ති ව්‍යාපාරය වෙත ආපසු යැවීය.

ඉහත සිද්ධියට අනුව තරිඳු ව්‍යාපාරයේ ගනුදෙනු සටහන් කරන මූලික සටහන් පොත් හා ඊට අදාළ මූලාශ්‍ර ලේඛන පහත වගුවේ සඳහන් කිරීම.

| අදාළ මූලික සටහන් පොත | මූලාශ්‍ර ලේඛන |
|---|---|
| • | • |
| • | • |

(02) VAT ලියාපදිංචි නොවූ ආයතනයක ආපසු යැවුම් ජර්නලයේ එකතුව පොදු ලෙජරයේ වාර්තා කරන ආකාරය හඳුනා ගැනීම.

(i) ගැනුම් ගිණුමට හා ණයහිමි ගිණුමට බැර කරයි.
(ii) ණයහිමි ගිණුමෙහි හා ආපසු යැවුම් ගිණුමෙහි හර කරයි.
(iii) ආපසු යැවුම් ගිණුමෙහි හා ණයහිමි පාලන ගිණුමෙහි බැර කරයි.
(iv) ණයහිමි පාලන ගිණුමෙහි හර කර ආපසු යැවුම් ගිණුමට බැර කරයි.
(v) ආපසු යැවුම් ගිණුමෙහි පමණක් බැර කරයි.

(03) පහත ප්‍රකාශ සත්‍ය ද, අසත්‍ය ද යන්න දැක්වීම.
(i) ගැනුම් ජ'නලය පිළියෙළ කිරීමෙන් පසු වෙළෙඳ වට්ටම් ගිණුම්ගත කෙරේ. (....)
(ii) ඒ ඒ හරපතේ ශුද්ධ වටිනාකම අදාළ ණයහිමි ගිණුම්වලට හර කෙරේ. (....)

(04) **ගැනුම් ජ'නලය**

| දිනය | ඉන්වොයිසි අංකය | සැපයුම්කරු | වටිනාකම (රු.) | වැට් 10% | මුළු වටිනාකම (රු.) | ලෙජර් පිටුව |
|---|---|---|---|---|---|---|
| 2017/03/05 | 224 | නීතා | 4 500 | 450 | 4 950 | |
| 2017/03/08 | 315 | ගීතා | 12 800 | 1 280 | 14 080 | |
| 2017/03/12 | 228 | ගීතා | 8 200 | 820 | 9 020 | |
| 2017/03/18 | 415 | විනීතා | 6 000 | 600 | 6 600 | |
| 2017/03/25 | 820 | අමිතා | 9 500 | 950 | 10 450 | |
| 2017/03/31 | | පොදු ලෙජරයට පිටපත් කළා | 41 000 | 4 100 | 45 100 | |

**ආපසු යැවුම් ජ'නලය**

| දිනය | හරපත් අංකය | සැපයුම්කරු | වට්නාකම (රු.) | වැට් 10% | මුළු වට්නාකම (රු.) | ලෙජර් පිටුව |
|---|---|---|---|---|---|---|
| 2017/03/10 | 42 | ගීතා | 1500 | 150 | 1 650 | |
| 2017/03/22 | 43 | විනීතා | 800 | 80 | 880 | |
| 2017/03/31 | | පොදු ලෙජරයට පිටපත් කළා | 2 300 | 230 | 2 530 | |

- සටහන : VAT ප්‍රතිශතය 10% කි.
- ඉහත සඳහන් අගයන් අදාළ දිනට ලෙජරයට පිටපත් කිරීම.

**නිපුණතාව 4.0 :** **මූලික සටහන් පොත් උපයෝගී කර ගනිමින් ගනුදෙනු ලෙජරයට පිටපත් කරයි.**

**නිපුණතා මට්ටම 4.6 :** වෙළඳ භාණ්ඩ ණයට විකුණුම් පිළිබඳ තොරතුරු පවත්වා ගනියි.


**කාලච්ඡේද සංඛ්‍යාව :** 06

**ඉගෙනුම් ඵල :**

- විකුණුම් ජර්නලය පැහැදිලි කරයි.
- ගනුදෙනු සටහන් කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛනය නම් කරයි.
- විකුණුම් ජර්නලයේ ආකෘතිය ගොඩ නගයි.
- විකුණුම් ජර්නලයේ ගනුදෙනු වාර්තා කරයි.
- විකුණුම් ජර්නලයේ ගනුදෙනු ලෙජරයට පිටපත් කරයි.
- ආපසු එවුම් ජර්නලය පැහැදිලි කරයි.
- ආපසු එවුම් ජර්නලයේ ගනුදෙනු සටහන් කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛනය නම් කරයි.
- ආපසු එවුම් ජර්නලයේ ආකෘතිය ගොඩ නගයි.
- ආපසු එවුම් ජර්නලයේ ගනුදෙනු සටහන් කරයි.
- ආපසු එවුම් ජර්නලයේ සටහන් කළ ගනුදෙනු ලෙජරයට පිටපත් කරයි.

**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම**



**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසුම**

- විකුණුම් ඉන්වොයිසි හා බැරපත්වල පිටපත් පන්තියේ සිසුන්ට නිරීක්ෂණය සඳහා යොමු කර, පහත සඳහන් කරුණු මතු වන පරිදි සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - ව්‍යාපාරවල , භාණ්ඩ විකිණීම අත්පිට මුදලට මෙන්ම ණයට ද සිදුවන බව.
  - වෙළඳ භාණ්ඩ ණයට විකිණීම පිළිබඳ තොරතුරු වෙන ම මූලික පොතක සටහන් කළ යුතු බව.
  - ණයට විකුණනු ලබන වෙළඳ භාණ්ඩ විවිධ හේතු මත ගනුදෙනුකරුවන් විසින් ආපසු එවනු ලබන අතර, භාණ්ඩ ආපසු එවුම් පිළිබඳ තොරතුරු ද වෙනම මූලික පොතක සටහන් කළ යුතු බව.

**ඉගෙනුම් සඳහා යෝජිත උපදෙස් :**

- සකස් කර ගත් ඉන්වොයිසි හා බැරපත්වල පිටපත් සිසුන්ට සපයා දෙන්න.
- සිසුන් කණ්ඩායම් දෙකකට වෙන් කර විකුණුම් ඉන්වොයිසි එක කණ්ඩායමකටත් බැරපත් අනෙක් කණ්ඩායමටත් ලබා දෙන්න.
- ඒ ඒ කණ්ඩායමට ලැබී ඇති මූලාශ්‍ර ලේඛන කට්ටලය පරිශීලනයෙන් පසුව කාලච්ඡේදය අවසානයේ ණයට විකුණුම්වල මුළු වටිනාකම ගණනය කිරීමට සුදුසු ආකෘතියක් ගොඩ නැගීමට යොමු කරන්න.
- විකුණුම්වලට අදාළ පහත සඳහන් තොරතුරු පිළිබඳ කෙටි හැඳින්වීමක් කිරීමට උපදෙස් දෙන්න.
  - භාණ්ඩ ණයට විකුණූ දිනය හා ලියවිල්ලේ අංකය
  - ගනුදෙනුකරුගේ නම
  - ණයට විකුණූ භාණ්ඩ වර්ගය හා ප්‍රමාණය
  - ඒකකයක මිල
  - වටිනාකම
  - වෙළෙඳ වට්ටම්
  - මුළු වටිනාකම (වෙළෙඳ වට්ටම් අඩු කළ පසු)
- කාලච්ඡේදය අවසානයේ මුළු ආපසු එවුම් වටිනාකම ගණනය කිරීම සඳහා සුදුසු ආකෘතියක් ගොඩ නැගීමට මග පෙන්වන්න.
- ආපසු එවුම්වලට අදාළ පහත සඳහන් තොරතුරු පිළිබඳ කෙටි හැඳින්වීමක් කිරීමට මග පෙන්වන්න.
  - ආපසු එවූ දිනය
  - ලියවිල්ලේ අංකය
  - ගනුදෙනුකරුගේ නම
  - ආපසු එවූ භාණ්ඩ වර්ගය හා ප්‍රමාණය
  - ඒකකයක මිල
  - වටිනාකම

- වට්ටම්
- මුළු වටිනාකම (වෙළෙඳ වට්ටම් අඩු කිරීමෙන් පසු)

- ආපසු එවීමට හේතු
- එක් එක් ගනුදෙනු ණයගැති උප ලෙජරයට පිටපත් කිරීමට යොමු කරන්න.
- මුළු ණයට විකුණුම් හා මුළු ආපසු එවුම්වලට අදාළ ද්විත්ව සටහන් ලිවීමට මග පෙන්වන්න.
- ද්විත්ව සටහන් පොදු ලෙජරයට පිටපත් කරවන්න.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

- වෙළඳ භාණ්ඩ ණයට විකුණුම් සටහන් කිරීම සඳහා පවත්වා ගෙන යන මූලික සටහන් පොත, **විකුණුම් ජර්නලය හෙවත් විකුණුම් පොත** වේ.
- විකුණුම් ජර්නලයට අදාළ මූලාශ්‍ර ලේඛනය **ඉන්වොයිසිය** වේ (විකුණුම් ඉන්වොයිසිය).
- වෙළඳ භාණ්ඩ ණයට විකිණීමේ දී භාණ්ඩවල ලකුණු කළ මිලෙන් යම් ප්‍රතිශතයක් අඩු කරන අතර එය **වෙළඳ වට්ටම්** ලෙස හඳුන්වනු ලැබේ.
- වෙළඳ වට්ටම් ඉන්වොයිසියෙන් අඩු කර දැක්වීම පමණක් සිදු කරයි. ගිණුම්ගත නොකරයි.
  - ව්‍යාපාරය භාණ්ඩ ණයට විකුණූ විට වෙළෙඳ ණයගැතියන් ඇතිවන අතර, එම ණයගැතියන් ව්‍යාපාරයේ වත්කම් ලෙස සැලකේ.
  - VAT ලියාපදිංචි වී නැති ව්‍යාපාරයක ණයට විකුණුම් පිළිබඳ වාර්තාකරන ආකාරය සිසුන්ට දැනුවත් කරන්න.
  - VAT ලියාපදිංචි ආයතනයක විකුණුම් ජර්නලයක ආකෘතිය පහත සඳහන් පරිදි දැක්විය හැකි ය.

| දිනය | ඉන්වොයිසි අංකය | ගැනුම්කරු | වටිනාකම (රු.) | වැට් (රු.) | මුළු වටිනාකම (රු.) | ලෙජර් පිටුව |
|---|---|---|---|---|---|---|
| 2017/03/01 | 520 | දුමින්ද ට්‍රේඩර්ස් | ×× | × | ××× | |
| 2017/03/20 | 521 | කමල් හා සහෝදරයෝ | ×× | × | ××× | |
| 2017/03/31 | | පොදු ලෙජරයට පිටපත් කළා | ×× | × | ××× | |

- ඒ ඒ දිනයන්හි දී මුළු වටිනාකම හා VAT ණයගැති උප ලෙජයේ අදාළ ණයගැති ගිණුම්වලට හර කරනු ලැබේ.
- කාලච්ඡේදය අවසානයේ VAT ද ඇතුළත් මුළු වටිනාකම් තීරුවේ එකතුව පොදු ලෙජරයේ ණයගැති පාලන ගිණුමට හර කර වටිනාකම් තීරුවේ එකතුව විකුණුම් ගිණුමට ද VAT තීරුවේ එකතුව VAT ගිණුමට ද බැර කළ යුතුයි.
- එනම්, විකුණුම් ජර්නලයේ එක් එක් එකතුව පොදු ලෙජරයට පිටපත් කිරීම පහත සඳහන් ආකාරයෙන් සිදු වේ.

| | | |
|---|---|---|
| ණයගැති පාලන ගිණුම | හර | → VAT සහිත විකුණුම්වල මුළු වටිනාකම |
| වැට් ගිණුමට | බැර | → VAT තීරුවේ එකතුව |
| විකුණුම් ගිණුම | බැර | → විකුණුම් ජර්නලයේ වටිනාකම් තීරුවේ එකතුව |

- ණයට විකුණු වෙළඳ භාණ්ඩ පහත සඳහන් හේතූන් මත ගනුදෙනුකරුවන් විසින් ආපසු එවීම සිදු කෙරේ.
    - කාලය ඉකුත් වීම.
    - ඇණවුමට අනුකූල නොවීම.
    - නෂ්‍ය වූ භාණ්ඩ වීම.
- ආපසු එවුම් සටහන් කිරීම සඳහා භාවිත කරන මූලික සටහන් පොත **ආපසු එවුම් ජර්නලය** හෙවත් ආපසු **එවුම් පොත** වේ.
- ආපසු එවුම් ජර්නලයේ ගනුදෙනු සටහන් කිරීමට පදනම් කර ගන්නා මූලාශ්‍ර ලේඛනය **බැරපත** වේ.
- VAT වැට් ලියාපදිංචි නැති ව්‍යාපාරයක ආපසු එවුම් පිළිබඳ වාර්තා කරන ආකාරය සිසුන් ව දනුවත් කරන්න.
- VAT වැට් ලියාපදිංචි වූ ආයතනයක ආපසු එවුම් ජර්නලයක ආකෘතිය පහත ආකාරය පහත දක්වේ.

| දිනය | බැරපත් අංකය | ගැනුම්කරු | වටිනා කම (රු.) | වැට් (රු.) | මුළු වටිනාකම (රු.) | ලෙජර් පිටුව |
|---|---|---|---|---|---|---|
| 2017/03/06 | 13 | දුමින්ද ට්‍රේඩර්ස් | ×× | × | ×× | |
| 2017/04/25 | 14 | කුමාර සහ සහෝදරයෝ | ×× | × | ×× | |
| 2017/03/31 | | පොදු ලෙජරයට පිටපත් කළා | ×× | × | ×× | |

- ඒ ඒ දිනයන්හි VAT ද අතුළත් වටිනාකම ණයගැති උප ලෙජයේ අදාළ ණයගැති ගිණුම්වලට බැර කළ යුතු වේ.
- කාලච්ඡේදය අවසානයේ දී වටිනාකම් තීරුවේ එකතුව පොදු ලෙජරයේ ආපසු එවුම් ගිණුමට හර කර, VAT තීරුවේ එකතුව VAT ගිණුමට හර කළ යුතුයි. පසුව VAT ද ඇතුළත් මුළු වටිනාකම් තීරුවේ එකතුව ණයගැති පාලන ගිණුමට බැර කළ යුතු ය.
- එනම්, ආපසු එවුම් ජර්නලයේ එකතුව පොදු ලෙජරයට පිටපත් කිරීම පහත ආකාරයෙන් සිදු වේ.

| | | | |
|---|---|---|---|
| ආපසු එවුම් ගිණුම | හර | → | වටිනාකම් තීරුවේ එකතුව |
| වැට් ගිණුම | හර | → | VAT තීරුවේ එකතුව |
| ණයගැති පාලන ගිණුම | බැර | → | VAT සහිත මුළු වටිනාකම් තීරුවේ එකතුව |

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :**

(01) විකුණුම් ජර්නලය සහ ආපසු එවුම් ජ'නලය හා සම්බන්ධ පහත ප්‍රශ්නලට පිළිතුරු සැපයීම.

| ජ'නලය | සටහන් කෙරෙන ගනුදෙනු | මූලාශ්‍ර ලේඛනය |
|---|---|---|
| • විකුණුම් ජ'නලය | ............______________ | __________........ |
| • ආපසු එවුම් ජ'නලය ______________ | ........................ -------------- | .............................. |

(02) ලී බඩු මිලට ගෙන නැවත විකිණීම සිදු කෙරෙන මොරටු ලී බඩු වෙළඳසැලේ විකුණුම් ජර්නලයේ සටහන් කෙරෙන ගනුදෙනුව තේරීම.

(i) වසරක් ප්‍රයෝජනයට ගෙන තිබූ මෝටර් රථය රු. 350,000 කට සරත්ට විකිණීම.

(ii) රු. 35 000 ක පිරිවැය වූ ලී බඩු තොගයක් රු. 50 000 ක මුදලට විකිණීම.

(iii) විකිණීම සඳහා රු. 60 000 කට ලී බඩු තොගයක් සුරංග ව්‍යාපාරයෙන් මිල දී ගැනීම.

(iv) ලී බඩු තොගයක් විපුලට රු. 68 000 කට විකිණීම.

(v) රු. 30 000 කට මිලට ගෙන තිබූ උපකරණ රු. 42 000 කට විකිණීම.

(03) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය යන්න දැක්වීම.

(i) ඒ ඒ බැරපතේ වටිනාකම ආපසු එවුම් ජ'නලයේ සටහන් කර අදාළ දිනයේ ම උප ලෙජරයේ ණයගැති ගිණුමට පමණක් බැර කරයි. (.....-----)

(ii) ව්‍යාපාරයක සිදුවන සියලුම විකුණුම් වටිනාකම විකුණුම් ජර්නලයක සටහන් කරයි. (.....-----)

(4) වෙළෙඳ භාණ්ඩ ණයට විකිණීමේ දී 10% ක වෙළෙඳ වට්ටමක් අඩු කිරීම VAT සඳහා ලියාපදිංචි වූ ශාලිකා වෙළෙඳ ව්‍යාපාරයේ විකුණුම් ප්‍රතිපත්තියයි. 2017 මාර්තු මාසයේ මෙම ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

| දිනය | විස්තරය |
|---|---|
| 2017/03/04 | ඉන්වොයිසි අංක 145 යටතේ සමනලීට විකුණුම් රු. 30 000 කි |
| 2017/03/08 | ඉන්වොයිසි අංක 146 යටතේ මාතලීට විකුණුම් රු. 45 000 කි. |
| 2017/03/10 | ඉන්වොයිසි අංක 147 යටතේ සඳමාලිට විකුණුම් රු. 28 000 කි |
| 2017/03/15 | 2017/03/10 වන දින සඳමාලිට විකුණු භාණ්ඩ සියල්ල ඉල්ලූ වර්ගයට වඩා වෙනස්වීම මත ආපසු එවා තිබුණි. (බැරපත් අංකය 18) |
| 2017/03/20 | ඉන්වොයිසි අංක 148 යටතේ සිරිමලීට විකුණුම් රු. 36 000 කි. |
| 2017/03/25 | 2017/03/20 වන දින සිරිමලීට විකුණු භාණ්ඩවලින් රු. 8 000 ක තොගය කල් ඉකුත්වීම මත ආපසු එවා තිබුණි. (බැරපත් අංකය 19) |
| | (සටහන් : සියලුම විකුණුම් VAT රහිත ව දක්වා ඇත. VAT ප්‍රතිශතය 15% කි) |

**අවශ්‍ය වන්නේ :** 1. විකුණුම් ජර්නලය හා ආපසු එවුම් ජර්නලය

2. අදාළ ලෙජර් ගිණුම් (පොදු ලෙජරය හා ණයගැති ලෙජරය)

**නිපුණතාව 4.0 : මූලික සටහන් පොත් උපයෝගී කර ගනිමින් ගනුදෙනු ලෙජරයට පිටපත් කරයි.**

**නිපුණතා මට්ටම 4.7 :** ගනුදෙනු පොදු ජර්නලය ඇසුරින් සටහන් කරයි.


**කාලච්ඡේද සංඛ්‍යාව :** 06

**ඉගෙනුම් ඵල :**

- පොදු ජර්නලය පැහැදිලි කරයි.
- පොදු ජර්නලයේ සටහන් කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛන නම් කරයි.
- පොදු ජර්නලයේ සටහන් කරන ගනුදෙනු වර්ග නම් කරයි.
- පොදු ජර්නලයේ ආකෘතිය ගොඩ නගයි.
- පොදු ජර්නලයේ ගනුදෙනු සටහන් කර ලෙජරයට පිටපත් කරයි.

**මූලික පද හා සංකල්ප**

**සංකල්ප සිතියම**



**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසුම** • පහත සඳහන් ගනුදෙනු සටහන් කිරිමට භාවිත කරන මූලික සටහන් පොත් මොනවා ද යන්න සිසුන්ගේ අදහස් විමසන්න.

1. අත්පිට විකුණුම්
2. සේවක වැටුප් ගෙවීම.
3. වෙළඳ භාණ්ඩ ණයට ගැනීම.
4. වෙළෙඳ භාණ්ඩ ආපසු යැවීම.
5. වෙළඳ භාණ්ඩ ණයට විකිණීම.
6. වෙළඳ භාණ්ඩ ආපසු එවීම.
7. සුළු වියදම් සඳහා ගෙවීම.
8. දේපළ, පිරියත හා උපකරණ ණයට ගැනීම.
9. දේපළ, පිරියත හා උපකරණ ණයට විකිණීම.
10. ගිණුම් තැබීමේ දී සිදු වූ වැරදි නිවැරදි කිරීම.
11. යන්ත්‍රයක වාර්ෂික ක්ෂය වාර්තා කිරීම

- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - අංක 01-07 දක්වා ගනුදෙනු සටහන් කිරීමට යොදා ගන්නා මූලික පොත් විශේෂ ජර්නල් වර්ගයට අයත් බව.
  - අංක 08, 09, 10, 11 ගනුදෙනු සටහන් කිරීමට යොදා ගන්නා උපයෝගී පොත **පොදු ජර්නලය** බව.
  - අංක 08, 09, 10, 11 යන ගනුදෙනුවලට අදාළ මූලාශ්‍ර ලේඛනය ජර්නල් වවුචරය බව.

**ඉගෙනුම් සඳහා යෝජිත උපදෙස් :**

- පහත සඳහන් ව්‍යාපාර ගනුදෙනු කෙරෙහි සිසුන්ගේ අවධානය යොමු කරවන්න.
- පරිගණක මිලට ගෙන නැවත විකිණීම සිදු කරන NET com ව්‍යාපාරයේ ගිණුම් කාලච්ඡේදය 2017/03/31 අවසන් වේ. පහත තොරතුරු ඔබට සපයා ඇත.

(1) 2016/04/01 දිනට පැවති ශේෂයන්

| | රු. |
|---|---|
| මෝටර් රථ | 500 000 |
| ගොඩනැගිලි | 600 000 |
| යන්ත්‍ර | 200 000 |
| ණයගැතියෝ | 60 000 |
| භාණ්ඩ තොග (පරිගණක) | 800 000 |
| මුදල් | 200 000 |
| බැංකු ණය | 500 000 |
| ණයහිමියෝ | 80 000 |
| ප්‍රාග්ධනය | ? |

(2) ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු. 60 000 ක ලී බඩු ශක්ති ව්‍යාපාරයෙන් මිල දී ගැනීම
(3) ව්‍යාපාරයේ ප්‍රයෝජනයට ගෙන තිබූ රු. 300 000 ක් වටිනා මෝටර් රථය රු. 350 000 කට සමන්සිරිට විකිණීම.
(4) පරිගණක මිල දී ගැනීමට ගෙවනු ලැබූ රු. 45 000 මුදල් ගෙවීම් ජර්නලයේ නිවැරදිව සටහන් කර, අත්පිට ගැනුම් විශ්ලේෂණ තීරුවේ එකතුව යන්ත්‍ර ගිණුමට ඇතුළත් කර තිබීම.

- සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා ගනුදෙනු 4 අහඹු ලෙස බෙදා දෙන්න.
- ඒ ඒ කණ්ඩායමට සපයා ඇති ගනුදෙනුවට අදාළ ව පහත ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට යොමු කරන්න.
  (i) මූලාශ්‍ර ලේඛනය
  (ii) මූලික සටහන් පොත
  (iii) වාර්තා කරන ආකාරය (ද්විත්ව සටහන) දැක්වීම.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

- විශේෂ ජර්නල්වල සටහන් නොකරන ගනුදෙනු, සටහන් කෙරෙන මූලික පොත **පොදු ජර්නලය** හෙවත් ප්‍රධාන ජර්නලය ලෙස හැඳින්වේ.
- පොදු ජර්නලයේ ගනුදෙනු සටහන් කිරීමට යොදා ගන්නා මූලාශ්‍ර ලේඛනය, ජර්නල් වවුචරය වේ.
- පොදු ජර්නලයක ආකෘතිය පහත ආකාරයට දැක්වේ.

**පොදු ජර්නලය**

| දිනය | ජර්නල් වවුචර් අංකය | විස්තරය | ලෙජර් පිටුව | හර (රු.) | බැර (රු.) |
|---|---|---|---|---|---|
| 20... / ..../ ... | | ........................ ගිණුම (හර)<br>........................ ගිණුම<br>{ ................................................<br>...................... (සංලක්ෂ්‍යය) } | | × × | × × |

- පොදු ජර්නලයේ ගනුදෙනු සටහන් කිරීමේ දී එම ගනුදෙනුවේ ද්විත්ව සටහන දක්වනු ලබයි.
- එම ගනුදෙනුවට අදාළ කෙටි පැහැදිලි කිරීම ''**සංලක්ෂය**'' ලෙස දක්වයි.
- පොදු ජර්නලයේ සටහන් කළ ගනුදෙනු ලෙජරයට ඒ ආකාරයෙන් ම පිටපත් කරයි.
- පහත සඳහන් ගනුදෙනු වර්ග පොදු ජර්නලයේ සටහන් කරනු ලබයි.

- ආරම්භක සටහන්
- ගැලපුම් සටහන්
- වැරදි නිවැරදි කිරීමේ සටහන්
- දේපළ, පිරියත හා උපකරණ ණයට ගැනීම්, ණයට විකිණීම්, ඉවත් කිරීම් හා හුවමාරු කිරීම් සම්බන්ධ සටහන්
- පියවීමේ සටහන්
- ලෙජරයට පිටපත් කිරීමේ සටහන්
- වෙනත් සටහන්

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :**

(1) (i) පොදු ජර්නලය පැහැදිලි කිරිම.
(ii) පොදු ජර්නලයක සටහන් කෙරෙන ගනුදෙනු වර්ග 6ක් ලිවීම.

(2) පොදු ජර්නලයක සටහන් ඇතුළත් කිරීමේ දී උපයෝගී කර ගන්නා මූලාශ්‍ර ලේඛනය තේරීම.
(i) ලදුපත වේ.
(ii) ඉන්වොයිසිය වේ.
(iii) ගෙවීම් වවුචරය වේ.
(iv) ජර්නල් වවුචරය වේ.
(v) බැරපත වේ.

(3) පහත සඳහන් ප්‍රකාශන සත්‍ය ද අසත්‍ය ද යන්න ඉදිරියෙන් දැක්වීම.
(i) පොදු ජර්නලය මූලික සටහන් පොතක් මෙන් ම ලෙජර් ගිණුමක් ලෙසට ද කටයුතු කරයි. ( )
(ii) ගනුදෙනුවට අදාළ ''හර හා බැර'' සටහන පොදු ජර්නලයක සටහන් කර ඊට අදාළ පැහැදිලි කිරීම, සංලක්ෂය මගින් සිදු කෙරේ. ( )

(4) සමනලීගේ ව්‍යාපාරයට අදාළ පහත සඳහන් තොරතුරු ඔබට ඉදිරිපත් කරයි.

(i) 2017/01/01 දින ශේෂයන්

| | රු. |
|---|---|
| යන්ත්‍රෝපකරණ | 40 000 |
| ලී බඩු | 25 000 |
| බඩු තොග | 18 000 |
| මුදල් | 60 000 |
| ණයගැතියෝ | 40 000 |
| ණයහිමියෝ | 50 000 |
| ප්‍රාග්ධනය | ? |

(i) සමනලී ව්‍යාපාරයේ කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා රු. 16 000 ක ලී බඩු ණයට මිල දී ගැනීම.
(ii) යන්ත්‍රයක් රු. 22 000 කට සපුමලී ට විකිණීම.
(iii) සේවක වැටුප් සඳහා ගෙවූ රු. 8 000 ක් විවිධ වියදම් ගිණුමේ සටහන් කර තිබීම.

අවශ්‍ය වන්නේ :
(i) පොදු ජර්නලය
(ii) ලෙජර් ගිණුම් පිළියෙල කිරීම

**නිපුණතාව 4.0 :** **මූලික සටහන් පොත් උපයෝගී කර ගනිමින් ගනුදෙනු ලෙජරයට පිටපත් කරයි.**

**නිපුණතා මට්ටම 4.8 :** පාලන ගිණුම් හා උපලෙජර් අතර සම්බන්ධතාව දක්වයි.


**කාලච්ඡේද සංඛ්‍යාව :** 07

**ඉගෙනුම් ඵල :**

- උප ලෙජර් පැහැදිලි කර, ඒවා සකස් කිරීමේ අවශ්‍යතාව විස්තර කරයි.
- ණයගැති හා ණයහිමි උප ලෙජර් පිළියෙල කරයි.
- උප ලෙජරය හා පොදු ලෙජරය අතර සම්බන්ධතාව දක්වයි.
- පාලන ගිණුම් පැහැදිලි කරයි.
- පාලන ගිණුම් හා උප ලෙජර් ශේෂ ලැයිස්තු සසඳයි.

**මූලික පද හා සංකල්ප**

**සංකල්ප සිතියම**



**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසුම**

- නගරයේ ඇති, පහසු ගෙවීම් ක්‍රමයට භාණ්ඩ අලෙවි කරන ආයතනයක් ගැන අදහස මතු කරමින් සිසුන් සමග සංවාදයක් ඇති කර ගන්න. එවැනි ව්‍යාපාරයක ලෙජරයේ ඇති ගිණුම්වලින් වැඩි ප්‍රමාණයක් ණයගැතියන් හා ණයහිමියන් බවත්, ණයගැතියන්ගේ හා ණයහිමියන්ගේ පෞද්ගලික ගිණුම් ''වෙනම ලෙජරයක්'' ලෙස පවත්වා ගෙන යා හැකි බවත් ඒවා උප ලෙජර් වශයෙන් හඳුන්වන බවත් සිසුන් සමග සාකච්ඡා කරන්න.

  මෙලෙස ගනුදෙනුකරුවන් වැඩිවන විට, ගනුදෙනු සටහන් කිරීම සංකීර්ණ වන අතර පහත ආකාරයේ ගැටලු මතු වන බව සාකච්ඡා කරන්න.
    - පොදු ලෙජරය අනවශ්‍ය ලෙස දීර්ඝ වීම.
    - ගනුදෙනු වාර්තා කිරීමේ දී වැරදි සිදුවීමේ ප්‍රවණතාවය වැඩි වීම.
    - ශේෂ පිරික්සුම ඉතා දීර්ඝ වීම.
    - මූල්‍ය වාර්තා පිළියෙල කිරීම, සංකීර්ණ වීම / ප්‍රමාද වීම.
  - ඉහත ගැටලුවලට පිළියමක් ලෙස සුදුසු පාලන ක්‍රමයක් අවශ්‍ය වීම.
  - මේ සඳහා පිළියමක් ලෙස උප ලෙජරයක් සහිත ගිණුම් ක්‍රමයක් භාවිත කළ හැකි වේ.
  - උප ලෙජර්වල ඇති සියලු ගිණුම් නියෝජනය කිරීම සඳහා පොදු ලෙජරයේ **පාලන ගිණුමක්** පවත්වා ගනී. ව්‍යාපාරයකට පාලන ගිණුම් තම අවශ්‍යතාව පරිදි යොදා ගත හැකි ය.

    උදා : වෙළෙඳ ණයගැතියන් වෙනුවෙන් - ණයගැති පාලන ගිණුම
    වෙළෙඳ ණය හිමියන් වෙනුවෙන් - ණයහිමි පාලන ගිණුම

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

**ක්‍රියාකාරකම 01 :**

- පහත දැක්වෙන්නේ ජයංගනීගේ ව්‍යාපාරයේ 2017 ජනවාරි මස සිදු වූ ණයට විකුණුම් පිළිබඳ තොරතුරු වේ.

(රු.000)

| නම | ණයට විකුණුම් රු. | ආපසු එවුම් රු. | මුදල් ලැබීම් රු. | දුන් වට්ටම් රු. | බොල් ණය රු. |
|---|---|---|---|---|---|
| අජන්ත | 1 400 | 160 | 300 | 40 | 100 |
| වික්‍රම | 850 | 20 | 400 | 30 | - |
| සඳලි | 500 | 150 | 250 | 100 | - |
| | 2 750 | 330 | 950 | 170 | 100 |

- ඉහත තොරතුරු කාර්ය පත්‍රිකාවක් ලෙස පන්තියේ ළමුන් කාණ්ඩ කර කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස ලබා දීම.

- ගනුදෙනු මූලික පොත්වල සටහන් කරවන්න.
- ඒවා පොදු ලෙජරයට හා උප ලෙජරයට පිටපත් කරවන්න.
- පොදු ලෙජරයේ ණයගැති පාලන ගිණුම වෙත අවධානය යොමු කරවන්න.
- උප ලෙජරයෙන් ණයගැති ශේෂ ලැයිස්තුවක් පිළියෙල කරවන්න.

- කණ්ඩායම් අනාවරණ නිර්මාණශීලීව ද සාමූහිකව ද සමස්ථ පන්තියට ඉදිරිපත් කරවන්න.
- කණ්ඩායම් අනාවරණයන් ලබා ගැනීමේ දී මූලික පොත් හා ලෙජර් ගිණුම් අතර සම්බන්ධතාවය ගොඩ නැගීමට පහත මාතෘකා යටතේ සාකච්ඡාව මෙහෙයවන්න.
  - මූලික පොත් හා උප ලෙජරය අතර සම්බන්ධතාව
  - මූලික පොත් හා පොදු ලෙජරය අතර සම්බන්ධතාව
  - උප ලෙජරය හා පාලන ගිණුම අතර ඇති සම්බන්ධය පැහැදිලි කිරීම
  - උප ලෙජරයට මූලික පොත්වලින් දෛනික ව තනි සටහන් ලෙස පිටපත් කිරීම.
  - කාලච්ඡේදය අවසානයේ පොදු ලෙජරයට මූලික පොත්වලින් ගනුදෙනුවල එකතුව ද්විත්ව සටහන් ක්‍රමයට පිටපත් කිරීම
  - නිශ්චිත දිනකට පොදු ලෙජරයේ ණයගැති පාලන ගිණුමේ ශේෂය, උප ලෙජරයේ ණයගැති ශේෂ ලැයිස්තුවේ එකතුවට සමාන බව දැක්වීම

ආදර්ශ විසඳුම්

**විකුණුම් ජර්නලය** **(රු.000)**

| දිනය | ඉන්වොයිසි අංකය | ගනුදෙනුකරු | වටිනාකම රු. | ලෙ. පි. |
|---|---|---|---|---|
| | | අජන්ත | 1 400 | |
| | | වික්‍රම | 850 | |
| | | සඳලි | 500 | |
| | | පොදු ලෙජරයට පිටපත් කළා | 2 750 | |

**ආපසු එවුම් ජර්නලය**

**(රු.000)**

| දිනය | බැරපත් අංකය | ගනුදෙනුකරු | වටිනාකම රු | ලෙ. පි. |
|---|---|---|---|---|
| | | අජන්ත | 160 | |
| | | වික්‍රම | 20 | |
| | | සඳලි | 150 | |
| | | පොදු ලෙජරයට පිටපත් කළා | 330 | |

**මුදල් ලැබීම් ජර්නලය**

**(රු.000)**

| දිනය | ලදුපත් අංකය | විස්තරය | දුන් වට්ටම් | විශ්ලේෂණය | | |
|---|---|---|---|---|---|---|
| | | | | එකතුව | ණයගැති ලැබීම් | ලෙ. පි. |
| | | අජන්ත | 40 | 300 | 300 | |
| | | වික්‍රම | 30 | 400 | 400 | |
| | | සඳලි | 100 | 250 | 250 | |
| | | | 170 | 950 | 950 | |

විකුණුම් ගිණුම (රු.000)

| | | | |
|---|---|---|---|
| | | ණයගැති පාලන | 2750 |

ආපසු එවුම් ගිණුම (රු.000)

| | | | |
|---|---|---|---|
| ණයගැති පාලන | 330 | | |

දුන් වට්ටම් ගිණුම (රු.000)

| | | | |
|---|---|---|---|
| ණයගැති පාලන | 170 | | |

බොල් ණය ගිණුම (රු.000)

| | | | |
|---|---|---|---|
| ණයගැති පාලන | 100 | | |

ණයගැති පාලන ගිණුම

| | (රු.000) | | (රු.000) |
|---|---|---|---|
| විකුණුම් | 2 750 | ආපසු එවුම් | 330 |
| | | දුන් වට්ටම් | 170 |
| | | මුදල් | 950 |
| | | බොල් ණය | 100 |
| | | ප/ගෙ ශේ. | 1 200 |
| | 2 750 | | 2 750 |
| ඉ/ගෙ | 1 200 | | |

## ණයගැති ලෙජරය

අජන්ත ගිණුම (රු.000)

| | | | |
|---|---|---|---|
| විකුණුම් | 1 400 | මුදල් | 300 |
| | | දුන් වට්ටම් | 40 |
| | | ආපසු | 160 |
| | | බොල් ණය | 100 |
| | | ශේ/ප/ගෙ | 800 |
| | 1 400 | | 1 400 |
| ඉ/ගෙ/ශේ | 800 | | |

වික්‍රම ගිණුම (රු.000)

| | | | |
|---|---|---|---|
| විකුණුම් | 850 | ආපසු | 20 |
| | | මුදල් | 400 |
| | | දුන් වට්ටම් | 30 |
| | | ශේෂය ප/ගෙ | 400 |
| | 850 | | 850 |
| ඉ/ගෙ/ශේ | 400 | | |

සඳලි ගිණුම (රු.000)

| | | | |
|---|---|---|---|
| විකුණුම් | 500 | ආපසු එවුම් | 150 |
| | | මුදල් | 250 |
| | | දුන් වට්ටම් | 100 |
| | 500 | | 500 |

ණයගැති උපලෙජරයෙන් උපුටාගත් ශේෂ ලැයිස්තුව

(රු.000)

| | |
|---|---|
| අජන්ත | 800 |
| වික්‍රම | 400 |
| සඳලි | - |
| | 1 200 |

පොදු ජර්නලය

| දිනය | ජ.පි. | විස්තරය | හර | බැර |
|---|---|---|---|---|
| | | බොල් ණය - හර | 100 | |
| | | ණයගැති පාලන ගිණුම | | 100 |
| | | (රු. 100 ක බොල් ණය කපා හැරීම) | | |

පොදු ලෙජරයේ ගිණුම් ශේෂ ඇසුරින් 2017 ජනවාරි 31 දිනට ශේෂ පිරික්සුමක් පිළියෙල කළ හැකි ය.

ජයංගනීගේ ව්‍යාපාරය

2017/01/31 දිනට ශේෂ පිරික්සුම

(රු දහස්)

| ගිණුමේ නම | ලෙ.පි. | හර (රු.) | බැර (රු.) |
|---|---|---|---|
| විකුණුම් ගිණුම | | | 2 750 |
| ආපසු එවුම් ගිණුම | | 330 | |
| දුන් වට්ටම් | | 170 | |
| බොල් ණය ගිණුම | | 100 | |
| ණයගැති පාලන | | 1 200 | |
| මුදල් | | 950 | |
| | | 2 750 | 2 750 |

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට උපදෙස් :**

- සමාන වර්ගයේ ගනුදෙනු රාශියක් සිදුවන ව්‍යාපාරවල ගැටලු රාශියක් මතු වන නිසා පොදු ලෙජරයට අමතර ව උප ලෙජර් පවත්වා ගත හැකි ය. උප ලෙජරය තුළ තනි සටහන් පමණක් ඇතුළත් කෙරේ. උදා : ණයගැති ලෙජරය
- මෙම උපලෙජරයේ ඇති ගිණුම් තුලනය කිරීමෙන් ශේෂ ලැයිස්තුවක් පිළියෙල කළ හැකිය. පොදු ලෙජරය තුළ ද්විත්ව සටහන් ක්‍රමය අනුගමනය කරන අතර, ණයගැතියන් හා ණයහිමියන් සම්බන්ධ ගනුදෙනුවල දී පාලන ගිණුම් උපයෝගී කර ගනී.
- ණයගැති පාලන ගිණුමක ආකෘතියක් පහත පරිදි වේ.

**ණයගැති පාලන ගිණුම**

| හර | රු. | බැර | රු. |
|---|---|---|---|
| 4/1 ශේෂය ඉ/ගෙ | XX | 4/1 ශේෂය ඉ/ගෙ | X |
| මුළු ණයට විකුණුම් | XX | ආපසු එවුම් | XX |
| අහිමි කළ දුන් වට්ටම් | XX | දුන් වට්ටම් | XX |
| ණයගැතියන්ගෙන් අය කළ පොලී | XX | මුදල් | XX |
| චෙක්පත් අගරු වීම් | XX | බොල් ණය | XX |
| ණයගැතියන්ට ආපසු ගෙවීම් | XX | ණයගැති ලෙජරයෙන් ණයහිමි | |
| ශේෂය ප/ගෙ | X | ලෙජරයට මාරු කිරීම් (හිලව් කිරීම) | XX |
| | | ශේ/ප/ගෙ | XX |
| | XX | | XX |
| ශේෂය ඉ/ගෙ | XX | ශේෂය ඉ/ගෙ | X |

- පොදු ලෙජරයේ පාලන ගිණුම සැකසීමේ දී ද්විත්ව සටහන් ක්‍රමයට ගනුදෙනු සටහන් කිරීම සිදු වේ.

උදා : ණයට විකුණුම් —— { ණයගැති පාලන ගිණුම - හර
විකුණුම් ගිණුම - බැර }


ණයගැති මුදල් ලැබීම —— { මුදල් පාලන ගිණුම/මුදල් ගිණුම - හර
ණයගැති පාලන ගිණුම - බැර }

- උප ලෙජරයේ ඇති ණයගැති සහ ණයහිමි ගිණුම් වෙනුවෙන් පොදු ලෙජරය තුළ පාලන ගිණුමක් පවත්වා ගනියි.
- පොදු ලෙජරය තුළ ද්විත්ව සටහන සම්පූර්ණ වීම නිසා පොදු ලෙජරයෙන් ශේෂ පිරික්සුමක් පිළියෙල කළ හැකිය.
- උප ලෙජරය තුළ ද්විත්ව සටහන සම්පූර්ණ නොවීම නිසා ශේෂ පිරික්සුමක් පිළියෙල කළ නො හැකි ය.
- පොදු ලෙජරයේ පාලන ගිණුමේ ශේෂය, උප ලෙජරයේ ඇති ශේෂ ලැයිස්තුවේ එකතුවට සමාන විය යුතු ය.
- එසේ ශේෂ සමාන නොවන්නේ නම්, ශේෂ සැසඳීම සඳහා සැසඳුම් ලේඛනයක් පිළියෙල කළ යුතු ය.

  උදා : ණයගැති ශේෂ සැසඳීමේ ලේඛනය

- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පහත ගැලීම් සටහන පිළිබඳ ව සිසුන්ගේ අවධානය යොමු කරවන්න.

**ණයගැති උපලෙජරය හා ණයගැති පාලන ගිණුම**



**ක්‍රියාකාරකම 02**

ක්‍රියකාරකම 01 සිදුකිරීමෙන් පසුව සිසුන්ගේ පෙර දැනුම විමසමින් බුද්ධි කලම්බනයක නිරත කරවන්න. මෙහි දී සිසුන්ගෙන් පහත පද පිළිබඳව අදහස් විමසන්න.

පොදු ලෙජරය, උප ලෙජරය, ණයගැති පාලන ගිණුම, ණය ගැති උප ලෙජරය, ණයගැති ශේෂ ලැයිස්තුව

පොදු ලෙජරයට හා උප ලෙජරයේ ගනුදෙනු හා සිද්ධි වාර්තා කිරීමේ දී අයිතමයන් ලබා ගැනීම.

- බුද්ධි කලම්බනයෙන් පසුව ව්‍යාපාරවල ණයහිමියන් විශාල සංඛ්‍යාවක් සිටින විට ණයහිමි උප ලෙජරයක් පවත්වා ගන්නා බව සිහිපත් කරමින් ක්‍රියාකාරකම් 02 පත්‍රිකාව කණ්ඩායම් අතර බෙදා දෙන්න.

**ක්‍රියාකාරකම් 02 පත්‍රිකාව**

නිම්මිගේ ව්‍යාපාරයේ 2017 අප්‍රේල් මාසයේ ණයහිමියන් සමග කළ ගනුදෙනුවල සාරාංශය පහත දැක්වේ.

රු. 000 වලිනි.

| ණය හිමියා | ණයට ගැනුම් | ආපසු යැවුම් | ගෙවූ මුදල් | ලද වට්ටම් |
|---|---|---|---|---|
| දිස්නා | 3 000 | 300 | 1 800 | 200 |
| නිමේෂිකා | 2 000 | 200 | 900 | 100 |
| මහේෂි | 1 000 | 100 | 450 | 50 |
| එකතුව | 6000 | 600 | 3 150 | 350 |

- ඉහත පත්‍රිකාව පන්තියේ සිසුන් කාණ්ඩ කර කණ්ඩායම්වලට ලබා දෙන්න.
- කණ්ඩායම් අනාවරණ ලබා ගැනීම සඳහා පහත පත්‍රිකාව ද කණ්ඩායම් අතර බෙදා හරින්න.

**නිම්මිගේ ව්‍යාපාරයේ මූලික පොත්**

ගැනුම් ජර්නලය

රු.000'

| දිනය | ණය හිමියා | | වටිනාකම |
|---|---|---|---|
| | | | |

ගැනුම් ගිණුම හර
ණයහිමි පාලන ගිණුම බැර

ආපසු යැවුම් ජර්නලය

රු.000'

| දිනය | ණය හිමියා | | වටිනාකම |
|---|---|---|---|
| | | | |

ණයහිමි පාලන ගිණුම හර
ආපසු යැවුම් ගිණුම බැර

මුදල් ගෙවීම් ජර්නලය

රු.000'

| දිනය | විස්තරය | ලද වට්ටම් | වටිනාකම | ගෙවීම් විශ්ලේෂණය | |
|---|---|---|---|---|---|
| | | | | අත්පිට ගැණුම් | ණයහිමි ගෙවීම් |
| | | | | | |
| | | | | | |

ණයහිමි පාලන ගිණුම හර
ලද වට්ටම් ගිණුම බැර

ණයහිමි පාලන ගිණුම හර
මුදල් ගිණුම බැර

**නිම්මිගේ ව්‍යාපාරයේ පොදු ලෙජරය**

ණයහිමි පාලන ගිණුම

ගැණුම් ගිණුම

ආපසු යැවුම් ගිණුම

ලද වට්ටම් ගිණුම

දිස්නා (ණයහිමි) ගේ ගිණුම

නිමේෂාගේ ගිණුම

මහේෂිගේ ගිණුම

ණයහිමි ශේෂ ලැයිස්තුව

දිස්නා .........................

නිමේෂිකා .........................

මහේෂී .........................

- ඒ ඒ කණ්ඩායමට පත්‍රිකා ලබාදීමෙන් පසුව පහත උපදෙස් ලබා දෙන්න.
    - ගනුදෙනු මූලික පොත්වල සටහන් කිරීමට.
    - ගනුදෙනු පොදු ලෙජරයේ හා උපලෙජරයේ අදාළ ගිණුම්වල සටහන් කිරීමට.
    - උප ලෙජරයේ පෞද්ගලික ගිණුම්වල ශේෂ එකතුවෙන් ශේෂ ලැයිස්තුවක් පිළියෙල කරවීම.
- කණ්ඩායම් අනාවරණයන් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- පොදු ලෙජරය තුළ සෑම විටම ද්විත්ව සටහන් ක්‍රමයට ගනුදෙනු හා සිද්ධි වාර්තා කරයි. උප ලෙජරය තුළ තනි සටහන් ක්‍රමයට ගනුදෙනු හා සිද්ධි වාර්තා කරයි.
- පොදු ලෙජරය තුළ ද්විත්ව සටහන් ක්‍රමය අනුගමනය කරන බැවින් ශේෂ පිරික්සුමක් පිළියෙල කළ හැකි ය.
- උප ලෙජරය තුළ තනි සටහන් ක්‍රමය අනුගමනය කරන බැවින් ශේෂ ලැයිස්තුවක් පමණක් පිළියෙල කරයි.
- යම් නිශ්චිත දිනකට පොදු ලෙජරයේ ණයහිමි පාලන ගිණුමේ ශේෂය උප ලෙජරයේ ණයහිමි ශේෂ ලැයිස්තුවේ එකතුවට සමාන විය යුතුයි.
- **ණයගැති පාලන ගිණුම පිළියෙල කිරීමෙන් ලද අවබෝධය තුළින් ණයහිමි පාලන ගිණුමේ ආකෘතිය හා ණයහිමියන් සම්බන්ධ ගනුදෙනු, ලෙජරයට පිටපත් කරන ආකාරයත්, ශේෂ සැසඳීම කරන ආකාරයත් පිළිබඳ ක්‍රියාකාරකමක් සකස් කර සිසුන්ට ලබා දෙන්න.**

**ක්‍රියාකාරකම (03)**

ක්‍රියාකාරකම (02) අවසානයේ ක්‍රියාකාරකම (03) ට සිසුන් යොමු කරන්න. මෙහිදී ප්‍රශ්නකරණය හෝ බුද්ධි කලම්බන ක්‍රමයට, පෙර ණයගැති හා ණයහිමි පාලන ගිණුම් හා උපලෙජර් පිළිබඳ දැනුම විමසන්න. මෙහි දී පහත පද හා අදහස් පිළිබඳ සිසුන්ගේ අවබෝධය පරික්ෂා කිරීමට සාකච්ඡාවක් පවත්වා ගෙන යා යුතු ය.

- පාලන ගිණුම් පිළියෙල කිරීමට තොරතුරු / ගනුදෙනු හා සිද්ධි ලබාගැනීම
- උප ලෙජරයන් තුළ පෞද්ගලික ගිණුම්වල වාර්තා කිරීමට ගනුදෙනු හා සිද්ධි ලබා ගැනීම.

- පහත සඳහන් ක්‍රියාකාරකම් පත්‍රිකා කණ්ඩායම් අතර බෙදා හරින්න.

**ක්‍රියාකාරකම (03) පත්‍රිකාව**

ලක්ෂිතගේ ව්‍යාපාරයේ 2017/03/31 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය රු. 128 000/- කි. මෙදිනට ණයගැති උපලෙජරයේ ඇති ශේෂ ලැයිස්තුවේ එකතුව රු. 121 000 කි. ගිණුම් විගණනයේ දී පහත දෝෂ අනාවරණය කර ගෙන ඇත.

1. කුෂාන්ට ණයට විකුණුම් රු. 12 000 ක ඉන්වොයිසිය පොත්වලින් මග හැරීම.
2. ආපසු එවුම් ජර්නලය එකතු කිරීමේ දී රු. 3 000 ක් අඩු වෙන් එකතු කර තිබීම.
3. මාධවගෙන් ලද රු. 15 000 ක් මුදල් ලැබීම් ජර්නලයේ රු. 1 500 ක් ලෙස වාර්තා කිරීම.
4. සුමුදුට දුන් වට්ටම් රු. 500 ක් ලෙස මුදල් ලැබීම් ජර්නලයෙ සටහන් කළත්, සුමුදුගේ ගිණුමේ සටහන් නො කිරීම.
5. චාරුනීගේ ගිණුමේ ශේෂය රු. 4 500 ශේෂ ලැයිස්තුවට ගෙන නැත.

ඉහත ක්‍රියාකාරකම් පත්‍රිකාව (03) සමග පහත පැවරුම් පත්‍රිකා (02) කණ්ඩායම්වලට ලබාදිය යුතුය.

**පැවරුම් පත්‍රිකා අංක (01)**

ලක්ෂිතගේ ව්‍යාපාරයේ සිදු වී ඇති වැරදි ආශ්‍රයෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| වරද | වරද සිදු වී ඇත්තේ පොදු ලෙජරය තුළ ද උප ලෙජරය තුළ ද යන්න | පොදු ලෙජරය තුළ නිවැරදි කළ යුතු ආකාරය (ද්විත්ව සටහන) |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |

**පැවරුම් පත්‍රිකා අංක (03)**

ණයගැති පාලන ගිණුමේ ශේෂය, ශේෂ ලැයිස්තුවේ දැනට පවතින ශේෂය සමග සැසඳීමේ ලේඛනයක් පිළියෙල කරන්න.

ශේෂ සැසඳීමේ ලේඛනය

(රු.)

| | | |
|---|---|---|
| ණයගැති පාලන ගිණුමේ ශේෂය | | |
| (+) | | |
| (-) | | |
| උප ලෙජරයේ ශේෂ ලැයිස්තුවේ පවතින ශේෂය | | 121 000 |

**පැවරුම් පත්‍රිකා අංක (03)**

ලක්ෂිතගේ ව්‍යාපාරයේ ණයගැති පාලන ගිණුම සංශෝධනය කරන්න.

සංශෝධිත ණයගැති පාලන ගිණුම

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ/ශේෂය | 128 000 | | |

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක :**

(01) උප ලෙජරයක් පවත්වා ගැනීමේ අරමුණක් නොවන්නේ මින් කුමක් ද? යන්න තේරීම

(i) පොදු ලෙරජය අනවශ්‍ය තරමට විශාලවීම වැලැක්වීම

(ii) වැරදි සිදුවීමට ඇති ඉඩකඩ ප්‍රමාණය අවම කිරීම

(iii) ශේෂ පිරික්සුම ඉතා දීර්ඝ වීම වැලැක්වීම

(iv) ගිණුම්කරණ කටයුතු කීප දෙනෙකු අතර බෙදාහැර අභ්‍යන්තර පාලනය විධිමත් කිරීම

(v) ගිණුම් තැබීමේ පිරිවැය අවම වීම

(02) සඳුනිගේ ව්‍යාපාරයේ 2017 ජනවාරි මාසයේ සිදු වූ පහත ගනුදෙනු සැලකිල්ලට ගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම.

(රු.)

| ණයගැතියා | 2017/1/1 ශේෂය | මුළු විකුණුම් | ණයට විකුණුම් මුළු විකුණුම්වලින් | ආපසු එවුම් | ලද මුදල | දුන් වට්ටම් |
|---|---|---|---|---|---|---|
| අජේන් | 20 000 | 400 000 | 80% ක් | 30 000 | 90 000 | 10 000 |
| රශිනි | 30 000 | 500 000 | 70% ක් | 40 000 | 180 000 | 20 000 |
| පසිඳු | 40 000 | 600 000 | 50% ක් | 30 000 | 180 000 | 20 000 |
| රවිඳු | (10 000) බැර | 700 000 | 60% ක් | 20 000 | 300 000 | 20 000 |
| එකතුව | 80 000 | 2 200 000 | - | 120 000 | 750 000 | 70 000 |

අවශ්‍ය වන්නේ :

1. මුදල් ලැබීම් ජර්නලය, විකුණුම් ජර්නලය, ආපසු එවුම් ජර්නලය
2. පොදු ලෙජරයේ අදාළ ගිණුම්
3. ණයගැති උප ලෙජරයේ අදාළ ගිණුම් හා ශේෂ ලැයිස්තුව

(03) (i) උප ලෙජරය පවත්වා ගැනීමේ ප්‍රයෝජන හතරක් ලිවීම.

(ii) විශාල පරිමාණයේ ව්‍යාපාරයක ණයගැති හා ණයහිමි උප ලෙජරයක් නොතිබුණහොත් මතුවන ගැටලු දැක්වීම.

(iii) එක් එක් ගනුදෙනු හා බැඳුණු මූලික ලියවිලි හා මූලික පොත් ණයහිමියන් හා සම්බන්ධ ගනුදෙනු ආශ්‍රයෙන් දැක්වීමට.

(iv) මේ සඳහා පහත ආකෘතිය භාවිත කිරීම.

| ගනුදෙනුව | මූලාශ්‍ර ලියවිල්ල | මූලික පොත |
|---|---|---|
| 1. ආරම්භක ශේෂයන් | ජර්නල් වවුචරය | පොදු ජර්නලය |
| 2. ණයට ගැනුම් | ........................................ | ........................................ |
| 3. ........................................ | ........................................ | ........................................ |
| 4. ........................................ | ........................................ | ........................................ |
| 5. ........................................ | ........................................ | ........................................ |

**නිපුණතාව 4.0 : මූලික සටහන් පොත් උපයෝගී කර ගනිමින් ගනුදෙනු ලෙජරයට පිටපත් කරයි.**

**නිපුණතා මට්ටම 4.9 :** මූලික සටහන් පොත් පිළියෙල කර, ලෙජර් ගිණුම් තුලනය කර මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරයි.


**කාලච්ඡේද සංඛ්‍යාව** : 13

**ඉගෙනුම් ඵල :**

- ලෙජර් ගිණුම් තුලනය කර, ශේෂ පිරික්සුමක් පිළියෙළ කරයි.
- ශේෂ පිරික්සුමේ ඇතුළත් තොරතුරු ඇසුරින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරයි.

**මූලික පද හා සංකල්ප :**


**සංකල්ප සිතියම**



**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසුම :**

- ගිණුම්කරණ ක්‍රියාවලිය දැක්වෙන ගැලීම් සටහන් සිසුන්ට ඉදිරිපත් කර පහත කරුණු අනාවරණය වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.




- ගනුදෙනු ප්‍රථමයෙන් ම සටහන් කළ යුතු මූලික සටහන් පොත් හා ඒවාට අදාළ මූලාශ්‍ර ලේඛන
- අදාළ ලෙජර් ගිණුම්
- ලෙජර් ගිණුම් තුලනය කිරීම
- ලෙජර් ගිණුම්වල ශේෂයන් ඇතුළත් කර, ශේෂ පිරික්සුම පිළියෙල කිරීම.
- කාලච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රතිඵලය ලබා ගැනීමට ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීම
- කාලච්ඡේදය අවසාන දිනට මූල්‍ය තත්ත්වය පෙන්නුම් කිරීමට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීම.

**ඉගෙනුම් සඳහා යෝජිත උපදෙස් :**

- පහත දැක්වෙන ව්‍යාපාර තොරතුරු සියලු සිසුන්ට ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 01 :**

2017. 03. 31 න් අවසන් වූ මාසයේ හංසලී ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

(1) මෙම ව්‍යාපාරයේ මුදල් ගනුදෙනු පහත දැක්වේ. සියලුම ලැබීම් එදින ම බැංකුගත කරයි.

| | | රු. |
|---|---|---|
| 2017. 03. 01 | ව්‍යාපාරයේ ආරම්භ කිරීමට යෙදූ මුදල් | 300 000 |
| 2017. 03. 02 | අත්පිට ගැනුම් - චෙක්පතකින් | 80 000 |
| 2017. 03. 03 | කඩකුලී ගෙවීම් - චෙක්පතකින් | 4 000 |
| 2017. 03. 08 | බැංකු ණය ගැනීම් | 200 000 |
| 2017. 03. 10 | අත්පිට විකුණුම් | 42 000 |
| 2017. 03. 12 | සිරිල්ගෙන් මුදල් ලැබීම් | 4 800 |
| | අඩු කළ වට්ටම (දුන් වට්ටම) | 200 |
| 2017. 03. 15 | ඇල්බට්ට මුදල් ගෙව්වා (ණයහිමි) - චෙක්පතකින් | 5 700 |
| | (ලද වට්ටම) | 300 |
| 2017. 03. 16 | සුළු මුදල් භාරකරුට ලබා දුන් අග්‍රිමය - චෙක්පතකින් | 2 000 |
| | ගැණුම් අත්පිට - චෙක්පතකින් | 8 000 |
| 2017. 03. 19 | බීටාට ගෙව්වා (ණය හිමි) - චෙක්පතකින් | 7 600 |
| | අඩු කළ වට්ටම (ලද වට්ටම) | 400 |
| 2017. 03. 20 | බැංකු ණය ගෙව්වා - චෙක්පතකින් | 4 000 |
| 2017. 03. 22 | අත්පිට විකුණුම් | 45 000 |
| 2017. 03. 24 | ජගත්ගෙන් චෙක්පතක් ලැබුණා | 12 000 |
| 2017. 03. 26 | ජගත්ගෙන් මුදල් ලැබීම් | 7 600 |
| | අඩු කළ වට්ටම් (දුන් වට්ටම) | 600 |
| 2017. 03. 31 | සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කරන ලදි - චෙක්පතකින් | |

(2) වෙළෙඳ භාණ්ඩ ණයට ගැනුම් පිළිබඳ විස්තර :

| දිනය | ඉන්වොයිසි අංකය | විස්තරය | වටිනාකම (රු.) |
|---|---|---|---|
| 2017. 03. 05 | 420 | ඇල්ෆා | 34 000 |
| | | අඩුකළ වෙළඳ වට්ටම් 10% | |
| 2017. 03. 08 | 318 | බීටා | 40 000 |
| | | අඩු කළ වෙළඳ වට්ටම 5% | |
| 2017. 03. 15 | 423 | ඇල්ෆා | 20 000 |
| 2017. 03. 23 | 324 | බීටා | 48 000 |

වෙනත් තොරතුරු :

(i) 2017. 03. 12 රු. 150 000 ක් වටිනා කාර්යාල උපකරණ කුමාර සමාගමෙන් මිලට ගැනීම.
(ii) 2017. 03. 31 කුරේ සමාගමෙන් ලී බඩු මිල දී ගත්තා. රු. 88 000

(3) ආපසු යැවුම් පිළිබඳ තොරතුරු

| දිනය | හරපත් අංකය | විස්තරය | වටිනාකම රු.) |
|---|---|---|---|
| 2017. 03. 10 | 01 | ඇල්ෆා (කල් ඉකුත්වීම) | 6 000 |
| 2017. 03. 28 | 02 | බීටා (/23 මිල දී ගත් භාණ්ඩ) (ඉල්ලූ වර්ගය වෙනස් වීම) | 7 000 |

(4) වෙළෙඳ භාණ්ඩ ණයට විකුණුම් හා ආපසු එවුම් පිළිබඳ තොරතුරු

| දිනය | ඉන්වොයිසි අංකය | බැරපත් අංකය | විස්තරය | වටිනාකම (රු.) |
|---|---|---|---|---|
| 2017. 03. 07 | 001 | | සිරිල් (අඩු කළ වෙළඳ වට්ටම් 10%) | 28 000 |
| 2017. 03. 12 | | 001 | සිරිල් (කල් ඉකුත් වීම) | 5 000 |
| 2017. 03. 15 | 002 | | ජගත් (අඩු කළ වෙළඳ වට්ටම් 10%) | 45 000 |
| 2017. 03. 22 | | 002 | ජගත් (ඉල්ලූ වර්ණයට වඩා වෙනස් වීම) | 6 000 |
| 2017. 03. 27 | (003 | | සිරිල් | 15 000 |

(5) සුළු වියදම් ගෙවීම් සම්බන්ධ ගනුදෙනු (රු.)

| | | | | | |
|---|---|---|---|---|---|
| 3/17 | සංග්‍රහ වියදම් | 180 | 3/24 | තැපැල් ගාස්තු | 160 |
| 3/18 | තැපැල් ගාස්තු | 220 | 3/25 | පිරිසිදු කිරීම් | 80 |
| 3/20 | මුද්දර ගැනීමට | 120 | 3/28 | ලිපි ද්‍රව්‍ය | 115 |
| 3/22 | පිරිසිදු කිරීමේ වියදම් | 150 | 3/30 | ලිපි ද්‍රව්‍ය | 85 |

- ඉහත ව්‍යාපාර සිද්ධියේ ඇතුළත් තොරතුරු අධ්‍යයනය කිරීමට සිසුන් යොමු කරන්න.

පහත මූලික පොත් සිසු කණ්ඩායම්වලට ලබා දෙන්න.

1. මුදල් ලැබීම් ජර්නලය
2. මුදල් ගෙවීම් ජර්නලය
3. සුළු මුදල් ගෙවීම් ජර්නලය
4. ගැනුම් ජර්නලය
5. ආපසු යැවුම් ජර්නලය
6. විකුණුම් ජර්නලය
7. ආපසු එවුම් ජර්නලය
8. පොදු ජර්නලය

- සිසු කණ්ඩායමට ලද මූලික පොතට අදාළ ගනුදෙනු තෝරා ගෙන එය පිළියෙල කිරීමට උපදෙස් දෙන්න.
- සෑම කණ්ඩායමක් ම පිළියෙල කළ මූලික පොත් කණ්ඩායම් අතර හුවමාරු කර ගනිමින් ලෙජරය පිළියෙල කිරීමට මගපෙන්වන්න.
- සෑම කණ්ඩායමකට ම 2017. 03. 31 දිනට ශේෂ පිරික්සුමක් පිළියෙල කිරීමට උපදෙස් දෙන්න.
- 2017. 03. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය පිළියෙල කරවන්න.
- 2017. 03. 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කරවන්න.
- කණ්ඩායම්වල පිළිතුරු නිවැරදිදැයි සොයා බලන්න.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

- මූලික පොත්වල සටහන් කරන ලද ගනුදෙනු පොදු ලෙජරයේ, ලෙජර් ගිණුම්වලට පිටපත් කරනු ලැබේ.
- එම ලෙජර් ගිණුම තුළනය කර ලබා ගන්නා ශේෂ ඇසුරින් ශේෂ පිරික්සුම පිළියෙල කරයි.
- ශේෂ පිරික්සුමේ ඇතුළත්ව ඇති ආදායම් හා වියදම් ගිණුම්වල ශේෂ යොදා ගනිමින් කාලච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රතිඵලය ගණනය කිරීම සඳහා ආදායම් ප්‍රකාශනය පිළියෙල කරයි.
- ශේෂ පිරික්සුමේ ඇතුළත් ව ඇති වත්කම් හිමිකම් හා වගකීම් ගිණුම්වල ශේෂ යොදා ගනිමින්, කාලච්ඡේදය අවසාන දිනට මූල්‍ය තත්ත්වය අනාවරණය කිරීම සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කරයි.

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක :**

01. පහත සඳහන් ගනුදෙනු සටහන් කිරීමේ දී යොදා ගන්නා මූලික සටහන් පොත් හා මූලාශ්‍ර ලේඛන දැක්වෙන පරිදි වගුවක් පිළියෙල කිරීම.

(i) මුදල හා චෙක්පත් ලැබීම්
(ii) බැංකු ජංගම ගිණුම මගින් සිදු කරන ගෙවීම්
(iii) වෙළෙඳ භාණ්ඩ ණයට මිල දී ගැනීම
(iv) වෙළෙඳ භාණ්ඩ ණයට විකිණීම
(v) වෙළෙඳ භාණ්ඩ ආපසු යැවීම
(vi) වෙළෙඳ භාණ්ඩ ආපසු එවීම
(vii) සුළු වියදම් ගෙවීම
(viii) ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා දේපළ, පිරියත හා උපකරණ ණයට ගැනීම

02. මූල්‍ය ප්‍රකාශනයක් ලෙස සැලකිය හැකි අයිතමය තේරීම.

(i) මුදල් ලැබීම් ජර්නලය
(ii) ශේෂ පිරික්සුම
(iii) ආදායම් ප්‍රකාශනය
(iv) සුළු මුදල් ගෙවීම් ජර්නලය
(v) පොදු ජර්නලය

03. මූලික සටහන් පොත්, ලෙජරය, ශේෂ පිරික්සුම යන කොටස් ආවරණය වන පරිදි ව්‍යාපාරික ගනුදෙනු ඇතුළත් කර අභ්‍යාසයක නිරත කරවීම.

**නිපුණතාව 4.0** : **මූලික සටහන් පොත් උපයෝගී කර ගනිමින් ගනුදෙනු ලෙජරයට පිටපත් කරයි.**

**නිපුණතා මට්ටම 4.10** : ගනුදෙනු වාර්තා කිරීමේ දී සිදුවන වැරදි නිවැරදි කරයි.


**කාලච්ඡේද සංඛ්‍යාව** : 12

**ඉගෙනුම් ඵල** :

- ගනුදෙනු වාර්තා කිරීමේ දී වැරදි සිදු විය හැකි බව පැහැදිලි කරයි.
- ශේෂ පිරික්සුමෙන් අනාවරණය නොවන වැරදි ඉදිරිපත් කරයි.
- ශේෂ පිරික්සුමෙන් අනාවරණය වන වැරදි ඉදිරිපත් කරයි.
- වැරදි නිවරදි කිරීම සඳහා පොදු ජර්නලය යොදා ගනියි.
- වැරදි නිවැරදි කිරීමෙන් පසු මූල්‍ය ප්‍රතිඵලයට හා මූල්‍ය තත්ත්වයට වන බලපෑම දක්වයි.

**මූලික පද හා සංකල්ප**

**සංකල්ප සිතියම**



**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසුම**

- පාසලේ සිදුවන එසේත් නැතිනම් සිදුවීමට ඉඩ ඇතැයි සිතන යම් පාසල් සංස්කෘතියට නොගැලපෙන වැරැද්දක් පිළිබඳ විමසමින් සිසුන් සමග සාකච්ඡාවක් ගොඩ නගන්න.

උදා : 1. සිසුවෙකු නවීන විලාසිතාවකට අනුව කොණ්ඩය සකස් කර ගෙන පාසලට පැමිණීම.

ඉහත වැරදි නිසා පොදුවේ පාසලේ පැවතිය යුතු ආචාර ධර්ම පද්ධතියට හානි සිදු වන බවත්, සිසුන්ගේ මානසික ඒකාග්‍රතාවය බිඳ වැටීමෙන් අධ්‍යාපනයට බාධා සිදු විය හැකි බවත් එම නිසා පොදු ආචාර ධර්ම පද්ධතියකට අනුව හැසිරිය යුතු බවත් සාකච්ඡා කරන්න.

මේ ආකාරයට ගිණුම්කරණයට අදාළව ද පොදු පිළිගත් මූලධර්ම සම්ප්‍රදායන් සංකල්ප පවතින බවත්, ඒවාට පටහැනිව කටයුතු කිරීමෙන් ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශවයන්ට ව්‍යාපාරය පිළිබඳ සාවද්‍ය තොරතුරු ලැබෙන බවත්, එම නිසා නිවැරදි තීරණ ගැනීමට නොහැකි බවත්, එකී දෝෂයන් නිවැරදි කිරීමේ අවශ්‍යතාවය සිසුන් සමග සාකච්ඡා කරන්න.

**ඉගෙනුම් සඳහා යෝජිත උපදෙස් :**

- පහත කාර්ය පත්‍රිකාව පිටපත් හතරක් පන්තියේ ළමුන් කණ්ඩායම් හතරකට ලබා දෙන්න.

**පැවරුම් පත්‍රිකාව**

ලෝචනාගේ ව්‍යාපාරයේ 2017 ජනවාරි මාසයේ මුල් සතියේ ගනුදෙනු මෙසේ ය.

| | | (රු. 000) |
|---|---|---|
| 1. | අත්පිට විකුණුම් | 9 000 |
| 2. | අත්පිට ගැණුම් | 3 000 |
| 3. | සේවක වැටුප් ගෙවීම් | 80 |
| 4. | මුදල් ගැනිලි | 50 |
| 5. | මෝටර් රථයක් මිලට ගැනුම් | 2 500 |
| 6. | මෝටර් රථ ධාවන වියදම් ගෙවීම් | 15 |
| 7. | ගෙවල් කුලී ආදායම් ලැබීම් | 60 |

මෙම ගනුදෙනු ව්‍යාපාරයේ ආධුනික ගිණුම් ලිපිකරු සටහන් කර ඇත්තේ පහත පරිදි වේ.

මුදල් ගිණුම (රු.000)

| | | | | | |
|---|---|---|---|---|---|
| (1) | විකුණුම් | 90 000 | (2) | ගැනුම් | 3 000 |
| (7) | ගෙවල් කුලී ආදායම් | 60 | (3) | සේවක වැටුප් | 80 |
| (7) | ගෙවල් කුලී ආදායම් | 60 | (5) | මෝටර් රථ | 250 |
| | | | (6) | මෝටර් රථ ධාවන වියදම් | 15 |
| | | | | ශේ/ප/ගෙ | 86 775 |
| | | 90 120 | | | 90 120 |
| | ශේ/ප/ගෙ | 86 775 | | | |

විකුණුම් ගිණුම (රු.000)

| | | | | |
|---|---|---|---|---|
| ශේෂය ප/ගෙ | 90 000 | (1) | මුදල් | 90 000 |
| | 90 000 | | | 90 000 |
| | | | ශේෂය ඉ/ගෙ | 90 000 |

ගැනුම් ගිණුම (රු.000)

| | | | | |
|---|---|---|---|---|
| (2) | මුදල් | 300 | ශේ/ප/ගෙ | 300 |
| | | 300 | | 300 |
| | ශේෂය ප/ගෙ | 300 | | |

සේවක වැටුප් ගිණුම (රු.000)

| | | | | |
|---|---|---|---|---|
| ශේ/ප/ගෙ | 80 | (3) | මුදල් | 80 |
| | 80 | | | 80 |
| | | | ශේ/ප/ගෙ | 80 |

මෝටර් රථ (රු.000)

| | | | | |
|---|---|---|---|---|
| (5) | මුදල් | 250 | ශේ/ප/ගෙ | 265 |
| (6) | මුදල් | 15 | | |
| | | 265 | | 265 |
| | ශේෂය/ඉ/ගෙ | 265 | | |

ගෙවල් කුලී ආදායම් (රු.000)

| | | | |
|---|---|---|---|
| ශේ/ප/ගෙ | 120 | මුදල් | 60 |
| | | මුදල් | 60 |
| | 120 | | 120 |
| | | ශේෂය/ඉ/ගෙ | 120 |

ඉහත ලෙජර් ගිණුම්වල ශේෂ ඇසුරෙන් පහත ශේෂ පිරික්සුම පිළියෙල කර ඇත.

**ලෝචනාගේ ව්‍යාපාරයේ**

**2017. 01. 07 දිනට ශේෂ පිරික්සුම**

(රු.000)

| ගිණුමේ නම | ලෙජර පිටුව | හර | බැර |
|---|---|---|---|
| මුදල් | | 86 775 | - |
| විකුණුම් | | - | 90 000 |
| ගැණුම් | | 300 | - |
| සේවක වැටුප් | | - | 80 |
| මෝටර් රථ | | 265 | - |
| ගෙවල් කුලී ආදායම | | - | 120 |
| අවිනිශ්චිත ගිණුම | | 2 860 | - |
| | | 90 200 | 90 200 |

| | |
|---|---|
| බැර පැත්ත | 90 200 |
| හර පැත්ත | (87 340) |
| අවිනිශ්චිත ගිණුම (වෙනස) | 2 860 |

- මෙම පිරික්සුමෙන් අනාවරණය නොවන වැරදි (වෙනසට බලපාන වැරදි) හා අනාවරණය වන වැරදි (වෙනසට බලනොපාන වැරදි) වෙන් කර හඳුනා ගැනීමට යොමු කරන්න.
- කණ්ඩායම් අනාවරණ ඉදිරිපත් කරන අවස්ථාවේ දී පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡා කරන්න.
  - සටහන් කළ මෙම ගනුදෙනු පිළිබඳ සිසු අදහස් මතුකර ගැනීම.
  - සටහන් කර ඇති ගනුදෙනුවල නිවැරදිතාවය පිළිබඳ සිසු අදහස් විමසීම.
  - පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - ලෝචනාගේ ව්‍යාපාරයේ ගනුදෙනු සටහන් කිරීමේදී පහත සඳහන් වැරදි සිදු වී ඇති බව.

      අංක 01 ද්විත්ව සටහනම සමාන වටිනාකමකින් වැඩි වීම.

      අංක 02 ද්විත්ව සටහන වටිනාකම් දෙකකින් සටහන් වීම.

      අංක 03 ගනුදෙනුව ගිණුම් දෙකේ ම එක ම පැත්තේ සටහන් කිරීම.

      අංක 04 ගනුදෙනුව සම්පූර්ණයෙන් මගහැරීම

      අංක 05 ද්විත්ව සටහන සමාන වටිනාකමකින් අඩුවීම.

      අංක 06 ගනුදෙනු අදාළ නොවන ගිණුම්වල සටහන් වීම.

      අංක 07 එක ම ගනුදෙනුව දෙවරක් ගිණුම්ගත වීම.

- මෙසේ ගනුදෙනු වැරදි ලෙස වාර්තා කිරීම නිසා ශේෂ පිරික්සුමේ තුලනයට බලපෑමක් විය හැකි අතර. ඇතැම් ගනුදෙනු වැරදි ලෙස වාර්තා කළ ද ශේෂ පිරික්සුමේ තුලනයට බලපෑමක් ඇති නොවන බව.
- ඒ ඒ වැරදීම්වලට අදාළ වූ ගනුදෙනු වාර්තා කිරීම වටිනාකම් සමග හඳුනා ගැනීමට මග පෙන්වන්න.

**ක්‍රියාකාරකම 2 :**

- සිසුන් උචිත පරිදි කණ්ඩායම් කර පහත මාතෘකා පවරන්න.
    1. ශේෂ පිරික්සුමෙන් අනාවරණය නොවන (සමානතාවට බලනොපාන) වැරදි
    2. ශේෂ පිරික්සුමෙන් අනාවරණය වන (සමානතාවට බලපාන) වැරදි
- පෙර ක්‍රියාකාරකමෙන් හඳුනා ගත් වැරදීම් මාතෘකාවට අදාළ ව වෙන් කර ගැනීමට යොමු කරන්න.
- තම කණ්ඩායම ලද ගනුදෙනු පහත ආකාරයේ වගුවක ඇතුළත් කිරීමට යොමු කරන්න.

| දැනට තබා ඇති ද්විත්ව සටහන | නිවැරදි ද්විත්ව සටහන | නිවැරදි කිරීමට අදාළ ජර්නල් සටහන |
|---|---|---|
| 1. | | |
| 2. | | |

- කණ්ඩායම් දෙකේ ගනුදෙනු හුවමාරු කර ගනිමින් ඉහත වගුව සම්පූර්ණ කිරීමට යොමු කරන්න.
- ශේෂ පිරික්සුම සමාන නොවූ ගනුදෙනු නිවැරදි කිරීමට යොදා ගන්නා තාවකාලික ගිණුම පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න.
- වැරදි නිවැරදි කිරීමට යොමු කරන්න.
- සකස් කර ඇති වගුව සමග සිසු පිළිතුරු සැසඳීමට යොමු කරන්න.

| ගනුදෙනු අංකය හා ලෙජරයේ දූනට තබා ඇති ද්විත්ව සටහන (රු.) | ගනුදෙනුවට අදාළ නිවැරදි ද්විත්ව සටහන (රු.) | වැරදි නිවැරදි කළ යුතු ජර්නල් සටහන (රු.) |
|---|---|---|
| 01 මුදල් ගිණුම හර 90 000<br>විකුණුම් ගිණුම බැර 90 000 | මුදල් ගිණුම හර 9 000<br>විකුණුම් ගිණුම 9 000 | විකුණුම් ගිණුම හර 81 000<br>මුදල් ගිණුම බැර 81 000 |
| 02. ගැණුම් ගිණුම හර 300<br>මුදල් ගිණුම බැර 3 000 | ගැනුම් ගිණුම හර 3 000<br>මුදල් ගිණුම 3 000 | ගැනුම් ගිණුම හර 2 700<br>**අවිනිශ්චිත ගිණුම බැර 2 700** |
| 03. සේවක වැටුප් ගිණුම බැර 80<br>මුදල් ගිණුම බැර 80 | සේවක වැටුප් ගිණුම හර 80<br>මුදල් ගිණුම බැර 80 | සේවක වැටුප් ගිණුම හර 160<br>**අවිනිශ්චිත ගිණුම බැර 160** |
| 04. ද්විත්ව සටහන තබා නැත. | ගැනිලි ගිණුම හර 50<br>මුදල් ගිණුම බැර 50 | ගැනිලි ගිණුම - හර 50<br>මුදල් ගිණුම බැර 50 |
| 05. මෝටර් රථ ගිණුම හර 250<br>මුදල් ගිණුම බැර 250 | මෝටර් රථ ගිණුම හර 2500<br>මුදල් ගිණුම බැර 2500 | මෝටර් රථ ගිණුම හර 2250<br>මුදල් ගිණුම බැර 2250 |
| 06. මෝටර් රථ ගිණුම හර 15<br>මුදල් ගිණුම (බැර) 15 | මෝටර් රථ ධාවන<br>වියදම් ගිණුම හර 15<br>මුදල් ගිණුම බැර 15 | මෝටර් රථ ධාවන<br>වියදම් ගිණුම හර 15<br>මෝටර් රථ ගිණුම බැර 15 |
| 07. මුදල් ගිණුම හර 60<br>ගෙවල් කුලී ආදායම්<br>ගිණුම බැර 60<br><br>මුදල් ගිණුම හර 60<br>ගෙවල් කුලී ආදායම්<br>ගිණුම බැර 60 | මුදල් ගිණුම හර 60<br>ගෙවල් කුලී ආදායම්<br>ගිණුම බැර 60 | ගෙවල් කුලී ආදායම හර 60<br>මුදල් ගිණුම බැර 60 |

අවිනිශ්චිත ගිණුම

| | රු. | | රු. |
|---|---|---|---|
| ශේෂ පිරික්සුමේ වෙනස | 2 860 | ගැණුම් | 2 700 |
| | | සේවක වැටුප් | 160 |
| | 2 860 | | 2 860 |

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

- ගනුදෙනු වාර්තා කිරීමේ දී විවිධ හේතු නිසා වැරදි සිදු වේ.
- ගනුදෙනු වාර්තා කරන විවිධ අවස්ථාවල දී වැරදි සිදුවිය හැකිය.
- ඕනෑ ම ගනුදෙනුවකට නිවැරදි ද්විත්ව සටහනක් පවතින අතර, නිවැරදිව සටහන් තැබීමෙන් පිළියෙල කරන ශේෂ පිරික්සුම තුලනය වේ.

ගනුදෙනු වාර්තා කිරීමේ දී සිදු වන වැරදි ප්‍රධාන ක්ෂේත්‍ර දෙකකට පහත පරිදි වර්ග කළ හැකිය.

1. ශේෂ පිරික්සුමේ අනාවරණ නොවන (සමානතාවට බලනොපාන) වැරදි
2. ශේෂ පිරික්සුමේ අනාවරණය වන (සමානතාවට බලපාන) වැරදි

- ශේෂ පිරික්සුමෙන් අනාවරණය නොවන වැරදි සිදුවන අවස්ථාවක දී ශේෂ පිරික්සුම තුලනය වේ.
- කුමන ආකාරයෙන් හෝ සිදුවන වැරදි නිවැරදි කිරීමට පොදු ජර්නලය තුළ සටහනක් තැබිය යුතුය.

**ශේෂ පිරික්සුමෙන් අනාවරණය නොවන වැරදි පහත අයුරින් දැක්විය හැකි ය.**

- කිසියම් ගනුදෙනුවකට අදාළ මූලාශ්‍ර ලේඛනය සටහන් කිරීම අත්හැරීම
- ප්‍රධාන ගිණුම්කරණ මූලධර්මවලට පටහැනිව ගනුදෙනු වාර්තා කිරීම
- යම් ගනුදෙනුවක වටිනාකම **ගිණුම්**වල වැඩියෙන් හෝ අඩුවෙන් සටහන් වීම
- යම් ගනුදෙනුවක් වාර්තා කිරීමේ දී සිදු වූ වරදක් තවත් වරදක් මගින් හිලව් කිරීම
- ගනුදෙනුවකට අදාළ ද්විත්ව සටහන **ගිණුම්**වල දෙවරක් සටහන් වීම
- ශේෂ පිරික්සුමේ අනාවරණය නොවන **(සමානතාවට බලනොපාන)** වැරදි හඳුනා ගෙන, ඒ ඒ වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය සටහන් පොදු ජර්නලය තුළ තබා ඒවා ලෙජරයට පිටපත් කළ යුතු ය.
- **ශේෂ පිරික්සුමේ අනාවරණය වන (සමානතාවට බලපාන)** වැරදි හේතුවෙන් ශේෂ පිරික්සුම තුලනය නොවන නිසා ''ඇතිවන වෙනස '' ලෙජරයේ අවිනිශ්චිත ගිණුමකට තාවකාලිකව මාරු කරනු ලැබේ.
- වැරදි නිවැරදි කළ පසු අවිනිශ්චිත ගිණුමේ ශේෂය අහෝසි වී යයි.
- ශේෂ පිරික්සුමේ අනාවරණය වන (සමානතාවට බලපාන) වැරදි පහත ආකාරයෙන් වර්ග කළ හැකි ය.
    - ගනුදෙනුවක වටිනාකම ගිණුම් දෙකේම අගයයන් දෙකකින් සටහන් වීම
    - ගනුදෙනුවක ද්විත්ව සටහනින් එක් සටහනක් මඟ හැරීම
    - ලෙජර් ගිණුම් තුලනය කිරීමේ දී සිදුවන වැරදි

- ගනුදෙනුවක ද්විත්ව සටහන ගිණුම් දෙකේම එකම පැත්තේ සටහන් වීම
- ශේෂ පිරික්සුම පිළියෙල කිරීමේදී සිදුවන වැරදි

- ගනුදෙනු වාර්තා කිරීමේ දී සිදුවන වැරදි නිසා ව්‍යාපාරයේ මූල්‍ය ප්‍රතිඵලයට බලපෑමක් වන අතර, වැරදි නිවැරදි කිරීමෙන් පසු නිවැරදි මූල්‍ය ප්‍රතිඵලය ගණනය කළ හැකි ය.
- නිවැරදි මුල්‍ය ප්‍රතිඵලය ගණනය කිරීමට ලාභ සංශෝධිත ලේඛනයක් පිළියෙල කරයි.
- සිදු වී ඇති වැරදි තුළ ආදායම් හා වියදම්වලට බලපාන ගනුදෙනු පමණක් තෝරා ගනිමින් ලාභ සංශෝධන ලේඛනය පිළියෙල කරයි.

**තක්සේරුව හා ඇගයීම් :**

(01) ශේෂ පිරික්සුමේ සමානතාවයට බලනොපාන වැරදි සඳහා නිදසුනක් පහත වැරදි අතරින් තේරීම.

(i) අත්පිට විකුණුම් රු. 15 000 ක් මුදල් ලැබීම් ජර්නලයේ රු. 15000 ක් ලෙසත් විකුණුම් ගිණුමේ
රු. 1 500 ක් ලෙසත් නිවැරදි පැත්තේ සටහන් කිරීම.

(ii) අත්පිට ගැනුම් රු. 12 000 ක් මුදල් ගෙවීම් ජර්නලයේ රු. 1 200 ක් ලෙස සටහන් කිරීම.

(iii) අමල්ගෙන් ලද රු. 8 000 ක් මුදල් පාලන ගිණුමේ හා අමල්ගේ ගිණුමේ හර පැත්තේ සටහන් කිරීම.

(iv) ණයහිමි නිෂාදිට ආපසු යැවුම් රු. 1 400 ක් ආපසු යැවුම් ජර්නලය තුළ රු. 1 400 ක් ලෙසත් නිශාදිගේ ගිණුමේ රු. 140 ක් ලෙසත් හර කිරීම.

(v) මුදල් ලැබීම් ජර්නලයේ ණයගැති එකතු තීරුවේ වටිනාකම මුදල් පාලන ගිණුමේ වාර්තා නොවීම.

(02) ශුද්ධ ලාභයට බලපෑමක් ඇති නොකරන වැරැද්ද තේරීම.

(i) මුදල් ලැබීම් ජර්නලයේ දුන් වට්ටම් තීරුව රු. 2 000 ක් අඩුවෙන් ගෙන තිබීම.

(ii) අත්පිට විකුණුම් රු. 35 000 ක් මුදල් ලැබීම් ජර්නලයේ හා විකුණුම් ගිණුමේ
රු. 53 000ක් ලෙස සටහන් කිරීම.

(iii) ලෙජරයේ ගැණුම් ගිණුම තුලනය කිරීමේ දී රු. 6 000 ක් වැඩියෙන් ගෙන තිබීම.

(iv) ගමන් වියදම් වශයෙන් ගෙවූ රු. 4 000 ක් ලිපි ද්‍රව්‍ය වියදම් ගිණුමට රු. 4 000 ක් ලෙස හර කිරීම.

(v) ගැනිලි ගිණුමේ රු. 1 500 ක් ශේෂය ශේෂ පිරික්සුමට ගෙන ගොස් නැත.

(03) පහත ප්‍රකාශ සත්‍ය නම් √ ලකුණ ද අසත්‍ය × නම් ලකුණ ද යෙදීම.

(i) ගනුදෙනුවක් නිවැරදි වටිනාකමට වඩා වැඩියෙන් මූලික පොතක
සටහන් කළ විට එය ශේෂ පිරික්සුම තුලනය වීමට බලනොපායි. ( )

(ii) අයිතිකරුගේ භාණ්ඩ ගැනිලි පොත්වල වාර්තා නොවීම ලාභයට බල නොපායි. ( )

(iii) ශේෂ පිරික්සුමේ වෙනස අවිනිශ්චිත ගිණුමකට මාරු කර වැරදි නිවැරදි කිරීමෙන් පසුව අවිනිශ්චිත ගිණුම අහෝසි වී යයි. ( )

(iv) අවිනිශ්චිත ගිණුමේ ශේෂයක් ඇතිවීමට තුඩු දෙන දෝෂ ලාභයට බලපෑමක් ඇති නොකරයි. ( )

(v) ශුද්ධ ලාභය නිවැරදි කිරීමට අදාළ වන්නේ දෝෂ තුළ ඇතුළත් ආදායම් හා වියදම් වෙනස්වීම් පමණි. ( )

(04) පහත සඳහන් වන්නේ මුදිත ගේ ව්‍යාපාරයේ 2017/03/31 න් අවසන් වසරේ ගිණුම් තැබීමේ දී සිදු වූ දෝෂ වේ.

(i) රු. 30 000 ක අශාන්ට ණයට විකුණුම් ඉන්වොයිසියක් පොත්වලින් මඟ හැරීම

(ii) රු. 12 000 ක ගොඩනැගිලි අලුත්වැඩියාවක් ගොඩනැගිලි ගිණුමට හර කිරීම.

(iii) රු. 2 000 ක විදුලිය වියදම දෙවරක් පොත්වල සටහන් වීම.

(iv) රු. 18 000 කට පසිඳුගෙන් ණයට ගත් බඩු තොගය, ගැනුම් ජර්නලයේ රු. 8 100 ක් ලෙස සටහන් කිරීම.

(v) රු. 4000 ක අත්පිට විකුණුම්, මුදල් ලැබීම් ජර්නලයේ නිවැරදිව සටහන් කර විකුණුම් ගිණුමට පිටපත් කර නැති අතර, රු. 24 000 ක් රවිඳුට ගෙවීම මුදල් ගෙවීම් ජර්නලයේ නිවැරදිව වාර්තා කර, රවිඳුගේ ගිණුමේ රු. 20 000 ක් ලෙස හර කිරීම.

අවශ්‍ය වන්නේ :

1. ඉහත එක් එක් දෝෂය නිවැරදි කිරීමේ ජර්නල් සටහන දැක්වීම.
2. මුදිතගේ ව්‍යාපාරයේ 2017/03/31 න් අවසන් වසරේ කෙටුම්පත් ශුද්ධ ලාභය රු. 128 000 ක් නම්, ශුද්ධ ලාභය නිවැරදි කිරීමේ ලේඛනයක් පිළියෙල කිරීම.

**නිපුණතාව 5.0** : **මූල්‍ය ගිණුම්කරණයේ පදනම විශ්ලේෂණය කරමින් ගිණුම්කරණ සංකල්ප භාවිතයට යොදා ගනියි.**


**නිපුණතා මට්ටම 5.1** : ගිණුම්කරණ සංකල්ප විග්‍රහ කරයි.

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් ඵල** :
- ගිණුම්කරණ සංකල්ප යන්න පැහැදිලි කරයි.
- ගිණුම්කරණ සංකල්ප මූල්‍ය ගිණුම්කරණයේ දී අදාළ කර ගත යුතු බව පැහැදිලි කරයි.

**මූලිකපද හා සංකල්ප :**

**සංකල්ප සිතියම**



**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- මූල්‍ය ප්‍රකාශන මූලිකාංග හඳුනා ගැනීමේ දී සහ මැනීමේ දී යොදා ගන්නා පොදුවේ පිළිගත් මූලධර්ම ගිණුම්කරණ සංකල්ප ලෙස හැඳින්වේ.
- ව්‍යාපාර විසින් සකස් කරන ගිණුම්කරණ තොරතුරුවල ඒකාකාරී ස්වභාවයක් තිබිය යුතු ය. එය ආරක්ෂා කර ගැනීම සඳහා ගිණුම්කරණ සංකල්ප යොදා ගනියි.
- මූල්‍ය ගිණුම්කරණයේ දී අදාළ කර ගන්නා ගිණුම්කරණ සංකල්ප රාශියක් ඇත. ඒවා යොදා ගනිමින් සකස් කරන මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම්කරණ තොරතුරු සැසඳීම කළ හැකිය.
- ගිණුම්කරණ තොරතුරු සකස් කිරීමේ දී භාවිතයට ගන්නා ගිණුම්කරණ සංකල්ප පහත දැක්වේ.
    - ඒකක සංකල්පය
    - අඛණ්ඩ පැවැත්මේ සංකල්පය
    - කාලච්ඡේද සංකල්පය
    - මූල්‍ය මිණුම් සංකල්පය
    - උපචිත සංකල්පය
    - සංගතතා සංකල්පය / අනුරූපිතා සංකල්පය
    - යථාරූපී සංකල්පය (හරාත්මක බවේ සංකල්පය)
    - උපලබ්ධි සංකල්පය
    - ගැලපුම් සංකල්පය
    - ආරක්ෂණ සංකල්පය / විචක්ෂණ සංකල්පය
    - ප්‍රමාණාත්මක සංකල්පය / වැදගත්බවේ සංකල්පය
    - ඓතිහාසික පිරිවැය සංකල්පය
    - අනාවරණ සංකල්පය / හෙළිදරව් කිරීමේ සංකල්පය
- ගනුදෙනු වාර්තා කිරීමේ දී හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී යොදා ගන්නා ඉහත සංකල්ප අතර සම්බන්ධතාවක් ඇත.
- එමෙන්ම එක් ගනුදෙනුවක් වාර්තා කිරීමේ දී ගිණුම්කරණ සංකල්ප කිහිපයක් සම්බන්ධ වේ.

  ක්ෂය වාර්තා කිරීමට - ගැලපුම් සංකල්පය

  ආරක්ෂණ සංකල්පය

  අඛණ්ඩ පැවැත්ම සංකල්පය

  කාලච්ඡේද සංකල්පය

  මූල්‍ය මිණුම් සංකල්පය අදාළ වේ.

තොගය වාර්තා කිරීම - ආරක්ෂණ සංකල්පය

ගැලපුම් සංකල්පය

මුල්‍ය මිණුම් සංකල්පය අදාළ වේ.

වියදම් වාර්තා කිරීම - ගැලපුම් සංකල්පය
කාලච්ඡේද සංකල්පය
උපචිත සංකල්පය
මුල්‍ය මිණුම් සංකල්පය අදාළ වේ.

ආදායම් වාර්තා කිරීම - උපලබ්ධි සංකල්පය
උපචිත සංකල්පය
ගැලපුම් සංකල්පය
කාලච්ඡේද සංකල්පය
මුල්‍ය මිණුම් සංකල්පය අදාළ වේ.

දේපළ පිරියත හා උපකරණ - ඓතිහාසික පිරිවැය සංකල්පය
අඛණ්ඩ පැවැත්ම සංකල්පය
අනාවරණ සංකල්පය
මුල්‍ය මිණුම් සංකල්පය අදාළ වේ.

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක :**

- ගිණුම් තොරතුරු වාර්තා කිරීමේ දී යොදා ගන්නා ගිණුම්කරණ සංකල්ප නම් කිරීම.
- ගිණුම්කරණ සංකල්පවල සම්බන්ධතාව දක්වෙන නිදසුන් ඉදිරිපත් කිරීම

**නිපුණතාව 5.0 : මූල්‍ය ගිණුම්කරණයේ පදනම විශ්ලේෂණය කරමින් ගිණුම්කරණ සංකල්ප භාවිතයට යොදා ගනියි.**

**නිපුණතා මට්ටම 5.2** : ගිණුම්කරණ ඒකකය සහ ඒකක සංකල්පය විශ්ලේෂණය කරයි.


**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් ඵල** :

- මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ඒකක සංකල්පය භාවිත කළ යුතු බව දක්වයි.

**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම**




**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසුම**

- පහත සඳහන් ප්‍රශ්න පන්තියට ඉදිරිපත් කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - ව්‍යාපාරය හා අයිතිකරු එක් පුද්ගලයෙක් ද?
  - ව්‍යාපාරයක අයිතිකරු, ව්‍යාපරය සමග කරන ගනුදෙනු මොනවාද?
  - එම ගනුදෙනු ව්‍යාපාරයේ පොත්වල වාර්තා කරන්නේ කෙසේ ද?

  නිදසුන : අයිතිකරු ව්‍යාපාරයෙන් මුදල් ගන්නේ නම්.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- පහත සඳහන් සිද්ධීන් දෙක හා ප්‍රශ්න සිසු කණ්ඩායම් දෙකකට ලබා දීමට කටයුතු කරන්න.

  **සිද්ධිය 01 :**

  **කුමාර තමා ඉතිරිකර ගත් රු. 100 000 ක් යොදා තම නිවසේ ඉදිරිපස කොටසේ සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. එම මුදලින් ව්‍යාපාරයට අවශ්‍ය දෑ මිලට ගත් අතර, විකිණීම සඳහා ණයට ද භාණ්ඩ ලබා ගන්නා ලදී. තව ද කුමාර සෑම මසක ම රු. 2 000 බැගින් තම නිවසේ විදුලි බිල ව්‍යාපාරයේ මුදලින් ගෙවයි.**

- පහත ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙන්න.
  - ව්‍යාපාරය ආරම්භ කළේ කවුරුන් ද?
  - ව්‍යාපාරයේ අයිතිකරු කවුරුන් ද?
  - ව්‍යාපාරය ආරම්භ කිරීමට යෙදූ මුදල කොපමණ ද?
  - කුමාර තම නිවසේ විදුලි බිල ගෙවීමට ව්‍යාපාරයෙන් මුදල් ගන්නා විට, කුමාර ව්‍යාපාරයට යෙදූ මුදලට කුමක් වේ ද ?

**සිද්ධිය 02 :**

- **ශ්‍යාමිලා නිමි ඇඳුම් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට තම මවගෙන් රු. 75 000 ක් ඉල්ලා ගත්තා ය. රු. 25 000 ක් වටිනා තම නිවසේ මහන මැෂිම ද ව්‍යාපාරයට යොදවන ලදී. තමා ඉතිරි කර ගෙන තිබූ රු. 20 000 ක මුදල්වලින් නිමි ඇඳුම් මිලට ගත්තා ය.**
  **රු. 30 000 ක බැංකු ණයක් ද ලබා ගත් ඇය, ව්‍යාපාරයට අවශ්‍ය උපකරණ මිලට ගත්තාය. ශ්‍යාමිලා තම දියණියට රු. 1 200 ක් පිරිවැය වන ඇඳුමක් තම ව්‍යාපාරයෙන් ලබා දෙන ලදී.**

- සිද්ධිය හොඳින් අධ්‍යයනය කිරීමෙන් පසු පහත ප්‍රශ්න සිසුන්ට යොමු කරන්න.
  - ශ්‍යාමිලාගේ ව්‍යාපාරයට, ශ්‍යාමිලාට ඇති අයිතියේ (හිමිකමේ) වටිනාකම කොපමණද?
  - සිද්ධිය අවසානයේ දී ඇයගේ ව්‍යාපාරයට ඇති අයිතිය අඩු වුනා ද? වැඩි වුනා ද? එයට හේතුව කුමක් ද?
  - ව්‍යාපාරය ආරම්භ කිරීමට යෙදූ මුදල සකස් වී ඇති ආකාරය දක්වන්න.
  - පසුව එම මුදල වෙනස් වූ ආකාරය කෙසේ ද? යන්න දක්වන්න.
- මෙම තොරතුරු සිසුන්ට පන්ති කාමරයට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ගිණුම්කරණයේ මූලික පදනම අයිතිකරු හා ව්‍යාපාරය ස්වාධීන ඒකක දෙකක් ලෙස සැලකීමයි.
- මෙය ඒකක සංකල්පය ලෙස හැඳින්වේ.
- ඒකක සංකල්පයෙන් අදහස් වන්නේ ව්‍යාපාරයට, අයිතිකරුවන්ගෙන් වෙන් වූ ස්වාධීන පැවැත්මක් ඇති බවයි.
- ව්‍යාපාරය ස්වාධීන ඒකකයන් නිසා, එහි ගනුදෙනු, අනෙකුත් ගනුදෙනුවලින් වෙන්කර ගෙන ව්‍යාපාරයේ දෘෂ්ඨී කෝණයෙන් ගිණුම්කරණය කළ යුතුයි.

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක**

- ව්‍යාපාර ඒකක සංකල්පය යන්න අර්ථ දැක්වීම.
- ව්‍යාපාරයේ අයිතිකරුගේ නිවසේ විදුලි බිල ව්‍යාපාරයේ මුදලින් ගෙවීම ව්‍යාපාරයේ වියදමක් ලෙස සැලකේ. මෙම ප්‍රකාශනයේ සත්‍ය හෝ අසත්‍ය භාවය දැක්වීම
- ව්‍යාපාරයේ ''අයිතිකරුගේ අයිතිය'' වෙනස්වන ගනුදෙනු දෙකක් නම් කිරීම.

**නිපුණතාව 5.0 : මූල්‍ය ගිණුම්කරණයේ පදනම විශ්ලේෂණය කරමින් ගිණුම්කරණ සංකල්ප භාවිතයට යොදා ගනියි.**


**නිපුණතා මට්ටම 5.3** : අඛණ්ඩ පැවැත්මේ සංකල්පය භාවිත කරයි.

**කාලච්ඡේද** : 04

**ඉගෙනුම් ඵල** :
- අඛණ්ඩ පැවැත්මේ සංකල්පය සහ එහි අදාළත්වය පැහැදිලි කරයි.
- අඛණ්ඩ පැවැත්මේ සංකල්පය යොදා ගන්නා ආකාරය දක්වයි.

**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම**




**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ව්‍යාපාරය දැකිය හැකි අනාගතයක් දක්වා පවතී යන උපකල්පනය කර මූල්‍ය වාර්තා පිළියෙල කරන බව අඛණ්ඩ පැවැත්ම සංකල්පයෙන් අදහස් වේ.
- ව්‍යාපාරය වසා දැමීමක්, මෙහෙයුම් කටයුතු සීමා කිරීමක් පිළිබඳ අවදානමක් නැත. යන්න මෙහි දී උපකල්පනය කරයි.

මෙම සංකල්පය යෙදෙන අවස්ථා

- වත්කම් - ජංගම වත්කම් හා ජංගම නොවන වත්කම් ලෙස වර්ග කිරීම
- වගකීම් - ජංගම වගකීම් හා ජංගම නොවන වගකීම් ලෙස වර්ග කිරීම
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත් වගකීම් උපලබ්ධි කරගත හැකි අගයන් මත නොපෙන්වා ඒවා ලබා ගත් වටිනාකමට පෙන්වීම.
- දේපළ, පිරියත හා උපකරණ වාර්ෂික ව ක්ෂය කිරීම.

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක :**

- අඛණ්ඩ පැවැත්මේ සංකල්පය පැහැදිලි කිරීම
- අඛණ්ඩ පැවැත්මේ සංකල්පය යෙදෙන අවස්ථා මූල්‍ය ප්‍රකාශන තුළින් නිදසුන් ගෙන දැක්වීම.
- ව්‍යාපාරයේ පැවැත්ම පිළිබඳ අවිනිශ්චිතතාවක් පවතී නම් '' වත්කම් හා වගකීම් වර්ග කිරීමක් අවශ්‍ය නැත'' යන්න සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වීම.

**නිපුණතාව 5.0** : **මූල්‍ය ගිණුම්කරණයේ පදනම විශ්ලේෂණය කරමින් ගිණුම්කරණ සංකල්ප භාවිතයට යොදා ගනියි.**


**නිපුණතා මට්ටම 5.4** : මූල්‍ය මිණුම් සංකල්පය භාවිත කරයි.

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් ඵල** :
- මූල්‍ය මිණුම් සංකල්පය හා එහි අදාළත්වය පැහැදිලි කරයි.
- මූල්‍ය මිණුම් සංකල්පයේ බලපෑම මූල්‍ය ප්‍රකාශනවලින් නිරූපණය වන බව පෙන්වයි.

**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම**




**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසුම**

- 'ව්‍යාපාරයක සිදුවන මුදලින් මැනිය හැකි හා මුදලින් මැනිය නොහැකි ගනුදෙනු හා සිද්ධීන් සඳහා සිසුන්ගෙන් නිදසුන් ලබා ගෙන පහත කරුණු මතුවන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - ව්‍යාපාරයක සිදු වන ගනුදෙනු හා සිද්ධීන් අතර මුදලින් මැනිය හැකි හා මුදලින් මැනිය නොහැකි ගනුදෙනු තිබෙන බවත් ඒවා වෙන්කර හඳුනාගත යුතු බව.
  - මුදලින් මැනිය හැකි ගනුදෙනු පමණක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරන බව. ව්‍යාපාරය වෙනුවෙන් තීරණ ගැනීම සඳහා මුදලින් මැනිය නොහැකි ගනුදෙනු ද අවශ්‍ය බව පැහැදිලි කරන්න.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- පහත මාතෘකා අතරින් ඒ ඒ කණ්ඩායමට ලැබෙන මාතෘකාව කෙරෙහි අවධානය යොමු කරවන්න.
  - **මුදලින් මැනිය හැකි ගනුදෙනු හා සිද්ධී**
  - **මුදලින් මැනිය නො හැකි ගනුදෙනු හා සිද්ධී**
- **පහත සඳහන් ගනුදෙනු හා සිද්ධීන් ඇතුළත් ලැයිස්තුව කණ්ඩායම්වලට ලබා දී, එය හොඳින් කියවීමට ඉඩ සලස්වන්න.**

- අයිතිකරු ව්‍යාපාරයට රු. 1 000 000 ක් වටිනා මෝටර් රථයක් යෙදීම.
- ව්‍යාපාරයේ විකුණුම් ආදායම රු. 650 000.
- ව්‍යාපාරය පරිසරය සිත් ගන්නා ආකාරයට සකස් කර ඇත.
- ව්‍යාපාරයට සේවකයින් පිරිසක් බඳවා ගෙන ඇත.
- පාරිභෝගික හැසිරීම් රටා හොඳින් සොයා බලයි.
- ණයගැතියන්ගෙන් රු. 1 000 ක ලැබිය යුතු ණයගැති ශේෂය කපා හැරීමට තීරණය විය.

- කණ්ඩායමට ලද මාතෘකාව පැහැදිලි කිරීමට උපදෙස් දෙන්න.
- කණ්ඩායම් මාතෘකාවට අදාළ ගනුදෙනු හා සිද්ධි දී ඇති ලැයිස්තුවෙන් තෝරා ගැනීමට යොමු කරන්න.
- කණ්ඩායමේ මාතෘකාවට අදාළ ව මෙහි ඇතුළත් නොවූ වෙනත් ගනුදෙනු හා සිද්ධීන් ලිවීමට උපදෙස් දෙන්න.
- කණ්ඩායමේ මාතෘකාවට අදාළ ව තෝරා ගත් ගනුදෙනු හා සිද්ධීන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරන්නේ ද? නැද්ද යන්න හේතු සහිත ව ඉදිරිපත් කිරීමට යොමු කරන්න.
- මෙම ගනුදෙනුව ව්‍යාපාරයට වැදගත් වන ආකාරය පැහැදිලි කිරීමට උපදෙස් දෙන්න.
- ඒ ඒ කණ්ඩායම් ගොනු කර ගත් තොරතුරු පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ව්‍යාපාරයක සිදුවන ගනුදෙනු හා සිද්ධීන් අතුරින් මුදලින් මැනිය හැකි ගනුදෙනු හා සිද්ධි පමණක් හඳුනා ගෙන මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කරයි.
- මෙම ඕනෑ ම ගනුදෙනුවක් එම රටේ මුදල් ඒකකයන් මැන මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරයි.
- මුදලින් මැනිය නොහැකි සිදුවීම් ව්‍යාපාරය පවත්වා ගෙන යාමේ දී තීරණ ගැනීමට උපකාරී වේ.

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක**

- ව්‍යාපාරයක සිදුවන ගනුදෙනු හා සිද්ධීන් 10 ක් ලිවීම.
- මූල්‍යමය ගනුදෙනු හා මූල්‍යමය නොවන ගනුදෙනු වෙන් කර හඳුනා ගැනීම.
- ''මූල්‍යමය නොවන ගනුදෙනු හා සිද්ධීන් ව්‍යාපාරයට අවශ්‍ය නොවේ '' යන්නෙහි සත්‍ය හෝ අසත්‍ය බව දැක්වීම.

**නිපුණතාව 5.0 : මූල්‍ය ගිණුම්කරණයේ පදනම විශ්ලේෂණය කරමින් ගිණුම්කරණ සංකල්ප භාවිතයට යොදා ගනියි.**


**නිපුණතා මට්ටම 5.5** : කාලච්ඡේද සංකල්පය භාවිත කරයි.

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් ඵල** :
- කාලච්ඡේද සංකල්පය හා එහි අදාළත්වය පැහැදිලි කරයි.
- කාලච්ඡේද සංකල්පය යොදා ගන්නා ආකාරය දක්වයි.

**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම**




**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසුම**

- ව්‍යාපාරයක ගිණුම් කාලච්ඡේදයක් ආරම්භයේ ආරම්භක දිනය ලෙස 2016/01/01 බව සිසුන්ට ඉදිරිපත් කර, එම ව්‍යාපාරයේ ''වාර්ෂික ගිණුම් කාලච්ඡේදය'' ප්‍රකාශ කරන ලෙස සිසුන්ට දන්වා පහත කරුණු මතුවන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - කාලච්ඡේදයේ මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කිරීම සඳහා ගිණුම් වර්ෂය පළමුව හඳුනා ගත යුතු බව.
  - ගිණුම් වර්ෂයට අදාළ ගනුදෙනු පමණක් ගැලපුම් කළ යුතු බව.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- ව්‍යාපාරයක සිදු විය හැකි පහත සඳහන් ගනුදෙනුවලින් එක් ගනුදෙනුව බැගින් එක් කණ්ඩායමකට ලබා දෙන්න.

  1. 2017/03/31 දිනෙන් අවසන් කාලච්ඡේදයේ දී රු. 60 000 ක තොග මිලට ගෙන ඇත. එයින් රු. 20 000 ක බඩු තොග එම කාලච්ඡේදයේ ම විකුණා ඇත.
  2. වර්ෂයේ අවසාන මාසයට අදාළ දුරකථන බිල රු. 7 000 ව්‍යාපාරයට ලැබී ඇත්තේ ගිණුම් කාලච්ඡේදය අවසන් වී මාසයක් ඉකුත් වන 2017/04/30 දිනයි.
- කණ්ඩායමට ලද ගනුදෙනුව හොඳින් අධ්‍යයනය කිරීමට උපදෙස් දෙන්න.

- ගිණුම් වර්ෂය මාස 12 ක් යයි උපකල්පනය කර ගනුදෙනුවට අදාළ ගිණුම් කාලච්ඡේදය ලිවීමට යොමු කරන්න.
- ගනුදෙනුව නිසා ගිණුම් කාලච්ඡේදයට ඇති වන බලපෑම ලියා දැක්වීමට උපදෙස් දෙන්න.
- ගනුදෙනුව ගැලපුම් කිරීමේ ද්විත්ව සටහන විමසන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ව්‍යාපාරයේ අඛණ්ඩ වූ ජීව කාලය නිශ්චිත කාලච්ඡේද වශයෙන් බෙදා එක් එක් කාලච්ඡේද සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම **කාලච්ඡේද සංකල්පයෙන්** අදහස් වේ.
- මූල්‍ය ප්‍රකාශන මූලිකාංග ඉදිරිපත් කිරීමේ දී කාලච්ඡේද සංකල්පය අනුගමනය කළ යුතු ය.
- මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන්නේ කාලච්ඡේද සංකල්පය අනුවයි.

  නිදසුන් : .................................. ව්‍යාපාරය

  1. 2016/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය
  2. 2017/03/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක :**

- කාලච්ඡේද සංකල්පය පැහැදිලි කිරීම
- දෙන ලද ගනුදෙනුවලින් ගිණුම්කරණ කාලච්ඡේදය හඳුනා ගැනීම
- මූල්‍ය ප්‍රකාශන තුළ කාලච්ඡේද සංකල්පය මතු කරන ස්ථාන සඳහා නිදසුන් ඉදිරිපත් කිරීම.
- ''මුදල් ගිණුම තුළ සටහන් වූ ගනුදෙනුවලින් කාලච්ඡේද සංකල්පය නිරූපණය කරයි'' යන ප්‍රකාශනයේ සත්‍ය අසත්‍ය බව දැක්වීම.

**නිපුණතාව 5.0** : **මූල්‍ය ගිණුම්කරණයේ පදනම විශ්ලේෂණය කරමින් ගිණුම්කරණ සංකල්ප භාවිතයට යොදා ගනියි.**

**නිපුණතා මට්ටම 5.6** : උපචිත සංකල්පය භාවිත කරයි.

**කාලච්ඡේද** : 05

**ඉගෙනුම් ඵල** :
- උපචිත සංකල්පය හා එහි අදාළත්වය පැහැදිලි කරයි.
- උපචිත සංකල්පය යොදා ගන්නා ආකාරය දක්වයි.

**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම**

උපචිත සංකල්පය
- හැඳින්වීම
- යෙදෙන අවස්ථා
  - ගෙවිය යුතු වියදම්
  - ඉදිරියට ගෙවූ වියදම්
  - ලැබිය යුතු ආදායම්
  - කලින් ලද ආදායම්
  - ණය ගැතියෝ
  - ණය හිමියෝ

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසුම :**

- පහත දැක්වෙන සටහන උචිත ආකාරයට සිසුන්ට ඉදිරිපත් කරන්න.

2017 ජනවාරී මාසයේ විදුලි බිලේ ජනවාරී මාසයේ විදුලිය පාවිච්චි කිරීම වෙනුවෙන් රු. 2700 ක් ලෙස සඳහන් වුනි.

| රු. 2500 ක් ගෙවූවේ නම් | රු. 3000 ක් ගෙව්වේ නම් |
|---|---|
| ගෙවිය යුතු විදුලිය කොපමණ ද? | වැඩිපුර ගෙවූ විදුලි බිල වටිනාකම කොපමණ ද? |
| ............................................ | ............................................ |

- මෙම සටහන සිසුන්ට ඉදිරිපත් කර එහි ඇතුළත් හිස්තැන් පිරවීමට යොමු කරන්න.
- මෙම පිළිතුරු සැලකිල්ලට ගෙන පහත කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - කාලච්ඡේදයේ මූල්‍ය ප්‍රතිඵලය ගණනය කිරීමට, කාලච්ඡේදයට අදාළ වටිනාකම ගණනය කළ යුතු බවත්,
    - ඒ අනුව ගෙවිය යුතු වියදම්, වැඩිපුර ගෙවා ඇති වියදම් ගැලපුම් කළ යුතු බවත්,
    - ඒ ආකාරයෙන් ම ආදායම් සම්බන්ධ ව ද ලැබිය යුතු හා කලින් ලද ආදායම් ද ගැලපුම් කළ යුතු බවත් පැහැදිලි කරන්න.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- පහත සඳහන් ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු සිසු කණ්ඩායම්වලට බෙදා දෙන්න.
    - කමල්ගේ ව්‍යාපාරයේ 2017. 03. 31 න් අවසන් වර්ෂයේ හෙළිදරව් වූ තොරතුරු කිහිපයක් පහත දැක් වේ.
        1. වර්ෂය තුළ ලැබූ විදුලි බිල්වල වටිනාකම රු. 38 000 කි. නමුත් වර්ෂය තුළ රු. 35 000 ක් ගෙවූ බව බිල්වල සඳහන් වීම.
        2. රු. 18 000 ක් වූ වාර්ෂික රක්ෂණ වාරිකය වෙනුවෙන් රු. 20 000 ක් ගෙවීම.
        3. රු. 5 000 ක මාසික කුලියට දුන් කඩ කාමරය සඳහා මාස 18කට කුලිය ලැබීම.
        4. රු. 50 000 ක ආයෝජනයක් සඳහා 10%ක ආදායමක් ලැබිය යුතු වුවත්, වර්ෂය තුළ රු. 3 000 ක පොළියක් පමණක් ලැබී ඇත.

    - ඒ ඒ කණ්ඩායමට ලද ගනුදෙනුවක් මතු වන වියදම හෝ ආදායම ගණනය කිරීමට යොමු කරන්න.
    - මෙම ගනුදෙනු තුළින් පහත කරුණු මතු කර ගැනීමට යොමු කරන්න. (වටිනාකම් සහිතව)
        - ගෙවිය යුතු වියදම්
        - ලැබිය යුතු ආදායම්
        - ඉදිරියට ගෙවූ වියදම්
        - කලින් ලද ආදායම්
    - එම මතු කර ගත් අයිතම ගැලපුම් කිරීමට, අදාළ **ද්විත්ව සටහන** පහත වගුවෙන් තෝරා ගැනීමට යොමු කරන්න.

| | හර | බැර |
|---|---|---|
| 1. අදාළ වියදම් ගිණුම | ×× | |
| ගෙවිය යුතු වියදම් ගිණුම | | ×× |
| 2. ඉදිරියට ගෙවූ වියදම් ගිණුම | ×× | |
| අදාළ වියදම් ගිණුම | | ×× |
| 3. ලැබිය යුතු ආදායම් ගිණුම | ×× | |
| අදාළ ආදායම් ගිණුම | | ×× |
| 4. අදාළ ආදායම් ගිණුම | ×× | |
| කලින් ලද ආදායම් ගිණුම | | ×× |

- තෝරා ගත් ද්විත්ව සටහනට ඔබේ ගනුදෙනුවේ වටිනාකම් ආදේශ කරන්න.
- කණ්ඩායම් අනාවරණ පන්ති කාමරයට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

**උපචිත සංකල්පය :**

- නිශ්චිත කාලච්ඡේදයක් සඳහා ව්‍යාපාරයක මූල්‍ය ප්‍රතිඵලය ගණනය කිරීමේ දී කාලච්ඡේදයට අදාළ සියලු ආදායම් මුදලින් ලැබී ඇතත්, නැතත් ආදායම් ලෙස ද, කාලච්ඡේදයට අදාළ සියලු වියදම් මුදලින් ගෙවා තිබුණත්, නැතත්, වියදම් ලෙස ද හඳුනාගත යුතු බව මෙම සංකල්පයෙන් අදහස් වේ.
- ගිණුම්කරණ කාලච්ඡේදයේ නිවැරදි මූල්‍ය ප්‍රතිඵලය අනාවරණය කිරීම සඳහා උපචිත සංකල්පය වැදගත් වේ.

**උපචිත සංකල්පය යෙදෙන අවස්ථා :**

- උපචිත වියදම් / ගෙවිය යුතු වියදම්
- ඉදිරියට ගෙවූ වියදම් / පෙර ගෙවුම්
- ලැබිය යුතු ආදායම් / උපචිත ආදායම්
- කලින් ලද ආදායම් / ඉදිරියට ලද ආදායම්
- ණයගැතියෝ
- ණයහිමියෝ

**උපචිත වියදම් :**

- ගිණුම් කාලච්ඡේදයට අදාළ නමුත්, ගිණුම් වර්ෂය අවසාන දින වන විටත් ගෙවා නොමැති වියදම්. උපචිත වියදම් ලෙස හැඳින්වේ. මෙය වගකීමකි. මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කිරීමේ දී උපචිත වියදම් ගැලපුම් කළ යුතු ය.

- අදාළ ද්විත්ව සටහන / ගැලපුම් සටහන

| | |
|---|---|
| අදාළ වියදම් ගිණුම | හර |
| උපචිත වියදම් ගිණුම | බැර |

නිදසුන : 2017/03/31 දිනෙන් අවසන් වර්ෂය තුළ ගෙවූ විදුලි බිල්වල වටිනාකම රු. 14 200 කි. නමුත් වසරට ලද විදුලි බිල්වල වටිනාකම රු. 22 000 කි.

- අදාළ ගැලපුම් සටහන ලෙස

| | රු. | රු. |
|---|---|---|
| විදුලි බිල් ගිණුම හර | රු. 7 800 | |
| උපචිත විදුලි බිල් ගිණුම | | රු. 7 800 |

**ආදායම් ප්‍රකාශනයේ** ඇතුළත් කළ යුතු වර්ෂයේ විදුලිබිල්වල වටිනාකම රු. 22 000 කි. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ **ජංගම වගකීම්** තුළ දැක්විය යුතු වටිනාකම රු. 7 800 කි.

- **ඉදිරියට ගෙවූ වියදම් / පෙර ගෙවුම් :**

ගිණුම් කාලච්ඡේදයට අදාළ ප්‍රමාණයට වඩා වැඩිපුර කාලයක් සඳහා ගෙවා ඇති වියදම් ප්‍රමාණයයි. මෙය වත්කමකි.

අදාළ ගැලපුම් සටහන

| | |
|---|---|
| ඉදිරියට ගෙවූ වියදම් ගිණුම | හර |
| අදාළ වියදම් ගිණුමට | බැර |

නිදසුන : වර්ෂයට අදාළ රක්ෂණ වාරිකය රු. 24 000 ක් වුවත් වර්ෂය තුළ දී රු. 25 000 ක් ගෙවා ඇත.

අදාළ ගැලපුම් සටහන

| | රු. | රු. |
|---|---|---|
| ඉදිරියට ගෙවූ රක්ෂණ ගිණුම හර | රු. 1 000 | |
| රක්ෂණ ගාස්තු ගිණුම | | රු. 1 000 |

**ආදායම් ප්‍රකාශනයට** ඇතුළත් කළ යුතු රක්ෂණ ගාස්තුව රු. 24 000 කි.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ **ජංගම වත්කම්වල** දැක්විය යුතු වටිනාකම රු. 1 000කි.

- **ලැබිය යුතු ආදායම්**

ගිණුම් කාලච්ඡේදයට අදාළ නමුත් ගිණුම් කාලච්ඡේදය අවසාන දින වන විටත් ලැබී නැති ආදායම් ප්‍රමාණය, ලැබිය යුතු ආදායම් ලෙස හැඳින්වේ. මෙය වත්කමකි.

අදාළ ගැළපුම් සටහන

| | |
|---|---|
| ලැබිය යුතු ආදායම් ගිණුම | හර |
| අදාළ ආදායම් ගිණුම | බැර |

නිදසුන : ව්‍යාපාරයේ ගොඩනැගිල්ලෙන් කොටසක් මසකට රු. 5 000 බැගින් කුලියට දී ඇත. ගිණුම් වර්ෂය තුළ ලැබූ ගෙවල් කුලිය රු. 50 000 කි.

අදාළ ගැළපුම් සටහන

| | | |
|---|---|---|
| | රු. | රු. |
| ලැබිය යුතු ගෙවල් කුලී ගිණුම හර | 10 000 | |
| ගෙවල් කුලී ආදායම් ගිණුම | බැර | 10 000 |

**ආදායම් ප්‍රකාශනයට** ඇතුළත් කළ යුතු ගෙවල් කුලී ආදායම රු. 60 000 කි.
මූල්‍ය තත්ත්වයේ ප්‍රකාශනයේ **ජංගම වත්කම්වල** දැක්විය යුතු වටිනාකම
රු. රු. 10 000 කි.

- **කලින් ලද ආදායම්**

ගිණුම් කාලච්ඡේදයට වඩා වැඩිපුර කාලයක් සඳහා ලැබී ඇති ආදායම් ප්‍රමාණය, කලින් ලද ආදායම් ලෙස හැඳින්වේ. මෙය වගකීමකි.

අදාළ ගැලපුම් සටහන

| | |
|---|---|
| අදාළ ආදායම් ගිණුම | හර |
| කලින් ලද ආදායම් ගිණුම | බැර |

නිදසුන : ව්‍යාපාරයේ ගොඩනැගිල්ලේ කොටසක් මසකට රු. 5 000 බැගින් කුලියට දී ඇති අවස්ථාවක ගිණුම් කාලච්ඡේදය තුළ රු. 75 000 ක ගෙවල් කුලී ආදායමක් ලැබී ඇත.

අදාළ ගැලපුම් සටහන

| | රු. | රු. |
|---|---|---|
| ගෙවල් කුලී ආදායම් ගිණුම | හර 15 000 | |
| කලින් ලද ගෙවල් කුලී ආදායම් ගිණුම | | බැර 15 000 |

**ආදායම් ප්‍රකාශනයට** ඇතුළත් කළ යුතු ගෙවල් කුලී ආදායම රු. 60 000 කි. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ **ජංගම වගකීම්වල** දැක්විය යුතු වටිනාකම රු. 15 000 කි.

උපචිත සංකල්පය මත ගනුදෙනු වාර්තා කළ විට **ණයහිමි** හා **ණයගැති** තත්ත්වයන් ජනිත වේ.

ලැබිය යුතු ආදායම්
ඉදිරියට ගෙවූ වියදම්

ගෙවිය යුතු වියදම්

කලින් ලද ආදායම්

ණයගැතියෝ සහ ණයහිමියෝ ද උපචිත සංකල්පයට අදාළ යෙදීම් වේ.

මෙම සංකල්පය මතු කර දැක්වෙන මෙවැනි ගනුදෙනුවලින් අභ්‍යාස නිර්මාණය කර සිසුන්ට ලබා දෙන්න.

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක :**

- උපචිත සංකල්පය පැහැදිලි කිරීම
- පහත සඳහන් ගනුදෙනුවලට ගැලපුම් සටහන් ඉදිරිපත් කිරීම.

| | ගෙවූ රු. | ගෙවිය යුතු රු. |
|---|---|---|
| විදුලිය | 4 000 | 2 000 |
| රක්ෂණ වාරික | 2 000 | 200 |

- ගිණුම් වර්ෂයට අදාළ ආදායම් හා වියදම් හඳුනා ගැනීමෙන් පසු මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත් කළ යුතු වටිනාකම දැක්වීම.


**නිපුණතාව 5.0** : **මූල්‍ය ගිණුම්කරණයේ පදනම විශ්ලේෂණය කරමින් ගිණුම්කරණ සංකල්ප භාවිතයට යොදා ගනියි.**

**නිපුණතා මට්ටම 5.7** : උපලබ්ධි සංකල්පය යොදා ගනියි.

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් ඵල** :
- උපලබ්ධි සංකල්පය හා එහි අදාළත්වය පැහැදිලි කරයි.
- ආදායම් මූලාශ්‍ර නම් කරයි.
- උපලබ්ධි සංකල්ප යොදා ගන්නා ආකාරය දක්වයි.

**මූලික පද හා සංකල්ප :** **සංකල්ප සිතියම**




**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ආදායම සත්‍ය වශයෙන් ඉපයූ අවස්ථාවේ දී එම ආදායම හඳුනා ගත යුතු බව මෙම සංකල්පයෙන් අදහස් කෙරේ. භාණ්ඩ විකිණීමක් නම් එම භාණ්ඩ තොගය සම්බන්ධයෙන් අවධානම් සහ ප්‍රතිලාභ එමෙන් ම එහි පාලනය විකුණුම්කරුගෙන් ගැනුම්කරුට මාරුවන අවස්ථාවේ ආදායම හඳුනාගත යුතු ය. මෙය සාමාන්‍යයෙන් සිදු වන්නේ භාණ්ඩ තොගය භාරදුන් අවස්ථාවේ දී හෝ අයිතිය මාරුවන අවස්ථාවේ දී ය. සේවාවක් නම් සේවාව සැපයූ අවස්ථාවේ සේවා ආදායම හඳුනා ගත යුතු ය.
- ගනුදෙනුව ගිවිස ගත් අවස්ථාව ආදායම උපලබ්ධි වූවා සේ සැලකේ.

- **සංකල්පයේ යෙදීම්**
  - **විකුණුම් අත්තිකාරම්** : අවදානම් සහ ප්‍රතිලාභ ගැණුම්කරුට මාරු වී නැත. එම නිසා ආදායමක් ලෙස හඳුනා ගත නොහැක.
  - ණයට විකුණුම් : මුදල් නොලැබුණ ද භාණ්ඩවල අයිතිය හුවමාරුවී එහි ප්‍රතිලාභ සහ අවදානම ගැණුම්කරුට මාරු වී ඇත. ඒ නිසා ආදායමක් සේ සලකයි.
  - භාණ්ඩ විකුණා ඇතත් භාණ්ඩ රැගෙන ගොස් නොතිබීම. එහි අයිතිය හුවමාරුවී ඇත. එය ආදායමක් සේ සැලකේ.
  - විකිණීම හෝ ආපසු එවීමේ පදනමට යවා ඇති භාණ්ඩ : මෙහි අයිතිය හුවමාරු වී නොමැති නිසා මෙය ආදායමක් ලෙස හඳුනා නොගනී.

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක :**

- උපලබ්ධි සංකල්පය පැහැදිලි කිරීම.
- උපලබ්ධි සංකල්පය අනුව ආදායම උපලබ්ධිවීම සලකන්නේ කවර අවස්ථාවේ දී ද යන්න දැක්වීම.
- උපලබ්ධි සංකල්පය කඩ කරන අවස්ථාවක් මතු කර දැක්වීම. ''අනාගත විකුණුම් සඳහා අත්තිකාරමක් ලබා ගැනීම උපලබ්ධි සංකල්පයට අනුව ආදායමක් ලෙස හඳුනා ගනී.'' මෙම ප්‍රකාශනයේ සත්‍ය හෝ අසත්‍ය බව දැක්වීම.

**නිපුණතාව 5.0 : මූල්‍ය ගිණුම්කරණයේ පදනම විශ්ලේෂණය කරමින් ගිණුම්කරණ සංකල්ප භාවිතයට යොදා ගනියි.**


**නිපුණතා මට්ටම 5.8** : ගැලපුම් සංකල්පය භාවිත කරයි.

**කාලච්ඡේද** : 03

**ඉගෙනුම් ඵල** :
- ගැලපුම් සංකල්පය හා එහි අදාළත්වය පැහැදිලි කරයි.
- ගැලපුම් සංකල්පය යොදා ගන්නා ආකාරය දක්වයි.

**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම**




**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ගිණුම් කාලච්ඡේදයකට අදාළ ව මූල්‍ය ප්‍රතිඵලය ගණනය කිරීමේ දී එම ගිණුම් කාලච්ඡේදයේ ආදායම, එම අදායම ඉපයීමට දායක වූ වියදම් සමග ගැලපිය යුතු බව ගැලපුම් සංකල්පයෙන් අදහස් වේ.
- නිදසුන් : විකුණුම් ආදායම, විකුණුම් පිරිවැය සමග ගැලපීම / සැසඳීම
- මෙම සංකල්පයේ යෙදීම්

1. අවසාන තොගය ගැලපීම - තොග ගිණුම හර
   වෙළඳ ගිණුම බැර
2. ප්‍රතිපාදනයන් කිරීම - සේවක වන්දි ගිණුම හර
   සේවක වන්දි වෙන් කිරීමේ ගිණුම බැර
3. අනාගත ආර්ථික ප්‍රතිලාභ ජනනය නොකරන සියලුම වියදම් කාලච්ඡේදයේ වියදමක් ලෙස වාර්තා කිරීම.
   තොග හානි : තොග හානි ගිණුම හර
   ගැණුම් ගිණුම බැර
4. අඩමාණ ණය වෙන් කිරීම - අඩමාණ ණය ගිණුම හර
   අඩමාණ ණය වෙන් කිරීම් ගිණුම බැර

5. බොල් ණය කපා හැරීම් - බොල් ණය ගිණුම හර
ණයගැති පාලන ගිණුම බැර

6. ක්ෂය වෙන් කිරීම - ක්ෂය ගිණුම හර
සමුච්චිත ක්ෂය ගිණුම බැර

- මේ සම්බන්ධ ව අභ්‍යාස ඉදිරියේ දී වෙනත් සංකල්ප මගින් ඉදිරිපත් කරයි.

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක :**

- ගැලපුම් සංකල්පයට අනුව ගනුදෙනු වාර්තා කිරීමට හේතුව ඉදිරිපත් කිරීම.
- ගැලපුම් සංකල්පය මූල්‍ය ප්‍රකාශනවල යෙදෙන අවස්ථා මතුකර දැක්වීම.
- රු. 14 000 ක වටිනා තොගයක් හානි වූ අතර, ඒ සඳහා රක්ෂණ ආයතනයක් 50% ක් ලබා දීමට එකඟ වේ. අදාළ ගැලපුම් සටහන ලියා දැක්වීම හා එයින් ලාභයට වන බලපෑම දැක්වීම.


**නිපුණතාව 5.0** : **මූල්‍ය ගිණුම්කරණයේ පදනම විශ්ලේෂණය කරමින් ගිණුම්කරණ සංකල්ප භාවිතයට යොදා ගනියි.**

**නිපුණතා මට්ටම 5.9** : ඓතිහාසික පිරිවැය සංකල්පය භාවිත කරයි.

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් ඵල** :
- ඓතිහාසික පිරිවැය සංකල්පය හා එහි අදාළත්වය පැහැදිලි කරයි.
- ඓතිහාසික පිරිවැය සංකල්පයෙන් භාවිතයන් දක්වයි.
- ඓතිහාසික පිරිවැය සංකල්පයෙන් බැහැරවන අවස්ථා ඇති බව දක්වයි.

**මූලික පද හා සංකල්ප** : සංකල්ප සිතියම




**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ව්‍යාපාරයක් සතු සම්පත් හා ඒ සඳහා දැරූ වියදම්, ඒවා අත්පත් කර ගත් අවස්ථාවේ දී හුවමාරු වූ සත්‍ය පිරිවැය මත පොත්වල වාර්තා කළ යුතු බව ඓතිහාසික පිරිවැය සංකල්පයෙන් අදහස් වේ.
- පිරිවැය මත වාර්තා කිරීම නිසා, අගය තහවුරු කර ගැනීම පිළිබඳ,
  - විශ්වාසදායී බවත්,
  - පහසු බවත් ඇති වේ.
- එමෙන් ම, ගිණුම් තැබීමේ කටයුතු ද පහසු වේ.

**ඓතිහාසික පිරිවැය සංකල්පයෙන් බැහැර වන අවස්ථා**
- දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යගණන අගයට වාර්තා කිරීම.
- තොගය ශුද්ධ උපලබ්ධි අගයට වාර්තා කිරීම.

**සංකල්පයේ යෙදීම්**
- දේපළ පිරියත හා උපකරණ හඳුනා ගැනීමේ දී (ප්‍රථම වතාවට) පිරිවැයට වාර්තා කිරීම.
- දේපළ පිරියත හා උපකරණ සම්බන්ධ ව පසුකාලීන ව දරණ වියදම් ද පිරිවැයට වාර්තා කිරීම.

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක :**

- ඓතිහාසික පිරිවැය සංකල්පය පැහැදිලි කරයි.
- ඓතිහාසික පිරිවැය සංකල්පය මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත වන ආකාරය ඉදිරිපත් කරයි.
- ඓතිහාසික පිරිවැය සංකල්පයෙන් බැහැර වන අවස්ථාවකට නිදසුනක් ඉදිරිපත් කිරීම.

**නිපුණතාව 5.0** : **මූල්‍ය ගිණුම්කරණයේ පදනම විශ්ලේෂණය කරමින් ගිණුම්කරණ සංකල්ප භාවිතයට යොදා ගනියි.**


**නිපුණතා මට්ටම 5.10** : ආරක්ෂණ සංකල්පය භාවිත කරයි.

**කාලච්ඡේද** : 04

**ඉගෙනුම් ඵල** :
- ආරක්ෂණ සංකල්පය පැහැදිලි කරයි.
- ආරක්ෂණ සංකල්පය සඳහා නිදසුන් දක්වයි.
- ආරක්ෂණ සංකල්පය යොදා ගන්නා ආකාරය දක්වයි.

**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම**




**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසුම**

- පහත සඳහන් ප්‍රශ්න සිසුන්ට යොමු කර සාකච්ඡා කරමින් පිළිතුරු මතු කර ගන්න.
  - අනාගතයේ දී ලැබීමට නියමිත ආදායම් හා ලාභ ගිණුම්ගත කළ යුතු ද?
  - වර්තමාන ගනුදෙනුවල ප්‍රතිඵලයක් ලෙස අනාගතයේ ඇති විය හැකි අලාභ සඳහා වෙන් කිරීම් කළ යුතු ද?
  - තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයේ වඩා අඩු අගයට වාර්තා කිරීම කළ යුතුද?

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- ඒ ඒ කණ්ඩායමට පහත ගැලපුම හා සිද්ධීන් බෙදා දෙන්න.
  - අඩමාණ ණය වෙන් කිරීම
  - ක්ෂය සඳහා වෙන් කිරීම
  - පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය හෝ යන අගයයන් දෙකෙන් අඩු අගයට වාර්තා නිරීම
- පහත ප්‍රශ්න කණ්ඩායම්වලට ලබා දෙන්න.
  - ආරක්ෂණ සංකල්පය හඳුන්වන්න.
  - ලැබී ඇති ගැලපුම පැහැදිලි කරන්න.

- ගැලපුමට අදාළ සිද්ධි තෝරා ගන්න.
- එම සිද්ධීන් තුළ ඇතුළත් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.
- කණ්ඩායම් පිළිතුරු පන්තියට ඉදිරිපත් කරන්න.

**සිද්ධිය 01 :**

තුෂාරගේ ව්‍යාපාරයේ 2017/03/31 දිනට ණයගැති ගිණුමේ ශේෂය රු. 50 000 කි. එදිනටඅඩමාන ණය සඳහා 5% ක් වෙන් කළ යුතුයි. මේ තොරතුරු සැලකිල්ලට ගනිමින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| අවස්ථාව | ගැලපුම් සටහන | ණයගැති වත්කමට වන බලපෑම | අඩමාණ ණය වෙන් කිරීමේ ගිණුමට කරන බලපෑම | ලාභයට කරන බලපෑම |
|---|---|---|---|---|
| 1. ප්‍රථම වතාවට අඩමාන ණය වෙන් කිරීම. | | | | |
| 2. 2016/04/01 දිනට අඩමාන ණය වෙන් කිරීමේ ගිණුමේ ශේෂය රු. 2 000 ක් පැවතියේ නම් | | | | |
| 3. 2016/04/01 දිනට අඩමාන ණය වෙන් කිරීම් ගිණුමේ ශේෂය රු. 3 200 ක් නම් | | | | |
| 4. 2016/04/01 දිනට අඩමාන ණය වෙන් කිරීම් ගිණුමේ ශේෂය රු. 2 500 ක් නම් | | | | |
| 5. ඉහත එක් එක් අවස්ථාව යටතේ බොල් ණය රු. 1 000 ක් වේ නම්. | | | | |

**සිද්ධිය 02 :**

සුසිත් ව්‍යාපාරයේ 2016/04/01 දිනට පැවති දේපළ පිරියත හා උපකරණ වත්කම්වලට අදාළ තොරතුරු පහත දැක්වේ.

| වත්කම් | පිරිවැය (රු.) | වාර්ෂික ක්ෂය අනුපාතය | 2016/04/01 දිනට සමුච්චිත ක්ෂය (රු.) |
|---|---|---|---|
| ගොඩනැගිලි | 500 000 | 10% | 100 000 |
| රථවාහන | 200 000 | 40% | 80 000 |
| පරිගණක | 160 000 | 25% | 20 000 |
| යන්ත්‍ර | 80 000 | 20% | 24 000 |

ඉහත තොරතුරු ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| වත්කම් | වාර්ෂික ක්ෂය (රු.) | ඵලදායි ජීව කාලය | 2017/03/31 දිනට සමුච්චිත ක්ෂය (රු.) | 2017/03/31 ධාරණ අගය (රු.) | වාර්ෂික ක්ෂය ගිණුම්ගත කිරීමේ ජර්නල් සටහන |
|---|---|---|---|---|---|
| ගොඩනැගිලි | | | | | |
| රථවාහන | | | | | |
| පරිගණක | | | | | |
| යන්ත්‍ර | | | | | |

**සිද්ධිය 03 :**

කුමාරගේ ව්‍යාපාරයේ 2016/03/31 දිනට තොගයේ පිරිවැය රු. 160 000 කි. එදිනට තොගයේ

1. ශුද්ධ උපලබ්ධි අගය රු. 130 000 ක් නම්
2. ශුද්ධ උපලබ්ධි අගය රු. 180 000 ක් නම්

| පිරිවැය | ශුද්ධ උපලබ්ධි අගය (රු.) | අදාළ ද්විත්ව සටහන් | වෙළඳ ගිණුමේ ඇතුළත් කරන වටිනාකම (රු.) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පෙන්වන අගය (රු.) | ලාභයට වන බලපෑම (රු.) |
|---|---|---|---|---|---|
| 1. | | | | | |
| 2. | | | | | |

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ගිණුම්කරණ ඒකකයේ මෙහෙයුම් ප්‍රතිඵලය, මූල්‍ය තත්ත්වය, මුදල් ප්‍රවාහයන් පිළිබඳ තොරතුරු වඩාත් සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආරක්ෂණ සංකල්පය දායක වෙයි.

1. මෙම සංකල්පය යෙදෙන අවස්ථා ලෙස,
   - අඩමාණ ණය වෙන් කිරීම
   - ක්ෂය වෙන් කිරීම
   - තොගයේ අඩු අගය වාර්තා කිරීම දැක්විය හැකි ය.
   - සේවක වන්දි සඳහා වෙන් කිරීම

   ඉහත ගැලපුම්වලට අදාළ ගැලපුම් සටහන් මෙසේ දැක්විය හැකි ය.

1. අඩමාන ණය ගිණුම හර } ප්‍රථම වරට වෙන් කිරීම
   අඩමාණ ණය වෙන් කිරීමේ ගිණුම බැර

| | | | |
|---|---|---|---|
| 2. | අඩමාන ණය ගිණුම | හර | |
| | අඩමාන ණය වෙන් කිරීමේ ගිණුම | බැර | } ඌණ අඩමාන ණය ගැලපීම |
| 3. | අඩමාන ණය වෙන් කිරීමේ ගිණුම | හර | |
| | අඩමාන ණය ගිණුම | බැර | } අධි අඩමාන ණය ගැලපීම |
| 4. | බොල් හා අඩමාන ණය ගිණුම | හර | |
| | අඩමාන ණය වෙන් කිරීමේ ගිණුම | බැර | |

- ගැලපුම්වලින් පසු ඇතිවන ගිණුම්වල ශේෂ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි ව ඇතුළත් කළ යුතු ය.
- ඉහත දක්වූ ගැලපුම් සටහන්වලට සම්බන්ධ ආරක්ෂණ සංකල්පයට අමතරව තවත් සංකල්ප සම්බන්ධ වේ. නිදසුන් : ගැලපුම් සංකල්පය, උපලබ්ධි සංකල්පය

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක :**

- ආරක්ෂණ සංකල්පය පැහැදිලි කිරීම.
- ආරක්ෂණ සංකල්පය යෙදෙන අවස්ථා ඉදිරිපත් කිරීම.
- පහත සඳහන් ගැලපුම් සටහන්වල ජර්නල් සටහන් ඉදිරිපත් කිරීම.
  - 2015/03/31 දිනට ණයගැතියෝ රු. 40 000 කි. ඉන් 5% අඩමාන ණය වෙන් කිරීම.
  - දේපළ හා පිරියත රු. 400 000 කි. සරල මාර්ග ක්‍රමයට 10% බැගින් ක්ෂය කිරීම.
  - ''තොගය, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් වඩා අඩු අගයට වාර්තා කිරීම ආරක්ෂණ සංකල්පයට පටහැනි වේ.'' මෙහි අසත්‍ය සත්‍ය බව දක්වීම.

**නිපුණතාව 5.0** : **මූල්‍ය ගිණුම්කරණයේ පදනම විශ්ලේෂණය කරමින් ගිණුම්කරණ සංකල්ප භාවිතයට යොදා ගනියි.**


**නිපුණතා මට්ටම 5.11** : ප්‍රමාණාත්මක සංකල්පය භාවිත කරයි.

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් ඵල** :
- ප්‍රමාණාත්මක බවේ සංකල්පය පැහැදිලි කරයි.
- ප්‍රමාණාත්මක බවේ සංකල්පය යොදා ගන්නා ආකාරය දක්වයි.

**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම**




**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ගිණුම්කරණයේ දී ප්‍රමාණාත්මක භාවය තීරණය වන්නේ කිසියම් තොරතුරක් ගිණුම් තොරතුරු පිළිබඳ ඇල්මක් දක්වන පාර්ශවයන්ගේ තීරණ ගැනීමේ හැකියාවට කොතරම් දුරට බලපාන්නේ ද? නැද්ද? යන්න මතයි. ඒ අනුව ගිණුම්කරණ තොරතුරු වාර්තාකරණයේ දී කිසියම් ගනුදෙනුවක් වත්කමක් ලෙස වාර්තා කරන්නේ ද? වියදමක් ලෙස වාර්තා කරන්නේ ද? වෙනත් අයිතමයක් ලෙස වාර්තා කරන්නේ ද? යන්න තීරණය කරන්නේ මෙම සංකල්පයට අනුවයි. ප්‍රමාණාත්මක බව යනු අයිතමයේ ඇති වැදගත්කමයි. ව්‍යාපාර කටයුතුවල ප්‍රමාණය හා ස්වභාවය මත වැදගත්කම තීරණය වේ. එමනිසා මෙය වැදගත්බවේ සංකල්පය ලෙස ද හැඳින්වේ.

**සංකල්පයේ යෙදීම් :**

- ආයතනයකට සිදුරු විදිනයක් / කටු ඇමුණුම් යන්ත්‍රයක් මිලට ගැනීම වියදම් සේ ලාභාලාභ ගිණුමට ලියා හැරීම
- සමාගමක අධ්‍යක්ෂවරයකුට දුන් ණය මුදල් කොතෙක් කුඩා ප්‍රමාණයක් වුව ද, එය වෙනම අනාවරණය කළ යුතු වීම

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක :**

- ප්‍රමාණාත්මක බවේ සංකල්පය පැහැදිලි කිරීම.
- ප්‍රමාණාත්මකබවේ සංකල්පයට වඩාත් ගැලපෙන ගනුදෙනුවක් ලිවීම
- ඵලදායි ජීව කාලය වර්ෂ 4ක් වුව ද, ලිපි ගොනු කවර 5ක පිරිවැය, ඒවා මිල දී ගත් අවස්ථාවේ දී ම වියදම් ලෙස සැලකීම කොතරම් සාධාරණ ද? යන්න සඳහන් කිරීම

**නිපුණතාව 5.0 : මූල්‍ය ගිණුම්කරණයේ පදනම විශ්ලේෂණය කරමින් ගිණුම්කරණ සංකල්ප භාවිතයට යොදා ගනියි.**


**නිපුණතා මට්ටම 5.12** : යථාරූපි (හරාත්මක බවේ) සංකල්පය භාවිත කරයි.

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් ඵල** :
- යථාරූපී සංකල්පය හා එහි අදාළත්වය පැහැදිලි කරයි.
- යථාරූපී සංකල්පය යොදා ගන්නා ආකාරය දක්වයි.

**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම**




**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසුම**

- කල්බදු ක්‍රමයට ව්‍යාපාරයක් ලබා ගත් මෝටර් රථයක් සම්බන්ධව පහත ප්‍රශ්න සිසුන්ට යොමු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - මෙම මෝටර් රථය පාවිච්චි කරන්නේ කවුරුන් ද?
    - මෝටර් රථයේ නීත්‍යානුකූල අයිතිය කා සතු ද? ඒ ඇයි?
    - මෝටර් රථයෙන් ආදායම් උපයන්නේ කවුරුන් ද?
    - මෙම රථය භාවිතයෙන් මතු වන අවදානම් භාරගන්නේ කවුරුන් ද?
- සිසුන්ගෙන් ලැබුණු පිළිතුරු ඇසුරින් පහත කරුණු ඉදිරිපත් කරන්න.
- නෛතික ලෙස ව්‍යාපාරයට අයිති නැති වත්කමක් වුවත්, ආර්ථික ප්‍රතිලාභ ලැබීම් සහ අවදානම් දැරීම් ව්‍යාපාරය විසින් දරන්නේ නම්, එය ව්‍යාපාරයේ වත්කමක් ලෙස හඳුනා ගන්නා බව.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- ව්‍යාපාරයක සිදු වී ඇති පහත ගනුදෙනු ඒ ඒ කණ්ඩායමට ලබා දෙන්න.
    1. රු. 1 850 000 ක් වටිනා මෝටර් රථයක් මූල්‍ය කල්බදු ක්‍රමයට 2016/04/01 දි න ලංකා මෝටර්ස් සමාගමෙන් ලබා ගෙන, මූලික තැන්පතුව ලෙස රු. 250 000 ක් ගෙවා ඇත.
    2. රු. 2 000 000 ක් වටිනා මෝටර් රථයක් සීමිත කල්දේරා සමාගමෙන් මූල්‍ය කල්බදු ක්‍රමයට ව්‍යාපාරයට මිලට ගෙන ඇත. මූලික තැන්පතුව ලෙස රු. 100 000 ක්

ගෙවා ඇත.

- ලැබුණු ගනුදෙනුව හොඳින් අධ්‍යයනය කිරීමට සලස්වා පහත ප්‍රශ්න කණ්ඩායම්වලට ඉදිරිපත් කරන්න.
    - මිලට ගත් වත්කමේ නීතිමය අයිතිය කා සතු ද?
    - මෙම වත්කමෙන් ලැබෙන ප්‍රතිලාභ දෙකක් නම් කර, ඒවා ලබා ගන්නේ කවුරුන්ද?
    - මෙම වත්කමට අදාළ අවදානමක්, නම් කර එය දරන්නේ කවුරුන් ද?
    - මෙම වත්කම ව්‍යාපාරයේ පොත්වල වාර්තා කරන්නේ ද? එසේ නම් එහි වටිනාකම හා එය වාර්තා කරන්නේ කෙසේ ද?
    - කණ්ඩායම් පිළියෙල කර ගත් පිළිතුරු පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- මූල්‍ය කල් බද්දට ගන්නා වත්කම් , ගැණුම්කරුගේ පොත්වල වත්කමක් ලෙස හඳුනා ගත යුතුයි.
- ගනුදෙනුවක් ගිණුම්ගත කිරීමේ දී පදනම් කර ගත යුත්තේ එම ගනුදෙනුවේ නෛතික ස්වභාවය නොව, එහි මූල්‍යමය යථාර්ථය හා හරය බව යථාරූපී සංකල්පයෙන් අදහස් වේ.
- වත්කම් නිර්වචනයට අනුව ද වත්කමක අයිතියක් නොමැති වුව ද, එය පාලනය කළ හැකි වීම වත්කමක ලක්ෂණයක් ලෙස දක්වා ඇත.
- වත්කම් පිළිබඳ නිර්වචනය සිසුන්ට හොඳින් අධ්‍යයනය කිරීමට යොමු කරවා, එහි ලක්ෂණ පිළිබඳ අවධානය යොමු කරවන්න.

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක :**

- යථාරූපී සංකල්පය පැහැදිලි කිරීම.
- යථාරූපී සංකල්පය යෙදෙන අවස්ථාවකට නිදසුනක් ඉදිරිපත් කිරීම

**නිපුණතාව 5.0** : **මූල්‍ය ගිණුම්කරණයේ පදනම විශ්ලේෂණය කරමින් ගිණුම්කරණ සංකල්ප භාවිතයට යොදා ගනියි.**


**නිපුණතා මට්ටම 5.13** : අනාවරණ සංකල්පය භාවිත කරයි.

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් ඵල** :
- අනාවරණ සංකල්පය හා එහි අදාළත්වය පැහැදිලි කරයි.
- අනාවරණ සංකල්පය යොදා ගන්නා අවස්ථා දක්වයි.

**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම**




**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

- මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්කරණ තොරතුරු ඉදිරිපත් කිරීමේ දී වැදගත් සියලු තොරතුරු අවශ්‍ය පාර්ශවයන්ට හෙළිදරව් කළ යුතු බව මෙම සංකල්පයේ අදහස වේ.

**අනාවරණ සංකල්පයේ යෙදීම් :**

- දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධව එහි පිරිවැය හා සමුච්චිත ක්ෂය යනාදියන්ගේ කාලච්ඡේදයේ සිද්ධි ඇති වෙනස හෙළිදරව් කිරීම.
- සීමිත පොදු සමාගම්වල ආදායම් ප්‍රකාශනය තුළ බදු පෙර ලාභය ගණනය කිරීමේ දී ඇතුළත් කළ යුතු අයිතම අනාවරණය කිරීම. (ක්ෂයවීම, ණය පොළී)
- තොග වර්ගීකරණය අනාවරණය කිරීම.

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක :**

- අනාවරණ සංකල්පය පැහැදිලි කිරීම.
- අනාවරණ සංකල්පය මතු කර දක්වෙන අවස්ථා සඳහා නිදසුන් ඉදිරිපත් කිරීම.

**නිපුණතාව 5.0 : මූල්‍ය ගිණුම්කරණයේ පදනම විශ්ලේෂණය කරමින් ගිණුම්කරණ සංකල්ප භාවිතයට යොදා ගනියි.**


k smqK ; duÜgu 5'14 ( සංගතතා සංකල්පය භාවිත කරයි.

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් ඵල** :
- සංගතතා සංකල්පය හා එහි අදාළත්වය පැහැදිලි කරයි.
- සංගතතා සංකල්පය යොදා ගන්නා ආකාරය දක්වයි.

**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම**




**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී හා ඉදිරිපත් කිරීමේ දී අනුගමනය කළ පදනම්, සම්ප්‍රදායයන්, ප්‍රතිපත්තීන්, නිරන්තරයෙන් ම වෙනස් නොකළ යුතු බව සංගතතා සංකල්පයෙන් දැක් වේ.
- මෙම ඒකාකාරී බව අනුගමනය කිරීම නිසා පහත ආකාරයේ සන්සන්දනයක් කිරීමට හැකි වේ.
  - එකම ව්‍යාපාරයක ගිණුම් වසර කිහිපයක් සමග
  - සමාන වෙනත් ව්‍යාපාරයක මූල්‍ය තොරතුරු සමග
- ව්‍යාපාරයක් දිගින් දිගටම අනුගමනය කරමින් පැවති ගිණුම්කරණ ප්‍රතිපත්තියක් වෙනස් කළ හැකි අවස්ථා දෙකක් ගිණුම්කරණ ප්‍රමිතයකින් (ගිණුම්කරණ ප්‍රතිපත්ති, ඇස්තමේන්තු වෙනස්වීම් හා වැරදි) හඳුන්වා දීම.
  - වෙනත් ගිණුම්කරණ ප්‍රමිතයක අවශ්‍යතාව මත හා
  - ප්‍රතිපත්ති වෙනස් කිරීමෙන් මූල්‍ය ප්‍රකාශන වඩාත් සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන්නේ නම්

**සංකල්පයේ යෙදීම් :**

- පෙර වර්ෂවල අනුගමනය කළ තොග අගය කිරීමේ ප්‍රතිපත්තිය වූ පෙර ඇතුළු පෙර පිට (FIFO) ක්‍රමය ම අදාළ ගිණුම් කාලච්ඡේදය තුළ දී අනුගමනය කිරීම.

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක :**

- සංගතතා සංකල්පය පැහැදිලි කිරීම.
- සංගතතා සංකල්පයේ ප්‍රයෝජන පැහැදිලි කිරීම.
- සංගතතා සංකල්පය යෙදෙන අවස්ථාවක් සඳහා නිදසුන් ඉදිරිපත් කිරීම.

- පහත ගනුදෙනු හා සිද්ධීන්වලට අදාළ වඩාත් උචිත ගිණුම්කරණ සංකල්ප හෝ සංකල්ප ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලිවීම.

| ගනුදෙනුව / සිද්ධිය | සංකල්පය / සංකල්ප |
|---|---|
| 1. ණයගැතියන් සඳහා 5% ක අඩමාන ණය වෙන් කිරීම. | ...................................... |
| 2. මූල්‍ය කල්බදු ක්‍රමයට අත්පත් කර ගත් යන්ත්‍රයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ දක්වා ඇත. | . ...................................... |
| 3. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කම් හා වගකීම් ජංගම හා ජංගම නොවන වශයෙන් වර්ග කර ඇත. | ...................................... |
| 4. ගෙවිය යුතු වියදම් හා ඉදිරියට ගෙවූ රක්ෂණ ගාස්තු මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පිළිවෙලින් ජංගම වගකීම් ලෙසත් ජංගම වත්කම් ලෙසත් දක්වා ඇත. | ...................................... |
| 5. ණයගැතියන්ගෙන් රු. 2 000 ක් බොල් ණය ලෙස කපා හැර එය වියදමක් සේ හඳුනා ගැනීම. | |
| 6. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ 2016. 03. 31 දිනට යනුවෙන් ඉහළින් සඳහන් කිරීම. | ...................................... |
| 7. තොගය, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට සටහන් කිරීම. | ...................................... |
| 8. 'සිල්වා ට්‍රේඩර්ස්' නමින් මූල්‍ය ප්‍රකාශන ඉහළින් ව්‍යාපාරයේ නම දැක්වීම. | ...................................... |
| 9. වසර 5කට පෙර මිල දී ගත් රු. 500,000 ක ඉඩම ප්‍රවර්තන වර්ෂයේදී ත්, රු. 500,000 ක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ප්‍රත්‍යාගණනයකර දැක්වීම. | ...................................... |
| 10. දේපළ, පිරියත හා උපකරණ වාර්ෂිකව 10% බැගින් ක්ෂය කිරීම. | ...................................... |

**පුන්සදා ව්‍යාපාරය** (A)

(B) **2017. 03. 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

(C) (රු.දහස්)

| | රු. (D) පිරිවැය | රු. සංක්ෂය | රු. ශුද්ධ අගය |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** (E) | | | |
| ඉඩම් හා ගොඩනැගිලි | 5 000 | 1 800 | 3 200 |
| මෝටර් රථ | 3 000 | (M) 900 | 2 100 |
| යන්ත්‍ර උපකරණ | 2 000 | 400 | 1 600 |
| | 10 000 | 3 100 | 6 900 |
| (F) **ජංගම වත්කම්** | | | |
| (G) තොග | | 1 300 | |
| වෙළඳ ණයගැතියෝ | | 2 000 | |
| ඉදිරියට ගෙවූ කඩකුලී (H) | | 300 | |
| මුදල් | | 2 400 | 6 000 |
| මුලු වත්කම් | | | 12 900 |
| **හිමිකම් හා වගකීම්** | | | |
| 2016. 04. 01 ප්‍රාග්ධනය (I) | | 6 000 | |
| එකතු කළා : ශුද්ධ ලාභය (J) | | 1 400 | |
| | | | 7 400 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| බැංකු ණය (වර්ෂ 3 කින් ගෙවිය යුතු) | | 2 000 | |
| කල්බදු ණය හිමියෝ (K) | | 600 | |
| | | | 2 600 |
| **ජංගම වගකීම්** | | | |
| බැංකු ණය - ජංගම කොටස | | 1 000 | |
| කල් බදු ණය - ජංගම කොටස | | 300 | |
| වෙළෙඳ ණය හිමියෝ | | 1 200 | |
| උපචිත විදුලිය ගාස්තු (L) | | 400 | 2 900 |
| | | | 12 900 |

(N)

සටහන : 1. තොගවල පිරිවැය රු. 1 500 000 වූ අතර ශුද්ධ උපලබ්ධි අගය රු. 1 300 000 කි.

2. තොග අගය කිරීමේ ප්‍රතිපත්තිය FIFO ක්‍රමය අඛණ්ඩ ව භාවිත කිරීම

- ඉහත සඳහන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීමේ දී සැලකිල්ලට ගෙන ඇති ගිණුම්කරණ සංකල්ප කවරක් ද යන්න පහත දැක්වෙන ඉංග්‍රීසි අකුරුවලින් ඉදිරිපත් කරන්න.

  A : ................................
  B : ................................
  C : ................................
  D : ................................
  E : ................................
  F : ................................
  G : ................................
  H : ................................
  I : ................................
  J : ................................
  K : ................................
  L : ................................
  M : ................................

**ඇගයීම :** පහත ප්‍රකාශන හරි නම් √ ලකුණ ද වැරදි නම් X ලකුණ ද යොදන්න.

| | |
|---|---|
| 01. ගිණුම්කරණයේ දී ව්‍යාපාරික ගනුදෙනු හා සිද්ධීන් ව්‍යාපාරයේ පොත්වල වාර්තා කිරීමේ දී ව්‍යාපාරයට අයිතිකරුගෙන් වෙන් වූ ස්වාධීන පැවැත්මක් ඇතැයි සැලකේ. | |
| 02. ව්‍යාපාරයක සිදුවන ගනුදෙනු හා සිද්ධීන් අතුරෙන් මුදලින් මැනිය හැකි ගනුදෙනු හා සිද්ධීන් පමණක් හඳුනා ගෙන මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කරයි. | |
| 03. ව්‍යාපාරය දැකිය හැකි අනාගතයක් දක්වා පවතී යන උපකල්පනය කර මූල්‍ය වාර්තා පිළියෙල කරයි. | |
| 04. ව්‍යාපාරයේ අඛණ්ඩ වූ ජීව කාලය කාලච්ඡේද වශයෙන් බෙදා එක් එක් කාලච්ඡේද සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි. | |
| 05. ගණනය කිරීමේ දී කාලච්ඡේදයට අදාළ සියළු ආදායම් මුදලින් ලැබුණත් ඇතත්, නැතත්, ආදායම් ලෙස ද, කාලච්ඡේදයට අදාළ සියළු වියදම් මුදලින් ගෙවා තිබුණොත් පමණක් වියදම් ලෙස ද සටහන් කෙරේ. | |

- පහත හිස්තැන්වලට අදාළ සංකල්පය දක්වන්න.

  1. ව්‍යාපාරිකයා සිය පුද්ගලික ප්‍රයෝජනයට ව්‍යාපාරයෙන් ලබා ගන්නා බඩු. තොග, ගැනිලි වශයෙන් සටහන් කරනුයේ ............................................ සංකල්පය පදනම් වේ.
  2. මුදලින් මැනිය හැකි ගනුදෙනු පමණක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරන්නේ ...................... අනුව ය.
  3. ව්‍යාපාරයක වත්කම් හා වගකීම්, ජංගම හා ජංගම නොවන ලෙස වර්ග කරනුයේ ...................... සංකල්පය අනුව වේ.
  4. ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන්නේ ............................. සංකල්පය අනුව ය.

**නිපුණතාව 6.0 : කේවල ස්වාමි ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.**

**නිපුණතා මට්ටම 6.1** : කේවල ස්වාමි ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශනවල වැදගත්කම පැහැදිලි කරයි.

**6.2** : කේවල ස්වාමි ව්‍යාපාරයක ආදායම් ප්‍රකාශනය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කරයි.


**කාලච්ඡේද** : 46

**ඉගෙනුම් ඵල** :

- කේවල ස්වාමි ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන නම් කර, එහි අවශ්‍යතාව පැහැදිලි කරයි.
- ගිණුම් කාලච්ඡේදයේ අවසාන දිනට තොගය ගැලපුම් කරයි.
- ලැබිය යුතු ආදායම් හා කලින් ලද ආදායම් ගැලපුම් කරයි.
- උපචිත වියදම් හා ඉදිරියට ගෙවූ වියදම් ගැලපුම් කරයි.
- බොල් ණය ගැලපුම් කරයි.
- අඩමාන ණය ප්‍රතිපාදන ගැලපුම් කරයි.
- ගැනිලි ගැලපුම් කරයි.
- දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම් ගැලපුම් කරයි.
- තොග හානි, තොග පරිත්‍යාග ගැලපුම් කරයි.
- සේවක අර්ථ සාධක අරමුදල් අරමුදල් දායකය (EPF) ගැලපුම් කරයි.
- සේවා නියුක්ති භාරකාර අරමුදල් දායකය (ETF) ගැලපුම් කරයි.
- එකතු කළ අගය මත බදු (VAT) ගැලපුම් කරයි.
- විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත යවන ලද භාණ්ඩ සම්බන්ධ ගැලපුම් කරයි.
- ගිණුම් කාලච්ඡේදය සඳහා ආදායම් ප්‍රකාශනය ද, කාලච්ඡේදයේ අවසාන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ද පිළියෙල කරයි.

## මූලික පද හා සංකල්ප

### සංකල්ප සිතියම



**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසුම :**

- පහත සඳහන් ප්‍රශ්න සිසුන්ට ඉදිරිපත් කරමින් සාකච්ඡාවක නිරතවන්න.
  - ව්‍යාපාරයක අරමුණු මොනවා ද?
  - ව්‍යාපාරවල ප්‍රතිඵල මැනීම සිදු කරන්නේ කෙසේ ද?
  - ආදායම් ප්‍රකාශනය යනු කුමක් ද?
  - මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය යනු කුමක් ද?

- පහත තොරතුරු හුණු පුවරුව මත දක්වන්න.

  2016. 04. 01 දින ආරම්භ කළ සාරාංගගේ ව්‍යාපාරයේ මුළු ගැනුම් රු. 200 000 කි.
  2017. 03. 31 දිනට මෙම ව්‍යාපාරයේ විකුණුම් රු. 500,000 කි.
  2017. 03. 31 දිනට එම තොගවලින් රු. 30 000 ක තොග ඉතිරි වී තිබුණි.
  වසරේ අනෙකුත් වියදම් රු. 40 000 කි.

- ඉහත තොරතුරු උපයෝගී කර ගෙන සාරාංග ව්‍යාපාරයේ 2017. 03. 31 අවසන් වසරේ ලාභය ගණනය කිරීමට සිසුන් යොමු කරන්න.

- පහත තොරතුරු හුණු පුවරුව මත දක්වන්න.

නාමල් සමාගමේ 2017. 03. 31 දිනට පැවති වත්කම් හා වගකීම් පහත දැක් වේ.

| | | | |
|---|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | රු. 1 200 000 | බැංකු ණය | රු. 200 000 |
| මෝටර් රථ | රු. 800 000 | ණයහිමියෝ | රු. 100 000 |
| බඩු තොගය | රු. 100 000 | | |
| ණයගැතියෝ | රු. 150 000 | | |
| මුදල් ශේෂය | රු. 50 000 | | |

- ඉහත තොරතුරු උපයෝගී කර ගෙන නාමල් සමාගමේ 2017. 03. 31 දිනට ප්‍රාග්ධනය ගණනය කිරීමට සිසුන් යොමු කරන්න.
- අවශ්‍ය නම් ඉහත තොරතුරු කණ්ඩායම් ක්‍රියාකාරකමක් සඳහා සිසුන් යොමු කිරීමට භාවිත කළ හැකි ය.

**ක්‍රියාකාරකම 6.1.1**

- පහත සඳහන් තොරතුරු සිසුන්ට ලබා දී කේවල ක්‍රියාකාරකමක නිරත කරවන්න.

**සුමුදුගේ ව්‍යාපාරයේ 2017. 03. 31 දිනට ශේෂ පිරික්සුම**

| ගිණුමේ නම | හර (රු.000) | බැර (රු.000) |
|---|---|---|
| විකුණුම් | - | 20 200 |
| ආපසු එවුම් | 200 | - |
| 2016. 04. 01 දිනට වෙළෙඳ තොගය | 1 500 | - |
| ගැනුම් | 8 000 | - |
| ගෙනඒමේ කුලී | 400 | - |
| මිල දී ගත් තොග පැටවීමේ හා බෑමේ කුලී | 300 | - |
| ආපසු යැවුම් | - | 200 |
| ලද වට්ටම් | - | 100 |
| ආයෝජන ආදායම් | - | 400 |
| ප්‍රචාරණ වියදම් | 300 | - |
| බොල් ණය | 100 | - |
| දුන් වට්ටම් | 200 | |
| සේවක වැටුප් හා වේතන | 500 | |
| විදුලිය | 180 | |
| ගොඩනැගිලි ක්ෂය | 80 | |
| වරිපනම් | 40 | |
| තොග පරිත්‍යාග | 50 | |
| ණය පොලී | 200 | |
| බැංකු ගාස්තු | 150 | |
| ඉඩම් (පිරිවැය) | 8 000 | |
| ගොඩනැගිලි (පිරිවැය) | 4 000 | |
| ගොඩනැගිලි සමුච්චිත ක්ෂය (2017. 03. 31) | - | 400 |
| ආයෝජන | 4 000 | |
| ණයගැතියෝ | 1 000 | |
| මුදල් ශේෂය | 1 800 | |
| ණයහිමියෝ | - | 700 |
| බැංකු ණය | | 2 000 |
| ප්‍රාග්ධනය | | 7 000 |
| | 31 000 | 31 000 |

- 2017. 03. 31 දිනට ඉතිරි තොග කිසිවක් නොවී ය.

**අවශ්‍ය වන්නේ :**

1. සුමුදු ව්‍යාපාරයේ 2017. 03. 31 න් අවසන් වසර සඳහා ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීම.
2. සුමුදු ව්‍යාපාරයේ 2017. 03. 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීම.

...................................... ව්‍යාපාරයේ ........................................ දිනෙන් අවසන් වර්ෂය සඳහා

**ආදායම් ප්‍රකාශනය / ලාභ හෝ අලාභ ප්‍රකාශනය**

| | | | |
|---|---|---|---|
| | | | (රු.) |
| විකුණුම් | | | ××× |
| ආපසු එවුම් | | | (××) |
| | | | ××× |
| **විකුණුම් පිරිවැය** | | | |
| ආරම්භක තොගය | | ×× | |
| ගැනුම් | ××× | | |
| ආපසු යැවුම් | (××) | | |
| ගෙන ඒමේ කුලී | ×× | | |
| පැටවීමේ හා බෑමේ කුලී | ×× | ××× | |
| | | ××× | |
| අවසාන තොගය | | (××) | (×××) |
| දළ ලාභය / අලාභය | | | ××× |
| **වෙනත් ආදායම්** | | | |
| ලද වට්ටම් | | ×× | |
| ආයෝජන ආදායම් | | ×× | |
| දේපළ පිරියත හා උපකරණ විකිණීමේ ලාභය | | ×× | ×× |
| **බෙදාහැරීමේ වියදම්** | | | |
| ප්‍රචාරණ වියදම් | ×× | | |
| බොල් ණය | ×× | | |
| දුන් වට්ටම් | ×× | | |
| බෙදාහැරීමේ රථ ක්ෂය | ×× | | |
| විකුණුම් කොමිස් | ×× | ×× | |
| **පරිපාලන වියදම්** | | | |
| සේවක වැටුප් හා වේතන | ×× | | |
| ගොඩනැගිලි කුලී හා වරිපනම් | ×× | | |
| විදුලිය වියදම් | ×× | | |
| රක්ෂණ ගාස්තු | ×× | | |
| ලී බඩු ක්ෂය | ×× | | |
| ගොඩනැගිලි ක්ෂය | ×× | ×× | |
| **වෙනත් වියදම්** | | | |
| තොග කපා හැරීම | ×× | | |
| තොග හානි | ×× | | |
| පරිත්‍යාග | ×× | ×× | |
| **මූල්‍ය වියදම්** | | | |
| බැංකු ගාස්තු | ×× | | |
| ණයපොළී | ×× | | |
| අයිරා පොළී | ×× | ×× | (×××) |
| ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට ගෙන ගියා | | | ××× |

ඉහත දැක්වූ ආදායම් ප්‍රකාශනය තිරස් ආකාරයට ගිණුමක් ලෙස ද, ඉදිරිපත් කළ හැකිය. එවිට මෙය වෙළෙඳ හා ලාභාලාභ ගිණුම නමින් නම් කරනු ලැබේ.

**......................................... ව්‍යාපාරයේ ................................. දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**වෙළෙඳ හා ලාභාලාභ ගිණුම**

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | (රු.) |
| ආරම්භක තොගය | | ××× | විකුණුම් | | ××× |
| ගැනුම් | ××× | | ආපසු එවුම් | | (××) |
| ආපසු යැවුම් | (××) | | | | ××× |
| ගෙන ඒමේ කුලී | ×× | | | | |
| පැටවුම් කුලී හා බෑමේ කුලී | ×× | | | | |
| | | ××× | | | |
| අවසාන තොගය | | (××) | | | |
| විකුණුම් පිරිවැය | | ××× | | | |
| දළ ලාභය ප/ගෙ | | ××× | | | |
| | | ××× | | | ××× |
| <u>බෙදා හැරීමේ වියදම්</u> | | | දළ ලභය ඉ/ගෙ | | ××× |
| ප්‍රචාරණ වියදම් | ×× | | <u>වෙනත් ආදායම්</u> | | |
| බොල් ණය | ×× | | ලද වට්ටම් | ×× | |
| දුන් වට්ටම් | ×× | | ආයෝජන ආදායම් | ×× | |
| බෙදාහැරීමේ රථ ක්ෂය | ×× | | දේපළ පිරියත හා උපකරණ | | |
| විකුණුම් කොමිස් | ×× | ××× | විකිණීමේ ලාභ | ×× | ×× |
| <u>පරිපාලන වියදම්</u> | | | | | |
| සේවක වැටුප් හා වේතන | ×× | | | | |
| ගොඩනැගිලි කුලී හා වරිපනම් | ×× | | | | |
| විදුලිය වියදම් | ×× | | | | |
| රක්ෂණ ගාස්තු | ×× | | | | |
| ලී බඩු ක්ෂය | ×× | | | | |
| ගොඩනැගිලි ක්ෂය | ×× | ××× | | | |
| <u>වෙනත් වියදම්</u> | | | | | |
| තොග කපා හැරීම | ×× | | | | |
| තොග හානි | ×× | | | | |
| පරිත්‍යාග | ×× | ×× | | | |
| <u>මූල්‍ය වියදම්</u> | | | | | |
| ණය පොළී | ×× | | | | |
| අයිරා පොළී | ×× | ×× | | | |
| ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට ගෙන ගියා | | ××× | | | ××× |

................................ ව්‍යාපාරයේ 2017. 03. 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | පිරිවැය | සමුච්චිත ක්ෂය | (රු.) ධාරණ අගය |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| ඉඩම් | ××× | - | ××× |
| ගොඩනැගිලි | ××× | ×× | ××× |
| මෝටර් රථ | ××× | ×× | ××× |
| යන්ත්‍ර උපකරණ | ××× | ×× | ××× |
| ලී බඩු හා සවි කිරීම් | ××× | ×× | ××× |
| | ××× | ×× | ××× |
| ආයෝජන | | | ×× |
| **ජංගම වත්කම්** | | | |
| අවසාන තොගය | | ××× | |
| ණයගැතියෝ/වෙළෙඳ ලැබිය යුතු දෑ | ××× | | |
| අඩමාන ණය වෙන් කිරීම | (××) | ××× | |
| ඉදිරියට කළ වියදම් | | ×× | |
| ලැබිය යුතු ආදායම් | | ×× | |
| මුදල් | - | ××× | ××× |
| **මුළු වත්කම්** | | | ××× |
| **හිමිකම් හා වගකීම්** | | | |
| ප්‍රාග්ධනය | - | ××× | - |
| ශුද්ධ ලාභය | | ××× | - |
| | | ××× | - |
| ගැනිලි | | (××) | × ×× |
| **ජංගම නොවන වගකීම්** | | | |
| දිගු කාලීන බැංකු ණය | | | ××× |
| **ජංගම වගකීම්** | | | |
| ණයහිමියෝ/වෙළෙඳ ගෙවිය යුතු දෑ | | ×× | |
| උපචිත වියදම් | | ×× | |
| ඉදිරියට ලද ආදායම් | | ×× | |
| උපචිත EPF | | ×× | |
| උපචිත ETF | | ×× | |
| උපචිත VAT | | ×× | |
| බැංකු අයිරාව | | ×× | ××× |
| **මුළු හිමිකම හා වගකීම්** | | | ×××× |

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- පහත දැක්වෙන 2016. 03. 31 දිනට දේවන්ගේ ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම හා ගැලපුම් උචිත ආකාරයට සිසුන්ට ඉදිරිපත් කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- මෙම ව්‍යාපාරය 2015. 04. 01 දින ආරම්භ කර ඇති බව සිසුන් දැනුවත් කරන්න.

**දේවන් ව්‍යාපාරයේ 2016/03/31 දින ශේෂ පිරික්සුම**

| ගිණුමේ නම | හර<br>රු.) | බැර<br>(රු.) |
|---|---|---|
| මුදල් | 80 000 | |
| බැංකු ණය | | 50 000 |
| විකුණුම් | | 57 000 |
| විකුණුම් පිරිවැය | 22 000 | |
| සේවක වැටුප් | 12 000 | |
| විදුලි බිල | 8 000 | |
| ප්‍රාග්ධනය | | 150 000 |
| ගොඩනැගිලි පිරිවැය | 120 000 | |
| ආයෝජන (දීර්ඝ කාලීන) | 10 000 | |
| භාණ්ඩ තොග (16/3/31) | 5 000 | |
| | 257 00 | 257 000 |

**අතිරේක තොරතුරු :**

1. 2016/03/31 දිනට ගෙවිය යුතු විදුලි බිල රු. 2 000 සහ ඉදිරියට ගෙවා ඇති වැටුප් රු. 4 000 කි.
2. ගොඩනැගිලි පිරිවැය මත වාර්ෂිකව 10% බැගින් ක්ෂය කරන්න.

- සිසුන් සමග සාකච්ඡාවකින් පහත කරුණු මතු කර ගන්න.
  - ගැලපුම් සහිත ශේෂ පිරික්සුමක් ඇසුරින් ව්‍යාපාරයේ මූල්‍ය ප්‍රතිඵලය හා මූල්‍ය තත්ත්වය සොයා ගත හැකි බව.
  - කාලච්ඡේදයට අදාළ හා ආදායම් හා වියදම් හඳුනා ගෙන කාලච්ඡේදයේ මූල්‍ය ප්‍රතිඵලය ගණනය කළ හැකි බව.
  - **උපචිත සංකල්පයට** අනුව ආදායම් හා වියදම් ගැලපුම් කළ යුතු බව.
    කාලච්ඡේදයේ මූල්‍ය ප්‍රතිඵලය ගණනය කිරීම සඳහා ආදායම් ප්‍රකාශනය / ලාභ හෝ අලාභ ප්‍රකාශනය පිළියෙල කළ යුතු බව.
  - නිශ්චිත දිනකට පැවති වත්කම්, වගකීම් හා හිමිකම් අනාවරණය කර ගැනීම සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කළ යුතු බව.
  - ඉහත සඳහන් දේවන්ගේ ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම ඇසුරින් මූල්‍ය ප්‍රකාශන පහත දැක්වෙන පරිදි සකස් කළ හැකි බව.

**දේවන් ව්‍යාපාරයේ 2016/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**ආදායම් ප්‍රකාශනය / ලාභ හෝ අලාභ ප්‍රකාශනය**

| | (රු.) | (රු.) |
|---|---|---|
| විකුණුම් | 57 000 | |
| විකුණුම් පිරිවැය | (22 000) | |
| දළ ලාභය | | 35 000 |
| **මෙහෙයුම් වියදම්** | | |
| විදුලි බිල (8 000 + 2 000) | 10 000 | |
| සේවක වැටුප් (12 000 - 4 000) | 8 000 | |
| ගොඩනැගිලි ක්ෂය | 12 000 | (30 000) |
| ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට ගෙන ගියා | | 5 000 |

**දේවන් ව්‍යාපාරයේ**
**2016. 03. 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

| | (රු.) | (රු.) |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | |
| ගොඩනැගිලි (120 000 - 12 000) | 108 000 | |
| ආයෝජන | 10 000 | 118 000 |
| **ජංගම වත්කම්** | | |
| තොගය | 5 000 | |
| ඉදිරියට ගෙවූ වැටුප් | 4 000 | |
| මුදල් | 80 000 | 89 000 |
| | | 207 000 |
| **හිමිකම් සහ වගකීම්** | | |
| **හිමිකම්** | | |
| ප්‍රාග්ධනය | 150 000 | |
| **එකතු කළා :** | | |
| ශුද්ධ ලාභය | 5 000 | 155 000 |
| **ජංගම නොවන වගකීම්** | | |
| බැංකු ණය | | 50 000 |
| **ජංගම වගකීම්** | | |
| ගෙවිය යුතු විදුලි බිල | | 2 000 |
| | | 207 000 |

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- පහත සඳහන් ව්‍යාපාරවලින් ඒ ඒ කණ්ඩායමට ලැබෙන ශේෂ පිරික්සුම් කෙරෙහි අවධානය යොමු කරවන්න.
  - සුහසිංහ ගේ ව්‍යාපාරය
  - නවාස් ගේ ව්‍යාපාරය

**2017/03/31 දිනට ශේෂ පිරික්සුම**

| | සුහසිංහ ව්‍යාපාරය | | නවාස් ව්‍යාපාරය | |
|---|---|---|---|---|
| ගිණුමේ නම | හර (රු.) | බැර (රු.) | හර (රු.) | බැර (රු.) |
| ගැණුම් | 80 000 | - | 160 000 | - |
| විකුණුම් | - | 200 000 | - | 400 000 |
| 2016/04/01 තොගය | 8 000 | - | 16 000 | - |
| ආපසු එවුම් | 10 000 | - | 20 000 | - |
| ප්‍රචාරණය | 3 000 | - | 6 000 | - |
| ගෙන ඒමේ කුලී | 2 000 | - | 4 000 | - |
| විදුලි බිල | 5 000 | - | 10 000 | - |
| වැටුප් හා වේතන | 15 000 | - | 30 000 | - |
| 10% බැංකු ණය | - | 50 000 | - | 100 000 |
| ලී බඩු පිරිවැයට | 10 000 | - | 20 000 | - |
| ඉඩම් හා ගොඩනැගිලි පිරිවැයට | 150 000 | - | 300 000 | - |
| මුදල් | 13 500 | - | 27 000 | - |
| විකුණුම් වියදම් | 4 000 | - | 8 000 | - |
| ණයගැතියෝ | 10 000 | - | 20 000 | - |
| ණයහිමියෝ | - | 26 500 | - | 53 000 |
| මෝටර් රථය පිරිවැයට | 75 000 | - | 150 000 | - |
| ගෙවල් කුලී ආදායම් | - | 9 000 | - | 18 000 |
| ප්‍රාග්ධනය | - | 100 000 | - | 200 000 |
| | 385 500 | 385 500 | 771 000 | 771 000 |

**අතිරේක තොරතුරු :**

* අතිරේක තොරතුරු ව්‍යාපාර දෙකට ම අදාළ වේ.

1. 2017/03/31 දිනට ව්‍යාපාරයේ තිබූ තොගය රු. 13 000 කට අගය කර ඇත.
2. විකිණීම හෝ ආපසු එවීමේ පදනමට යවා ඇති රු. 5 000 ක් පිරිවැය වූ භාණ්ඩ ණයට විකුණුම් ලෙස වාර්තා කර ඇත. එහි විකුණුම් මිල රු. 6 000 කි. ඒවා තවම විකිණී නැත.
3. අයිතිකරු රු. 2 000 ක් වටිනා භාණ්ඩ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ගෙන ගොස් ඇත.
4. රු. 5 000 ක් වටිනා තොග හානි වූ අතර එයින් 60% ක රක්ෂණ වන්දි මුදලක් ලැබීමට නියමිත ය.

5. රු. 1000 ක් බොල් ණය ලෙස කපා හැර, ඉතිරි ණයගැතියන්ගෙන් 5% ක් අඩමාණ ණය සඳහා වෙන් කරන්න.
6. 2017/03/31 දිනට උපචිත වියදම්
   විදුලි බිල රු. 1 000, ගෙන ඒමේ කුලී රු. 2 000
7. 2017/03/31 දිනට ඉදිරියට ගෙවූ ප්‍රචාරණ වියදම් රු. 2 000
8. 2017/03/31 දිනට කලින් ලද ගෙවල් කුලී ආදායම රු. 4 000
9. ලී බඩු හා මෝටර් රථ පිරිවැය මත පිළිවෙලින් 5% හා 10% බැගින් වාර්ෂික ව ක්ෂය කරන්න.
10. බැංකු ණය 2016.03.31 දින ලබා ගෙන ඇත.

- අතිරේක තොරතුරු ගැලපුම් කිරීමට උපදෙස් දෙන්න.
- මූල්‍ය ප්‍රකාශනවල ආකෘතීන් සිසුන්ට ලබා දෙන්න.
- කණ්ඩායමට ලැබී ඇති ව්‍යාපාරයේ ගනුදෙනු, මූල්‍ය ප්‍රකාශනවල සටහන් කිරීමට මග පෙන්වන්න.
- සිසුන් පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශනවල කාර්යභාරය හඳුනා ගැනීමට යොමු කරන්න.
- සකස් කළ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිතාව පරික්ෂා කර බලා, සදොස් කරුණු නිදොස් කිරීමට මග පෙන්වන්න.
- එක් එක් කණ්ඩායමට නොලැබුණ ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන කට්ටලය පිළියෙල කර ගෙන ඒමට උපදෙස් දෙන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ගිණුම් කාලච්ඡේදයට අදාළ මූල්‍ය ප්‍රතිඵලය ගණනය කිරීම සඳහා ගැලපුම් සිදු කළ යුතුය.
- ඒ සඳහා ආදායම් ප්‍රකාශනය / ලාභ හෝ අලාභ ප්‍රකාශනය පිළියෙල කළ යුතු ය.
- නිශ්චිත දිනකට මූල්‍ය තත්ත්වය අනාවරණය කර ගැනීම සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කළ යුතු ය.
- මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ගිණුම්කරණ සංකල්ප, ප්‍රමිත, සම්ප්‍රදායයන් සැලකිල්ලට ගත යුතු ය.
- ආදායම් ප්‍රකාශනය තිරස් හා සිරස් ආකෘතියට පිළියෙල කළ හැකිය.
- ගැලපුම් සටහන් සඳහා ද්විත්ව සටහන් පහත පරිදි ය.

| ගැලපුම | ද්විත්ව සටහන |
|---|---|
| 1. අවසාන ඉතිරි තොගය | ඉතිරි බඩු තොග ගිණුම (හර)<br>වෙළෙඳ ගිණුම/ආදායම් ප්‍රකාශනය (බැර) |
| 2. භාණ්ඩ ගැනිලි | ගැනිලි ගිණුම (හර)<br>ගැනුම් ගිණුම (බැර) |
| 3. තොග පරිත්‍යාග | තොග පරිත්‍යාග ගිණුම (හර)<br>ගැනුම් ගිණුම (බැර) |
| 4. උපචිත වියදම් | අදාළ වියදම් ගිණුම් (හර)<br>උපචිත වියදම් (බැර) |
| 5. ලැබිය යුතු ආදායම් | ලැබිය යුතු ආදායම් ගිණුම (හර)<br>අදාළ ආදායම් ගිණුම (බැර) |
| 6. ඉදිරියට ගෙවූ වියදම් | ඉදිරියට ගෙවූ වියදම් ගිණුම (හර)<br>අදාළ වියදම් ගිණුම (බැර) |
| 7. කලින් ලද ආදායම් | අදාළ ආදායම් ගිණුම (හර)<br>කලින් ලද ආදායම් ගිණුම (බැර) |
| 8. බොල් ණය | බොල් ණය ගිණුම (හර)<br>ණයගැති පාලන ගිණුම (බැර) |
| 9. අඩමාණ ණය වෙන් කිරීම | අඩමාන ණය ගිණුම (හර)<br>අඩමාන ණය වෙන් කිරීම් ගිණුම (බැර) |
| 10. දේපළ පිරියත ක්ෂය | ක්ෂය ගිණුම (හර)<br>සමුච්චිත ක්ෂය ගිණුම (බැර) |

**විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත යවන ලද භාණ්ඩ**

- විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත භාණ්ඩ යවන අවස්ථාවේ දී ඒවා සම්බන්ධයෙන් සිහිවටන සටහනක් පමණක් ව්‍යාපාරය තබා ගනී.
- ගණුදෙනුකරු / නියෝජිතයා එම බඩු තොගය විකුණන ලද බව ව්‍යාපාරයට දැනුම් දුන් විට හෝ අදාළ තොග විකිණීමට ඉඩ දුන් කාලසීමාව ඉකුත් ව ඇත්නම් අදාළ වටිනාකම පරිදි ගිණුම්ගත කළ යුතුයි.

  ණය ගැති පාලන ගිණුම (හර)

  විකුණුම් ගිණුම (බැර)

- මිනුම් කාලච්ඡේදය අග වන විටත් එම බඩු තොගය විකිණී නොමැති නම් අනුමත කාලය ඉකුත්ව නැතිනම් එකී තොගයේ පිරිවැය අවසාන තොගයට එකතු කරන්න.
- නමුත් යවන ලද තොග වැරදීමකින් විකුණුම් ලෙස ගිණුම්ගත වී ඇත්නම් එම ප්‍රමාණය පහත පරිදි ගැලපීම් කළ යුතුයි.

  විකුණුම් ගිණුම (හර)

  ණයගැති පාලන ගිණුම (බැර)

- **තොග හානි වීම**

  විකිණීම සඳහා ලබා ගත් තොගයක් ගින්නකින් හෝ වෙනත් හේතුවක් මත හානිවුව හොත් එම හානි වූ තොගයේ පිරිවැය පහත පරිදි වාර්තා කරන්න.

  හානි වූ තොග ගිණුම (හර)

  ගැනුම් ගිණුම (බැර)

- හානි වූ තොග රක්ෂණය කර තිබුණේ නම් එහි දී දීමට එකඟ වූ රක්ෂණ වන්දිය පහත පරිදි සටහන් කරන්න.

  ලැබිය යුතු රක්ෂණ වන්දි ගිණුම (හර)

  හානි වූ තොග ගිණුම (බැර)

- හානි වූ තොග ගිණුමේ ශේෂය (අලාභය) ආදායම් ප්‍රකාශනයේ වෙනත් වියදම් යටතේ දක්වන්න.

සුහසිංහගේ ව්‍යාපාරයේ මූල්‍ය ප්‍රකශන සම්ප්‍රදායික ආකෘතියට පහත ආකාරයට ඉදිරිපත් කළ හැකි ය.

**සුහසිංහ ව්‍යාපාරය**

**2017/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙළඳ හා ලාභාලාභ ගිණුම**

(රු.)

| | | | | | |
|---|---|---|---|---|---|
| 2016/04/01 තොගය | | 8 000 | විකුණුම් | | |
| + ගැනුම් | | | (200 000 - 6 000) | 194 000 | |
| (80 0000 - 5 000 - 2000) | 73 000 | | ආපසු එවුම් | (10 000) | 184 000 |
| ගෙන ඒමේ කුලී | 4 000 | | | | |
| | | 77 000 | | | |
| | | 85 000 | | | |
| - 2017/03/31 තොගය | | (18 000) | | | |
| විකුණුම් පිරිවැය | | 67 000 | | | |
| දළ ලාභය ප/ගෙ | | 117 000 | | | |
| | | 184 000 | | | 184 000 |
| | | | දළ ලාභය ඉ/ගෙ | | 117 000 |
| **බෙදා හැරීමේ වියදම්** | | | **වෙනත් ආදායම්** | | |
| ප්‍රචාරණය | 1 000 | | ගෙවල් කුලී ආදායම් | | 5 000 |
| මෝටර් රථ ක්ෂය | 7 500 | | | | |
| බොල් ණය | 1 000 | | | | |
| අඩමාණ ණය | 150 | | | | |
| විකුණුම් වියදම් | 4 000 | 13 650 | | | |
| **පරිපාලන වියදම්** | | | | | |
| විදුලිය | 6 000 | | | | |
| ලී බඩු ක්ෂය | 500 | | | | |
| වැටුප් හා වේතන | 15 000 | 21 500 | | | |
| මූල්‍ය හා වෙනත් වියදම් | | | | | |
| තොග හානි | 2 000 | | | | |
| ණය පොලී | 5 000 | | | | |
| බැංකු ගාස්තු | 1 500 | 8 500 | | | |
| ශුද්ධ ලාභය ප්‍රාග්ධන | | 78 350 | | | |
| ගිණුමට ගෙන ගියා | | 122 000 | | | 122 000 |

**සුභසිංහ ව්‍යාපාරය**

**2017/03/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

(රු.)

| | | | | පිරිවැය | සමුච්චිත ක්ෂය | ධාරණ අගය |
|---|---|---|---|---|---|---|
| **හිමිකම්** | | | **ජංගම නොවන වත්කම්** | | | |
| ප්‍රාග්ධනය | 100 000 | | | | | |
| + ශුද්ධ ලාභය | 78 350 | | ඉඩම් හා ගොඩනැගිලි | 150 000 | - | 150 000 |
| | 175 650 | | මෝටර් රථ | 75 000 | 7 500 | 67 500 |
| - ගැනිලි | (2 000) | 176 350 | ලී බඩු | 10 000 | 500 | 9 500 |
| | | | | 235 000 | 8 000 | 227 000 |
| **ජංගම නොවන වගකීම්** | | | **ජංගම වත්කම්** | | | |
| 10% බැංකු ණය | | 50 000 | තොගය | | 18 000 | |
| | | | ණයගැතියෝ | 3 000 | | |
| | | | - අඩමාණ ණය වෙ.කි. | (150) | 2 850 | |
| | | | ලැබිය යුතු රක්ෂණ වන්දි | | 3 000 | |
| | | | ඉ/ගෙ ප්‍රචාරණය | | 2 000 | |
| **ජංගම වගකීම්** | | | මුදල් | | 12 000 | 37 850 |
| ණයහිමියෝ | 26 500 | | | | | |
| උපචිත ගෙන ඒමේ කුලී | 2 000 | | | | | |
| උපචිත විදුලිය | 1 000 | | | | | |
| උපචිත ණය පොළී | 5 000 | | | | | |
| කලින් ලද ගෙවල් කුලී | 4 000 | 38 500 | | | | |
| | | 264 850 | | | | 264 850 |

**පෙර වැඩ :**

| | |
|---|---|
| ණයගැතියෝ | 10 000 |
| - බොල් ණය | (1 000) |
| ආපසු එවුම් පදනම | (6 000) |
| | 3 000 |

අඩමානණය වෙන් කිරීම = $3000 \times \frac{5}{100} = \underline{\underline{150}}$

- ඉහත මූල්‍ය ප්‍රකාශන වර්තමානයේ දී පහත ආකාරයට පිළියෙල කරනු ලැබේ.

**නවාස්ගේ ව්‍යාපාරය**

**2017/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**ආදායම් ප්‍රකාශනය**

(රු.)

| | | | |
|---|---|---|---|
| විකුණුම් | | 394 000 | |
| - ආපසු එවුම් | | (20 000) | 374 000 |
| **- විකුණුම් පිරිවැය** | | | |
| 2016/04/01 තොගය | | 16 000 | |
| + ගැණුම් (160 000 - 5 000 - 2 000) | 153 000 | | |
| ගෙන ඒමේ කුලී | 6 000 | 159 000 | |
| | | 175 000 | |
| - 2017. 08. 31 තොගය | | (18 000) | (157 000) |
| දළ ලාභය | | | 217 000 |
| **වෙනත් ආදායම්** | | | |
| + ගෙවල් කුලී ආදායම් | | | 14 000 |
| | | | 231 000 |
| **බෙදාහැරීමේ වියදම්** | | | |
| ප්‍රචාරණය | 4 000 | | |
| මෝටර් රථ ක්ෂය | 15 000 | | |
| බොල් හා අඩමාණ ණය | 1 650 | | |
| විකුණුම් වියදම් | 8 000 | 28 650 | |
| **පරිපාලන වියදම්** | | | |
| විදුලිය | 11 000 | | |
| ලී බඩු ක්ෂය | 1 000 | | |
| වැටුප් හා වේතන | 30 000 | 42 000 | |
| **මූල්‍ය හා වෙනත් වියදම්** | | | |
| තොග හානි | 2 000 | | |
| ණය පොළී | 10 000 | | |
| බැංකු ගාස්තු | 3 000 | 15 000 | (85 650) |
| **ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට ගෙ/ගි** | | | **145 350** |

**නවාස් ව්‍යාපාරය**

**2017/03/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

| | පිරිවැය රු. | සමුච්චිත ක්ෂය රු. | ධාරණ අගය රු. |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| ඉඩම් හා ගොඩනැගිලි | 300 000 | - | 300 000 |
| මෝටර් රථ | 150 000 | 15 000 | 135 000 |
| ලී බඩු | 20 000 | 1 000 | 19 000 |
| | 470 000 | 16 000 | 454 000 |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | | 18 000 | |
| ණයගැතියෝ | 13 000 | | |
| (-) අඩමාණය ණය වෙන් කිරීම | (650) | 12 350 | |
| ලැබිය යුතු රක්ෂණ වන්දිය | | 3 000 | |
| ඉදිරියට ගෙවූ ප්‍රචාරණය | | 2 000 | |
| මුදල් | | 24 000 | 59 350 |
| **මුළු වත්කම්** | | | 513 350 |
| **හිමිකම් හා වගකීම්** | | | |
| 2016/04/01 ප්‍රාග්ධනය | | 200 000 | |
| + ශුද්ධ ලාභය | | 145 350 | |
| | | 345 350 | |
| (-) ගැනිලි | | (2 000) | 343 350 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| 10% බැංකු ණය | | | 100 000 |
| **ජංගම වගකීම්** | | | |
| ණයහිමියෝ | | 53 000 | |
| උපචිත ගෙන ඒමේ කුලී | | 2 000 | |
| උපචිත විදුලිය | | 1 000 | |
| උපචිත ණය පොළී | | 10 000 | |
| කලින් ලද ගෙවල් කුලිය | | 4 000 | |
| | | | 70 000 |
| **මුළු හිමිකම් හා වගකීම්** | | | **513 350** |

- සේවක අර්ථසාධක අරමුදල් (EPF), සේවක භාර අරමුදල් (ETF) හා එකතු කළ අගය මත බදු (VAT) හා සම්බන්ධ ගැලපුම් සහිත කේවල ස්වාමි ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ආකාරය පහත නිදසුන් ඇසුරින් දැක්විය හැකි ය.
- විමුක්තිගේ වෙළෙඳ ව්‍යාපාරයේ 2017. 03. 31 දිනට උපුටා ගත් ශේෂ පිරික්සුම පහත දැක්වේ.

**ශේෂ පිරික්සුම**

(රු.)

| ගිණුමේ නම | හර | බැර |
|---|---|---|
| ඉඩම් පිරිවැයට | 1 000 000 | |
| ගොඩනැගිලි පිරිවැයට | 800 000 | |
| මෝටර් රථ පිරිවැයට | 1 200 000 | |
| සමුච්චිත ක්ෂය (2016. 04. 01 දිනට) | | |
| ගොඩනැගිලි | | 160 000 |
| මෝටර් රථ | | 240 000 |
| ගැනුම් | 345 000 | |
| විකුණුම් | - | 920 000 |
| තොගය (2016. 04. 01) | 30 000 | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ (ණයගැතියෝ) | 105 000 | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ (ණයහිමියෝ) | | 230 000 |
| වැටුප් හා වේතන (ශුද්ධ) | 72 000 | |
| අනෙකුත් පරිපාලන වියදම් | 23 000 | |
| 12% බැංකු ණය | | 100 000 |
| ගෙවූ බැංකු ණය පොළී | 9 000 | |
| පරිත්‍යාග | 2 000 | |
| මුදල් | 130 000 | |
| සුළු මුදල් | 10 000 | |
| වට්ටම් | 2 000 | 14 000 |
| ගැනිලි | 5 000 | |
| ප්‍රචාරණ වියදම් | 6 000 | |
| ගෙවූ VAT | 25 000 | |
| ප්‍රාග්ධනය | | 2 100 000 |
| | 3 764 000 | 3 764 000 |

**අතිරේක තොරතුරු :**

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී පහත සඳහන් ගැලපීම් කළ යුතු වේ.

1. 2017. 3. 31 තොගය පිරිවැයට රු. 120 000 ක් වූ අතර එදිනට එහි ශුද්ධ උපලබ්ධි අගය රු. 100 000 කි.
2. ගොඩනැගිලි හා මෝටර් රථ පිරිවැය මත 10% බැගින් ක්ෂය කළ යුතු ය.
3. සේවක අර්ථසාධක අරමුදල (EPF) සේවක දායකය 10% ක් වන අතර සේව්‍ය දායකය 15% ක් වේ. සේවක භාර අරමුදල් දායකය (ETF) 3% ක් වේ. EPF සේවක දායකත්වය අඩු කර වැටුප් ගෙවා ඇත. EPF සහ ETF සම්බන්ධයෙන් වෙනත් ගැලපීම් සිදු කර නැත.
4. සියලුම ගැනුම් හා විකුණුම් ණය පදනම මත සිදු වේ. ගැනුම් හා විකුණුම් තුළ 15% ක (VAT) ඇතුළත් වේ. ව්‍යාපාරය VAT සඳහා ලියාපදිංචි වී ඇත.
5. බොල් ණය ලෙස රු. 5 000 ක් කපා හැරීම කළ යුතු අතර, ඉතිරි ණයගැතියන්ගෙන් 10% ක් අඩමාණ ණය ලෙස වෙන් කිරීමට තීරණය කර ඇත.
6. ඉදිරියට ගෙවන ලද රු. 3 000 ක රක්ෂණ ගාස්තු පරිපාලන වියදම් තුළ ඇතුළත් වේ.

අවශ්‍ය වන්නේ :

1. 2017. 03. 31 දිනෙන් අවසන් වසර සඳහා ආදායම් ප්‍රකාශනය
2. 2017. 03. 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

**විමුක්තිගේ වෙළෙඳ ව්‍යාපාරය**

**2017. 03. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය**

| | | | |
|---|---|---|---|
| | | | (රු.) |
| විකුණුම් | | | 800 000 |
| 2016/04/01 තොගය | | 30 000 | |
| + ගැණුම් | | 300 000 | |
| විකිණීමට තිබූ තොගය | | 330 000 | |
| - 2017. 03. 31 තොගය | | (120 000) | |
| විකුණුම් පිරිවැය | | | (210 000) |
| දළ ලාභය | | | 590 000 |
| **වෙනත් ආදායම්** | | | |
| ලද වට්ටම් | | 14 000 | 14 000 |
| | | | 604 000 |
| **බෙදාහැරීමේ වියදම්** | | | |
| මෝටර් රථ ක්ෂය | 120 000 | | |
| බොල් ණය | 5 000 | | |
| අඩමාන ණය | 10 000 | | |
| දුන් වට්ටම් | 2 000 | | |
| ප්‍රචාරණ වියදම් | 6 000 | 143 000 | |
| **පරිපාලන වියදම්** | | | |
| ගොඩනැගිලි ක්ෂය | 80 000 | | |
| වැටුප් හා වේතන | 80 000 | | |
| EPF වියදම | 12 000 | | |
| ETF වියදම | 2 400 | | |
| වෙනත් පරිපාලන වියදම් | 20 000 | 194 400 | |
| **මූල්‍ය වියදම්** | | | |
| ණය පොළී | 12 000 | 12 000 | |
| **වෙනත් වියදම්** | | | |
| තොග කපා හැරීම | 20 000 | | |
| පරිත්‍යාග | 2 000 | 22 000 | (371 400) |
| **ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට මාරු කළා** | | | **232 600** |

පෙර වැඩ

| VAT සහිත වටිනාකම | = | VAT වටිනාකම | + | VAT රහිත වටිනාකම |
|---|---|---|---|---|
| 115 | = | 15 | + | 100 |

විකුණුම් මත VAT $= \frac{920000}{115} \times 15 = \underline{120\,000}$

ගැනුම් මත VAT $\frac{345000}{115} \times 15 = \underline{45\,000}$

VAT ගිණුම

| | | | |
|---|---|---|---|
| මුදල් | 25 000 | විකුණුම් | 120 000 |
| ගැනුම් | 45 000 | | |
| ප/ගෙ | 50 000 | | |
| | 120 000 | | 120 000 |
| | | ඉ/ගෙ | 50 000 |

ගැනුම් ගිණුම

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ | 345 000 | VAT | 45 000 |
| | | ආදායම් ප්‍රකාශනයට | 300 000 |
| | 345 000 | | 345 000 |

විකුණුම් ගිණුම

| | | | |
|---|---|---|---|
| VAT | 120 000 | ඉ/ගෙ | 920 000 |
| ආදායම් ප්‍රකාශනයට | 800 000 | | |
| | 920 000 | | 920 000 |

අඩමාන ණය 105000
(5000)

$100000 \times \frac{10}{100} = \underline{\underline{10000}}$

අඩමාන ණය වෙන් කිරීම :

**විමුක්තිගේ වෙළෙඳ ව්‍යාපාරය**

**2017. 03. 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

(රු.)

| | පිරිවැය | සමුච්චිත ක්ෂය | ධාරණ අගය |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| ඉඩම් | 1 000 000 | - | 1 000 000 |
| ගොඩනැගිලි | 800 000 | 240 000 | 560 000 |
| මෝටර් රථ | 1 200 000 | 360 000 | 840 000 |
| | 3 000 000 | 600 000 | 2 400 000 |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | | 100 000 | |
| ඉදිරියට ගෙවූ රක්ෂණ ගාස්තු | | 3 000 | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 100 000 | | |
| - අඩමාන ණය වෙන් කිරීම | (10 000) | 90 000 | |
| මුදල් | | 130 000 | |
| සුළු මුදල් | | 10 000 | 333 000 |
| මුළු වත්කම් | | | 2733 000 |
| **හිමිකම් හා වගකීම්** | | | |
| ප්‍රාග්ධනය | | 2 100 000 | |
| + ශුද්ධ ලාභය | | 232 600 | |
| | | 2 332 600 | |
| - ගැනිලි | | (5 000) | 2 327 600 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| 12% බැංකු ණය | | 100 000 | 100 000 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 230 000 | |
| ගෙවිය යුතු EPF | | 20 000 | |
| ගෙවිය යුතු ETF | | 2 400 | |
| ගෙවිය යුතු VAT | | 50 000 | |
| උපචිත ණය පොළී | | 3 000 | 305 400 |
| මුළු හිමිකම් හා වගකීම් | | | 2 733 000 |

**පෙර වැඩ**

දළ වැටුප = EPF + ශුද්ධ වැටුප

100 = 10 + 90

EPF සේවක දායකය $= \frac{72000}{90} \times 10 = 8000$

EPF සේව්‍ය දායකය $= \frac{80000}{100} \times 15 = 12000$

වැටුප් හා වේතන ගිණුම

| | | | |
|---|---|---|---|
| මුදල් | 72 000 | ආදායම් ප්‍රකාශනයට | 80 000 |
| ගෙවිය යුතු EPF | 8 000 | | |
| | 80 000 | | 80 000 |

EPF වියදම් ගිණුම

| | | | |
|---|---|---|---|
| ගෙවිය යුතු EPF | 12 000 | ආදායම් ප්‍රකාශනයට | 12 000 |
| | 12 000 | | 12 000 |

ගෙවිය යුතු EPF ගිණුම

| | | | |
|---|---|---|---|
| | | වැටුප් | 8 000 |
| | | EPF වියදම | 12 000 |
| ප/ගෙ | 20 000 | | |
| | 20 000 | | 20 000 |
| | | ඉ/ගෙ | 20 000 |

EPF දායකය $= 80000 \times \frac{03}{100} = 2400$

ETF වියදම් ගිණුම

| | | | |
|---|---|---|---|
| ගෙවිය යුතු ETF | 2 400 | ආදායම් ප්‍රකාශනයට | 2 400 |
| | 2 400 | | 2 400 |

ගෙවිය යුතු ETF ගිණුම

| | | | |
|---|---|---|---|
| | | ETF වියදම | 2 400 |
| ප/ගෙ | 2 400 | | |
| | | | 2 400 |
| | 2 400 | | 2 400 |
| | | ශේ/ඉ/ගෙ | 2 400 |

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක**

- කේවල ස්වාමි ව්‍යාපාරයක මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කිරීම සඳහා පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශනය නම් කරයි.
- පහත සඳහන් ගැලපුම් සටහන්වලට අදාළ ද්විත්ව සටහන් ඉදිරිපත් කරයි.
  - ගෙවිය යුතු විදුලිය
  - ඉදිරියට ගෙවූ රක්ෂණ වාරිකය
  - කලින් ලද ගෙවල් කුලී ආදායම
  - ලැබිය යුතු පොලී ආදායම

- දෙන ලද තොරතුරු ඇසුරින් කේවල ස්වාමී ව්‍යාපාරයක මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කිරීම.
- විකුණුම් පිරිවැය ගණනය කරන ආකාරය දැක්වීම.

- 2017. 03. 31 දිනට අමිල ව්‍යාපාරයේ ගිණුම් පොත්වලින් පහත තොරතුරු ඔබට සපයයි.

| | |
|---|---|
| භෞතික තොගය (2017. 03. 31) | 150 000 |
| ණයගැතියෝ | 120 000 |
| විකුණුම් | 850 00 |

විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත ගනුදෙනුකරුවන්ට රු. 60 000 ක් පිරිවැය වූ භාණ්ඩ 75 000 කට ඉන්වොයිස් කර ඇත. ආපසු එවීමේ කාලය ඉක්මනොවූ මෙම බඩු තොගයෙන් 60% ක් 2017. 03. 31 දිනට විකුණා ඇති බව අනාවරණය කර ගෙන ඇත.

පහත එක් එක් අවස්ථා යටතේ ඒ ඒ ගිණුම් ශේෂයන් ගණනය කරන්න.

1. තොග යවන අවස්ථාවේ නාමික සටහනක් තබා තොග භාර දී ඇත.
2. තොග යවන අවස්ථාවේ මුළු වටිනාකම ණයට විකුණුම් ලෙස වාර්තා කර ඇත.

| | 2017. 03. 31 තොගය | 2017.03.31 දිනට ණයගැති වටිනාකම | විකුණුම් වටිනාකම |
|---|---|---|---|
| | | | |
| | | | |

**නිපුණතාව 7.0 : නිෂ්පාදන ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.**

**නිපුණතා මට්ටම 7.1** : නිෂ්පාදන ව්‍යාපාරයක නිෂ්පාදන පිරිවැය ගණනය කරයි.

**7.2 : නිෂ්පාදන ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන ඇසුරෙන් තීරණ ගනියි.**


**කාලච්ඡේද** : 10

**ඉගෙනුම් ඵල** :

- නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේ අවශ්‍යතාව දක්වයි.
- නිෂ්පාදන පිරිවැයෙහි මූලිකාංග පැහැදිලි කරයි.
- නිෂ්පාදන ව්‍යාපාරයක ඇති තොග වර්ග පැහැදිලි කරයි.
- නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේ දී නොනිමි තොගය නිෂ්පාදන පිරිවැයට ගණනය කරයි.
- නිෂ්පාදන පිරිවැය ගණනය කරයි.
- නිෂ්පාදන පිරිවැය ඇසුරින් විකුණුම් පිරිවැය ගණනය කරයි.
- නිෂ්පාදන ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.
- නිෂ්පාදන ගිණුමක් ඇසුරෙන් නිෂ්පාදන පිරිවැය මූලිකාංග මතු කර දක්වයි.

**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම**



**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසුම**

- පහත සඳහන් නිෂ්පාදන ව්‍යාපාර දෙකෙහි අදාළ වියදම් ලැයිස්තුව ඇතුළත් රූප සටහන උචිත ආකාරයකට සිසුන්ට ඉදිරිපත් කරන්න.

**නිෂ්පාදන ව්‍යාපාර දෙකකට අදාළ වියදම් ලැයිස්තුව**

1. දැව ගෙන ඒමේ කුලී
2. දැව මිලට ගැණුම්
3. රෙදි මිලට ගැණුම්
4. යන්ත්‍ර ක්‍රියාකරු වැටුප්
5. දැව ආපසු යැවුම්
6. කම්හල් විදුලිය
7. යන්ත්‍ර ක්ෂය
8. කම්හල් රක්‍ෂණය
9. කම්හල් නඩත්තු වියදම්
10. වඩු කාර්මික වැටුප
11. කම්හල් කළමනාකරණ වේතන
12. රෙදි ආපසු යැවුම්
13. රෙදි ගෙන ඒමේ කුලී
14. මහන මැෂින් අලුත්වැඩියා
15. තීන්ත ආලේපන වියදම්
16. මෝස්තර නිර්මාණ වියදම්
17. ඇසුරුම් වියදම්
18. පරිපාලන වියදම්
19. යන්ත්‍ර අලුත්වැඩියා වියදම්
20. විකුණුම් වියදම්

**ලී බඩු නිෂ්පාදන ආයතනය**

**ඇගලුම් නිෂ්පාදන ආයතනය**

- ඉහත රූප සටහනේ ඇතුළත් වියදම් අයිතම ඒ ඒ නිෂ්පාදන ව්‍යාපාරයට අදාළ ව වෙන් කර ලියා දැක්වීමට යොමු කරන්න.
- සිසුන් ලියන ලද වර්ග කිරීම් නිවැරදි ව පරික්ෂා කර, වැරදි අයිතම ඇතොත් ඒවා නිවැරදි කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- ඉහත ඉදිරිපත් කරන ලද ව්‍යාපාර දෙක පදනම් කර ගෙන සිසුන් කණ්ඩායම් දෙකකට වෙන් කරන්න.
- ඒ ඒ කණ්ඩායමට ලැබුණු ව්‍යාපාරයේ වියදම් අයිතම පහත ආකාරයේ ගැලීම් සටහනක ඇතුළත් කරන ලෙස උපදෙස් දෙන්න.

| ලී බඩු නිෂ්පාදන ආයතනය | (රු.) |
|---|---|
| දැව ගෙන ඒමේ කුලී | 10 000 |
| දැව මිලට ගැණුම් | 250 000 |
| යන්ත්‍ර ක්‍රියාකරු වැටුප | 70 000 |
| දැව ආපසු යැවුම් | 10 000 |
| කම්හල් විදුලිය | 4 000 |
| යන්ත්‍ර ක්ෂය | 5 000 |
| කම්හල් රක්‍ෂණය | 8 000 |
| කම්හල් නඩත්තු වියදම් | 4 000 |
| වඩු කාර්මික වැටුප | 80 000 |
| කම්හල් වේතන | 15 000 |
| තීන්ත ආලේපන වියදම් | 5 000 |
| මෝස්තර නිර්මාණ වියදම | 14 000 |

අමතර තොරතුරු

| | |
|---|---|
| යන්ත්‍ර | 50 000 |
| ආරම්භක නොනිමි තොග | 20 000 |
| අවසාන නොනිමි තොග | 18 000 |
| ආරම්භක දැව තොගය | 20 000 |
| අවසාන ඉතිරි දැව තොගය | 15 000 |
| ආරම්භක නිමි තොගය | 25 000 |

| ඇගලුම් නිෂ්පාදන ආයතනය | (රු.) |
|---|---|
| රෙදි මිලට ගැණුම් | 200 000 |
| යන්ත්‍ර ක්‍රියාකරු වැටුප | 90 000 |
| කම්හල් විදුලිය | 10 000 |
| යන්ත්‍ර ක්ෂය | 8 000 |
| කම්හල් නඩත්තු වියදම් | 6 000 |
| කම්හල් රක්‍ෂණය | 5 000 |
| කම්හල් වේතන | 15 000 |
| රෙදි ආපසු යැවුම් | 20 000 |
| රෙදි ගෙන ඒමේ කුලී | 12 000 |
| මහන මැෂින් අලුත්වැඩියාව | 8 000 |
| ඇසුරුම් වියදම් | 12 000 |
| මෝස්තර නිර්මාණ වියදම | 14 000 |

අමතර තොරතුරු

| | |
|---|---|
| මහන මැෂින් | 100 000 |
| ආරම්භක නොනිමි තොග | 20 000 |
| අවසාන නොනිමි තොග | 22 000 |
| ආරම්භක රෙදි තොගය | 22 000 |
| අවසාන දිනට රෙදි තොගය | 15 000 |
| ආරම්භක නිමි තොගය | 18 000 |

- නිෂ්පාදනයට අදාළ වියදම් පමණක් හඳුනා ගෙන, මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම කළ යුතු බව පැහැදිලි කරන්න.
- ආරම්භක අමුද්‍රව්‍ය, නොනිමි සහ නිමි තොග, එමෙන් ම ඒවායේ අවසාන ශේෂ සහ විකුණුම් ආදායම වෙන ම වගුවක ලබා දෙන්න.
- නිෂ්පාදන පිරිවැය මූලිකාංග මතුවන ආකාරයට පහත දැක්වෙන පරිදි නිෂ්පාදන ගිණුමක් ඇසුරින් මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම සිසුන් සමග සාකච්ඡා කරමින් පිළියෙල කරන්න. එය පහත දැක්වේ.

**ලී බඩු නිෂ්පාදන ආයතනය**

**2017. 03. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන**

**පිරිවැය ලේඛනය හා ආදායම් ප්‍රකාශනය**

| | (රු.) | (රු.) |
|---|---|---|
| ආරම්භක දැව තොගය | | 20 000 |
| දැව ගැණුම් | 250 000 | |
| - දැව ආපසු යැවුම් | (10 000) | |
| | 240 000 | |
| + දැව ගෙන ඒමේ කුලී | 10 000 | 250 000 |
| | | 270 000 |
| අවසාන දිනට දැව තොගය | | (15 000) |
| පරිභෝජන ද්‍රව්‍ය පිරිවැය | | 255 000 |
| යන්ත්‍ර ක්‍රියාකරු වැටුප | 70 000 | |
| වඩු කාර්මික වැටුප | 80 000 | |
| මෝස්තර නිර්මාණ වියදම | 14 000 | 164 000 |
| ප්‍රාථමික පිරිවැය | | 419 000 |
| **නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය** | | |
| කම්හල් රක්‍ෂණය | 8 000 | |
| කම්හල් නඩත්තු වියදම් | 4 000 | |
| කම්හල් විදුලිය | 4 000 | |
| යන්ත්‍ර ක්ෂය | 5 000 | |
| කම්හල් වේතන | 15 000 | |
| තීන්ත ආලේපන වියදම් | 5 000 | 41 000 |
| | | 460 000 |
| ආරම්භක නොනිමි තොගය | 20 000 | |
| අවසාන නොනිමි තොගය | (18 000) | 2 000 |
| මුළු නිෂ්පාදන පිරිවැය වෙළඳ ගිණුමට ගෙ/ගි | | 462 000 |
| විකුණුම් ආදායම් | | 600 000 |
| ආරම්භක නිමි තොගය | 25 000 | |
| නිෂ්පාදන පිරිවැය | 462 000 | |
| | 487 000 | |
| අවසාන නිමි තොගය | (10 000) | |
| විකුණුම් පිරිවැය | | (477 000) |
| දළ ලාභය | | 123 000 |

- ඇගලුම් නිෂ්පාදන ව්‍යාපාරයේ නිෂ්පාදන ගිණුම හා ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීමට සිසුන් යොමු කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- නිෂ්පාදන ගිණුමක් පිළියෙල කිරීමේ අවශ්‍යතාව
  - මුළු නිෂ්පාදන පිරිවැය සෙවීම
  - නිෂ්පාදන පිරිවැය පාලනය කිරීම
  - නිෂ්පාදනය පිළිබඳ තීරණ ගැනීම

**නිෂ්පාදන පිරිවැය මූලිකාංග**

- ප්‍රාථමික පිරිවැය
- නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය ලෙස නම් කරයි.

**ඍජු ද්‍රව්‍ය පිරිවැය**

නිෂ්පාදනයට ඍජු ව අදාළ නිෂ්පාදන ඒකක සමග පැහැදිලි ව වෙන්කර හඳුනා ගත හැකි ද්‍රව්‍යවලට වැය වූ පිරිවැයයි.

නිදසුන් : ලී බඩු නිපදවන ආයතනයක - දැව

ඇඳුම් මැසීමේ ආයතනයක - රෙදි

**ඍජු ශ්‍රම පිරිවැය**

නිෂ්පාදන ඒකක සමග පැහැදිලි ව වෙන් කර හඳුනා ගත හැකි, නිෂ්පාදිත සැකසීමට ඍජුව ම දායකවන ශ්‍රමිකයන් වෙනුවෙන් දරන වැටුප් පිරිවැය.

නිදසුන් : ලී බඩු නිෂ්පාදන - වඩු කාර්මික වැටුප

ඇගළුම් කම්හලක - ඇඳුම් මසන්නාට ගෙවූ වැටුප

**ඍජු වෙනත් වියදම්**

නිෂ්පාදිත ඒකකයන් සමග පැහැදිලි ව වෙන් කර, හඳුනා ගත හැකි, ද්‍රව්‍ය හා ශ්‍රමය නොවන වෙනත් වියදම් ඍජු වෙනත් වියදම් වේ.

නිදසුන් :
- මෝස්තර නිර්මාණය කිරීමේ වියදම්
- නිෂ්පාදන ඒකක අනුව ගෙවන පුරස්කාර

- නිෂ්පාදන ව්‍යාපාරයක පහත දැක්වෙන තොග දැකිය හැකි ය.
  - අමුද්‍රව්‍ය තොගය
  - නොනිමි තොගය
  - නිමි තොගය

- නොනිමි තොගය සඳහා ප්‍රාථමික හා නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය ඇතුළත් වී ඇතැයි සලකා නිෂ්පාදන පිරිවැයට ගැලපුම් කරනු ලැබේ.
- නිෂ්පාදන හා බෙදාහැරීමේ ව්‍යාපාරයකට අදාළ දත්ත ඇතුළත් අභ්‍යාස කිහිපයක් සකස් කර නිෂ්පාදන ගිණුම, ආදායම් ප්‍රකාශනය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීමට සිසුන්ට ලබා දෙන්න.

**තක්සේරු හා ඇගයීම් නිර්නායක**

- නිෂ්පාදන පිරිවැය යන්න අර්ථ දැක්වීම
- නිෂ්පාදන පිරිවැය මූලිකාංග වර්ග කර දැක්වීම
- ප්‍රාථමික පිරිවැය හා නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය වෙන්කර හඳුනා ගැනීමට වියදම් ලේඛනයක් ඉදිරිපත් කිරීම.
- නිෂ්පාදන ගිණුම හා ආදායම් ප්‍රකාශනය අතර සම්බන්ධය දැක්වීම.
- දෙන ලද තොරතුරු ඇසුරින් නිෂ්පාදන ගිණුමක් පිළියෙල කිරීම.

| මූලික පද | பிரதான பதங்கள் | Key terms |
|---|---|---|
| • නිෂ්පාදන පිරිවැය | உற்பத்திக் கிரயம் | Cost of porduction |
| • නිෂ්පාදන පිරිවැය මූලිකාංග | உற்பத்திக் கிரயக் கூறுகள் | Elements of cost of production |
| • ද්‍රව්‍ය පිරිවැය | பொருட் கிரயம் | Material cost |
| • ශ්‍රම පිරිවැය | கூலிக் கிரயம் | Labour cost |
| • සෘජු ද්‍රව්‍ය පිරිවැය | நேர்பொருட் கிரயம் | Direct material cost |
| • සෘජු ශ්‍රම පිරිවැය | நேர்கூலிக் கிரயம் | Direct labour cost |
| • සෘජු වෙනත් පිරිවැය | நேர் ஏனைய கிரயங்கள் | Direct other costs |
| • වක්‍ර ද්‍රව්‍ය පිරිවැය | நேரில் பொருட் கிரயம் | Indirect material cost |
| • වක්‍ර ශ්‍රම පිරිවැය | நேரில் கூலிக் கிரயம் | Indirect labour cost |
| • වක්‍ර වෙනත් පිරිවැය | ஏனைய நேரில் கிரயங்கள் | Indirect other costs |
| • නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | உற்பத்தி மேந்தலைகள் | Production overhead Cost |
| • ප්‍රාථමික පිරිවැය | முதன்மைக் கிரயம் | Prime cost |
| • මුළු නිෂ්පාදන පිරිවැය | மொத்த உற்பத்திக் கிரயம் | Total cost of production |

**නිපුණතාව 8.0 : ලාභ අරමුණු කර නොගත් සංවිධානයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.**

**නිපුණතා මට්ටම 8.1 :** ලාභ අරමුණු කර නොගත් සංවිධානයක ගිණුම් තැබීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.

8.2 : ලාභ අරමුණු කර නොගත් සංවිධානයක කාර්ය සාධනය හා මූල්‍ය තත්ත්වය අනාවරණය කරයි.


**කාලච්ඡේද** : 16

**ඉගෙනුම් ඵල** :

- ලාභ අරමුණු කර නොගත් සංවිධාන පැහැදිලි කරයි.
- ගිණුම් තැබීමේ අවශ්‍යතාව දක්වයි.
- සංවිධානයක පවත්වා ගන්නා ගිණුම් පැහැදිලි කරයි.
- සාමාජික මුදල් ගිණුම පිළියෙල කරයි.
- යාවජීව සාමාජික මුදල් ගිණුම්ගත කරයි.
- පරිත්‍යාග ගිණුම්ගත කරන ආකාරය පැහැදිලි කරයි.
- සමුච්චිත අරමුදල යන්න පැහැදිලි කර, ගණනය කරයි.
- ලාභ අරමුණු කර නොගත් සංවිධාන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.

**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම**



**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසුම :**

- සිසුන් පදිංචි වී සිටින ප්‍රදේශවල පවත්වා ගෙන යන සමිති සංවිධාන මොනවාදැයි සිසුන්ගෙන් විමසමින් ඒවායේ ප්‍රධාන අරමුණ පැහැදිලි කර දෙන්න.
- ලාභ අරමුණු කර නොගත් සංවිධානයක් නිදසුන් ලෙස ගෙන, එහි සිදුවිය හැකි ගනුදෙනු ලැයිස්තුවක් පිළියෙල කර පන්තියට ඉදිරිපත් කරන්න.

නිදසුන : 2016 වර්ෂයේ ආරම්භක කරන ලද ශක්ති ක්‍රීඩා සංගමයේ ගනුදෙනු / තොරතුරු පහත දැක්වේ.

සාමාජික සංඛ්‍යාව - 200

| | |
|---|---|
| • එක් අයකුගේ වාර්ෂික සාමාජික මුදල | 100 |
| • විදුලි බිල ගෙවීම | 1 000 |
| • පුවත්පත් මිලට ගැණුම් | 300 |
| • සංග්‍රහ වියදම් | 250 |
| • පරිත්‍යාග ලැබීම් | 15 000 |
| • ක්‍රීඩා පිටිය පිරිසිදු කිරීමට | 2 000 |
| • සන්නිවේදන ගාස්තු | 1 500 |
| • ගෙවිය යුතු සේවක වැටුප් | 8 000 |
| • ලිපිද්‍රව්‍ය වියදම | 2 500 |
| • ක්‍රීඩා තරග වියදම | 12 000 |
| • ක්‍රීඩා පිටිය නවීකරණය (වැටක් සවි කිරීමට) | 15 000 |
| • ක්‍රීඩා පිටිය කුලියට දීමෙන් | 80 000 |
| • පරණ පත්තර විකිණීමෙන් | 200 |
| • ආපනශාලා ආදායම් | 20 000 |
| • ආපනශාලා වියදම් | 12 000 |
| • ලැබූ සාමාජික මුදල් වර්ෂය සඳහා | 18 000 |
| • ලී බඩු ණයට ගැණුම් | 20 000 |

- ක්‍රීඩා සංගමයේ ලාභ අරමුණක් නැතත් ආර්ථිකමය ගනුදෙනු සිදු වී ඇති නිසා ඒ පිළිබඳ සාමාජිකයන් දැනුවත් කළ යුතු බැවින්, ගිණුම් පවත්වා ගත යුතු බව සිසුන්ට පැහැදිලි කර දෙන්න.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- පහත සඳහන් මාතෘකාවලින් ඒ ඒ කණ්ඩායමට ලැබෙන මාතෘකාව කෙරෙහි අවධානය යොමු කරවන්න.

- ලැබීම් හා ගෙවීම් ගිණුම / මුදල් ගිණුම
- ආදායම් හා වියදම් ගිණුම (ආදායම් ප්‍රකාශනය)

- පිවිසුම සඳහා යොදා ගත් ක්‍රීඩා සංගමයේ ගනුදෙනු ලැයිස්තුව සිසු කණ්ඩායම් දෙකකට ලබා දෙන්න.
- එම ගනුදෙනු ලැයිස්තුව හොඳින් අධ්‍යයනය කිරීමට ඉඩ සලස්වා ලැබූ මාතෘකාවට අදාළ ව ගනුදෙනු වෙන් කර හඳුනා ගැනීමට මඟ පෙන්වන්න.
- මාතෘකාවට අදාළ ව හඳුනා ගත් ගනුදෙනු ඇසුරින් එම ගිණුම / ගිණුම් වාර්තාව පිළියෙල කරවන්න.
- කණ්ඩායම් විසින් සකස් කළ ගිණුම් වාර්තා පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එම ගිණුම් වාර්තාවල වැරදි ඇතොත් ඒ වේලාවේ ම නිවැරදි කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.
- කණ්ඩායම් දෙක පිළියෙල කළ ගිණුම් වාර්තාවල අවසාන ප්‍රතිඵලය පිළිබඳ විමසා එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට සම්බන්ධ කර ගන්නා ආකාරය පැහැදිලි කර දෙන්න.
- කණ්ඩායම් විසින් සකස් කළ ගිණුම් වාර්තා දෙක අතර වෙනස්කම් වගුගත කිරීමට යොමු කරවන්න.
- මෙම ක්‍රීඩා සංගමයේ ගනුදෙනු අතරින් තම කණ්ඩායම සකස් කළ ගිණුම් වාර්තාවට ඇතුළත් නොකළ අයිතම නම් කර, එයට හේතුවඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- මෙම ක්‍රීඩා සංගමය නිරත වී ඇති අතිරේක ක්‍රියාකාරකම කුමක්දැයි විමසා එයින් ලද ප්‍රතිඵලය සෙවීමට සිසුන් යොමු කර එය වාර්තා කරන ආකාරය පැහැදිලි කර දෙන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- සාමාජික හා සමාජ සුභ සාධනයට හා අභිවෘද්ධිය අරමුණු කර ගත් සංවිධාන ලාභ අරමුණු කර නොගත් සංවිධාන ලෙස හැඳින්වේ.

  නිදසුන් :
  - ක්‍රීඩා සමිති, සංවිධාන
  - අවමංගල්‍යාධාර සමිති
  - තරුණ සංවිධාන
  - ආගමික සංවිධාන
  - යනාදිය

- ගිණුම් තැබීමේ අවශ්‍යතාව
  - ලාභ අරමුණක් නැතත් මෙවැනි සංවිධාන ආර්ථිකමය කටයුතුවල දී නිරත වේ. එමෙන්ම සාමාජිකයිගේ මුදල් ලබා ගනියි. මෙවැනි ආර්ථිකමය කටයුතුවල නිරත වන බැවින් ඒ පිළිබඳ නිවැරදි තොරතුරු සාමාජිකයන්ට ලබාදීම සඳහා ගිණුම් තැබීමක් අවශ්‍ය වේ.

- ලාභ අරමුණු කර නොගත් සංවිධාන සකස් කරන ගිණුම් හා වාර්තා
    - ලැබීම් හා ගෙවීම් ගිණුම/මුදල් ගිණුම
    - සාමාජික මුදල් ගිණුම
    - ආදායම් හා වියදම් ගිණුම / ආදායම් ප්‍රකාශනය
    - මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
    - බාහිර ක්‍රියාකාරකම්වලින් සිදු වන ප්‍රතිඵල ගණනය කිරීම සඳහා ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීම.
- ලාභ අරමුණු කර නොගත් සංවිධානවල ප්‍රධාන ආදායම් මාර්ගය සාමාජික මුදල් බැවින් ඒ සඳහා සාමාජික මුදල් ගිණුමක් පවත්වා ගනියි.

- සාමාජික මුදල් ගිණුමේ අන්තර්ගත තොරතුරු ලෙස
    - වර්ෂය ආරම්භක දිනට - හිඟ හිටි සාමාජික මුදල්
      - කලින් ලද සාමාජික මුදල්
    - වර්ෂය අවසාන දිනට - හිඟහිටි සාමාජික මුදල්
      - කලින් ලද සාමාජික මුදල්
    - වර්ෂය තුළ ලැබූ සාමාජික මුදල්
    - වර්ෂයට අදාළ සාමාජික මුදල

- **ලැබීම් හා ගෙවීම් ගිණුම / මුදල් ගිණුම**

  ගිණුම් කාලච්ඡේදය තුළ සංවිධානයට මුදලින් ලැබූ හා සංවිධාන විසින් මුදලින් ගෙවූ වටිනාකම පමණක් සාරාංශ කර ඇතුළත් කරන ගිණුම, ලැබීම් ගෙවීම් ගිණුමයි. මෙය මුදල් **පදනමට** පිළියෙල කරයි.

  **ආදායම් ප්‍රකාශනය / ආදායම් හා වියදම් ගිණුම**

  කාලච්ඡේදයට අදාළ ආදායම් හා වියදම් ඇතුළත් කර සකස් කරන ලේඛනය ආදායම් ප්‍රකාශනයයි. මෙය **උපචිත පදනමට** පිළියෙල කරයි. මෙහි ප්‍රතිඵලය **අතිරික්තය** හෝ **ඌණතාව** ලෙස හැඳින්වේ.

  කාලච්ඡේදයේ වියදමට වඩා වැඩි ආදායම් ප්‍රමාණය **අතිරික්තය** ලෙස හැඳින්වේ. මෙම අතිරික්ත එක් රැස්වීමෙන් ගොඩ නැගෙන අරමුදල **සමුච්චිත අරමුදල** ලෙස හැඳින්වේ. කාලච්ඡේදයේ වියදමට වඩා ආදායම් ප්‍රමාණය අඩු නම් එම අඩු වූ ප්‍රමාණය **ඌණතාව** ලෙස හැඳින්වේ.

  **සමුච්චිත අරමුදල**

  අතිරික්තය නිසා වැඩි වන අතර ඌණතාවය නිසා අඩු වේ. සෑම වසරක ම අතිරික්ත එකතු වීමෙන් සමුච්චිත අරමුදල ගොඩ නැගේ. එමෙන් ම නිශ්චිත දිනකට පැවැති මුළු වත්කම් වටිනාකමෙන් මුළු වගකීම් වටිනාකම අඩු කර සමුච්චිත අරමුදල ගණනය කරයි.

  **බාහිර ක්‍රියාකාරකම්**

  ලාභ අරමුණු කර නොගත් සංවිධාන සිය දියුණුව හා සංවර්ධනය කර ගැනීමේ අරමුණින් ප්‍රධාන අරමුණට අමතරව ලාභ අරමුණු සහිත ව බාහිර ක්‍රියාකාරකම්වල නිරත වේ.

නිදසුන් :

- ආපනශාලා පවත්වා ගෙන යාම
- ක්‍රීඩා තරග පැවැත්වීම
- නාට්‍ය සංදර්ශන පැවැත්වීම

යනාදිය දැක්විය හැකිය. මේවායේ ප්‍රතිඵල වෙන ම ගණනය කර, එය ආදායම් ප්‍රකාශනයට / ආදායම් හා වියදම් ගිණුමට ඇතුළත් කළ යුතු ය.

**යාවජීව සාමාජික මුදල්**

සංවිධානයේ සාමාජිකයන් මුළු ජීවිත කාලය සඳහා ම එකවර මුදලක් ගෙවා ලබා ගන්නා සාමාජිකත්වය වෙනුවෙන් ලැබෙන මුදල් **යාවජීව සාමාජික** මුදල් ලෙස හැඳින්වේ. මෙය එකවර ලැබෙන මුදලක් බැවින්, වර්ෂයට අදාළ ව සමිතිය තීරණය කරන යම් ප්‍රමාණයක් ආදායමක් සේ සලකා, ඉතිරිය ඉදිරි කාලච්ඡේද සඳහා බෙදාහැරීමට අරමුදලක් සේ පවත්වා ගැනීම බොහෝ දුරට සිදු වේ.

**පරිත්‍යාග**

ලාභ අරමුණු කර නොගත් ආයතනවලට විවිධ පරිත්‍යාග ලැබේ. මෙවැනි ලැබෙන පරිත්‍යාග සාමාන්‍ය පරිත්‍යාග සහ විශේෂ පරිත්‍යාග ලෙස කොටස් දෙකකට වර්ග කළ හැකි ය. සාමාන්‍ය පරිත්‍යාග යනු ආයතනයේ එදිනෙදා කටයුතු පවත්වා ගැනීමට ලැබෙන පරිත්‍යාග වේ.

සාමාන්‍ය පරිත්‍යාග ගිණුම්ගත කිරීම :

ලැබීම් හා ගෙවීම් ගිණුම හර

ආදායම් වියදම් ගිණුම බැර

එනම් සාමාන්‍ය පරිත්‍යාග ලැබෙන වර්ෂයේ ආදායමක් ලෙස වාර්තා කෙරේ. කිසියම් නිශ්චිත කටයුත්තක් හෝ අරමුණක් සඳහා පරිත්‍යාග ලැබේ නම් එය **විශේෂ පරිත්‍යාගයක්** වශයෙන් හැඳින්වේ. උදා : ලෙස රු. ලක්ෂ 20 ක වටිනාකමින් යුත් මෝටර් රථයක් පරිත්‍යාගයක් ලෙස ලැබීම දැක්විය හැකි ය.

මෙවැනි විශේෂ පරිත්‍යාග ලැබෙන වර්ෂයේ සම්පූර්ණයෙන් ම ආදායමක් ලෙස සාමාන්‍යයෙන් නොගනියි. ඒ අනුව ඉහත උදාහරණයට අනුව මෝටර් රථ පරිත්‍යාගය පහත ලෙස ගිණුම් තැබිය හැකි ය.

මෝටර් රථ ගිණුම හර

පරිත්‍යාග ගිණුම බැර

පරිත්‍යාග ගිණුමේ ශේෂය කොටස් වශයෙන් ආදායමට හඳුනාගත හැකි ය. එය ආයතනයේ කළමනාකාරිත්වය තීරණය කළ යුතු ය. එසේ කොටස් වශයෙන් ආදායමට හඳුනා ගන්නා විට,

පරිත්‍යාග ගිණුම හර

ආදායම් වියදම් ගිණුම බැර

ලෙස සටහන් කළ යුතු ය.

පරිත්‍යාග ගිණුමේ ඉතිරි ඉතිරි ශේෂය මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සමුච්චිත අරමුදල යටතේ පෙන්නුම් කළ යුතු ය.

නිදසුන ඃ සුමග සුහ සාධක සංගමයේ 2017/03/31 දිනෙන් අවසන් වර්ෂයේ සිදු වූ මුදල් ලැබීම් හා ගෙවීම් මෙසේ ය.

මුදල් ගිණුම / ලැබීම් හා ගෙවීම් ගිණුම

(රු.)

| | | | |
|---|---|---|---|
| 2016/04/01 අතැති මුදල් | 50 000 | නඩත්තු වියදම් | 20 000 |
| සාමාජික මුදල් | 50 000 | ආපනශාලා ආහාර | 60 000 |
| ආපනශාලා ලැබීම් | 100 000 | දුරකථන ගාස්තු | 10 000 |
| යාවජීව සාමාජික මුදල් | 60 000 | සේවක වැටුප් | 70 000 |
| ඇතුළත්වීමේ ගාස්තු | 20 000 | ලිපි ද්‍රව්‍ය | 15 000 |
| වත්කම් කුලියට දීමෙන් | 55 000 | ආපනශාලා වියදම් | 8 000 |
| | | මුද්‍රණ වියදම් | 10 000 |
| | | පුවත්පත් | 2 000 |
| | | ක්‍රීඩා වියදම් | 12 000 |
| | | බැංකු ණය ගෙවීම් | 20 000 |
| | | 2017/03/31 ශේෂය | 108 000 |
| | 335 000 | | 335 000 |

2016/04/01 දිනට පැවැති ශේෂ

| | රු. |
|---|---|
| ගොඩනැගිල්ල | 100 000 |
| ක්‍රීඩා පිටිය | 250 000 |
| ලී බඩු | 50 000 |
| බැංකු ණය | 200 000 |

**අනෙකුත් තොරතුරු**

1. 2016/04/01 සිට යාවජීව සාමාජිකත්වය ක්‍රියාත්මක කළ අතර එම මුදලින් රු. 4 000 ක් පමණක් වසරේ ආදායම වශයෙන් හඳුනා ගැනේ.
2. ඇතුළත්වීමේ ගාස්තුවෙන් 2 000 ක් පමණක් වර්ෂයේ ආදායමක් සේ හඳුනා ගැනේ.
3. වාර්ෂික සාමාජික ගාස්තුව එක් අයෙකුගේ රු. 1000/- කි. 2017. 03. 31 දිනට සංගමයේ සාමාජික සංඛ්‍යාව 50 කි. මෙම වර්ෂය තුළ නව සාමාජිකයින් 15 දෙනෙකු බඳවා ගත් අතර, එයින් පස් දෙනෙක් යාවජීව සාමාජිකයෝ වෙති. එක් අයකුගේ යාවජීව සාමාජික ගාස්තුව රු. 12 000/- කි.
4. 2015/2016 සඳහා ලද සාමාජික මුදල රු. 7 000 ක්ද, 2017/2018 සඳහා ලද සාමාජික මුදල් 5 000 ක් ලැබූ සාමාජික මුදල්වල අන්තර්ගත වේ.

5. 2016/04/01 දිනට ආපනශාලා ආහාර තොගය රු. 12 000 ක් වූ අතර, 2017/03/31 දිනට රු. 10 000 ක ආහාර තොගයක් විය. එදිනට ලී බඩුවල වටිනාකම 10% කින් අඩු වී ඇත.

6. සේවක වැටුප්වලින් 20% ක් ආපනශාලා සේවකයින්ට අදාළ වේ.

7. පහත දෑ පිළියෙල කරමු. 2017/03/31 න් අවසන් වර්ෂයේ
    1. සාමාජික මුදල් ගිණුම
    2. බාහිර ක්‍රියාකාරකම් ප්‍රතිඵල ගණනය කිරීම
    3. ආදායම් ප්‍රකාශනය / ආදායම් හා වියදම් ගිණුම
    4. 2016/04/01 දිනට සමුච්චිත අරමුදල
    5. 2017/03/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය.

(I) සාමාජික මුදල් ගිණුම

| | රු. | | රු. |
|---|---|---|---|
| 2016/04/01 ශේෂය | 7 000 | ලැබීම් හා ගෙවීම් | 50 000 |
| ආදායම් හා වියදම් | 45 000 | | |
| 2017/03/31 ශේෂය ප/ගෙ | 5 000 | 2017/03/31 හිඟ ශේෂය ප/ගෙ | 7 000 |
| | 57 000 | | 57 000 |
| 2017.04.01 ශේෂය ඉ/ගෙ | 7 000 | 2017.04.01 ශේෂය ඉ/ගෙ | 5 000 |

**ආපනශාලා ආදායම් ප්‍රකාශනය**

| | | | රු. |
|---|---|---|---|
| ආපනශාලා ආදායම | | | 100 000 |
| **ආපනශාලා විකුණුම් පිරිවැය** | | | |
| ආරම්භක තොගය | 12 000 | | |
| ගැණුම් | 60 000 | | |
| | 72 000 | | |
| - ආපනශාලා අග තොගය | (10 000) | 62 000 | |
| ආපනශාලා වැටුප් | | 14 000 | |
| ආපනශාලා වියදම් | | 8 000 | (84 000) |
| ආපනශාලා ලාභය ආදායම් ප්‍රකාශනයට මාරු කළා | | | 16 000 |

(3)

**සුමග සුබසාධක සංගමය**

**2017/03/31 න් අවසන් වර්ෂය සඳහා**

**ආදායම් ප්‍රකාශනය**

| | | රු. | රු. |
|---|---|---|---|
| **ආදායම්** | සාමාජික මුදල් | 45 000 | |
| | වත්කම් කුලී ආදායම් | 55 000 | |
| | ආපනශාලා ලාභය | 16 000 | |
| | ඇතුළත්වීමේ ගාස්තු | 2 000 | |
| | යාවජීව සාමාජික මුදල් | 4 000 | 122 000 |
| **වියදම්** | නඩත්තු වියදම් | 20 000 | |
| | දුරකථන ගාස්තු | 10 000 | |
| | සේවක වැටුප් | 56 000 | |
| | ලිපි ද්‍රව්‍ය | 15 000 | |
| | මුද්‍රණ වියදම් | 10 000 | |
| | පුවත්පත් | 2 000 | |
| | ක්‍රීඩා වියදම් | 12 000 | |
| | ලී බඩු ක්ෂය | 5 000 | (130 000) |
| ඌණතාව සමුච්චිත අරමුදලට ගෙ/ගි | | | (8 000) |

**2016/04/31 දිනට සමුච්චිත අරමුදල**

| | | රු. | රු. |
|---|---|---|---|
| **වත්කම්** | ගොඩනැගිලි | 100 000 | |
| | ක්‍රීඩා පිටිය | 250 000 | |
| | ලී බඩු | 50 000 | |
| | ආහාර තොගය | 12 000 | |
| | හිඟ හිටි සාමාජික මුදල | 7 000 | |
| | මුදල් | 50 000 | |
| | | | 469 000 |
| **වගකීම්** | බැංකු ණය | 200 000 | (200 000) |
| | සමුච්චිත අරමුදල | | 269 000 |

**සුමග සුබසාධක සංගමය**
**2017/03/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

(රු.)

| | | |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | |
| ගොඩනැගිල්ල | 100 000 | |
| ක්‍රීඩා පිටිය | 250 000 | |
| ලී බඩු | 45 000 | 395 000 |
| **ජංගම වත්කම්** | | |
| ආහාර තොගය | 10 000 | |
| ලැබිය යුතු සාමාජික මුදල් | 7 000 | |
| මුදල් | 108 000 | 125 000 |
| | | 520 000 |
| **හිමිකම් හා වගකීම්** | | |
| සමුච්චිත අරමුදල | 269 000 | |
| ඌණතාව | (8 000) | 261000 |
| ඇතුළත්වීමේ ගාස්තු . . . | 18 000 | |
| යාවජීව සාමාජික මුදල් | 56 000 | 74 000 |
| **ජංගම නොවන වගකීම්** | | |
| බැංකු ණය | | 180 000 |
| **ජංගම වගකීම්** | | |
| කලින් ලද සාමාජික මුදල් | | 5 000 |
| | | 520 000 |

ඉහත ආකාරයේ අභ්‍යාස කිහිපයක් සිසුන්ට ඉදිරිපත් කර විසඳීමට මඟ පෙන්වන්න.

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක**

- ලාභ අරමුණු කර නොගත් සංවිධානවල සකස් කරන ගිණුම් නම් කිරීම.
- ලාභ අරමුණු කර නොගත් සංවිධානවල ගිණුම් පිළියෙල කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කිරීම.
- පහත ආකාරයේ ගැටලු ලබා දීම.

| | | |
|---|---|---|
| 2016/04/01 | ලැබිය යුතු සාමාජික මුදල | රු. 6 000 |
| | කලින් ලද සාමාජික මුදල | රු. 1 000 |
| 2017/03/31 | දිනට හිඟ සාමාජික මුදල | රු. 4 000 |
| | කලින් ලද සාමාජික මුදල | රු. 1 000 |
| වර්ෂය තුළ ලැබූ සාමාජික මුදල | | රු. 60 000 |

සාමාජික මුදල් ගිණුම පිළියෙල කිරීම

- ලාභ අරමුණු කර නොගත් සංවිධානයක පිළියෙල කරන ලැබීම් හා ගෙවීම් ගිණුමක් ආදායම් ප්‍රකාශනයක් අතර වෙනස්කම් දැක්වීම.
- සමුච්චිත අරමුදල යන්න හඳුන්වා, එය වෙනස්වීමට හේතු වන කරුණු දැක්වීම.

| මූලික පද | பிரதான பதங்கள் | Key terms |
|---|---|---|
| • ලාභ අරමුණු කර නොගත් සංවිධාන | இலாப நோக்கற்ற அமைப்புக்கள் | Not for Profit Making Organization |
| • සාමාජික මුදල් | அங்கத்தவர் சந்தா | Member fee/Subscription |
| • ලැබීම් හා ගෙවීම් ගිණුම | பெறுவனவு கொடுப்பனவு கணக்கு | Receipts and Payments Account |
| • යාවජීව සාමාජක මුදල් | ஆயுள் சந்தாக் கட்டணம் | Life Membership Fee |
| • ආදායම් හා වියදම් ගිණුම් | வருமான செலவினக் கணக்கு | Income and Expenditures Account |
| • අතිරික්තය | மிகை | Surplus |
| • ඌණතාව | குறை | Deficit |
| • සමුච්චිත අරමුදල | திரண்ட நிதி | Consolidated Fund |
| • සාමාන්‍ය පරිත්‍යාග | பொது நன்கொடை | General Donation |
| • විශේෂ පරිත්‍යාග | விசேட நன்கொடை | Special Donation |

**නිපුණතාව 9.0** : **ආයතනයක ගිණුම් වාර්තා අසම්පූර්ණ වූ විටත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.**

**නිපුණතා මට්ටම 9.1** : අසම්පූර්ණ සටහන් පැහැදිලි කර එයට හේතු ඉදිරිපත් කරයි.

**9.2** : අසම්පූර්ණ සටහන් ද්විත්ව සටහන් බවට පරිවර්තනය කර, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.


**කාලච්ඡේද** : 14

**ඉගෙනුම් ඵල** :

- වාර්තා සම්පූර්ණ නොවීමට හේතු පැහැදිලි කරයි.
- අසම්පූර්ණ සටහන් ද්විත්ව සටහන් බවට පරිවර්තනය කරන ආකාරය පැහැදිලි කරයි.
- සම්පූර්ණ කරන ලද වාර්තා ඇසුරෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.

**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම**



## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**පිවිසුම :**

- පහත දැක්වෙන ''සාගර ව්‍යාපාරයේ '' තොරතුරු උචිත ආකාරයකට පන්තියට ඉදිරිපත් කරන්න.

'' **සාගර ව්‍යාපාරය** ''

සාගර තවත් ව්‍යාපාරික ස්ථානයක් විවෘත කිරීමට අදහස් කරයි. මේ සඳහා අවශ්‍ය අතිරේක මූල්‍ය අවශ්‍යතාව, සම්පූර්ණ කර ගැනීමට සිය බැංකුව වෙත යන ලදී. බැංකු කළමනාකරු පැවසුවේ ණය මුදල ලබා දීමට නම් පසුගිය වසර දෙකක මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු බවයි. සාගර බැංකු කළමනාකරුට පවසා ඇත්තේ බැංකුවෙන් එවන ලද මාසික විස්තර ඇතුළත් ලිපි ගොනු සහ ණය ගනුදෙනු ඇතුළත් **"සාරාංශයක් "** පමණක් ඇති බවයි.

- සාගර ව්‍යාපාරයේ තොරතුරු පිළිබඳ සිසු අදහස් විමසමින් පහත සඳහන් කරුණු මතු වන ආකාරයට සාකච්ඡාවක යෙදෙන්න.
    - ක්‍රමානුකූල ව ගනුදෙනු සටහන් නොකිරීම නිසා මතුවන ගැටලු සහ ගිණුම් වාර්තා ක්‍රමවත් ව තබා නොගැනීම **අසම්පූර්ණ වාර්තා ක්‍රමය** ලෙස පැහැදිලි කිරීම.
    - අසම්පූර්ණ සටහන් තබා ගැනීමට ව්‍යාපාරිකයන් උනන්දුවීමට හේතු ඇති බව
    - නිවැරදිවත්, ක්‍රමානුකූලවත් ගනුදෙනු සටහන් කිරීමේ වැදගත්කම හා අවශ්‍යතාව මතු කර දැක්වීම.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- ඇමුණුම 9.1.1 හි ඇතුළත් ''ඉසුරු ව්‍යාපාරයේ '' තොරතුරු කේවල ක්‍රියාකාරකමක් ලෙස ඒ ඒ ශිෂ්‍යයාට ලබා දීමට කටයුතු කරන්න.
- එම ව්‍යාපාරයේ තොරතුරු හොඳින් අධ්‍යයනය කිරීමට අවස්ථාවක් ලබා දෙන්න.
- ඉසුරු ව්‍යාපාරයේ තොරතුරු ඇසුරින් සිසුන් සමග සාකච්ඡා කරමින් පහත ලේඛන හා ගිණුම් පිළියෙල කිරීමට මග පෙන්වන්න.
    - ආරම්භක ප්‍රාග්ධනය ගණනය කිරීම.
    - ක්ෂය ගණනය කිරීම (යන්ත්‍ර හා ලී බඩු සඳහා)
    - ණයගැති පාලන ගිණුම
    - ණයහිමි පාලන ගිණුම
    - මුදල් ගිණුම
    - ආදායම් ප්‍රකාශනය
    - මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
- සිසුන් සකස් කළ ඒ ඒ වාර්තා හා ගිණුම් පහත දැක්වෙන පරිදි සකස් කර තිබේදැයි පරීක්ෂා කර බලන්න.

- 2016/04/01 දිනට ප්‍රාග්ධනය ගණනය කිරීම

| | රු. | රු. |
|---|---|---|
| යන්ත්‍ර උපකරණ | 120 000 | |
| ලී බඩු සවි කිරීම් | 80 000 | |
| භාණ්ඩ තොගය | 30 000 | |
| ණයගැතියෝ | 45 000 | |
| මුදල් | 15 000 | 290 000 |
| (-) උපචිත මෙහෙයුම් වියදම් | 3 000 | |
| ණයහිමියෝ | 27 000 | (30 000) |
| ප්‍රාග්ධනය | | 260 000 |

- ක්ෂය ගණනය කිරීම

| | යන්ත්‍ර උපකරණ (රු.) | ලී බඩු සවි කිරීම (රු.) |
|---|---|---|
| 2016/04/01 ශේෂය | 120 000 | 80 000 |
| (+) මිලට ගැණුම් | 80 000 | - |
| | 200 000 | 80 000 |
| (-) ඉවත් කිරීම් | - | (10 000) |
| | 200 000 | 70 000 |
| 2017/03/31 ශේෂය | (180 000) | (60 000) |
| ක්ෂය | 20 000 | 10 000 |

ණයගැති පාලන ගිණුම

| | | (රු.) | | (රු.) |
|---|---|---|---|---|
| 2016/4/1 | ශේෂය ඉ/ගෙ | 45 000 | මුදල් | 240 000 |
| | විකුණුම් | 252 000 | දුන් වට්ටම් | 4 000 |
| | | | 2017/3/31 ශේෂය ප/ගෙ | 53 000 |
| | | 297 000 | | 297 000 |
| 2017/04/1 | ඉ/ගෙ/ශේ | 53 000 | | |

ණයහිමි පාලන ගිණුම

| | (රු.) | | (රු.) |
|---|---|---|---|
| ලද වට්ටම් | 5 000 | 2016/4/1 ශේෂය ඉ/ගෙ | 27 000 |
| මුදල් | 203 000 | ගැණුම් | 199 000 |
| 2017/3/31 ශේෂය ප/ගෙ | 18 000 | | |
| | 226 000 | | 226 000 |
| | | 2017/04/01 ඉ/ගෙ/ශේ | 18 000 |

**ඉසුරු ව්‍යාපාරයේ**

2017/04/01 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

| | රු. | රු. |
|---|---|---|
| විකුණුම් | | 252 000 |
| **(-) විකුණුම් පිරිවැය** | | |
| 2016/04/01 තොගය | 30 000 | |
| ගැණුම් | 199 000 | |
| | 229 000 | |
| 2017/03/31 තොගය | (40 000) | (189 000) |
| දළ ලාභය | | 63 000 |
| (+) **වෙනත් ආදායම්** | | |
| ලද වට්ටම් | 5 000 | |
| ලී බඩු විකුණුම් ලාභය | 2 000 | 7 000 |
| | | 70 000 |
| (-) **වියදම්** | | |
| මෙහෙයුම් වියදම | 18 000 | |
| දුන් වට්ටම | 4 000 | |
| යන්ත්‍ර ක්ෂය | 20 000 | |
| ලී බඩු ක්ෂය | 10 000 | |
| ණය පොලිය | 5 000 | (57 000) |
| ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට මාරු කළා | | 13 000 |

**ඉසුරු ව්‍යාපාරය**

**2017/03/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

| | (රු.) | (රු.) |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | |
| යන්ත්‍ර උපකරණ | 180 000 | |
| ලී බඩු සවි කිරීම | 60 000 | 240 000 |
| **ජංගම වත්කම්** | | |
| තොගය | 40 000 | |
| ණයගැති | 53 000 | 93 000 |
| මුළු වත්කම් | | 333 000 |
| **හිමිකම්** | | |
| ප්‍රාග්ධනය | | 260 000 |
| අමතර ප්‍රාග්ධනය | | 15 000 |
| | | 275 000 |
| ශුද්ධ ලාභය | | 13 000 |
| (-) ගැනිලි | | (6 000) |
| | | 282 000 |
| **ජංගම වගකීම්** | | |
| ණයහිමි | 18 000 | |
| උපචිත වියදම් | 4 000 | |
| මුදල් (බැංකු අයිරාව) | 29 000 | 51 000 |
| මුළු හිමිකම් හා වගකීම් | | 333 000 |

**මුදල් ගිණුම**

| | රු. | | රු. |
|---|---|---|---|
| 2016.04.01 ඉ/ගෙ/ශේෂය | 15 000 | ණයහිමි ගෙවීම් | 203 000 |
| ණයගැති ලැබීම් | 240 000 | යන්ත්‍ර ගැනීමට | 80 000 |
| ලීබඩු විකිණීමෙන් | 12 000 | මෙහෙයුම් වියදම් | 17 000 |
| බැංකු ණය | 50 000 | බැංකු ණය ගෙවීම් | 55 000 |
| ප්‍රාග්ධනය | 15 000 | ගැනිලි | 6 000 |
| 2017.03.31 ප/ගෙ/ශේෂය | 29 000 | | |
| | 361 000 | | 361 000 |
| | | ශේ/ඉ/ගෙ | 29 000 |

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

- ගිණුම් කාලච්ඡේදය ආරම්භක දිනට ඇති වත්කම් වගකීම් පදනම් කර ගෙන ප්‍රාග්ධනය ගණනය කිරීම.
- මුදල් පොතක් පිළියෙල කර, එමගින් ආනාවරණය කළ හැකි පහත දත්ත සොයා ගත හැකි ය.
  - අත්පිට විකුණුම්
  - ණයගැති ලැබීම්
  - අත්පිට ගැණුම්
  - ණයහිමියන්ට ගෙවීම්
  - මුදල් ගැනිලි
  - මුදල් ශේෂය
  - බැංකු තැන්පතු

- ණයගැති පාලන ගිණුම පිළියෙල කිරීමෙන් පහත තොරතුරුවලින් අවශ්‍ය අයිතමය සොයාගත හැකිය.
  - ණයගැති ආරම්භක ශේෂය
  - ණයට විකුණුම් ශේෂය
  - ණයගැති ලැබීම්
  - අවසාන ණයගැති ශේෂය

- ණයහිමි පාලන ගිණුම පිළියෙල කිරීමෙන් පහත තොරතුරුවලින් අවශ්‍ය තොරතුරු සොයා ගත හැකිය.
  - ණයහිමි ආරම්භක ශේෂය
  - ණයට ගැනුම්
  - ණයහිමියන්ට ගෙවීම්
  - අවසාන ණයහිමි ශේෂය

- ගිණුම් කාලච්ඡේදය ආරම්භයේ තිබූ ස්ථාවර වත්කම්වල වටිනාකම් හා අවසාන දිනට වූ වටිනාකම් ඇසුරෙන් ක්ෂය වූ ප්‍රමාණය සොයාගත හැකිවීම.
- වෙළෙඳ ගිණුම පිළියෙල කිරීමෙන් තොගය විකුණුම් පිරිවැය හා දළ ලාභය ගණනය කිරීම. ගැලපුම් කර, ශුද්ධ ලාභය ගණනය කිරීම.
- ඉහත ප්‍රතිඵල ගණනය කිරීමට ආදායම් ප්‍රකාශනයක් ද ඉදිරිපත් කළ හැකි ය.
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වත්කම් වගකීම් හිමිකම් වර්ග කර අනාවරණය කිරීම.

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක**

- අසම්පූර්ණ සටහන් පවත්වා ගැනීමට හේතු ඉදිරිපත් කිරීම.
- අසම්පූර්ණ සටහන් බවට පත් කිරීමේ දී මුදල් ගිණුමක් මඟින් ලබා ගත හැකි අයිතම තුනක් සඳහන් කරන්න.
- ගිණුම් කාලච්ඡේදය ආරම්භයේ දේපළ පිරියත හා උපකරණවල වටිනාකම රු. 380 000 කි. වර්ෂය අවසානයේ ඒවායේ වටිනාකම රු. 350 000 කි. වත්කම් මිලට ගැනීමක් හෝ විකිණීමක් සිදු වී නැත්නම් වෙනස කුමක් ලෙස සලකන්නේ ද? යන්න දැක්වීම.

ඇමුණුම 9.1.1

**ඉසුරු ව්‍යාපාරයේ තොරතුරු**

- වත්කම් හා වගකීම් පහත දැක්වේ.

| | රු. | රු. |
|---|---|---|
| අයිතම | 2016/4/1 | 2017/3/31 |
| යන්ත්‍ර උපකරණ | 120 000 | 180 000 |
| ලී බඩු සවි කිරීම | 80 000 | 60 000 |
| භාණ්ඩ තොගය | 30 000 | 40 000 |
| ණයගැතියෝ | 45 000 | 53 000 |
| මුදල් | 15 000 | - |
| උපචිත මෙහෙයුම් වියදම් | 3 000 | 4 000 |
| ණයහිමියෝ | 27 000 | 18 000 |

**අතිරේක තොරතුරු**

- වර්ෂය තුළ රු. 80 000 ක යන්ත්‍රයක් ලබා ගත් අතර, රු. 10 000 ක ලී බඩු උපකරණ, වර්ෂය තුළ රු. 12 000කට විකුණා ඇත.
- මුදලින් ගෙවූ මෙහෙයුම් වියදම් රු. 17 000 කි.
- වර්ෂය තුළ රු. 50 000 ක බැංකු ණයක් ලබා ගෙන රු. 55 000 ක් ගෙවා, එම ණය වර්ෂය තුළ නිදහස් කර ඇත.
- පුද්ගලික ප්‍රයෝජනයට අයිතිකරු, රු. 6 000 ක් ලබා ගෙන ඇති අතර, රු. 15 000 ක මුදලක් ප්‍රාග්ධනය ලෙස යොදා ඇත.
- ගිණුම් කාලච්ඡේදය තුළ ගනුදෙනුකරුවන්ගෙන් රු. 240 000 ක් ලැබී ඇති අතර, දුන් වට්ටම් රු. 4 000 කි. කාලච්ඡේදය තුළ දී ණයහිමියන්ට මුදල් ගෙවීමේ දී රු. 5 000 ක වට්ටමක් ලැබුණි.
- පිරිවැයට 33 1/3% ක් ලාභ තබාගෙන කාලච්ඡේදය තුළ භාණ්ඩ විකුණා ඇත.

| මූලික පද | பிரதான பதங்கள் | Key Terms |
|---|---|---|
| • අසම්පූර්ණ සටහන් | நிறைவில் பதிவுகள் | Incomplete Recods |
| • ණයගැති පාලන ගිණුම | கடன்பட்டோர் கட்டுப்பாட்டுக் கணக்கு | Debtors Control Accounts |
| • ණයහිමි පාලන ගිණුම | கடன் கொடுத்தோர் கட்டுப்பாட்டுக் கணக்கு | Crediters Control Accounts |

**නිපුණතාව 10.0** : **හවුල් ව්‍යාපාරයක, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.**

**නිපුණතා මට්ටම 10.1** : හවුල් ව්‍යාපාරයක ගිණුම්කරණයට අදාළ නෛතික පරිසරය පැහැදිලි කරයි.


**කාලච්ඡේද** : 05

**ඉගෙනුම් ඵල** :

- හවුල් ව්‍යාපාරයක් යන්න පැහැදිලි කරයි.
- හවුල් ගිවිසුම යන්න පැහැදිලි කර, ගිණුම්කරණයට අදාළ ව කොන්දේසි ඉදිරිපත් කරයි.
- 1840 අංක 07 දරණ වංචා වැලැක්වීමේ ආඥා පනතේ 18 වන වගන්තියේ වැදගත්කම සාකච්ඡා කරයි.
- හවුල් ව්‍යාපාර හා සම්බන්ධව 1890 හවුල් ආඥාපනතේ 24 වන වගන්තිය හා 42 වන වගන්තියේ වැදගත්කම සාකච්ඡා කරයි.
- හවුල් ගිවිසුමේ අන්තර්ගත නොවූ කරුණු සම්බන්ධයෙන් හවුල් ආඥාපනත බලපාන ආකාරය පැහැදිලි කරයි.
- 2007 අංක 07 දරණ සමාගම් පනත හවුල් ව්‍යාපාරයකට වැදගත් වීමට බලපාන හේතුව දක්වයි.

**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම**



**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසුම**

කවිඳු රු. 500 000 ක් ද රවිඳු රු. 300 000 ක් ද යොදා කියවීම වර්ධනය කිරීමේ අදහසින් රවිදු ගේ ගොඩනැගිල්ලක සේවා හවුල් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. කවිඳු පාලන හවුල්කරු ලෙස කටයුතු කළ අතර, රවිදුගේ ගොඩනැගිල්ලට කුලී ලෙස වර්ෂයකට රු. 60 000/- ක් ගෙවීමට එකඟ විය. පළමු ගිණුම් වර්ෂයක පාඨකයන්ගෙන් අයකර ගත් ගාස්තුව රු. 250 000 කි. වාර්ෂික වියදම රු. 70 000 කි. වර්ෂයේ ලාභය බෙදා ගැනීමේ දී සම සම ව බෙදාගත යුතු බව රවිදු කියා සිටිය ද, කවිඳු ඊට එකඟ නොවී ය.

- ඉහත ගැටලුව පන්තියට ඉදිරිපත් කර, පහත කරුණු මතු කර ගැනීමට සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - ලාභ අපේක්ෂාවෙන් පුද්ගලයන් කිහිප දෙනෙකුට හවුල් ව්‍යාපාර කටයුත්තක් ආරම්භ කළ හැකි බව.
    - මතුවන ගැටලු නිරාකරණය සඳහා හවුල්කරුවන් අතර එකඟතාවක් තිබීමේ වැදගත්කම.
    - හවුල් පනතේ විධිවිධානවලට වඩා හවුල් ගිවිසුම බලවත් බව.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- ඒ ඒ කණ්ඩායමට පහත සඳහන් මාතෘකා බෙදා දී ඒ කෙරෙහි අවධානය යොමු කරවන්න.
    - හවුල් ව්‍යාපාර නිර්වචනය හා මූලිකාංග
    - හවුල් ව්‍යාපාරවලට බලපාන වෙනත් නීතිමය විධිවිධාන
    - හවුල් ගිවිසුම හා එහි අන්තර්ගතය
    - හවුල් ගිවිසුමක් නැති විට හෝ පවතින ගිවිසුමක අදාළ කරුණු පිළිබඳ ව කටයුතු කළ යුතු ආකාරය දක්වා නොමැති විටෙක ක්‍රියාකළ යුතු ආකාරය
- ඇමුණුම 10. 1. 1. හි ඇතුළත් විස්තර පත්‍රිකාව පරිශීලනය කිරීමට සිසුන්ට ලබා දෙන්න.
- කණ්ඩායමට ලැබුණු මාතෘකාවට අදාළ විස්තර කොටසට ගැලපෙන හවුල් ව්‍යාපාරය තෝරා ගැනීමට යොමු කරවන්න.
- එහි ඇතුළත් තොරතුරු තම කණ්ඩායමේ මාතෘකාවට අදාළව පැහැදිලි කිරීමට උපදෙස් දෙන්න.
- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

(3) හවුල් ව්‍යාපාර තොරතුරු ඇතුළත් විස්තර පත්‍රිකාව

ඇමුණුම 10.1.1

| අමර - විමල් හවුල් ව්‍යාපාරය | රංග - තරංග හවුල් ව්‍යාපාරය |
|---|---|
| • ප්‍රාග්ධනයට දායක වන ආකාරය කෙසේද?<br>• ලාභාලාභ බෙදා ගන්නා ආකාරය කෙසේද?<br>• ප්‍රාග්ධනය සඳහා පොළී ගෙවනවාද? නැද්ද යන්නත් එසේ ගෙවන්නේ නම් කෙසේ ද?<br>• පාලන කාර්යයට සම්බන්ධ වන්නේ ද? එසේ සම්බන්ධ වන්නේ නම් හවුල්කරුවන්ට හවුල් වේතන ගෙවනවා ද නැද්ද යන්නත් එසේ ගෙවන්නේ නම් ඒ කෙසේ ද? | • 2007 අංක 7 දරණ සමාගම් පනත<br>• 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ පනත<br>• 1840 අංක 07 දරණ වංචා වැලැක්වීමේ ආඥා පනත<br>• 1890 හවුල් පනතේ 24 හා 42 වගන්ති |
| **රවී - සරත් හවුල් ව්‍යාපාරය** | **ඉන්දු-බින්දු හවුල් ව්‍යාපාරය** |
| • ප්‍රාග්ධනය සඳහා පොළී ගෙවනු නොලැබේ.<br>• ලාභාලාභ සමානව බෙදා ගත යුතු ය.<br>• හවුල්කරුවන් සපයා ඇති ණය සඳහා 5%ක අවම වාර්ෂික පොලියක් ගෙවයි.<br>• හවුල්කරුවන් වේතන ලැබීමට හිමිකමක් නැත. | • ලාභලැබීමේ පොදු පරමාර්ථයෙන් ව්‍යාපාරයක් පවත්වා ගෙන යන පුද්ගලයන් අතර ඇති සම්බන්ධතාව<br>• පුද්ගලයන්<br>• ව්‍යාපාර කටයුත්තක්<br>• ලාභ ලැබීමේ අරමුණ<br>• පොදු සම්බන්ධතාවය (එකඟතාව) |

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

- 1890 හවුල් ආඥා පනතට අනුව හවුල් ව්‍යාපාරයක් යනු, ලාභ ලැබීමේ පරමාර්ථයෙන් ව්‍යාපාරයක් පවත්වා ගෙන යන පුද්ගලයන් අතර පවත්නා සම්බන්ධතාවයයි.
- ඉහත නිර්වචනයට අනුව හවුල් ව්‍යාපාරයක තිබිය යුතු ප්‍රධාන අංග කිහිපයකි.
    - පුද්ගලයින්
    - පොදු එකඟතාව
    - ව්‍යාපාරයක්
    - ලාභ ලැබීමේ පරමාර්ථ
- හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් අදාළ වන නීතිමය අණ පනත් කිහිපයක් පහත දැක්වේ.
    - 1890 හවුල් ආඥා පනත
    - 2007 අංක 7 දරණ සමාගම් පනතේ 519 වගන්තිය
    - 1840 අංක 7 දරණ වංචා වැලැක්වීමේ ආඥා පනත
    - 1918 අංක 6 දරණ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ පනත

- හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ලිඛිත ගිවිසුමක් තිබේ නම්, එය වඩාත් යෝග්‍ය වන අතර හවුල් ව්‍යාපාරයක් ආරම්භ කළ හැකි ආකාර කිහිපයකි.
  - ලිඛිතව
  - වාචිකව
  - පාර්ශ්වයන්ගේ හැසිරීමෙන්

- හවුල් ගිවිසුමක ඇතුළත් කළ හැකි කොන්දේසි කිහිපයක් පහත දැක්වේ.
  - හවුල්කරුවන් ප්‍රාග්ධනයට දායක වන ආකාරය
  - හවුල්කරුවන් කළමනාකරණයට දායක වන ආකාරය
  - හවුල්කරුවන් ලාභාලාභ බෙදා ගන්නා ආකාරය
  - හවුල්කරුවන්ගේ වේතන හිමිවන ආකාරය
  - ප්‍රාග්ධන පොළී හිමිවන ආකාරය
  - කීර්ති නාමය වාර්තා කරන ආකාරය
  - හවුල්කරුවන් විසින් ප්‍රාග්ධනයට අමතර ව ව්‍යාපාරයට සපයා ඇති ණය සඳහා පොළී ගෙවන ආකාරය

- ලිඛිත ගිවිසුමක් නොමැති නම් හෝ ගිවිසුමක ඇතුළත් නොවූ කරුණු සම්බන්ධයෙන් හවුල් ආඥාපනතේ 24 වන වගන්තිය අනුව, ගිණුම්කරණ ගැටලු නිරාකරණය කළ යුතුය. 24 වන වගන්තියේ ඇතුළත් ගිණුම්කරණයට අදාළ ප්‍රධාන වගන්ති කිහිපයක් පහත දැක්වේ.
  - ප්‍රාග්ධනයට කෙසේ දායක වී තිබුණ ද **ලාභාලාභ සමාන ව බෙදා ගත යුතු යි.**
  - හවුල් කරුවන් ප්‍රාග්ධනයට අතිරේක ව සපයා ඇති **ණය සඳහා 5% ක වාර්ෂික පොළියක්** හවුල්කරුවන්ට හිමි වේ.
  - පාලන කටයුතුවලට සෑම හවුල්කරුවෙක් ම සහාය විය යුතු අතර, ඒ සඳහා **වේතනයක් හිමි නොවේ.**
  - දායක වූ ප්‍රාග්ධනය සඳහා පොළි ලැබීමට කිසිදු හවුල්කරුවෙකුට හිමිකමක් නොමැත.
  - හවුල් ව්‍යාපාරයේ වියදමක් **හවුල්කරුවන් තම පුද්ගලික මුදලින් ගෙවා ඇත්නම්, ඒ මුදල ප්‍රතිපූරණය කිරීමේ හැකියාව හවුල්කරු සතු වේ.**

- 1890 හවුල් ආඥා පනතේ 42 වගන්තිය අනුව, විශ්‍රාම යන / ඉවත් වන / මිය යන හවුල්කරුවන්ගේ හිමිකම් කොටස එදින නොගෙවන්නේ නම්, එදින සිට ගෙවන දින දක්වා කාලය සඳහා 5% ක වාර්ෂික පොළියක් ගෙවීම කළ යුතු ය.

- 2007 අංක 07 දරණ සමාගම් පනතේ 519 වගන්තිය අනුව යම් හවුල් ව්‍යාපාරයක උපරිම සාමාජික සංඛ්‍යාව 20 බවට සීමා කර ඇත.

- හවුල් ගිවිසුමක් නොමැති විට හෝ යම් කැරණක් සම්බන්ධයෙන් ගිවිසුමෙහි සඳහන් නොවූ විට හවුල් ව්‍යාපාරයක යම් ගැටලුවක් යම් මතු වුවහොත් එම ගැටලුව ද හවුල් ආඥා පනතේ විධි විධාන අනුව විසඳා ගත යුතු ය.

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක :**

- 1890 හවුල් ආඥාපනතට අනුව හවුල් ව්‍යාපාර නිර්වචනයේ ඇතුළත් ප්‍රධාන කරුණු දැක්වීම.
- පහත සඳහන් එක් එක් ප්‍රශ්නයට අදාළ ව අදහස් ඉදිරිපත් කිරීම.
  - ලිඛිත හවුල් ගිවිසුමක් නොමැති අවස්ථාවක ලබා ගත් ප්‍රාග්ධන පොළිය
  - ලිඛිත හවුල් ගිවිසුමක් නොමැති අවස්ථාවක ලබා ගත් හවුල් වේතන
  - ලිඛිත ගිවිසුමක් නොමැති විටෙක හවුල්කරුවන් පුද්ගලික මුදලින් දරා ඇති ව්‍යාපාරික වියදම්
- ලිහිණි රු 300 000 ක් හා මධුර රු. 200 000 ක් ප්‍රාග්ධනය යොදා ධීවර හවුල් ව්‍යාපාරයක් ආරම්භ කර, මුළු මුදලින් බෝට්ටුවක් ලබා ගෙන මෙහෙයුම් කටයුතු ආරම්භ කළ මුල් දිනයේ ම බෝට්ටුව සම්පූර්ණයෙන් ම විනාශවීමෙන් ව්‍යාපාරය විසුරුවා හැරීමට තීරණය කරන ලදී.
  - එක් එක් හවුල්කරුවන්ගේ අලාභ කොටස්
- හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් 2007 අංක 07 සමාගම් පනත බලපාන ආකාරය පැහැදිලි කිරීම.

| මූලික පද | பிரதான பதங்கள் | **Key terms** |
|---|---|---|
| • ලාභ අරමුණු කර නොගත් | இலாப நோக்கற்ற | Not for Profit Making |
| • හවුල් ව්‍යාපාරය | பங்குடைமை | Partnership |
| • හවුල්කරුවන් | பங்காளன் | Partners |
| • හවුල් ගිවිසුම | பங்குடைமை ஒப்பந்தம் | Partnership Agreement |
| • හවුල් ආඥා පනත | பங்குடைமைக் கட்டளைச் சட்டம் | Partnership Ordinance |
| • හවුල් ව්‍යාපාරයේ මූලික ලක්ෂණ | பங்குடைமையின் பிரதான அம்சங்கள் | Main features of partnership |
| • 2007 අංක 07 දරණ සමාගම් පනත | 2007 ஆம் ஆண்டின் 7 ஆம் இலக்க கம்பனிச் சட்டம் | Company Act, No 07 of 2007 |
| • කීර්ති නාමය | நன்மதிப்பு | Goodwill |

**නිපුණතාව 10.0 : හවුල් ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.**

**නිපුණතා මට්ටම 10.2 :** හවුල් ව්‍යාපාරකට විශේෂිත වූ ගනුදෙනු විග්‍රහ කරයි.


**කාලච්ඡේද** : 05

**ඉගෙනුම් ඵල** :

- හවුල් ව්‍යාපාරයක් වෙනුවෙන් හවුල්කරුවන් සහභාගි වන විවිධ ආකාර පැහැදිලි කරයි.
- හවුල්කරුවන්ගේ සහභාගිත්වය අනුව ලබා දෙන ප්‍රතිලාභ වාර්තා කරන ආකාරය දක්වයි.

**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම**



**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසුම**

- හවුල් ව්‍යාපාරයකට හවුල්කරුවන් දායකත්වය සපයන ආකාර විමසමින් පහත කරුණු මතුවන සේ සිසුන් සමග සාකච්ඡාවක යෙදෙන්න.
    - විශේෂ හැකියා ඇති අය, මූල්‍ය ශක්තිය ඇති අය, කළමනාකරණ දක්ෂතා ඇති අය හවුල් ව්‍යාපාරයට සම්බන්ධ වන බව පහදන්න.
    - ඔවුන්ගේ දායකත්ව හැකියාවට ව්‍යාපාරය විවිධ ආකාරයෙන් සාධාරණත්වයක් ඉටු කරන බව පැහැදිලි කරන්න.
    - හවුල්කරුවන් ව්‍යාපාරයට දක්වන දායකත්වය ඉහළ නැංවීමට ඔවුන්ට සාධාරණත්වයක් ඉටු කිරීම අවශ්‍ය බව පෙන්වා දෙන්න.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- පහත සඳහන් හවුල් ගිවිසුමේ කොන්දේසි ඒ ඒ කණ්ඩායමට ලබා දී ඒ කෙරෙහි අවධානය යොමු කරවන්න.
    - හවුල්කරුවන් තිදෙනෙකු සිටින හවුල් ව්‍යාපාරයේ පාලන කාර්යයේ නියුතු හවුල්කරුට මසකට රු 40 000 ක වේතන ගෙවීම.
    - හවුල්කරුවන් යොදා ඇති ප්‍රාග්ධනය පිළිවෙලින් රු. 500 000, රු. 400 000, රු. 300 000 වේ. එහෙත් ප්‍රාග්ධන පොළී නොගෙවීම.
    - ලාභාලාභ සමානව හවුල්කරුවන් අතර බෙදා ගැනීම.
    - ප්‍රාග්ධනයට අතිරේකව හවුල්කරුවකු සපයා ඇති ණය සඳහා 10% ක වාර්ෂික පොළියක් ගෙවීම.
- හවුල් ව්‍යාපාරයට හවුල්කරුවන් සපයන ලද දායකත්වය හා ඒ වෙනුවෙන් ලැබෙන ප්‍රතිලාභ සාකච්ඡා කරන්න.
- කොන්දේසි කියවා පහත ප්‍රශ්නවලට පිළිතුරු ගොනු කිරීමට සිසුන් යොමු කරන්න.
- ඒ ඒ කොන්දේසි අනුව හවුල්කරුවන්ට ඇතිවන වාසි අවාසි විග්‍රහ කර දක්වන්න.
- හවුල් ව්‍යාපාරයක මුදල් ආයෝජනය කරන අයෙකුට, ඒ මඟින් ලැබෙන ප්‍රතිලාභ සම්බන්ධ කෙටි හැඳින්වීමක් කිරීමට උපදෙස් දෙන්න.
- හවුල් ආඥා පනතේ සඳහන් ණය පොළියට වඩා, ඉහළ පොළියක් ලබා ගැනීමට හැකියාව තිබේ ද යන්න පැහැදිලි කිරීමට ඉඩ සලස්වන්න.
- කණ්ඩායමට ලද **කොන්දේසියට අදාළ ප්‍රතිලාභය** වාර්තා කරන ආකාරය දැක්වීමට යොමු කරන්න.
- එක් එක් කණ්ඩායම් අනාවරණ පන්තිය වෙත වෙන වෙන ම ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

- ප්‍රාග්ධනය සැපයීමෙන්, කළමනාකරණයට දායකත්වය දීම, අවදානම් දැරීම තුළින් හා ව්‍යාපාරයට ණය සැපයීම මඟින් හවුල් ව්‍යාපාරයට දායකත්වය සැපයිය හැකිය.
- වෙනත් ව්‍යාපාරයක / වෙනත් ආයෝජනයක් කැපකර, හවුල් ව්‍යාපාරයේ ප්‍රාග්ධනය යොදා ඇති බැවින් ආවස්ථික පිරිවැය සංකල්පයට අනුව ප්‍රාග්ධන පොළී ගෙවීම වඩාත් යෝග්‍ය ය.
- එසේ ම කළමනාකරණයට දායකවීම, හා අවදානම් දැරීම ද හේතු වෙන් ප්‍රතිලාභ දීම යෝග්‍ය ය.
- හවුල් ව්‍යාපාර ගිවිසුම අනුව හවුල්කරුවන්ට, ප්‍රාග්ධනය යෙදීම නිසා පොළියත්, කළමනාකරණයට දායක වීම නිසා, වේතනත්, ප්‍රතිලාභ ලෙස ලැබෙන බව, අවදානම වෙනුවෙන් ලාභ කොටස හිමි ය.
- හවුල්කරු ව්‍යාපාරයට සපයන ණය සඳහා පොළී ලැබීම ද ප්‍රතිලාභයකි.
- හවුල්කරුවන් සපයන සේවාවන් අනුව ව්‍යාපාරයට විවිධ වූ ප්‍රයෝජන ලබා ගත හැකිය.
- හවුල් ව්‍යාපාරය විසින් හවුල්කරුවන්ට ලබා දෙන ප්‍රතිලාභ ව්‍යාපාරය උපයාගත් ශුද්ධ ලාභයෙන් බෙදාහරියි.
  - ප්‍රාග්ධන පොළිය
  - හවුල් වේතන
  - ලාභ කොටස්
- මෙම ප්‍රතිලාභ ගෙවීම වියදම් ලෙස නොසලකන අතර, ඒවා ව්‍යාපාරයේ **ලාභය බෙදාහැරීමක්** ලෙස සැලකේ.
- හවුල්කරුවන් ව්‍යාපාරයට සපයන ණය සඳහා පොළිය ව්‍යාපාරයේ වියදමක් සේ සලකයි. එයට හේතුව එම ණය මුදල ව්‍යාපාරයේ කටයුතු සඳහා ලබා ගන්නා බැවිනි.

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :**

- හවුල්කරුවන් යෙදූ ප්‍රාග්ධනය සඳහා පොළී ගෙවීම සාධාරණයයි ඔබ සිතන්නේ ද?
- හවුල්කරුවන්ගේ අවදානම අනුව ලාභ බෙදා ගැනීම සෑම විටම සිදුවේ ද? යන්න දැක්වීම.
- හවුල්කරුවන්ට වඩාත් සාධාරණ ආකාරයෙන් හවුල් වේතන ගෙවීම කළ හැකි ආකාරය දැක්වීම.
- හවුල්කරුවන්ගෙන් ව්‍යාපාරයට ලැබෙන ප්‍රයෝජන දෙකක් ලිවීම.

| මූලික පද | பிரதான பதங்கள் | Key terms |
|---|---|---|
| • ප්‍රාග්ධන පොළිය | மூலதன வட்டி | Capilal Interest |
| • ණය පොළිය | கடன் வட்டி | Loan Interest |
| • හවුල්කරුවන්ගේ වේතන | பங்காளர் சம்பளம் | Partner' s Salary |
| • ලාභ කොටස් | இலாபப் பங்கு | Profit Share |

**නිපුණතාව 10.0 : හවුල් ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.**

**නිපුණතා මට්ටම 10.3** : හවුල්කරුවන්ගේ හිමිකම් අනාවරණය කරයි.


**කාලච්ඡේද** : 05

**ඉගෙනුම් ඵල** :

- හවුල්කරුවන්ගේ හිමිකම් දැක්වීමට පිළියෙල කළ යුතු ගිණුම් වර්ග නම් කරයි.
- ප්‍රාග්ධන ගිණුම හා ජංගම ගිණුම පිළියෙල කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- ප්‍රාග්ධන ගිණුමක හා ජංගම ගිණුමක ඇතුළත් කරන ගනුදෙනු වෙන්කර දක්වයි.
- දෙන ලද දත්තවලට අනුව ප්‍රාග්ධන ගිණුම හා ජංගම ගිණුම පිළියෙල කරයි.
- හවුල්කරුවන් ගේ මුළු හිමිකම අනාවරණය කරයි.

**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම**



**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ඃ**

**පිවිසුම**

- පහත සඳහන් ප්‍රශ්න පන්තියට ඉදිරිපත් කර සිසුන්ගේ අදහස් විමසන්න.
- ව්‍යාපාරයක හවුල්කරුවකු වීම සඳහා යම් පුද්ගලයකුට අනුගමනය කළ හැකි ක්‍රියා මාර්ග මොනවා ද?
- හවුල්කරුවකු වීමෙන් ලැබෙන ප්‍රතිලාභ මොනවා ද?
- හවුල් ව්‍යාපාරයේ සම්පත්, හවුල්කරුවන්ගේ පෞද්ගලික ප්‍රයෝජනයට ගන්නා ආකාර කෙසේ ද?
- හවුල්කරුවන් හවුල් ව්‍යාපාරයට සිය දායකත්වය සපයන ආකාර කෙසේ ද?
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- හවුල්කරුවන්ට හවුල් ව්‍යාපාරයෙන් විවිධ ප්‍රතිලාභ ලැබෙන බවත් එම ප්‍රතිලාභ සඳහා විවිධාකාර ලෙස හවුල්කරුවන් සිය දායකත්වය සපයන බවත් පැහැදිලි කරන්න.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් ඃ**

- රංග, තරංග, සුරංග හවුල් ව්‍යාපාරයේ ගිවිසුමේ ඇතුළත් කොන්දේසි සහිත පත්‍රිකාව, ඒ ඒ කණ්ඩායමට ලබා දී, එම පත්‍රිකාවේ ඇතුළත් තොරතුරු කෙරෙහි අවධානය යොමු කරවන්න.

**රංග, තරංග, සුරංග හවුල් ව්‍යාපාරයේ තොරතුරු පත්‍රිකාව**

හවුල් ගිවිසුමේ කොන්දේසි පහත පරිදි වේ.

- ගිණුම් කාලච්ඡේදයක් ආරම්භයේ ඇති ප්‍රාග්ධන ගිණුම් ශේෂ සඳහා 10% ක වාර්ෂික පොළියක් ගෙවීම.
- රංගට සහ තරංගට මසකට රු. 20 000/ ක් බැගින් හවුල් වේතනයකට හිමිකම් ලබන අතර සුරංගට මසකට රු. 15 000/-ක වේතනයක් හිමි වේ.
- හවුල්කරුවන් එකඟ වූ ප්‍රාග්ධනයට අමතර ව සපයා ඇති ණය සඳහා වාර්ෂික ව 10% ක පොළියක් හවුල්කරුවන්ට හිමි වේ.

- **හිස්තැනට සුදුසු වටිනාකම යෙදීමට උපදෙස් දෙන්න.**

| ප්‍රාග්ධන ගිණුම් ශේෂයන් (රු.) | | ප්‍රාග්ධන පොළිය (රු.) | හිමිකමට ඇති කරන බලපෑම (රු.) |
|---|---|---|---|
| රංග | 400 000 | ........................... | ........................... |
| තරංග | 300 000 | ........................... | ........................... |
| සුරංග | 200 000 | .......................... | ........................... |

| | හවුල් වේතන | මුළු වේතනය | |
|---|---|---|---|
| රංග | 20 000 | ........................... | |
| තරංග | 20 000 | ........................... | ..................... |
| සුරංග | 15 000 | ........................... | |

- රංග හවුල් ව්‍යාපාරයට හිමි ප්‍රාග්ධනයට අමතර ව සපයා ඇති ණය රු. 100 000 කි. පොළිය අඩු කළ පසු ශුද්ධ ලාභය රු. 900 000කි. එක් එක් හවුල්කරුගේ ලාභ කොටස්

| | | |
|---|---|---|
| රංග | ........................... | |
| තරංග | ........................... | ........................... |
| සුරංග | ........................... | |

**මෙම ගනුදෙනු මඟින් ඇති වන එක් එක් හවුල්කරුගේ හිමිකම**

| | | |
|---|---|---|
| රංග | ........................... | |
| තරංග | ........................... | ........................... |
| සුරංග | ........................... | |

- එක් එක් හවුල්කරුවන්ගේ ගැනිලි රංග, තරංග හා සුරංග පිළිවෙලින් රු. 120 000 ක් රු. 100 000 ක් හා රු. 80 000 ක් වේ, නම් හිමිකමට ඇති කරන බලපෑම හා ප්‍රමාණය

| | බලපෑම | ප්‍රමාණය (වටිනාකම) | අවසාන හිමිකම |
|---|---|---|---|
| රංග | ........................... | ........................... | ........................... |
| තරංග | ........................... | ........................... | ........................... |
| සුරංග | ........................... | ........................... | ........................... |

- ඒ ඒ කණ්ඩායම්හි සාකච්ඡා කර, එම පත්‍රිකාවේ ඇතුළත් හිස්තැන් පිරවීමට උපදෙස් දෙන්න.
- වගුවේ ඇතුළත් ස්ථාවර හිමිකම් හා විචල්‍ය හිමිකම් පන්ති කාමරයේ දී කණ්ඩායම් නායකයා මඟින් ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන්න.
- ඉදිරිපත් කරන ලද තොරතුරු දී ඇති ප්‍රාග්ධන ගිණුමේ හා ජංගම ගිණුමේ වාර්තා කිරීමට උපදෙස් දෙන්න.

හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම

| විස්තරය | රංග (රු.) | තරංග | සුරංග | විස්තරය | රංග | තරංග | සුරංග (රු.) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |

හවුල්කරුවන්ගේ ජංගම ගිණුම

| (රු.) | | | | (රු.) | | | |
|---|---|---|---|---|---|---|---|
| විස්තරය | රංග | තරංග | සුරංග | විස්තරය | රංග | තරංග | සුරංග |
| | | | | | | | |

හවුල්කරුවන්ගේ ජංගම ගිණුම හා ප්‍රාග්ධන ගිණුම සිරස් ආකෘතියක් තුළ වුව ද ඉදිරිපත් කළ හැකි ය.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්**

- හවුල් ව්‍යාපාරවල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී හිමිකම ගණනය කිරීම සඳහා ප්‍රාග්ධන ගිණුම හා ජංගම ගිණුම පිළියෙල කිරීම අවශ්‍ය වේ.
- ප්‍රාග්ධන ගිණුමේ ස්ථාවර හිමිකම් ලෙස වාර්තා කරන ලද පහත සඳහන් අයිතම ගැන පමණක් අවධානය යොමු කරයි.
    - ප්‍රාග්ධන ගිණුමේ ආරම්භක ශේෂය
    - අතිරේක ප්‍රාග්ධනය
    - එකඟතාව මත ප්‍රාග්ධන ආපසු ගැනීම්
- විචල්‍ය හිමිකම වාර්තාකරණ ගිණුම ජංගම ගිණුමයි. එහි පහත අයිතම ඇතුළත් කරයි.
    - ප්‍රාග්ධන පොළී
    - හවුල් වේතන
    - ගැනිලි
    - ලාභ කොටස් / අලාභ කොටස්
    - හවුල්කරුවන් සපයා ඇති ණය සඳහා පොළිය
    - හවුල්කරුවන් විසින් හවුල් ව්‍යාපාරය වෙනුවෙන් දරා ඇති ව්‍යාපාර වියදම්
- ප්‍රාග්ධන ගිණුම හා ජංගම ගිණුම වෙන් වෙන් ව තිබිය යුතු අතර ඒවා අනු තීරු ක්‍රමයට තබාගත යුතු ය.
- ප්‍රාග්ධන ගිණුම් ශේෂයන් හා ජංගම ගිණුම් ශේෂයන්ගේ එකතුව හවුල් ව්‍යාපාරයේ මුළු හිමිකම නියෝජනය වේ.
- බාහිර පාර්ශ්ව විසින් සපයා ඇති ණය, හිමිකමක් නොව වගකීමක් ලෙස හඳුනා ගත යුතුය.
- පහත අභ්‍යාසය සිසුන්ට ලබා දෙන්න.

උදා : රවී, මනී සහ සනී ගෙන යන හවුල් ව්‍යාපාරයේ ගිවිසුමේ ඇතුළත් ප්‍රතිපාදන පහත දැක්වේ.

- ගිණුම් කාලච්ඡේදයේ ආරම්භයේ ඇති ප්‍රාග්ධන ගිණුම් ශේෂයන් සඳහා වර්ෂයකට 10% ක පොළී ගෙවනු ඇත.
- සෑම හවුල්කරුවෙක් ම මසකට රු. 30 000/- බැගින් හවුල් වේතන හිමිකම් ලබයි.

- ප්‍රාග්ධනයට අතිරේක ව හවුල්කරුවන් විසින් ව්‍යාපාරයට සපයා ඇති ණය සඳහා 10% ක පොළී ගෙවන අතර ලාභාලාභ සමාන ව බෙදා ගනී.

- 2016/04/01 දිනට හවුල්කරුවන්ගේ පෞද්ගලික ගිණුම් ශේෂයන් මෙසේය.

| | රවී | මනී | සනී |
|---|---|---|---|
| ප්‍රාග්ධනය (රු.'000) | 5 000 | 4 000 | 4 000 |
| මුළු හිමිකම (රු.'000) | 5 400 | 4 200 | 3 700 |

- 2017/03/31 දිනෙන් අවසන් වර්ෂයේ එක් එක් හවුල්කරු පහත ගැනිලි සිදු කර ඇත.

| | |
|---|---|
| රවී | රු. 480 000 |
| මනී | රු. 500 000 |
| සනී | රු. 320 000 |

- 2016/04/01 දින මනී සපයා ඇති ණය ගිණුමේ ශේෂය රු. 200 000 කි.
- ණය පොළී අඩු කිරීමට පෙර රු. 2 580 000 ක ශුද්ධ ලාභයක් 2017/03/31 දිනෙන් අවසන් වර්ෂයේ දී හවුල් ව්‍යාපාරය උපයා ඇත.
- 2017/03/30 දින එක් එක් හවුල්කරුවන් රු. 1 000 000 බැගින් ආයෝජනය කර ඒ මුදලින් එදින ම යන්ත්‍රයක් ලබා ගෙන ඇත.
  - හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් හා ප්‍රාග්ධන ගිණුම් පිළියෙල කරන්න.

හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම

(රු.000)

| | රවී | මනී | සනී | | රවී | මනී | සනී |
|---|---|---|---|---|---|---|---|
| ප/ගෙ/ශේ | 6 000 | 5 000 | 5 000 | ඉ/ගෙ/ශේ | 5 000 | 4 000 | 4 000 |
| | | | | යන්ත්‍ර ගිණුම | 1 000 | 1 000 | 1 000 |
| | 6 000 | 5 000 | 5 000 | | 6 000 | 5 000 | 5 000 |
| | | | | ඉ/ගෙ/ශේ | 6 000 | 5 000 | 5 000 |

හවුල්කරුවන්ගේ ජංගම ගිණුම

(රු.)000

| | රවී | මනී | සනී | | රවී | මනී | සනී |
|---|---|---|---|---|---|---|---|
| ඉ/ගෙ/ශේ | - | - | 300 | ඉ/ගෙ/ශේ | 400 | 200 | - |
| ගැනිලි | 480 | 500 | 320 | හවුල් වේතන | 360 | 360 | 360 |
| ප/ගෙ/ශේ | 840 | 540 | 200 | ප්‍රාග්ධන පොළී | 500 | 400 | 400 |
| | | | | ණය පොළී | - | 20 | - |
| | | | | ලාභ කොටස් | 60 | 60 | 60 |
| | 1 320 | 1 040 | 820 | | 1 320 | 1 040 | 820 |
| | | | | ඉ/ගෙ/ශේ | 8 40 | 540 | 200 |

පෙර වැඩ

| | | රු. |
|---|---|---|
| ශුද්ධ ලාභය | | 2 580 000 |
| අඩු : ණය පොළී | 20 000 | |
| ප්‍රාග්ධන පොළී | 1300 000 | |
| හවුල් වේතන | 1 080 000 | (2400 000) |
| බෙදිය යුතු ලාභය | | 180 000 |
| ලාභ කොටස් - රවී | 60 000 | |
| - මනී | 60 000 | |
| - සනී | 60 000 | (180 000) |
| - | | 0 |

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :**

- හවුල්කරුවන් ව්‍යාපාරයක ජංගම ගිණුමේ වාර්තාකරන ගනුදෙනු 4ක් සඳහන් කිරීම.
- ප්‍රාග්ධන ගිණුම ස්ථාවර ව පවත්වා ගෙන යාමෙන් අපේක්ෂිත අරමුණ සඳහන් කිරීම.
- හවුල් ව්‍යාපාරයෙන් හවුල්කරුවෙකු ණයක් ගෙන ඇත්නම්, එයට අදාළ පොළිය ව්‍යාපාරයේ ලාභයට එකතු කිරීම පිළිබඳ ව ඔබේ අදහස ඉදිරිපත් කිරීම.

| මූලික පද | **பிரதான பதங்கள்** | **Key terms** |
|---|---|---|
| • ජංගම ගිණුම් | நடைமுறைக் கணக்குகள் | Current Accounts |
| • ප්‍රාග්ධන ගිණුම් | மூலதனக் கணக்குகள் | Capital Accounts |
| • හිමිකම | உரிமையாண்மை | Equity |

**නිපුණතාව 10.0 : හවුල් ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.**

**නිපුණතා මට්ටම 10.4** : හවුල් ව්‍යාපාරයක ආදායම් ප්‍රකාශනය පිළියෙල කර, හවුල්කරුවන් අතර ලාභාලාභ විසර්ජනය කරයි.


**කාලච්ඡේද** : 20

**ඉගෙනුම් ඵල :**

- හවුල් ව්‍යාපාරයක ලාභාලාභ ගණනය කරයි.
- හවුල් ව්‍යාපාරයක ලාභය / අලාභය හවුල්කරුවන් අතර බෙදාහරින ආකාරය දක්වයි.
- ආදායම් ප්‍රකාශනය පිළියෙල කරයි.
- ලාභ විසර්ජනයට අදාළ අයිතම ජංගම ගිණුමට පිටපත් කරයි.

**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම**



**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසුම**

- හවුල් ව්‍යාපාරයක උපයන ශුද්ධ ලාභය හවුල්කරුවන් අතර, බෙදා දීම සිදු කරන්නේ කෙසේ ද? යන්න සිසුන්ගෙන් විමසමින් පහත කරුණු මතු වන ආකාරයට සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - ලිඛිත හවුල් ගිවිසුමක් තිබේ නම්, එහි සඳහන් ආකාරයට ප්‍රාග්ධන පොළී, හවුල් වේතන හා ලාභ කොටස් බෙදා දිය යුතු බව.
  - ලිඛිත හවුල් ගිවිසුමක් නොමැති නම්, 1890 හවුල් ආඥා පනතේ 24 වගන්තියේ නියමයන්ට අනුව ක්‍රියා කළ යුතු බව.
  - හවුල් ව්‍යාපාරයක ඉපයූ ශුද්ධ ලාභය, ප්‍රාග්ධන පොළී, හවුල් වේතන හා ලාභ අලාභ කොටස් ලෙස බෙදා හැරීමට ලාභාලාභ විසර්ජන ප්‍රකාශනයක් පිළියෙල කරන බව.
  - ලාභාලාභ විසර්ජන ප්‍රකාශනයේ ඇතුළත් අයිතම ජංගම ගිණුම්වලට මාරු කරන බව.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- පහත සඳහන් ව්‍යාපාර දෙකට අදාළ තොරතුරු අතුරින් ඒ ඒ කණ්ඩායමට ලැබෙන ව්‍යාපාරය කෙරෙහි අවධානය යොමු කරවන්න.
  - ප්‍රභා ව්‍යාපාරය (ප්‍රමිතා හා භාරත)
  - රවී ව්‍යාපාරය (රස්මි හා වින්දන)
- කණ්ඩායමට ලැබුණු ව්‍යාපාරයේ තොරතුරු ඇතුළත් ඇමුණුම 10.4.1 පත්‍රිකාව අධ්‍යයනය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- හවුල් ව්‍යාපාරයේ ලාභ ගණනය කිරීමට යොමු කරන්න.
- හවුල් ගිවිසුමේ ඇතුළත් කොන්දේසි වූ ප්‍රාග්ධන පොළී, හවුල් වේතනවලට අදාළ ද්විත්ව සටහන් ලිවීමට උපදෙස් දෙන්න.
- ලාභ/ අලාභ කොටස් බෙදා දැක්වීම හා ඊට අදාළ ද්විත්ව සටහන් ලිවීමට යොමු කරන්න.
- හවුල් ව්‍යාපාරයේ ලාභය බෙදා ගන්නා, ආකාරය දී ඇති ආකෘතියට අනුව පිළියෙල කිරීමට යොමු කරවන්න.
- ඒ ඒ කණ්ඩායම් සඳහා ලාභාලාභ විසර්ජන ප්‍රකාශනය හා ජංගම ගිණුම පිළියෙල කිරීමට උපදෙස් දෙන්න.
- සකස් කළ ගිණුම්, පන්ති කාමරයට ඉදිරිපත් කිරීමට සලස්වන්න
- ඉදිරිපත් කළ ගිණුම්වල නිවැරදිතාව පිළිබඳ තහවුරු කර, සිසුන් ඇගයීමට ලක් කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

- හවුල් ව්‍යාපාරයක මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කිරීම සඳහා ආදායම් ප්‍රකාශනය පිළියෙල කරයි.

- හවුල් ව්‍යාපාරයක අයිතිය කිහිප දෙනෙකු සතු වන නිසා ශුද්ධ ලාභය හවුල්කරුවන් අතර බෙදාහැරීම කළ යුතු ය (විසර්ජනය කළ යුතු ය)
- හවුල් ගිවිසුමට අනුව ගිණුම් කාලච්ඡේදයට අදාළ වූ පහත සඳහන් අයිතම ලාභාලාභ විසර්ජන ප්‍රකාශයනට ඇතුළත් කරයි.
  - ප්‍රාග්ධන පොළිය
  - හවුල් වේතන
  - ලාභ / අලාභ කොටස්
- ඉහත අයිතමවලට අදාළ ද්විත්ව සටහන වන්නේ

  ලාභාලාභ විසර්ජන ගිණුම හර

  ජංගම ගිණුම බැර
- හවුල්කරුවන්ට හිමි යම් ප්‍රමාණ හිමිකමක් ඔවුන් මුදලින් ලබා ගෙන ඇත්නම්, ජංගම ගිණුමට හර කර මුදල් ගිණුමට බැර කරන්න.
- ලාභාලාභ විසර්ජන ගිණුම් ඇතුළත් අයිතමවල ද්විත්ව සටහන සම්පූර්ණ කිරීම සඳහා මෙන් ම, හවුල්කරුවන්ගේ විචල්‍ය හිමිකම පෙන්වීම සඳහා ජංගම ගිණුම් භාවිත කරයි.
- ඉහත තොරතුරුවලට අනුව ප්‍රභා ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය, ලාභාලාභ විසර්ජන ගිණුම, හා ජංගම ගිණුම පහත ආකාරයට සකස් කළ හැකි ය.

**ඇමුණුම 10.4.1 ව්‍යාපාර තොරතුරු**

**2017/03/31 දිනෙන් අවසන් වර්ෂයේ**
**ව්‍යාපාර දෙකක තොරතුරු**

| ප්‍රභා ව්‍යාපාරය (රු.000') | | | | රවී ව්‍යාපාරය (රු.000') |
|---|---|---|---|---|
| 1 000 | ප්‍රමිතා | ප්‍රාග්ධනය | රශ්මි | 1 200 |
| 800 | භාරත | | වින්දන | 1 000 |
| 200 | ප්‍රමිතා | ජංගම ගිණුම් | රශ්මි | 300 |
| 100 | භාරත | | වින්දන | 200 |
| 150 | ප්‍රමිතා | ගැනිලි | රශ්මි | 100 |
| 50 | භාරත | | වින්දන | 100 |
| 2 500 | -------- | විකුණුම් | --------- | 3 000 |
| 1 000 | --------- | විකුණුම් පිරිවැය | --------- | 1 300 |
| 200 | --------- | පරිපාලන වියදම් | --------- | 300 |
| 100 | --------- | බෙදාහැරීමේ වියදම් | --------- | 150 |
| 90 | --------- | වෙනත් වියදම් | --------- | 80 |
| 50 | --------- | මූල්‍ය වියදම් | --------- | 70 |
| 500 | ප්‍රමිතා | ව්‍යාපාරයට දුන් ණය | රශ්මි | 300 |
| 10% | --------- | ණය සඳහා පොළිය | --------- | - |
| 5% | --------- | ප්‍රාග්ධන පොළිය | --------- | - |
| 10 | --------- | හවුල් වේතන මසකට | | - |
| 700 | භාරත | හවුල් ව්‍යාපාරයෙන් ගත් ණය | --- | |
| 10% | --------- | ගත් ණය සඳහා පොළිය | --- | |
| 2 : 1 | ප්‍රමිතා : භාරත | ලාභාලාභ අනුපාතය | | --- |

**ලාභාලාභ විසර්ජන ගිණුම** රු.

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රාග්ධන පොලී A | × | | ශුද්ධ ලාභ ඉ/ගෙ | × × × |
| B | × | × × | | |
| හවුල් වේතන A | × | | | |
| B | × | × × | | |
| ලාභ කොටස් A | × | | | |
| B | × | × × | | |
| | | × × × | | × × × |

**ලාභාලාභ විසර්ජන ප්‍රකාශනය**

රු.

| | | | |
|---|---|---|---|
| ශුද්ධ ලාභය | | | × × × |
| ප්‍රාග්ධන පොලී A | × | | |
| B | × | × × | |
| හවුල් වේතන A | × | | |
| B | × | × × | (× ×) |
| ලාභ කොටස් A | × | | |
| B | × | × × | (× ×) |
| | | | - |

සම්ප්‍රදායික ක්‍රමයට හවුල් ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන තිරස් ක්‍රමයට පහත පරිදි පිළියෙල කළ හැකි ය. එය පහත දක් වේ.

**ප්‍රභා ව්‍යාපාරය**

**2017/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**වෙළෙඳ හා ලාභාලාභ ගිණුම හා විසර්ජන ගිණුම /ආදායම් ප්‍රකාශනය**

(රු.000')

| | | | | |
|---|---|---|---|---|
| විකුණුම් පිරිවැය | | 1 000 | විකුණුම් | 2 500 |
| දළ ලාභය ප/ගෙ | | 1 500 | | |
| | | 2 500 | | 2 500 |
| බෙදාහැරීමේ වියදම් | | 2 00 | දළ ලාභය ඉ/ගෙ | 1 500 |
| පරිපාලන වියදම් | | 100 | **වෙනත් ආදායම්** | |
| වෙනත් වියදම් | | 90 | ණය පොළී ආදායම | 70 |
| මූල්‍ය වියදම් | | | | |
| (ණය පොළිය -ප්‍රමිතා 50) | | 100 | | |
| ශුද්ධ ලාභය ප/ගෙ | | 1 080 | | |
| | | 1 570 | | 1 570 |
| ප්‍රාග්ධන පොළී - ප්‍රමිතා | 50 | | ශුද්ධ ලාභය | 1 080 |
| - භාරත | 40 | 90 | | |
| හවුල් වේතන - ප්‍රමිතා | 120 | | | |
| - භාරක | 120 | 240 | | |
| ලාභ කොටස් | | | | |
| - ප්‍රමිතා | 500 | | | |
| - භාරත | 250 | 750 | | |
| | | 1 080 | | 1 080 |

සම්ප්‍රදායික ක්‍රමයට හවුල් ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන සිරස් ක්‍රමයට පහත පරිදි පිළියෙල කළ හැකි ය. එය පහත දැක් වේ.

**ප්‍රභා ව්‍යාපාරය**

**2017/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**ආදායම් ප්‍රකාශනය හා විසර්ජන ප්‍රකාශනය**

(රු.000')

| | | | |
|---|---|---|---|
| විකුණුම් | | | 2 500 |
| **අඩු කළා :** විකුණුම් පිරිවැය | | | (1 000) |
| දළ ලාභය | | | 1 500 |
| **එකතු කළා :** වෙනත් ආදායම් | | | |
| ණය පොලී ආදායම | | | 70 |
| | | | 1570 |
| **අඩු කළා :** වියදම් | | | |
| බෙදාහැරීමේ වියදම් | 200 | | |
| පරිපාලන වියදම් | 100 | | |
| වෙනත් වියදම් | 90 | | |
| මූල්‍ය වියදම් | 100 | 490 | (490) |
| ණය පොලී - ප්‍රමිතා සමග) | | | |
| ශුද්ධ ලාභය | | | 1 080 |
| **අඩු කළා :** | | | |
| ප්‍රාග්ධන පොලී ..... ප්‍රමිතා | 50 | | |
| භාරත | 40 | 90 | |
| හවුල් වේතන ...... ප්‍රමිතා | 120 | | |
| භාරත | 120 | 240 | (330) |
| ලාභ කොටස් ..................... ප්‍රමිතා | 500 | | |
| භාරත | 250 | 750 | (750) |
| | | | 0 |

හවුල්කරුවන්ගේ ජංගම ගිණුම (රු.)

| විස්තරය | ප්‍රමිතා | භාරත | විස්තරය | ප්‍රමිතා | භාරත |
|---|---|---|---|---|---|
| ගැනිලි | 150 | 50 | ශේෂය ඉ/ගෙ | 200 | 100 |
| ණය පොළී | - | 70 | ප්‍රාග්ධන පොළී | 50 | 40 |
| ශේෂය ප/ගෙ | 770 | 390 | හවුල් වේතන | 120 | 120 |
| | | | ණය පොළී | 50 | - |
| | | | ලාභ කොටස් | 500 | 250 |
| | 920 | 510 | | 920 | 510 |
| | | | ශේෂය ප/ගෙ | 770 | 390 |

- හවුල් ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන තිරස් හා සිරස් විසර්ජන ගිණුම් ප්‍රකාශනයක් ලෙස සකස් කිරීමට මග පෙන්වන්න.
- මෙවැනි ආකාරයෙන් නිර්මාණය කර ගත් අභ්‍යාස කිහිපයක් සිසුන්ට ලබා දෙන්න.
- කණ්ඩායම් අතර, ඉහත ව්‍යාපාර දෙකේ තොරතුරු මාරු කර අදාළ මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරවන්න.

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :**

- ව්‍යාපාරයක ලාභාලාභ විසර්ජන ගිණුමක් /ප්‍රකාශනයක් පිළියෙල කිරීමේ අවශ්‍යතාව දැක්වීම.

- පහත සඳහන් ගනුදෙනුවල ද්විත්ව සටහන් ලිවීම.
    - ප්‍රාග්ධන පොළී A රු. 400
      B රු. 200
  - හවුල්කරුවෙකු වූ කුමාරට ගෙවිය යුතු ණය පොළිය රු. 100
- සුමනා හා යමුනා ගේ හවුල් ව්‍යාපාරයේ දෙන ලද තොරතුරු ඇසුරින් ලාභාලාභ විසර්ජන ප්‍රකාශනය පිළියෙල කිරීම.

| | | |
|---|---|---|
| ප්‍රාග්ධනය | සුමනා | රු. 700 000 |
| | යමුනා | රු. 500 000 |
| ප්‍රාග්ධන පොළිය 10% වාර්ෂික ව | | |
| හවුල් වේතන සුමනාට වාර්ෂිකව | | රු. 100 000 |
| හවුල් වේතන යමුනාට වාර්ෂිකව | | රු. 80 000 |
| වර්ෂයේ ශුද්ධ ලාභය | | රු. 200 000 |

ලාභාලාභ අනුපාතය හවුල්කරුවන් අතර සම සම වේ.

| මූලික පද | பிரதான பதங்கள் | **Key terms** |
|---|---|---|
| • ලාභාලාභ විසර්ජන ප්‍රකාශනය | இலாப நட்டப் பகிர்வுக் கூற்று | Profit and Loss Appropriate Statement |
| • ලාභාලාභ ප්‍රකාශනය | இலாப நட்டக் கூற்று | Profit and Loss Statement |
| • ලාභාලාභ බෙදාගන්නා අනුපාතය | இலாப நட்ட பகிர்வு விகிதம் | Profit and Loss Sharing Ratio |

**නිපුණතාව 10.0 : හවුල් ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.**

**නිපුණතා මට්ටම 10.5 :** හවුල්කරුවන් බඳවා ගැනීමේ දී, ඉවත් වීමේ දී සිදුවන ගනුදෙනු හා සිද්ධීන් ගිණුම්ගත කරයි.


**කාලච්ඡේද** : 03

**ඉගෙනුම් ඵල** :

- හවුල් ව්‍යාපාරයක අයිතිය වෙනස්වන අවස්ථා නම් කරයි.
- හවුල්කරුවන්ගේ අයිතිය වෙනස්වන අවස්ථාවක කීර්ති නාමය ගැලපුම් කළ යුතු බව පැහැදිලි කරයි.
- කීර්ති නාම ගිණුමක් විවෘත නොකර, කීර්ති නාමය ප්‍රාග්ධන ගිණුම තුළින් ගැලපුම් කරයි.
- කීර්ති නාමය ගැලපීමෙන් පසුව ප්‍රාග්ධන ශේෂවලට වන බලපෑම දක්වයි.
- ඉවත් වන හවුල්කරුවන්ගේ හිමිකම් කොටස ණයක් ලෙස රඳවාගත හැකි බව පෙන්වා දෙයි.

**මූලික පද හා සංකල්ප :**

**සංකල්ප සිතියම**



**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පිවිසුම**

- පහත සඳහන් ප්‍රශ්න හුණු පුවරුවේ / වෙනත් ආකාරයකට ලියා පන්ති කාමරයේ සියලුම සිසුන්ට පෙනෙන සේ ඉදිරිපත් කරන්න.
    1. හවුල්කරුවන් දෙදෙනෙක් සිටින ව්‍යාපාරයකට ගිණුම් කාලච්ඡේදය ආරම්භක දින හවුල්කරුවෙකු බඳවා ගන්නේ නම්, ඇති වන තත්ත්වයන්, හා ගත යුතු ක්‍රියා මාර්ග මොනවා ද?
    2. හවුල්කරුවන් තිදෙනෙක් සිටින ව්‍යාපාරයක එක් හවුල්කරුවෙකු ගිණුම් කාලච්ඡේදයේ අවසාන දින ඉවත්වූයේ නම්, ඇති වන තත්ත්වයන් හා ගත යුතු ක්‍රියා මාර්ග මොනවා ද?
- ඉහත ප්‍රශ්න දෙකට සිසුන් ඉදිරිපත් කරන අදහස් ඇසුරින්, පහත සඳහන් කරුනු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - හවුල් ව්‍යාපාරයක අයිතිය වෙනස්වන අවස්ථාවල දී සිටින හවුල්කරුවන්ගේ අයිතිය වෙනස්වන බව
    - හවුල්කරුවකු බඳවා ගැනීමේ දී නව හවුල්කරුට ද ව්‍යාපාරයට අයිතියක් ඇති වන බව.
    - නව හවුල්කරු පැමිණෙන විට, පැවති හවුල් ව්‍යාපාරයේ කීර්ති නාමයක් පැවති බව
    - පැවති හවුල් ව්‍යාපාරයේ තක්සේරු කළ කීර්ති නාමය ගැලපුම් කළ යුතු බව.
    - කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුම් තුළ ගැලපුම් කරන බව.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- පහත සඳහන් අවස්ථා එක් එක් කණ්ඩායම්වලට ලබා දී ඒ කෙරෙහි අවධානය යොමු කරවන්න. (මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම් පිළියෙල කරන ව්‍යාපාරයක)
    1. 2017. 04. 01 දින ප්‍රනීත් බඳවා ගැනීම.
    2. 2017. 04. 01 දින ප්‍රනීත් ඉවත් වීම.
    3. 2018. 03. 31 දි ප්‍රනීත් බඳවා ගැනීම.
    4. 2018. 03. 31 දින ප්‍රනීත් ඉවත් වීම.
- පහත සඳහන් හවුල් ව්‍යාපාරයේ තොරතුරු හොඳින් අධ්‍යයනය කිරීමට ඉඩ සලස්වන්න.
    - මලිඳු, නිසාන් හා ප්‍රනීත් හවුල් ව්‍යාපාරයේ ගිවිසුමේ කොන්දේසි මෙසේය.
    - ලාභ ලාභ අනුපාතය 3 : 2 : 1
    - මාසික හවුල් වේතන - මලිඳු රු. 3 000, නිසාන් රු. 2 000 ප්‍රනීත්, රු. 4 000
    - ප්‍රාග්ධන පොළී - වාර්ෂිකව 10% (නව හා පැරණි ගිවිසුම)
    - ණය සඳහා පොළී 10% (නව හා පැරණි ගිවිසුම)

- 2018/03/31 දිනෙන් අවසන් වර්ෂය තුළ උපුටා ගත් තොරතුරු කිහිපයක් මෙසේ ය.

| | | රු. |
|---|---|---|
| • විකුණුම් ආදායම | | 1 000 000 |
| • විකුණුම් පිරිවැය | | 600 000 |
| • පරිපාලන වියදම් | | 50 000 |
| • බෙදාහැරීමේ වියදම් | | 30 000 |
| • මූල්‍ය වියදම් | | 15 000 |
| • වෙනත් වියදම් | | 4 000 |
| • මලිඳුට ගෙවූ ණය පොළී | | 4 000 |
| • බොල් ණය | | 5 000 |
| • ප්‍රාග්ධනය- මලිඳු | | 400 000 |
| (2017.4.1 දිනට) | - නිසාන් | 300 000 |
| | - ප්‍රනීත් | 200 000 |
| • ගැනිලි | - මලිඳු | 20 000 |
| | - නිසාන් | 10 000 |
| • 2017/04/01 දිනට ජංගම ගිණුමේ ශේෂ | | |
| | - මලිඳු | 30 000 |
| | - නිසාන් | 20 000 |

- හවුල්කරුවන්ගේ අයිතිය වෙනස් වූ දිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 120 000 ක් ලෙස තක්සේරු කර ඇත.
- මලිඳු ණය සපයා ඇත්තේ 2016/04/01 දින වන අතර ඒ සඳහා ගෙවා ඇත්තේ මාස 6 ක පොළිය පමණි.

- ඒ ඒ කණ්ඩායමට ලැබුණු අවස්ථාව (මාතෘකාව) අනුව. 2018/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **ආදායම් ප්‍රකාශනය හා විසර්ජන ප්‍රකාශනය** පිළියෙල කිරීමට යොමු කරවන්න.
- හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් පිළියෙළ කිරීමට උපදෙස් දෙන්න.
- හවුල් ව්‍යාපාරයේ හිමිකම වෙනස් වු දිනට කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුම් තුළින් ගැලපීම වාර්තා කිරීමට යොමු කරවන්න.
- හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් සහ ප්‍රාග්ධන ගිණුම් තුලනය කරවන්න.
- ඒ ඒ කණ්ඩායමට ලැබුණු (මාතෘකාව) අවස්ථාව හැර ඉතිරි මාතෘකා (අවස්ථා) තුන සඳහා ලාභා ලාභ විසර්ජන ප්‍රකාශනය, ජංගම ගිණුම්, ප්‍රාග්ධන ගිණුම් පිළියෙල කරවන්න.
- සකස් කළ ගිණුම් හා වාර්තාවල නිවැරදි බව පරික්ෂා කර බලන්න.
- හවුල් ව්‍යාපාරයෙන් ඉවත්වන හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුමේ ශේෂය වාර්තාකරණ ආකාරය පැහැදිලි කර දෙන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන්ගේ අයිතිය වෙනස්වන අවස්ථා ලෙස
    - හවුල්කරුවෙකු බඳවා ගැනීම
    - හවුල්කරුවකු ඉවත්වීම දැක්විය හැකි ය.
- ගිණුම් කාලච්ඡේදයේ ආරම්භක දින හා අවසාන දින පමණක් අයිතිය වෙනස්වීම් සිදු වූවා සේ සලකා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සිදු කරයි.
- හවුල් ව්‍යාපාරයේ අයිතිය වෙනස් වීම නිසා වෙනස් වූ දිනෙන් පසු නව හවුල් ව්‍යාපාරයක් ආරම්භ වන බව පැහැදිලි කරන්න.
- හවුල් ව්‍යාපාරයේ අයිතිය වෙනස් වන දිනට ව්‍යාපාරයේ තක්සේරු කළ කීර්තිනාමය, හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්වලින් ගැලපීම් කළ යුතුය.
- කීර්තිනාමය වාර්තා කිරීමේ ජර්නල් සටහන් පහත ආකාරයෙන් දැක්විය හැකිය.
    - **මුළු** කීර්තිනාමයේ වටිනාකම

| | |
|---|---|
| සියලුම හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් (නව අනුපාතයට) | හර |
| පැරණි හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් (පැරණි අනුපාතයට) | බැර |

- නව හවුල්කරුවන්ගේ කීර්තිනාම කොටස

| | |
|---|---|
| නව හවුල්කරු ප්‍රාග්ධන ගිණුම | හර |
| පැරණි හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් (කැප කළ අනුපාතයට) | බැර |

- කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුම තුළින් ගැලපීම නිසා ඒ ඒ හවුල්කරුවන්ගේ හිමිකමට බලපෑමක් වුවත් හවුල් ව්‍යාපාරයේ මුළු හිමිකට බලපෑමක් සිදු නොවේ. එය අභ්‍යාස සකස් කිරීමෙන් පැහැදිලි කළ යුතුයි.
- හවුල්කරුවෙකු **ඉවත් වීමේ දී** හිමිකම ගණනය කිරීම සඳහා ජංගම ගිණුමේ ශේෂය ද ප්‍රාග්ධන ගිණුමට මාරු කර ගණනය කරන බව පැහැදිලි කරන්න.
- සිසුන්ට ලබාදුන් ක්‍රියාකාරකමෙහි හවුල්කරුවන්ගේ අයිතිය වෙනස්වූ අවස්ථාවලින්
    - 2017/04/01 දින ප්‍රනීත් බඳවා ගැනීම
    - 2017/04/01 දින ප්‍රනීත් ඉවත් වීම.

    සම්බන්ධ ව ගිණුම් පිළියෙල කිරීම පහත දැක්වේ.

(01) **නව හවුල්කරුවකු ලෙස ප්‍රනීත් ගිණුම් කාලච්ඡේදය ආරම්භක දින (2017.04.01) බඳවා ගැනීම**

**මලිඳු, නිසාන් සහ ප්‍රනීත් හවුල් ව්‍යාපාරය**

**2018/03/31 දිනෙන් අවසන් වර්ෂයේ ආදායම් ප්‍රකාශනය**

| | | | (රු.) |
|---|---|---|---|
| විකුණුම් | | | 1 000 000 |
| විකුණුම් පිරිවැය | | | (600 000) |
| දළ ලාභය | | | 400 000 |
| බෙදාහැරීමේ වියදම් (බොල් ණය සමග) | | 35 000 | |
| පරිපාලන වියදම් | | 50 000 | |
| මූල්‍ය වියදම් | | 23 000 | |
| (මලිඳුගේ ණය පොළිය ද ඇතුලුව) | | | |
| වෙනත් වියදම් | | 4 000 | (112 000) |
| ශුද්ධ ලාභය | | | 288 000 |
| **විසර්ජනයන්** | | | |
| ප්‍රාග්ධන පොළී | මලිඳු | 40 000 | |
| | නිසාන් | 32 000 | |
| | ප්‍රනීත් | 18 000 | (90 000) |
| හවුල් වේතන | මලිඳු | 36 000 | |
| | නිසාන් | 24 000 | |
| | ප්‍රනීත් | 48 000 | (108 000) |
| ලාභ කොටස් | මලිඳු - 3 | 45 000 | |
| | නිසාන්- 2 | 30 000 | |
| | ප්‍රනීත් - 1 | 15 000 | (90 000) |
| | | | |

**පෙරවැඩ :**

| **බෙදාහැරීමේ වියදම් (බොල් ණය ද සමග)** | රු. |
|---|---|
| බෙදාහැරීමේ වියදම් | 30 000 |
| බොල් ණය | 5 000 |
| | 35 000 |

| **මූල්‍ය විදයම් (මලිඳුගේ ණය පොළිය ද සමග)** | රු. |
|---|---|
| මූල්‍ය වියදම් | 15 000 |
| ණය පොළී - මලිඳු | 8 000 |
| | 23 000 |

**හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්**

| විස්තරය | මලිදු | නිසාන් | ප්‍රනීත් | විස්තරය | මලිදු | නිසාන් | ප්‍රනීත් |
|---|---|---|---|---|---|---|---|
| | | | රු. | | | | රු. |
| ගැනිලි | 20 000 | 10 000 | - | ශේෂය ඉ/ගෙ | 30 000 | 20 000 | - |
| ශේ/ප/ගෙ | 135 000 | 96 000 | 81 000 | ණය පොළී | 4 000 | - | - |
| | | | | වේතන | 36 000 | 24 000 | 48 000 |
| | | | | ප්‍රාග්ධන පොළී | 40 000 | 32 000 | 18 000 |
| | | | | ලාභ කොටස් | 45 000 | 30 000 | 15 000 |
| | 155 000 | 106 000 | 81 000 | | 155 000 | 106 000 | 81 000 |
| | | | | ශේ/ප/ගෙ | 135 000 | 96 000 | 81 000 |

**හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්**

| විස්තරය | මලිදු | නිසාන් | ප්‍රනීත් | විස්තරය | මලිදු | නිසාන් | ප්‍රනීත් |
|---|---|---|---|---|---|---|---|
| | | | රු. | | | | රු. |
| ප්‍රාග්ධන ගිණුම් (කීර්තිනාමය) | 60 000 | 40 000 | 20 000 | ශේෂය ඉ/ගෙ | 400 000 | 300 000 | - |
| | | | | මුදල් | - | - | 200 000 |
| ශේ/ප/ගෙ | 400 000 | 320 000 | 180 000 | ප්‍රාග්ධන ගිණුම් (කීර්තිනාමය) | 60 000 | 60 000 | - |
| | 460 000 | 360 000 | 200 000 | | 460 000 | 360 000 | 200 000 |
| | | | | ශේ/ඉ/ගෙ | 400 000 | 320 000 | 180 000 |

- **ප්‍රනීත්ගේ ප්‍රාග්ධන ගිණුමේ ශේෂය ඔහු ආරම්භක දින ප්‍රාග්ධනය ලෙස රැගෙන ආ මුදල ලෙස සලකා ඇත.**

(02) අවස්ථාව : ගිණුම් කාලච්ඡේදයක ආරම්භක දින (2017.04.01) හවුල්කරුවකු ප්‍රනීත් ඉවත් වීම

**මලිදු සහ නිසාන් හවුල් ව්‍යාපාරය**

**2018/03/31 දිනෙන් අවසන් වර්ෂයේ ආදායම් ප්‍රකාශනය**

| | | | |
|---|---|---|---|
| විකුණුම් | | | 1 000 000 |
| විකුණුම් පිරිවැය | | | (600 000) |
| දළ ලාභය | | | 400 000 |
| බෙදාහැරීමේ වියදම් | | 35 000 | |
| පරිපාලන වියදම් | | 50 000 | |
| මූල්‍ය වියදම් | | 34 000 | |
| වෙනත් වියදම් | | 4 000 | (123 000) |
| ශුද්ධ ලාභය | | | 277 000 |
| **විසර්ජනයන්** | | | |
| ප්‍රාග්ධන පොළී | මලිදු | 40 000 | |
| | නිසාන් | 28 000 | (68 000) |
| ලාභ කොටස් | මලිදු | 104 500 | |
| | නිසාන් | 104 500 | (209 000) |
| | | | — |

* ප්‍රනීත් ඉවත්වීමේ දී ගෙවිය යුතු මුළු ණය මුදල මත 5% ක වාර්ෂික පොලියක් ගෙවීම (1890 හවුල් ආඥා පනතේ 24 වන්තිය)

**මූල්‍ය වියදම් :**

| | රු. | |
|---|---|---|
| මූල්‍ය වියදම් | 15 000 | |
| ණය පොළී - මලිදු | 8 000 | රු. $220\ 000 \times \frac{5}{100}$ |
| ණය පොළී - ප්‍රනීත් | 11 000 | |
| | 34 000 | රු. 11 000 |

**හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්** (රු.)

| විස්තරය | මලිදු | නිසාන් | විස්තරය | මලිදු | නිසාන් |
|---|---|---|---|---|---|
| ගැනිලි | 20 000 | 10 000 | ශේෂය ඉ/ගෙ | 30 000 | 20 000 |
| ශේ/ප/ගෙ | 164 500 | 148 500 | ප්‍රාග්ධන පොළී | 40 000 | 28 000 |
| | | | වේතන | - | - |
| | | | ණය පොළී | 4 000 | - |
| | | | ලාභ කොටස් | 110 500 | 110 500 |
| | 184 500 | 158 500 | | 184 500 | 158 500 |
| | | | ශේ/ඉ/ගෙ | 164 500 | 148 500 |

### හවල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්

| විස්තරය | මලිදු | නිසාන් | ප්‍රනීත් | විස්තරය | මලිදු | නිසාන් | ප්‍රනීත් |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් | 60 000 | 60 000 | - | ශේෂය ඉ/ගෙ | 400 000 | 300 000 | 200 000 |
| ප්‍රති.(කී.නාමය) | | | | (මුදල්) | - | - | - |
| ණය ගිණුමට | - | - | 220 000 | ප්‍රාග්/ගි/ප්‍රති) | 60 000 | 40 000 | 20 000 |
| ශේ/ප/ගෙ | 400 000 | 280 000 | - | කීර්තිනාමය | | | |
| | 460 000 | 340 000 | 220 000 | | 460 000 | 340 000 | 220 000 |
| | | | | ශේ/ඉ/ගෙ | 400 000 | 280 000 | - |

- **ඉවත් වන හවුල්කරුගේ ප්‍රාග්ධන ගිණුමේ ශේෂය සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග**
  - ඉවත්වන හවුල්කරුට ගෙවිය යුතු මුදල එකවර ඉවත්වන දිනයේ දී ම ගෙවීම.
  - පසුව ගෙවීමට එකඟ වී ඉවත් ව යන හවුල්කරුවන්ගේ හිමිකම හවුල්කරුවන්ගේ ණය ගිණුමකට මාරු කිරීම
- ඒ අනුව ප්‍රනීත් ඉවත් වන දිනට ඔහු ගෙවිය යුතු මුළු මුදල් නොගෙවන නිසා, ඒ සඳහා 5%ක වාර්ෂික පොළියක් ගෙවිය යුතුයි.
- ඉහත ගිණුම්වල ශේෂ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පහත ආකාරයට දැක්විය යුතුයි.

| | | | රු. |
|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් | - මලිදු | 400 000 | |
| | - නිසාන් | 280 000 | 680 000 |
| ජංගම ගිණුම් | - මලිදු | 164 500 | |
| | - නිසාන් | 148 500 | 313 000 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| ණය ගිණුම - ප්‍රනීත් | | | 220 000 |
| **ජංගම වගකීම්** | | | |
| උපයන ණය පොළිය | | | 11 000 |

- මේ ආකාරයෙන් අනෙක් ව්‍යාපාර දෙකේ ද තොරතුරු ඇසුරින්
  - ලාභාලාභ විසර්ජන ප්‍රකාශනය
  - ජංගම ගිණුම්
  - ප්‍රාග්ධන ගිණුම් සකස් කර ඉදිරිපත් කරන්න.
  - තවත් මෙවැනි විවිධ වූ අභ්‍යාස සිසුන්ට ලබා දී විසඳීමට යොමු කරන්න.

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක :**

- හවුල් ව්‍යාපාරයක අයිතිය වෙනස්වන අවස්ථා නම් කිරීම
- හවුල්කරුවන්ගේ අයිතිය වෙනස්වීමක දී ඇති වන තත්ත්වයන් මතු කිරීම.
- කිර්ති නාමය ගැලපුම් කළ යුතු ආකාරය දැක්වීම.

(01) 2018/03/31 දිනෙන් අවසන් වර්ෂයේ ලෙජරයෙන් උපුටාගත් ශේෂ කිහිපයක් පහත දැක්වේ.

- ප්‍රාග්ධන ගිණුම් 2017. 04. 01 - අමල් රු. 600 000
  - කමල් රු. 450 000
- ජංගම ගිණුම් 2017. 04. 01 - අමල් රු. 50 000
  - කමල් රු. (20 000)
- 2017. 04. 01 දින රු. 400 000 ක් යොදමින් නිමල් ව්‍යාපාරයට බඳවා ගනියි.
- එදිනට ව්‍යාපාරයේ කීර්ති නාමය රු. 60 000 ක් ලෙස තක්සේරු කරන ලදී.
- පැරණි ව්‍යාපාරයේ ලාභාලාභ අනුපාතය පිළිවෙලින් අමල් හා කමල් 3 : 2 වේ.
- නව ව්‍යාපාරයේ ලාභාලාභ අනුපාතය පිළිවෙලින් අමල් කමල් හා නිමල් 5 : 3 : 2 වේ.
- කීර්ති නාමය ගැලපීම ප්‍රාග්ධන ගිණුම් තුළින් පෙන්වීම.

(02) ඉහත හවුල් ව්‍යාපාරයේ කාලච්ඡේදයේ ලාභය රු. 450 000 ක් නම්, ලාභය විසර්ජනය කිරීම පෙන්වීම.

**ක්‍රියාකාරකම 02 :**

**පිවිසුම**

- පෙර දැනුම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න සිසුන් වෙත ඉදිරිපත් කර, පහත කරුණු මතු කර ගැනීමට සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - ගිණුම් කාලච්ඡේදයක මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කිරීමෙන් පසු ලෙජරයේ ඉතිරි වන ගිණුම් මොනවා ද?
  - එම ගිණුම්වල ශේෂ ඇතුළත් කරන මූල්‍ය ප්‍රකාශනය කුමක් ද?
  - ව්‍යාපාර සංවිධානය කුමක් වුවත්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයකින් ඉදිරිපත් කරන තොරතුරුවල වෙනසක් තිබේ ද?
    හවුල්කරුවන්ගේ හිමිකමට අයත් වන ගිණුම් වර්ග මොනවා ද?
- හවුල් ව්‍යාපාරයක මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කළ පසු ලෙජරයේ ඉතිරිවන වත්කම්, වගකීම් හා හිමිකම් ගිණුම්වල ශේෂ ඇසුරින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සකස් කරන බව පැහැදිලි කරන්න.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- පහත සඳහන් ව්‍යාපාර අතුරින් ඒ ඒ කණ්ඩායමට ලැබෙන ව්‍යාපාරය කෙරෙහි අවධානය යොමු කරවන්න.

| සිත් හා මෙත් හවුල් ව්‍යාපාරය (රු.) | සඳ, රුස් හා තරු හවුල් ව්‍යාපාරය (රු.) | A, B හා C හවුල් ව්‍යාපාරය (රු.) |
|---|---|---|
| • ආරම්භක ප්‍රාග්ධනය<br>සිත් 3000 000<br>මෙත් 200 000<br>• අතිරේක ප්‍රාග්ධනය යෙදීම<br>සිත් 100 000<br>• ආරම්භක ජංගම ගිණුම් ශේෂ<br>සිත් 50 000<br>මෙත් 40 000<br>• ප්‍රාග්ධන පොළී<br>සිත් 20 000<br>මෙත් 10 000<br>• හවුල් වේතන<br>සිත් 30 000<br>මෙත් 30 000<br>• ලාභ කොටස්<br>සිත් 30 000<br>මෙත් 10 000<br>• ණය හිමියෝ 25 000<br>• උපචිත වියදම් 5 000<br>• දේපළ පිරියත හා උපකරණ 500 000<br>• මුදල් 220 000<br>• ණයගැතියෝ 80 000<br>• අවසාන තොගය 50 000 | • ආරම්භක ප්‍රාග්ධනය<br>සඳ 150 000<br>රුස් 100 000<br>තරු 80 000<br>• ආරම්භක ජංගම ගිණුම් ශේෂ<br>සඳ 20 000<br>රුස් (10 000)<br>තරු 15 000<br>• ලාභ කොටස්<br>සඳ 25 000<br>රුස් 20 000<br>තරු 25 000<br>• ණය හිමියෝ 50 000<br>• බැංකු ණය 100 000<br>• දේපළ පිරියත හා උපකරණ 350 000<br>• මුදල් 150 000<br>• අවසාන තොගය 80 000 | • ආරම්භක ප්‍රාග්ධනය<br>A 800 000<br>B 600 000<br>C 500 000<br>• ආරම්භක ජංගම ගිණුම් ශේෂ<br>A 70 000<br>B (50 000)<br>C (30 000)<br>• ලාභ කොටස්<br>A 60 000<br>B 60 000<br>C 30 000<br>• ප්‍රාග්ධන පොළී<br>A 80 000<br>B 60 000<br>C 50 000<br>• ගැනිලි<br>A 10 000<br>B 20 000<br>• ණය ගිණුම් (බැර)<br>B 100 000<br>C 150 000<br>• දේපළ පිරියත හා උපකරණ 1 590 000<br>• ණය හිමියෝ 50 000<br>• බැංකු ණය 75 000<br>• මුදල් හා බැංකු 510 000<br>• තොගය 200 000<br>• ණයගැතියෝ 300 000<br>• ව්‍යාපාරයට මෝටර් රථයක් යෙදවීම B 250 000<br>• උපචිත පොළී B 10 000<br>C 15 000 |

- ඒ ඒ කණ්ඩායමේ ව්‍යාපාරය පහත ගිණුම් පිළියෙල කර, තුලනය කිරීමට උපදෙස් දෙන්න.
    - ජංගම ගිණුම්
    - ප්‍රාග්ධන ගිණුම්
- 2016/03/31 දිනට අනෙකුත් වත්කම්, වගකීම් ගිණුම්වල ශේෂ හා ප්‍රාග්ධන ගිණුම් හා ජංගම ගිණුම් ශේෂ උපයෝගී කර ගෙන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීමට මඟ පෙන්වන්න.
- සිසුන් සකස් කළ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා හිමිකම් ගිණුම් පන්ති කාමරයට උචිත පරිදි ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඒ ඒ කණ්ඩායම් අනෙක් ව්‍යාපාර දෙක සඳහා ද ජංගම ගිණුම්, ප්‍රාග්ධන ගිණුම් හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙළ කිරීම හා එය රැගෙන ඒමට ඉදිරි දින ලබා දෙන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

- හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හා ජංගම ගිණුම්වල ශේෂ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙන් වෙන් ව දැක්විය යුතු ය.
- හවුල්කරුවන් ව්‍යාපාරයට සැපයූ ණය ඔවුන්ගේ හිමිකමේ කොටසක් නොවන නිසා එය වෙන වෙන ම පෙන්විය යුතු ය.
- ජංගම ගිණුම්වල ' හර ' ශේෂ ඇතිවිට, එය අනෙකුත් ජංගම ගිණුම්වල ශේෂ එකතුවෙන් අඩුකර දැක්විය යුතු යි.
- අනෙකුත් වත්කම් හා වගකීම් ගිණුම් කේවල ස්වාමී ව්‍යාපාරයක් මෙන් සටහන් කළ ආකාරයට ඉදිරිපත් කළ යුතු යි.
- ක්‍රියාකාරකමෙහි ඇතුළත් A, B, C හවුල් ව්‍යාපාරයේ ජංගම ගිණුම්, ප්‍රාග්ධන ගිණුම් හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පහත ආකාරයට සකස් කෙරේ.

**හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්**

| විස්තරය | A | B | C (රු.) | විස්තරය | A | B | C (රු.) |
|---|---|---|---|---|---|---|---|
| ශේෂය | - | 50 000 | 30 000 | ශේෂය | 70 000 | - | - |
| ගැනිලි | 10 000 | 20 000 | - | ප්‍රාග්ධන පොළී | 80 000 | 60 000 | 50 000 |
| ශේ/ප/ගෙ | 200 000 | 60 000 | 65 000 | ලාභ කොටස් | 60 000 | 60 000 | 30 000 |
| | | | | ණය පොළිය | - | 10 000 | 15 000 |
| | 210 000 | 130 000 | 95 000 | | 210 000 | 130 000 | 95 000 |
| | | | | ඉ/ගෙ/ශේ | 200 000 | 60 000 | 65 000 |

**හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්**

| විස්තරය | A | B | C (රු.) | විස්තරය | A | B | C (රු.) |
|---|---|---|---|---|---|---|---|
| ශේ/ප/ගෙ | 800 000 | 850 000 | 500 000 | ශේෂය | 800 000 | 600 000 | 500 000 |
| | | | | මෝටර් රථය | - | 250 000 | - |
| | 800 000 | 850 000 | 500 000 | | 800 000 | 850 000 | 500 000 |
| | | | | ශේ/ඉ/ගෙ | 800 000 | 850 00 | 500 000 |

**2017/03/31 දිනට**

A, B, C හවුල් ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(රු.000)

| | | |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | |
| දේපළ පිරියත හා උපකරණ | | 1 840 |
| **ජංගම වත්කම්** | | |
| තොගය | 200 | |
| ණයගැතියෝ | 300 | |
| මුදල් | 510 | 1 010 |
| | | 2 850 |
| **හිමිකම් හා වගකීම්** | | |
| ප්‍රාග්ධන ගිණුම් A | 800 | |
| B | 850 | |
| C | 500 | 2 150 |
| ජංගම ගිණුම් A | 200 | |
| B | 60 | |
| C | 65 | 325 |
| **ජංගම නොවන වගකීම්** | | |
| බැංකු ණය | 75 | |
| ණය ගිණුම B | 100 | |
| C | 150 | 325 |
| **ජංගම වගකීම්** | | |
| ණය හිමියෝ | 50 | 50 |
| | | 2 850 |

**තක්සේරු ඇගයීම් හා නිර්ණායක :**

- පහත දක්වා ඇති හවුල් ව්‍යාපාර දෙකේ තොරතුරු සිසුන්ට ලබා දී 2017/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශන හා 2017/03/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පිළියෙළ කිරීම .

**2016/03/31 දිනට හවුල් ව්‍යාපාර ශේෂ පිරික්සුම්**

(රු.000')

| ගිණුමේ නම | අතුල හා මිතුල ව්‍යාපාරය | | සිංහ හා වීර ව්‍යාපාරය | |
|---|---|---|---|---|
| | හර | බැර | හර | බැර |
| 2015/04/01 තොගය | 800 | - | 400 | - |
| විකුණුම් ආදායම | - | 2 000 | - | 1 000 |
| දේපළ පිරියත හා උපකරණ | 1 200 | - | 800 | - |
| ණයගැතියෝ සහ ණයහිමියෝ | 300 | 250 | 200 | 500 |
| ප්‍රාග්ධන ගිණුම් - අතුල / සිංහ | - | 1 000 | - | 500 |
| - මිතුල /වීර | - | 800 | - | 400 |
| ජංගම ගිණුම් - අතුල සිංහ | - | 50 | 30 | - |
| - මිතුල / වීර | 10 | - | - | 60 |
| ගැණුම් | 1 400 | - | 850 | - |
| ගැනිලි - අතුල | 100 | - | - | - |
| - වීර | - | - | 50 | - |
| ප්‍රචාරණය | 20 | - | 40 | - |
| ගෙවල් කුලී | 40 | - | 30 | - |
| විදුලිය | 110 | - | 80 | - |
| වැටුප් හා වේතන | 180 | - | 90 | - |
| වෙනත් ආදායම් | - | 140 | - | 80 |
| ගෙවූ වේතන - අතුල | 50 | - | - | - |
| - මිතුල | 40 | - | - | - |
| ගෙවූ ප්‍රාග්ධන පොලී - සිංහ | - | - | 10 | - |
| - වීර | - | - | 20 | - |
| ණය ගිණුම - මිතුල / වීර | - | 150 | - | 100 |
| දේපළ පිරියත ක්ෂය වෙන් කිරීම (2015. 04. 01) | - | 60 | - | 40 |
| අඩමාණ ණය වෙන් කිරීම (2015.04.01) | - | 50 | - | 20 |
| මුදල් හා මුදල් සමාන දෑ | 250 | - | 100 | - |
| | 4 500 | 4 500 | 2 700 | 2 700 |

අතිරේක තොරතුරු ව්‍යාපාර දෙකට ම අදාළ කර ගන්න.

01. 2016.03.31 දිනට තොගයේ පිරිවැය රු. 70 000 ක් වූ අතර, එදිනට එහි ශුද්ධ උපලබ්ධි අගය රු. 50 000 කි.
02. 2016.03.31 දිනට උපචිත වියදම් හා ඉදිරියට කළ ගෙවීම් මෙසේ ය.
උපචිත විදුලිය රු. 10 000 ඉදිරියට ගෙවූ ගෙවල් කුලිය රු. 5 000
03. රු. 50 000 ක් බොල්ණය ලෙස කපා හැර ඉතිරි ණයගැතියන්ගෙන් 10% ක් අඩමාණ ණය සඳහා වෙන් කරන්න.
04. හවුල්කරුවන්ගේ පහත සඳහන් භාණ්ඩ ගැනිලි වාර්තා කර නැත.
අතුල රු. 10 000 සිංහ රු. 15 000
මිතුල රු. 20 000 වීර රු. 5 000
05. රු. 30 000 ක් වූ විදුලි බිල අතුල විසින් ද රු. 10 000 ක් වූ දුරකථන බිල සිංහ විසින් ද ව්‍යාපාරය වෙනුවෙන් ගෙවා ඇත. එය ප්‍රතිපූරණය කිරීම.
06. හවුල් ගිවිසුම්වල ඇතුළත් කොන්දේසි මෙසේ ය.
    1. ප්‍රාග්ධනයට 10% වාර්ෂික පොළියක් ගෙවීම.
    2. සෑම හවුල්කරුවෙකුට ම වාර්ෂික ව රු. 60 000 බැගින් වේතන ගෙවීම.
    3. ණය සඳහා 10% වාර්ෂික පොළියක් ගෙවීම

(2) දෙන ලද ව්‍යාපාරයක තොරතුරු ඇසුරින් ජංගම ගිණුම් හා ප්‍රාග්ධන ගිණුම් පිළියෙළ කිරීම.

(3) හිමිකම් ගිණුම්වල ශේෂ, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන ආකාරය නිදසුනක් ඇසුරින් දැක්වීම.

(4) පහත සඳහන් වගන්ති සත්‍ය ද අසත්‍ය ද සඳහන් කිරීම.
    (අ) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් හිමිකම් ගිණුම් වර්ගයකි. ( )
    (ආ) ගැනිලි නිසා හවුල්කරුවන්ගේ හිමිකම වෙනස් නොවේ. ( )
    (ඇ) හවුල්කරුවෙකුට ගෙවිය යුතු ණය සඳහා පොළිය ලාභ විසර්ජනයට යොදා නොගනී. ( )

- පහත වගන්තිවල හිස්තැන් පිරවීම
    (අ) ලාභාලාභ විසර්ජන ගිණුම මඟින් පෙන්නුම් කරන්නේ ........................................................................ යි.
    (ආ) ව්‍යාපාරය වෙනුවෙන් හවුල්කරුවෙකු දැරූ වියදම්වල වටිනාකම් ..................................ගිණුමට .................................................. කරයි.

- අතිරේක අභ්‍යාස කිහිපයක් ඇතුළත් කිරීමට ද නිර්දේශ කරමි.